



සිළුමිණ
The Silumina

- ආරම්භය - 1930 මාර්තු 30
- 92 වැනි කාණ්ඩය 19 වැනි පත්‍රය
- ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී
- ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මේෂ රවි 26 භාග බක් අව තෙළෙස්වක ඉරිදා
- වර්ෂ 2021ක් වූ මැයි මස 09 වැනි ඉරිදා

අද පත්‍රය පිටු 100 | මිල රුපියල් 80.00














# ආයතන වසා තැබුවත් සේවක වැටුප අනිවාර්යයි

## වැටුප් ගෙවීම පැහැර හැරියොත් කම්කරු අමාත්‍යාංශයට දැනුම් දෙන්න

(තාරක වික්‍රමසේකර)

**පෞද්ගලික අංශයේ යම් සේවකයකු කොවිඩ් වසංගතයට ගොදුරු වුවහොත් හෝ නිරෝධායනයට ලක්වුවහොත් එම සේවකයාට අදාළ ආයතනය විසින් අනිවාර්යයෙන්ම වැටුප් ලබාදීමට කටයුතු කළ යුතු බව කම්කරු ඇමැති නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා සිළුමිණට පැවැසීය.**

මේ අනුව පෞද්ගලික අංශයේ ලක්ෂ 35කට අධික සේවකයන්ට පමණක් නොව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය ලබා ඇති සියලුම සාමාජිකයන්ගේ රැකියා සුරක්ෂිත බව ඇමැතිවරයා අවධාරණය කළේය. එමෙන්ම කොවිඩ් 19 වසංගතය පැතිරීම නිසා රැකියාවලට පැමිණීමට නොහැකිව නිවෙස්වලට වී සැලැකිය යුතු කාලයක් සිටීමට සිදුව ඇති අයට වැටුපෙන් අඩක් ගෙවීමටද කම්කරු දෙපාර්තමේන්තුව, හාම්පුතුන් සහ වෘත්තිය සමිති සමග එක්ව කරන ලද සාකච්ඡාවේදී තීරණය කර තිබේ.

යම් පෞද්ගලික ආයතනයක් වසංගතය නිසා සති කිහිපයක් වසා දමනු ලැබුවත් වැටුප් ගෙවීම අනිවාර්යයෙන්ම කළ යුතු බව පෙන්වා දුන් කම්කරු ඇමැතිවරයා ආයතනයක් වසංගතය නිසා සැලැකිය යුතු ලෙසින් පාඩු ලබන බවට තහවුරු වුවහොත් පමණක් සේවකයන්ට අවම වශයෙන් රුපියල් 14,500ක් ගෙවිය යුතු බවද පෙන්වා දුන්නේය. මේ අතර කම්කරු අමාත්‍යාංශය පවසන්නේ යම් ආයතනයක් සේවකයකුට වැටුප් ගෙවීම පැහැර හැරියහොත් එය සිය අමාත්‍යාංශයට දැනුම් දිය යුතු බවය.

## නිරෝධායන නීති උල්ලංඝනය කළ 6,000කට වැඩ වරදී

(අමිල මලවිසූරිය)

**මුහුණු ආවරණ නොපැලඳීම සහ නිසි ආකාරයෙන් නොපැලඳීම මෙන්ම සමාජ දුරස්ථභාවය නැතිකම ඇතුළු නිරෝධායන නීති උල්ලංඝනය කිරීම හේතුවෙන් මැයි 07 වැනිදා බස්නාහිර පළාත ඇතුළත පමණක් පුද්ගලයන් 436 දෙනකු අත්අඩංගුවට ගෙන තිබේ. මෙසේ මොවුන් අත්අඩංගුවට ගෙන ඇත්තේ ජංගම වෙළෙඳුන්, පොදු වෙළෙඳපොළ, ගෘහස්ථ ක්‍රීඩාගාර, උද්‍යාන, උපකාරක පන්ති ඇතුළු ස්ථාන 1099 පරීක්ෂා කිරීමෙනි.**

පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ පවසන්නේ ඉකුත් මාස හය ඇතුළත පුද්ගලයන් 5,936 දෙනකු නිරෝධායන නීති උල්ලංඝනය කිරීම නිසා පොලිස් අත්අඩංගුවට ගත් බවයි.

## අධිවේගයේ පිවිසුම් 5ක් වැසේ

(තාරක වික්‍රමසේකර)

**කොළඹ පිටත වටරවුම් මාර්ගයේ හා දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිවිසුම් ස්ථාන පහක් වසා දැමීමට සිදුව ඇතැයි මාර්ග සංවර්ධන අධිකාරිය පවසයි.**

ඒ අනුව කොතලාවල, කඩුවෙල, කොට්ටාව, ඉමදූව සහ මත්තල පිවිසුම් වසා දමා ඇති බවත් ඒ ස්ථානයන්හි සේවකයන් 28 දෙනකුට කොවිඩ් රෝගය වැලඳීම ඊට හේතු වී තිබෙන බවත් වාර්තා වේ. කෙසේ වුවත් මුදල් ගෙවීමකින් තොරව ගිලන් රථවලට පමණක් කොට්ටාව පිවිසුමෙන් පිටවීමට අවස්ථාව ලබාදී ඇති අතර එහි පොලිස් නිලධාරීන් පමණක් සේවයේ යෙදී සිටී.

### පීසීආර් පරීක්ෂණ දිගටම... ස්පුට්නික් එන්නත දීම ඇරැඹේ...





මැයි 05 වැනිදා පමණක් කොළඹ නගර සභාව මඟින් පීසීආර් පරීක්ෂණ දහසක් සිදුකරන ලදී. එහිදී කොළඹ සුගතදාස ක්‍රීඩාංගණ සේවකයකුට පීසීආර් පරීක්ෂණයක් සිදුකරන අයුරු විමල් කරුණාතිලකගේ කැමරාවට හසුවූ අයුරු වම්පස ඡායාරූපයෙන් දැක්වේ. දකුණු පස ඡායාරූපයෙන් දිස්වන්නේ රුසියාවේ ගැමීලියාඩ් සමාගමේ නිෂ්පාදිත ස්පුට්නික් එන්නතේ පළමු කාණ්ඩය ලබාදීම මැයි 06 වැනිදා ආරම්භ වූ අවස්ථාවේදී ගොතටුව, මාදින්නාගොඩ ශ්‍රී සුරම්‍යාරාම රජමහා විහාරයේදී ප්‍රදේශවාසීන්ට එන්නත් ලබා දුන් අයුරු සිළුමිණ ඡායාරූප ශිල්පී රුක්මල් ගමගේගේ කැමරාවේ සටහන් වූ ආකාරයයි.

## මුල් මාස දෙකට අල්ලස් පැමිණිලි 200යි

(සුභාෂිණී ජයරත්න)

**මේ වසරේ ජනවාරි සහ පෙබරවාරි මාස දෙකෙහි අල්ලස් සහ දූෂණ පැමිණිලි 191ක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලැබී තිබේ. ඒ අතර වත්කම් පැමිණිලි 8ක්ද, වැටලීම් 21ක්ද සිදුකර තිබේ. ඉකුත් වසරේ ලැබී තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 2,740 කි. එම පැමිණිලි සංඛ්‍යාවෙන් 2,017ක් වැඩිදුර විභාග කිරීමට කොමිෂන් සභාව කටයුතු කරගෙන යයි.**

## රණවිරුවන්ට අප්‍රේල් 27 සිට සහන

(අමිල මලවිසූරිය)

**ත්‍රස්තවාදී හේතු නිසා මියගිය සහ ආබාධිත වූ රණවිරුවන්ගේ යැපෙන්නන් වෙත සහන සැලැසීම සඳහා යෝජනා 7ක් ඇමැති මණ්ඩලය විසින් ඉකුත් අප්‍රේල් 27 වැනිදා අනුමත කළ අතර එය එදින සිට ක්‍රියාත්මක වේ.**

සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව රජයක වගකීම සහ යුතුකම වන්නේ රණවිරුවන් වෙනුවෙන් සැපයිය හැකි සියලුම පහසුකම් ලබා දීම බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් අවධාරණය කර තිබිණි.

## සියලු රෝහල් කොවිඩ් වෙනුවෙන් සීරුවෙන්

**පසුගිය දින කීපය තුළ අඛණ්ඩව දිනකට වාර්තා වන කොවිඩ් රෝගීන්ගේ සංඛ්‍යාව දෙදහසකට ආසන්න වීම හේතුවෙන් මේ වන විට මෙරට රෝහල් පද්ධතිය තුළ කොවිඩ් රෝගීන් 18000කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රතිකාර ගන්නා හෙයින් ඉදිරියේදී තවත් රෝහල් කිහිපයක්ම සම්පූර්ණයෙන්ම කොවිඩ් රෝගීන් සඳහා වෙන් කිරීමට සැලසුම් කර තිබේ.**

ඊට අමතරව සෑම ප්‍රධාන රෝහලක ම වාට්ටු කිහිපයක් කොවිඩ් රෝගීන් සඳහා වෙන් කිරීමට සැලැසුම් කරන බව වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය සුදත් සමරවීර පැවැසීය. ඊට අමතරව මෙතෙක් නිරෝධායන මධ්‍යස්ථාන ලෙස භාවිත කළ ස්ථාන කිහිපයක්ද රෝග ලක්ෂණ ► 2 වැනි පිටුවට

## පොල් වගාකරුවන්ට සහන රැසක්

**පොල් වගාවේ ප්‍රවර්ධනය සඳහා මේ වසරේදී පොල් වගාකරුවන් වෙත සහන රැසක් සැලැසීමට පොල් වගා කිරීමේ මණ්ඩලය තීරණය කර තිබේ. මේ සහන ලබා ගැනීම සඳහා නොවැම්බර් මස 30 දක්වා ඉල්ලුම් කළ හැකි බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී මානෙල් කුලරත්න පැවැසීය.**

මේ යටතේ සහන මිලට පොල් පැළ ලබා දීම සහ පොල් පැළ නඩත්තු කිරීම සඳහා සහනාධාර ලබාගත හැකිය. එමෙන්ම නව වගාව, නැවත වගාව, යටි වගාව යටතේ සහ පාළු පැළ සිටුවීමේ, තේ සමඟ මිශ්‍ර වැඩසටහන් සඳහා ද සහනාධාර හිමි වේ. අදාළ වැඩි විස්තර පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල මගින් හෝ ප්‍රදේශයේ පොල් සංවර්ධන නිලධාරින් මගින් ලබාගත හැකිය.




## කොවිඩ් රෝගීන්ට තවත් ඇඳන් 5,000ක්

(සුභාෂිණී ජයරත්න)

**මේ වන විට කොවිඩ් රෝගීන් සඳහා වෙන්වූ ඇඳන් ප්‍රමාණය 15,000කට අධික වන අතර අවම වශයෙන් එක් දිස්ත්‍රික්කයකින් වැඩි වන අවශ්‍යතා අනුව තවත් ඇඳන් 1,000ක් කොවිඩ් රෝගීන් සඳහා වෙන් කිරීමට රජය තීරණය කර තිබේ. එමෙන්ම ආයුර්වේද රෝහල් කීපයක ද කොවිඩ් රෝගීන් සඳහා ඇඳන් ධාරිතාව 5,000 දක්වා වැඩිකර ඒවා අතරමැදි මධ්‍යස්ථාන බවට පත්කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කර තිබෙන බව ප්‍රාථමික සෞඛ්‍ය සේවා රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලෙ සිළුමිණට ප්‍රකාශ කළාය.**

එමෙන්ම මැයි මස අවසානය වන විට රුසියාවේ ස්පුට්නික් එන්නතේ ඉදිරි මාත්‍රා ද අදියර වශයෙන් ගෙන්වීමට කටයුතු කරන බව හෙළි කළ රාජ්‍ය ඇමැතිනිය වැඩිදුරටත් පවසා සිටියේ, ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රා එන්නතේ දෙවැනි මාත්‍රාව තවත් ලක්ෂ 6කට පමණ ලබාදීමට ඇති හෙයින් ඉදිරියේදී එය ලබාදීමේ කටයුතු ද සැලැසුම් කර ඇති බවය.


## විස පොල්තෙල් හරවා යවයි

**පිරිපහදු නොකළ ඇෆ්ලටොක්සින් පිළිකා කාරක අඩංගු බවට අනාවරණය වූ සමාගම් තුනෙන් එදිරිසිංහ එඩිබල් ඔයිල් පෞද්ගලික සමාගමට අයත් පොල්තෙල් මෙට්‍රික් ටොන් 230ක් අඩංගු අඩි 20 බහාලුම් 12ක් පසුගිය සිකුරාදා (07) එවර් එතික් නමැති නෞකාවෙන් මැලේෂියාවට ප්‍රතිඅපනයනය කළ බව රේගු මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ සුදත්ත සිල්වා පැවැසීය.**



ඒ අනුව පසුගිය අප්‍රේල් මස මුල් සතියේදී කටාන රිෆයිනරීස් පෞද්ගලික සමාගමට අයත් පිළිකා කාරක අඩංගු පොල්තෙල් මෙට්‍රික් ටොන් 105ක්ද ප්‍රතිඅපනයනය කිරීම නිසා මේ වන විට පිළිකාකාරක අඩංගු පොල්තෙල් මෙට්‍රික් ටොන් 335ක් ප්‍රතිඅපනයනය කළ බවද නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

ඒ නිසාවෙන් ගැටලුකාරී තත්ත්වයට මුහුණ දුන් සමාගම් තුනෙන් මේ වන විට ප්‍රතිඅපනයනයට ඉතිරිව ඇත්තෙ අලි බ්‍රදර්ස් සමාගමට ► 2 වැනි පිටුවට

● සුනිල් ස්ටැන්ලි - කළුතර මධ්‍යම සමූහ

# කොරෝනා ගැන රතු එළි දල්වන PHI මහත්තුරු

**ලොව මම බිලි ගත් කොරෝනා වසංගතයේ පළමු සහ දෙවන අදියර පසු කර තුන්වන රැල්ල කරා අපි ළඟාවී සිටිමු. වරින් වර විවිධ ප්‍රභේද මතුවෙමින් අප රට ද ආක්‍රමණය කර සිටින වසංගතය හමුවේ දිනෙන් දින වාර්තා වන රෝගීන් සංඛ්‍යාව මෙන්ම මරණ සංඛ්‍යාව ද වැඩිවෙමින් පවතී. අපි ජීවත් වන්නේ කොරෝනා රෝගියකු දැකීමටවත් අකමැති වූ සමාජයකය. කොරෝනා ආසාදිතයකු හඳුනා ගැනීමත් සමඟ ඔහු කෙරෙන් බොහෝ ඈත්වූ මිනිසුන් සිටින සමාජයකය. ඒ අතර කොරෝනා රෝගීන්ට ඉතා සමීපවෙමින් රාජකාරී කරන නිලධාරීන් පිරිසක් ද සිටිති. ඒ මේ රටේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුය.**

ඇත්තටම කිවහොත් තුන්වන කොරෝනා රැල්ලේ බලාපොරොත්තු නොවූ ධාරිතාව මත සීමිත පිරිසක් වූ ඔවුන් දිවා රාත්‍රී නොබලා, වෙලාව අවේලාව නොබලා, කෑම බීම ගැන නොබලා රට වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක නිරතවී සිටිති. ඔවුනට සෙනසුරාදාවක්, ඉරිදාවක්, පසළොස්වක පොහොයක් තබා මැයි 01 වැනිදාට යෙදී තිබූ ජාත්‍යන්තර කම්කරු දිනයේ නිවාඩුවවත් නැත.

උදේ රැයින් රෝගීන් හඳුනා ගැනීම සඳහා පීසීආර් පරීක්ෂණ පටන් ගන්නා ඔවුන් දහවල් 1 - 2 වනතුරු එම රාජකාරිවල නිරතවී සිටිති. සවස හඳුනා ගත් රෝගීන්ගේ ආශ්‍රිතයන් හඳුනා ගැනීම සහ ඔවුන් නිවෙස් තුළ නිරෝධායනයට ලක් කිරීමේ මෙහෙවරෙහි නිරතව සිටිති. ඉන් අනතුරුව රාත්‍රී කාලයේ හඳුනා ගත් රෝගීන් හඳුනා ගත් රෝහල් කරා ගෙන යාටම කටයුතු කිරීමත් සිදු කරති.

වැඩි වශයෙන් මෙම රෝගය පැතිර යන රටේ ප්‍රදේශ රැසක සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් බොහොමයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන්ම දෙන බත් පාර්සලය හෝ මාළු පාන් ගෙඩිය කා නිවෙස්වලට නොගොස් ඒ ආසන්නයේ නවාතැන්පළක ගත කරන බව මේ රටේ බොහෝ දෙනෙකු නොදන්නවා විය හැකිය. එහෙත් එය සැබෑවකි. රට වෙනුවෙන් තමන්ගෙන් සිදුවිය යුතු යුතුකම් ඉටු කරමින් ඔවුන් මෙසේ නිවෙස්වලට නොගොස් රැඳී සිටිනුයේ රෝගීන් සමඟම කටයුතු කරන තමන්ගෙන් තම පවුලේ අය මෙන්ම තම සමීපතමයන් ආසාදනය වීම වළක්වා ගැනීමටය.

ඒ පරිසර සෞඛ්‍ය කළමනාකරණය තුළින් බෝවන රෝග පාලනය කිරීම මූලික වගකීම කොට ගත් රෝග නිවාරණයේ පුරෝගාමීන් ලෙස ශ්‍රී ලංකා ප්‍රජාවගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය උදෙසා මහජන සෞඛ්‍ය නීතිය බලාත්මක කරන නිලධාරියා තමන් බව ඔවුන් දන්නා නිසාය.

මහාමාරිය මේ රටේ පැතිර ගිය වකවානුවක 1913 වසරේදී මෙම සේවාව ආරම්භ වී ඇත්තේ 'සැනිටරි ඇසිස්ටන්ට්' යනුවෙනි. ඒ බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට නිලධාරීන් තිදෙනකු 1912 වසරේදී එංගලන්තයට යවා පුහුණු කර ගෙන්වා ගැනීමෙන් පසුවය. බ්‍රිතාන්‍යයේ එළිසබෙත් මහ රැජින අනුශාසකත්වය දරන රාජ්‍ය සෞඛය සංගමයෙන් ඔවුනට උසස් ඩිප්ලෝමාවක් ලබාදී තිබූ අතර මෙරට පළමු උසස් ඩිප්ලෝමාලාභීන් වන්නේ ද ඔවුන්ය.

ඉන්පසු 1935 දී 'සැනිටරි ඉන්ස්පෙක්ටර්' යන නමින් හැඳින්වූ ඔවුන් 1950 වසරේදී පිහිටුවනු ලැබූ 'සැනිටරි බෝඩ්' කමිටුවල සාමාජිකයන් වූහ. ඉන්පසු මහජන සෞඛ්‍ය පරීක්ෂක යන නිල නාමය ඔවුනට ලැබුණේ 1977 වසරේදීය.

මෙරට 350 කට ආසන්න සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල මෙන්ම විශේෂිත ව්‍යාපාරවල මේ වනවිට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 2500ක් පමණ සේවයේ යෙදී සිටිති. ඒ අතරේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරියන් කීප දෙනෙක් ද වෙති.


පී.සී.ආර්. පරීක්ෂණයක් සඳහා ගාල්ලේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමක්

රේණුකා හේරත් සෞඛ්‍ය අමාත්‍ය ධුරය දැරූ කාලයේ අත්හදා බැලීමක් වශයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂණ පුහුණු කණ්ඩායම් තුනක් සඳහා ආධුනික මහජන සෞඛ්‍ය පරීක්ෂකවරියන් කීප දෙනෙකු බඳවා ගන්නා ලදි. ඒ පළමු කණ්ඩායමට 03ක් දෙවන කණ්ඩායමට 01ක් හා තුන්වන කණ්ඩායමට 03ක් වශයෙනි. එහෙත් ප්‍රායෝගික ගැටලු මත එම තීරණය අසාර්ථක වූ බැවින් ඉන්පසු මෙම වෘත්තීය සඳහා කාන්තාවන් බඳවා ගැනීම සිදු නොකරන ලදී. එසේ බඳවා ගත් හත් දෙනාගෙන් එක් අයකු දන්ත වෛද්‍යවරියක වශයෙන්ද, තවත් අයකු විදේශ රැකියාවක් සඳහා සහ තවත් අයකු මෙරට වෙනත් රැකියාවක් සඳහා ද මෙම සේවය අතහැර ගොස් ඇති අතර මේ වන විට ඉතිරිව සිටිනුයේ ඉන් සිවු දෙනකු පමණි.

ඉන් එක් අයකු නුගේගොඩ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරිය වශයෙන්ද, අනෙක් තිදෙනා මහනුවර ළය චිකිත්සාගාරයේ, ගම්පහ ලාදුරු මර්දන ඒකකයේ සහ මොනරාගල මැලේරියා මර්දන ඒකකයේ ද සේවයේ නිරතව සිටිති.


වමේ සිට - ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ, කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක ආර්.ජී. සිංහබාහු, PHI පුහුණු කිරීමේ විදුහලේ විදුහල්පති පී. සාලිය චන්ද්‍ර කුමාර ද සිල්වා සහ මහරගම මහජන සෞඛ්‍ය පරීක්ෂක කීර්ති ලාල් තුඩුවගේ


බේරුවල හුදෙකලා කළ ගම්මානයකට ගෙනයන භාණ්ඩ පරීක්ෂාකරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්

රට පුරා ඇති සියලු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල පළාත් සභා යටතේ පාලනය වුවද කළුතර සහ බේරුවල යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස දෙක පාලනය වන්නේ මධ්‍යම රජය යටතේය. ඒ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩල පුහුණු කරන කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය පිහිටා තිබීමත් පුහුණුවන්නන්ට ක්ෂේත්‍ර පුහුණුව ලබා දීමත් සඳහාය. තුන්වන කොරෝනා රැල්ලේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කටයුතු කරනා ආකාරය කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක ආර්.ජී. සිංහබාහු විස්තර කළේ මෙසේය.


ජ්‍යෙෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් සිය ආධුනිකයන්ගේ සහාය කොරෝනා වැඩසටහනට ලබාගනිමින්

"අප්‍රේල් මුල් සතියේදී අපි ප්‍රාදේශීය සියලු වෙළඳසැල් පරීක්ෂා කර වෙළඳසැල්වලට ඇතුළුවීමට පෙර අත් සේදීම, විෂබීජනාශක දියර පෙඟවූ කාපට් ඇතිරීම ආදී රෝග වළක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දුන්නා. ඊට අමතරව ප්‍රදේශය පුරා ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් රෝගය වළක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දුන්නා. එහෙත් ජනතාව මීට සූදානම් වුණේ නැහැ. වෙළඳසැල්වල පොකුරු පිටින් ගැවසෙන්න ගත්තා. අපි අවුරුදු උත්සවවලට ඉඩ දුන්නේ නැහැ. බයිසිකල් ධාවන තරග කීපයකට ඉඩ දුන්නේ සියලු ක්‍රීඩකයන් හා සංවිධායකයන් ප්‍රතිදේහ පරීක්ෂණවලට භාජනය කිරීමෙන් අනතුරුවයි. අපේ ප්‍රදේශයේ තුන්වන කොරෝනා රැල්ල ආරම්භ වූයේ අවුරුදු කැට පොළවල් හා අවසර නැතිව පැවැත්වූ ක්‍රිකට් තරග එක්ක. දෙවන රැල්ලේ අවසන් කොරෝනා ආසාදිතයන් මීට සහභාගිවී තිබෙනවා."

ඒ අනුව පයාගල හොරගස්කැලේ ප්‍රදේශයේ අයකු රෝගාතුරවී කළුතර මහ රෝහලට පැමිණි අතර ඔහු කොරෝනා ආසාදිතයකු බවට හඳුනා ගත්තා. ඒ අනුව කළ පරීක්ෂණවලදී ඔහුගේ පවුලේ සාමාජිකයන් 06 දෙනෙකු ද ආසාදිතයන් බවට හඳුනා ගත්තා. ගම තුළ කළ පීසීආර් පරීක්ෂණ තුළින් තවත් රෝගීන් 62ක් හඳුනා ගත්තා.

තුන්වන රැල්ලේ දෙවන රෝගියා අපට හමු වූයේ කළුතර අධිකාරිගොඩ ප්‍රදේශයෙන්. ඇය ඇඟලුම් සේවිකාවක්. අධිකාරිගොඩ ග්‍රාම නිලධාරී වසමේ කොස්හේන ප්‍රදේශයේ ඇය පදිංචිවී සිටි අතර එම ප්‍රදේශයේ පැවැති අවුරුදු සාදයකට හා කැටපොළකට සහභාගිවූ අය ඇතුළුව රෝගය ගම පුරා පැතිර ගියා. මේ මොහොත වන විට 120 ට වැඩි රෝගීන් පිරිසක් එම ගමෙන් හඳුනාගෙන තිබෙනවා.

පාසල් වෑන් රථ රියැදුරන්, රිය සහයකයන් ආසාදිතයන්වීම තුළින් රෝගය පාසල් කරාත් පැතිර ගියා. ඒ අනුව එම ගමෙන් පිටත අනු පොකුරු රැසක් බිහි වුණා. තුන්වන කොරෝනා රැල්ල හමුවේ හුදෙකලා කළ දෙවන ග්‍රාම නිලධාරී වසම බවට අධිකාරිගොඩ පත්වුණා.

කළුතර හා බේරුවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස දෙකටම සිටිනුයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු 18ක් පමණයි. මේ අය අති මහත් කැප කිරීමෙන් යුතුව දිවා රාත්‍රී නොබලා වැඩ කරනවා. උදේ වරුවට පීසීආර් පරීක්ෂණ 400 ක් පමණ කරනවා. බේරුවල වරායේ පීසීආර් පරීක්ෂණ ආරම්භ කළේ අලුයම 5 ට.

බොහෝ ප්‍රදේශවල ජනතාව පීසීආර් පරීක්ෂණ සඳහා සහය දුන්නත් බේරුවල, අළුත්ගම, ධර්ගා නගරය හා කටුකුරුන්ද වැනි ප්‍රදේශවල ඇතැම් පිරිස් සහය නුදුන් බව සඳහන් කළ යුතුයි. ඔවුන් මෙම පරීක්ෂණ ප්‍රතික්ෂේප කරමින් වෙළඳසල් වසා පලා ගියා.

මුළු සවස් වරුවම අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කැප කරන්නේ රෝගීන්ගේ ආශ්‍රිතයන් සොයා ගැනීමට හා ඔවුන් නිරෝධායනයට ලක් කිරීමටය. රාත්‍රී 10 - 11 වනතුරු හඳුනා ගත් රෝගීන් රෝහල් සොයා රෝහල්ගත කිරීම් සිදු කරනවා. මේ දිනවල රෝගීන් සංඛ්‍යාව වැඩිවීම නිසා රෝහල් පිරී ගොස් තිබීම විශාල ගැටලුවක්. ඒ අනුව හඳුනාගත් රෝගීන් පවා දින කීපයක් නිවෙස් තුළ රඳවා තබා ගැනීමට සිදු වුණා.

කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය තමර කළුබෝවිල මැදිහත්වී අපට දිනකට පීසීආර් කට්ටල 400ක් හා ක්ෂණික ප්‍රතිදේහ කට්ටල 250ක් පමණවූ වැඩි කෝටාවක් ලබාදී තිබෙනවා. ඒ තුළින් වැඩි රෝගීන් පිරිසක් ඉක්මනින් හඳුනා ගැන්මට අපට හැකි වුණා.

නිවෙස්වල මිය යන පුද්ගලයන් පීසීආර් පරීක්ෂණ සඳහා භාජනය නොකර අවසන් කටයුතු සිදු කිරීමට ඉඩ දෙන ලෙසට ඇතැම් ප්‍රාදේශීය දේශපාලඥයන් අපට විශාල වශයෙන් බලපෑම් කරනවා. අප ඒ බලපෑම් නොතකා මෘත දේහ පීසීආර් පරීක්ෂණ සඳහා රෝහල වෙත යොමු කරනවා.

උතුරු කළුතර ප්‍රදේශයේ නිවසක මිය ගිය අයකු පීසීආර් පරීක්ෂණ සඳහා යොමු නොකරන ලෙසට එසේ බලපෑම් ආවා. අප ඒ බලපෑම් නොතකා මෘත දේහය පීසීආර් පරීක්ෂණ සඳහා යොමු කිරීමෙන් අනතුරුව කොරෝනා ආසාදිත බවට හඳුනා ගත්තා. ඊට දවස් තුනකට පසු ඒ නිවසේම තවත් අයෙකු කොරෝනා රෝගයෙන් මිය ගියා. තවත් ආසාදිතයන් කීප දෙනෙකු නිවසින් හඳුනා ගත්තා. ඒ වගේම නාකන්දලගොඩ ප්‍රදේශයේ මිය ගිය අයකුගේ මෘත දේහය අපි බලෙන් වගේ පරීක්ෂණයට යොමු කිරීමෙන් අනතුරුව කොරෝනා ආසාදිත බවට හඳුනා ගත්තා. පසුව කළ පරීක්ෂණවලදී එම නිවසින් තවත් රෝගීන් 5 දෙනෙකු හඳුනා ගත්තා.

මෙහිදී කළුතර දිස්ත්‍රික් ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සමන් ගීගනගේ මහතා අදහස් දක්වමින් මෙසේ කීය. කළුතර දිස්ත්‍රික්කය පුරා සේවය කිරීමට අපට ඉන්නේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 59 ක් හා පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 11ක් පමණයි. තවත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 20ක පමණ හිඟයක් අපට තිබෙනවා. දිවා රාත්‍රී නොබලා අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු රාජකාරියේ නිරතව සිටිනවා. එසේ කළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුනට බණ්ඩාරගම අටුලුගම ප්‍රදේශයේදි කොරෝනා රෝගියකු මුහුණට කෙළ ගැසීමේ සිද්ධියක් පවා වාර්තා වුණා. කොරෝනා තුන්වන රැල්ලට මුල් වුණේ අලුත් අවුරුද්දට පෙර ජනතාවට දුන් උපදෙස් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොකිරීමයි.

මෙහිදී ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ අදහස් දක්වමින් මෙසේ කීය. මේ වනවිට මහජන සෞඛය පරීක්ෂකවරුන් 1.000 කගේ පමණ හිඟයක් රට තුළ පවතිනවා. අතිකාල ඉල්ලීමකින් තොරව රෑ එළිවෙනතුරු ඇතැම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු රාජකාරියේ නිරතව සිටිනවා. රාත්‍රී 2ටත් රෝගීන් රෝහල් ගත කිරීමට කටයුතු කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සිටිවා. මෙවැනි කැපවීමකින් කටයුතු කරන අයව සමහරු ජීවිත කාලය තුළම දැක නැතිව ඇති. ඒත් ඇතැම් පාර්ශ්වවලින් විවිධ කෙනහිලිකම් තිබෙනවා.

බිම් මට්ටමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කැපවීමෙන් කරන මෙම මෙහෙය අත්හැරියොත් මෙම රෝගී තත්ත්වය කොහෙන් නවතීද කියා හිතන්න අමාරුයි. ග්‍රාම නිලධාරිවරුන්, ත්‍රිවිධ හමුදාව හා පොලිසිය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සමඟ මේ මොහොතේ සමීපව කටයුතු කරනවා. මෙම රෝග පාලන කටයුතු සඳහා අන්තර් පාර්ශ්වීය සහය අවශ්‍යය.

කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ පිහිටි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පුහුණු කිරීමේ විදුහලේ විදුහල්පති පී. සාලිය චන්ද්‍ර කුමාර ද සිල්වා මෙහිදී අදහස් දක්වමින් මෙසේ කීය.

කළුතර මහජන සෞඛ්‍ය පරීක්ෂක විදුහලේ ආධුනික මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 118 දෙනකුද, මඩකලපුව, ගාල්ල, කුරුණෑගල, යාපනය, කඩුගන්නාව යන ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන පහේ 232 දෙනකුද ඇතුළුව නව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 350ක් මේ වන විට පුහුණුව ලබමින් සිටිනවා. ඔවුන්ගේ වසර දෙකක පුහුණුව අවසන් වන්නේ මේ වසර අවසානයේදී.

දෙවන කොරෝනා රැල්ලේදී අප බ්‍රැන්ඩික්ස් පොකුර සහ පෑලියගොඩ මාළු වෙළඳපොළ පොකුර ආශ්‍රිත රෝගීන්ගේ කටයුතු සඳහා දැනටමත් අප විදුහලේ පුහුණුව ලබමින් සිටින ආධුනික මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 118 දෙනාම යෙදවුවා. යෝධ ව්‍යසනයක් හමුවේ ප්‍රජාවගේ වසංගතවේද ආවේක්ෂණ කටයුතු සඳහා පුහුණු වෙමින් සිටින කණ්ඩායමක් අනුයුක්ත කළ ලෝකයේ පළමුවන අවස්ථාව මෙයයි. අප එසේ මොවුන් විශ්වාසයෙන් යුතුව යොමු කළේ වසංගත රෝග පාලනය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ඒ වනවිටත් ඔවුනට මෙම පාඨමාලාව තුළින් ලබාදී තිබීම නිසයි. ඔවුන් කිසිම දීමනාවකින් තොරව මෙම කටයුතුවල නිරතව සිටියා. එසේ කිරීමෙන් ඔවුන්ගේ පාඨමාලා කාලය සම්පූර්ණ කිරීමට තවත් මාස කීපයක් ගත කිරීමට සිදුවී තිබෙනවා.

මෙම ආධුනික මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් රෝග නිවාරණ කටයුතු සඳහා පිටව යාමට පෙර අපූරු කවියක් මහජන සෞඛ්‍ය පරීක්ෂක විදුහලේ දැන්වීම් පුවරුවේ තබා ගොස් තිබුණා.

**"කොරෝනා, අපි එනවා
වෙන මොකටවත් නෙවෙයි
උඹ දැන් නැටුවා ඇති
අහිංසක මිනිසුන්ගේ
කඳුළු එක්ක
ඒ පව ගෙවන්න වෙයි උඹට
අපි එනවා උඹත් එක්ක
දෙකෙන් එකක් විසඳ ගන්න
යක්කු වගේ කොල්ලො ටිකක්
බැරිවෙයි උඹට ගැලවෙන්න
උන්ගෙන්
අනුකම්පා නොකරම උඹ මේ
පුංචි රටෙන් යවන්න වෙනවා
හදවත් පුරෝගෙන අපි ආවේ
නොඑන්නම උඹව යවන්න"**




## සියලු පාසල්, පිරිවෙන්, උපකාරක පන්ති, පෙර පාසල් සහ විශ්වවිද්‍යාල විවෘත කිරීම තවත් කල් යයි

## සියලුම රාත්‍රී තැපැල් දුම්රිය ඇතුළු දුම්රිය ගමන් වාර 22ක් නවතියි

## ගෙදර කොවිඩ් ආසාදිතයන් ඉන්නවා නම් 1906 ට කියන්න


## රට පුරා හුදෙකලා ප්‍රදේශ තවත් ඉහළට...

කොවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීමේ අරමුණින් ඉකුත් සති අන්තය වන විට කුරුණෑගල, කළුතර, ගම්පහ, ත්‍රිකුණාමලය, මාතලේ, අම්පාර සහ මොනරාගල,පොළොන්නරුව සහ පුත්තලම යන දිස්ත්‍රික්ක 9කට අයත් ග්‍රාම නිලධාරී වසම් 32ක් සහ පොලිස් බල ප්‍රදේශ 9ක් හුදෙකලා කර තිබුණි. මෙම සති අන්තය වන විට දිස්ත්‍රික්ක 13කට අයත් ග්‍රාම නිලධාරී වසම් 112ක් සහ පොලිස් බල ප්‍රදේශ 10ක් හුදෙකලා කර තිබේ.

ඒ අනුව ඉකුත් 30 වැනිදා කළුතර දිස්ත්‍රික්කයේ බොල්ලුන්න, ඉඟුරුදලුව, මිදලන,මෝරපිටිය,පැළෑද, හැඩිගල්ල,මෝරපිටිය, තීනියාවල,වලල්ලාවිට දකුණ, මාකලන්දාව, බෝතලාව,කටුයකැලේ වැල්මීගොඩ, පහළ හවෙස්ස, මිරිස්වත්ත සහ පැලවත්ත නැඟෙනහිර යන ග්‍රාම නිලධාරී වසම් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇළහැර පොලිස් බලප්‍රදේශයේ සරුබිම ග්‍රාම නිලධාරී වසම හුදෙකලා කරනු ලැබිණි. ඉකුත් 1 වැනිදා හුදෙකලා කරනු ලැබුවේ පිළියන්දල ප්‍රදේශයේ නාම්පමුණුව සහ ගොරකාපිටිය , අම්බලන්ගොඩ ප්‍රදේශයේ ගොඩහේන සහ තල්ගස්ගොඩ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ දෙහිඅත්තකණ්ඩිය සහ කදිරාපුර, කලවාන ප්‍රදේශයේ හපුගොඩ යන ග්‍රාම නිලධාරී වසම් ය. කොළඹ දිස්ත්‍රික්කයේ පිළියන්දල පොලිස් බල ප්‍රදේශය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඕර්ස් හිල් සහ අන්පුවාලිපුරම් ග්‍රාම සේවා වසම් සහ පාණදුර දකුණ ප්‍රදේශයේ වෑකඩ උතුර, කිරිබේරිය සහ පාලමුල්ල නැඟෙනහිර සහ නුවරඑළියේ නීලදණ්ඩාහින්න ග්‍රාම සේවා වසම ද පසුව හුදෙකලා කරනු ලැබිණි. ඉකුත් 3 වැනිදා නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ග්‍රාම නිලධාරී වසම, කළුතර දිස්ත්‍රික්කයේ පිංවත්ත, නාරම්පිටිය හා පිංවත්ත බටහිර යන ග්‍රාම නිලධාරී වසම් හුදෙකලා කරනු ලැබීය. එදිනම බණ්ඩාරගම නැඟෙනහිර, උග්ගල්ල ග්‍රාම නිලධාරී වසම් සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ තිස්ස වීරසිංගම් චතුරස්‍රය ග්‍රාම නිලධාරී වසමත් වත්තල පොලිස් බලප්‍රදේශයේ අල්විස් වත්ත ග්‍රාම නිලධාරී වසමත් හුදෙකලා කරනු ලැබිණි.ඊට පසුදින කොළඹ දිස්ත්‍රික්කයේ විල්ලෝරාවත්ත, කළුතර බෝම්බුවල,රත්නපුර ගුඟුල්විටිය, රක්වාන පොතුපිටිය උතුර,කලවාන හපුගොඩ, ගම්පහ දිස්ත්‍රික්කයේ ඇල්දෙණිය පල්ලිය පටුමඟ සහ රණවිරු ධර්මසිරි මාවත, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉන්ජස්ට්‍රි සහ ෆෝඩයිස් වත්ත ග්‍රාම සේවා වසම්ද හුදෙකලා කරනු ලැබීය. මීට අමතරව කොළඹ දිස්ත්‍රික්කයේ පමුණුව, හොන්නන්තර, දැල්තර, ගම්පහ දිස්ත්‍රික්කයේ කුට්ටිවිල, රත්නපුර දිස්ත්‍රික්කයේ පල්ලේගම, උඩගම, නව නගරය, වලල්ගොඩ, සුදුගල , පනාමුර, රත්ගම,වව්නියාව දිස්ත්‍රික්කයේ කුරුක්කල්පුතුකුලම්,ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සුභාත්‍රා ලංකා මාවත, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පනන්ගම්මන යන ග්‍රාමසේවා වසම් හුදෙකලා කෙරුණි.

සිකුරාදා පෙරවරුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඇල්දෙනිය නැඟෙනහිර, සූරියපාලුව දකුණ සහ උතුර, පහළ කරගහමුණ උතුර සහ ඉහළ කරගහමුණ උතුර ග්‍රාම නිලධාරී වසම් සහ කොළඹ දිස්ත්‍රික්කයේ හල්පිට, කැස්බෑව නැඟෙනහිර, මාකන්දර බටහිර, නිවුන්ගම සහ පොල්හේන ග්‍රාම නිලධාරී වසම් සහ කළුතර දිස්ත්‍රික්කයේ පිඹුර සහ යටියන බටහිර ග්‍රාම නිලධාරී වසම් වහාම ක්‍රියාත්මක වන පරිදි හුදෙකලා කෙරිණි. එතෙක් හුදෙකලා කර තිබූ කළුතර දිස්ත්‍රික්කයේ ඉඟුරුදළුව, මීගහතැන්න, පැලවත්ත නැඟෙනහිර, මිරිස්වත්ත සහ පහළ හේවෙස්ස ග්‍රාම නිලධාරී වසම් සිකුරාදා පෙරවරුවේ හුදෙකලා බවින් නිදහස් කරනු ලැබිණි.

## දිස්ත්‍රික්ක අනුව දිවයිනේ සමස්ත කොවිඩ් ආසාදිතයන්




සිළුමිණ ග්‍රැෆික්: මහේෂ් විදාණපතිරණ



## ඔක්සිජන් දැනට ප්‍රමාණවත්


රෝහල්වල දැනට පවතින ඔක්සිජන් ධාරිතාව ටොන් අසූවක් දක්වා වැඩි කිරීමට පියවර ගෙන ඇති බව සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි පැවසුවාය. ඒ අනුව ඔක්සිජන් ජම්බෝ සිලින්ඩර 4,000ක් මිලදී ගැනීමට ඇණවුම් කර ඇති බවත් ඉන් 400ක් දැනට ලැබී ඇති බව ද ඇය සඳහන් කළාය. එමෙන්ම ඉදිරියේදී ඇතිවිය හැකි ඔක්සිජන් අවශ්‍යතාව සපුරාලීම සඳහා ඉහළ ප්‍රමිතියෙන් යුත් හයිෆ්ලො ඔක්සිජන් යන්ත්‍ර 150ක් ගෙන්වීමට සෞඛ්‍ය අමාත්‍යංශය තීරණය කර ඇත. ඒ අතර බයි පැක් යන්ත්‍ර 350ක් ද වේ. මේ අතර ඔක්සිජන් සිලින්ඩර් 7,500ක් මේ වන විට සමස්ත රට පුරා භාවිතයට ගනිමින් තිබෙන බවත් හදිසි අවස්ථාවක භාවිතයට කාර්මික ඔක්සිජන් සිලින්ඩර් 500 ක් සැපයුම්කරුවන් සතුව ඇති බවත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පැවසීය. ඇණවුම් කර ඇති අතිරේක ඔක්සිජන් සිලින්ඩර් 395ක් ලබන සතියේ ලැබෙන බවත් තවත් සිලින්ඩර් 1,000ක් ආනයනය කිරීමට කටයුතු කර ඇති බවත් වාර්තා වේ.

## නව කොවිඩ් ප්‍රභේදය ගැබිනි මවුවරුන්ට මාරාන්තිකයි


මෙරටින් හඳුනාගත් පළමු කොරෝනා ආසාදිත ගැබිනි කාන්තාවක් කොවිඩ් නිව්මෝනියා තත්ත්වය හේතුවෙන් ඉකුත් 4 වැනිදා මියගිය අතර එසේ මිය ගියේ රාගම බටුවත්ත ප්‍රදේශයේ පදිංචි 45 හැවිරිදි කාන්තාවකි. මේ වන විට කොවිඩ් ආසාදිත ගැබිනි මවුවරුන් 400 දෙනකු රට පුරා රෝහල්වල ප්‍රතිකාර ලබමින් සිටින බව වාර්තා වේ. රට පුරා පැතිරී යන කොවිඩ් නව ප්‍රභේදයෙන් කුඩා දරුවන් සහ ගැබිනි මවුවරුන් විශේෂයෙන් ආරක්ෂා විය යුතු බව වෛද්‍ය විශේෂඥයෝ අනතුරු අඟවති. රට පුරා රෝහල්වල කොවිඩ් වයිරසය ආසාදනය වූ දරුවන් අතර වයස මාසයත්, මාස 6ත් අතර දරුවන් ද සිටින බව වාර්තා වේ.

ගැබිනි කාන්තාවන්ට පළමු සති 28න් පසු කොවිඩ් ආසාදනය වීම බරපතළ තත්ත්වයක් බව කාසල් වීදියේ කාන්තා රෝහලේ ජ්‍යෙෂ්ඨ විශේෂඥ වෛද්‍ය සනත් ලැනරොල්ගේ අදහසයි. එසේ පළමු සති 28දී වයිරස ආසාදිත කාන්තාවන්ගෙන් සියයට 80කට පමණ කිසිම රෝග ලක්ෂණයක් නොපෙන්වන බවත් ආසාදිත බව හඳුනා ගත හැක්කේ PCR පරීක්ෂණයකින් පමණක් දෙවැනි සති 28දී ආසාදිත වුවහොත් සංකූලතා වැඩිවිය හැකි බවත් හෙතෙම පැවසීය. එබැවින් සැක සහිත රෝග ලක්ෂණ පෙන්වන ගැබිනි මවුවරු කඩිනමින් වෛද්‍ය උපදෙස් ලබාගැනීම අත්‍යවශ්‍ය වේ.

## ශ්‍රී ලංකාවේ කොවිඩ් මරණ ව්‍යාප්තිය වයස් මට්ටම් අනුව




## සමස්ත මරණ සංඛ්‍යාව 745






## එන්නත් ගැන අලුත් බලාපොරොත්තු

කොවිඩ් වයිරසයේ ශීඝ්‍ර ව්‍යාප්තියත් සමඟ කොවිඩ් මර්දන එන්නත් කෙරෙහි ලොව පුරාම ජනතාව අපේක්ෂා දල්වාගෙන සිටිති. ගෝලීය දත්ත වාර්තා අනුව මේ වන විට කුමන හෝ කොවිඩ් මර්දන එන්නතකින් සම්පූර්ණ මාත්‍රාවම ලබාගෙන ඇත්තේ ලෝක ජනගහනයෙන් සියයට 3.6ක් පමණි. කුමන හෝ එන්නතකින් එක් මාත්‍රාවක් පමණක් ලබාගෙන ඇති ජනගහනයේ ප්‍රතිශතය සියයට 7.8කි.

එවැනි පසුබිමක් තුළ ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ පළමු මාත්‍රාව මෙරට පුද්ගලයන් 9,28,107ක් ලබාගෙන ඇති අතර මේ වන විට එහි දෙවැනි මාත්‍රාව ලබාගෙන ඇති සංඛ්‍යාව 1,74,800කි. ඊට අමතරව චීනයේ නිෂ්පාදිත සයිනොෆාම් එන්නතේ දෙවැනි මාත්‍රාව මෙරට සේවය කරන චීන වැසියන් 2,430කට ලබාදී ඇත.

මේ අතර කොවිඩ් මර්දන එන්නතේ පළමු මාත්‍රාව එක එන්නත් වර්ගයකින් ලබාදී දෙවැනි මාත්‍රාව වෙනත් එන්නත් වර්ගයකින් ලබාදීමට හැකියාව ඇත්දැයි සෙවීමට මේ දිනවල පරීක්ෂණ පැවැත්වෙන බව වසංගත රෝග විද්‍යා ඒකකයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ සුදත් සමරවීර පැවසීය. එසේ ලබා දිය හැකි යැයි පරීක්ෂණවලදී තහවුරු වුවහොත් වෙනත් එන්නතක් ගෙනැවිත් දෙවැන මාත්‍රාව ලෙස ලබාදීමට හැකියාව ඇති බව ද ඔහු සඳහන් කළේය.

ශ්‍රී ලාංකිකයන්ට ඇස්ට්‍රාසෙනිකා එන්නතේ දෙවැනි මාත්‍රාව ලබාදීම සඳහා එන්නත් මාත්‍රා ලක්ෂ හයක් අවශ්‍ය වන බවත් එය සපයා ගැනීම සඳහා විවිධ රටවල් සමඟ සාකච්ඡා කරමින් සිටින බවත් කොරෝනා මර්දන රාජ්‍ය ඇමතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ පැවසුවාය.

මේ අතර රුසියාවේ නිෂ්පාදිත ස්පුට්නික් V එන්නතේ මාත්‍රා ලක්ෂ 130ක් මෙම වසරේදී මෙරටට ලබාදීමට අදාළ නිෂ්පාදන සමාගම එකඟතාව පළකර ඇති බව රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන පැවසීය. ඉන් පළමු එන්නත් මාත්‍රා 15,000ක් ඉකුත් 5 වැනිදා මෙරටට ගෙන්වනු ලැබූ අතර එම එන්නත්කරණ වැඩසටහන පසුගියදා ගොතටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයෙන් ආරම්භ විය.

මේ වන විට 669 කට එම එන්නත ලබා දී ඇත.



## අන්තර්ජාලයේ පළවන බෙහෙත් එපා

කොවිඩ් 19 වයිරසයෙන් ආරක්ෂාවීමට හැකි බව කියමින් අන්තර්ජාලයේ පළවන ඖෂධ වට්ටෝරු අත්හදාබැලීමෙන් වළකින ලෙස දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය ජනතාවගෙන් ඉල්ලා සිටී. කොවිඩ් වයිරස ව්‍යාප්තිය ඉහළ යෑමත් සමඟ අන්තර්ජාලය ඔස්සේ විවිධ බෙහෙත් වට්ටෝරු සංසරණය වෙමින් පවතින බවත් එවැනි ආගන්තුක වට්ටෝරු අත්හදා බැලීම තුළින් අහිතකර ප්‍රතිඵල ඇතිවිය හැකි බව එම අමාත්‍යාංශයේ ලේකම් කුමාරි වීරසේකර අවධාරණය කළාය. වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා භාවිත කළ හැකි ප්‍රතිශක්තිය වර්ධනය වන ඖෂධ වර්ග හා ප්‍රතිකර්ම වේ නම් ඒ ගැන ආයුර්වේද වෛද්‍ය දෙපාර්තමේන්තුව, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු සහ ප්‍රජා සෞඛ්‍ය ආයුර්වේද නිලධාරීන් මඟින් ජනතාව දැනුම්වත් කිරීමට පියවර ගන්නා බව ද ලේකම්වරිය සඳහන් කළාය.

## කොවිඩ් මඬින වෑයම් දැඩි වේ

ඉන්දියාව තුළ පැතිර යමින් ඇති කොරෝනා වයිරස ප්‍රභේදය මෙරටට ද ව්‍යාප්තවීමේ අවදානමක් මතුව ඇති බව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානී විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර පැවසීය. මෙරට ධීවර ප්‍රජාව ඉන්දියාවේ සිට පැමිණෙන ධීවර ප්‍රජාවත් සමඟ ගැඹුරු මුහුදේදී සම්බන්ධවීමේ ඇති ප්‍රවණතාවක් මතුව ඇති බවත් මේ හේතුවෙන් මෙරට තුළට ඉන්දියාවේ පවතින කොරෝනා ප්‍රභේදය බෝවීමේ වැඩි ඉඩකඩක් මතුව ඇති බවත් හෙතෙම පැවසීය. ඒ අනුව එම අවදානම වැළැක්වීමට රජය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ක්‍රියාමාර්ග කිහිපයක්ම ගනු ලැබිණි. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඉන්දියාවේ සිට පැමිණෙන කිසිදු පුද්ගලයකුට ශ්‍රී ලංකාවට ඇතුළුවීම ඉකුත් 6 වැනිදා සිට තහනම් කරනු ලැබුණි. වෙනත් රටවල පුද්ගලයන් මෙරටදී නිරෝධායනයට ලක් කළ බව පැවසෙන මධ්‍යස්ථාන අත්හිටුවීමට ද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන විසින් උපදෙස් දී ඇත. එමෙන්ම නීති විරෝධී ලෙස මුහුදු මාර්ග ඔස්සේ ශ්‍රී ලංකාව දෙසට සංක්‍රමණිකයන් පැමිණීම මැඩ පැවැත්වීමට නාවික හමුදාව පැය 24 පුරා ක්‍රියාත්මක වන පරිදි මුර සංචාර වැඩි කරමින් වයඹදිග සහ උතුරු මුහුදේ ආරක්ෂාව තර කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මුහුදු සීමාවට අනවසරයෙන් ඇතුළු වීමට උත්සාහ කළ බවට සැක සහිත පුද්ගලයන් 86 දෙනකු සහිත ඉන්දීය ධීවර යාත්‍රා 11ක් මෙරට මුහුදු සීමාවෙන් නැවත හරවා යැවීමට ශ්‍රී ලංකා නාවික හමුදාව කටයුතු කළේය.

## වසංගතය අතරේත් ජනාධිපති කාර්යාලය අඛණ්ඩව වැඩ

උද්ගතව ඇති කොවිඩ් 19 ව්‍යාප්තිය හමුවේ සෞඛ්‍ය උපදෙස් පරිදි ජනාධිපති කාර්යාලයට කැඳවන සේවක සංඛ්‍යාව සීමා කර තිබුණද මහජනතාවට සැපයෙන සේවා අඛණ්ඩව පවත්වාගෙන යන බව එම කාර්යාලය පැවසීය.

වසංගතය පාලනය පිණිස පනවා ඇති සීමා නිසා ජනාධිපති කාර්යාලයට පැමිණීමට මහජනතාවට ඇති අපහසුව සැලකිල්ලට ගෙන දුරකථන, තැපෑල සහ විද්‍යුත් තැපෑල යන සන්නිවේදන මාර්ග ඔස්සේ තම ඉල්ලීම් දැනුම් දීමට අවස්ථාව සලසා ඇත.

ඒ අනුව ඉදිරි දෙසතියක කාලයේදී, ජනාධිපති කාර්යාලයේ මහජන සම්බන්ධතා අංශය, ඔම්බුඩ්ස්මන් කාර්යාලය සහ ජනාධිපති අරමුදල සමඟ පහත සඳහන් දුරකථන, ෆැක්ස් අංක ඔස්සේ සම්බන්ධ විය හැකිය. ජනාධිපති මහජන සම්බන්ධතා අංශයේ 0114354550, 0112354550 දුරකථන අංක, 0112348855 ෆැක්ස් අංකය සහ **publicaffairs@presidentsoffice.lk** යන විද්‍යුත් තැපෑල, ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ 0112338073 දුරකථන අංකය සහ **ombudsman@presidentsoffice.lk** විද්‍යුත් තැපෑල, ජනාධිපති අරමුදලේ 0112354354 දුරකථන අංකය, 0112331243යන ෆැක්ස් අංකය සහ **fundsecretary@presidentsoffice.lk** විද්‍යුත් තැපෑල ඔස්සේත් ජනතාවට තම සේවා ලබාගත හැකිය.




## නිරෝධායන නීති කැඩූ 5,900කට නඩු

## රට පුරා ග්‍රාම නිලධාරී වසම් 115ක් හුදෙකලා කෙරේ

## රට පුරා ආයුර්වේද රෝහල්වලත් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන

ශ්‍රී ලංකාව තුළ දැනට තහවුරු කළ රෝගීන්
1,21,313

| දැනට රෝහල්ගත කර සිටින රෝගීන් | සුවපත් වූ කොරෝනා රෝගීන් |
|---|---|
| 18,013 | 1,01,763 |

| පසුගිය පැය24 තුළ තහවුරු වූ රෝගීන් | මරණ සංඛ්‍යාව |
|---|---|
| 1,889 | 745 |

# කොවිඩ් මාරුතයේ සතියක සමාලෝචනය



## ගාල්ලේ කඩ සති 2කට වැසේ

## දෛනික ආසාදිතයන් ගණන දෙදහසට වැඩි වන රතු එළි


## වැලිසර විශේෂ ආර්ථික මධ්‍යස්ථානයත් වැසේ

● සුරේකා නිල්මිණී ඉලංකෝන්

ලෝකයම ග්‍රහණයට ගෙන සිටින අදෘශ්‍යමාන සතුරා වන කොවිඩ් 19 ගෝලීය වසංගතය මෙම සති අන්තය වන විට ලොව පුරා මිලියන 155ක් ආසාදිතයන් බවට පත්කොට මිලියන 3.24කට මරණය උරුම කර දී ඇත. මේ වන විට වසංගතයට ගොදුරු වී තිබෙන රටවල් අතරින් වැඩිම බලපෑම සහිත ඇමෙරිකාවේ ආසාදිතයන් සංඛ්‍යාව මිලියන 32.6ක් වන අතර ඉන්දියාවේ ආසාදිතයන් සංඛ්‍යාව මිලියන 21.1කි.

ඒ අතරින් ඉකුත් 5 වැනිදා අසල්වැසි ඉන්දියාවේ පැය 24ක් තුළ වාර්තා වූ වැඩිම කොවිඩ් 19 ආසාදිතයන් සංඛ්‍යාව ලෙස 4,12,618ක් සහ මරණ 3,982ක් වාර්තා විය. ඉන්දියාව තුළ කොවිඩ් ආසාදිතයන් ඉහළ යෑමට හේතුව B.1.617 නම් ද්විත්ව විකෘති කොරෝනා වයිරස් ප්‍රභේදය බව එරට විශේෂඥයෝ පවසති. මේ අතර දිනක් තුළ මෙරටින් හඳුනාගත් වැඩිම ආසාදිතයන් සංඛ්‍යාව ද එදින වාර්තා වූ අතර එම සංඛ්‍යාව 1,939කි. ගතවූ සතිය උණුසුම් කළ කොවිඩ් 19 පිළිබඳ නවක තතු මෙසේය.

### ගතවූ සතියේ ශ්‍රී ලංකාවේ නව කොරෝනා අසාදිතයන් වැඩි වූ හැටි




## දින 4ක් තුළ කොවිඩ් මරණ 49ක්



## නැර කොවිඩ් ප්‍රභේද සොයා තවදුරටත් පරීක්ෂණ

කොවිඩ් වයිසරසේ තවත් විකෘති ප්‍රභේද ඇත්දැයි සෙවීමට කොවිඩ් ආසාදිතයන්ගේ ජෛව පටල සාම්පල 90ක් සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කළ බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආසාත්මිකතා, ප්‍රතිශක්ති වේද හා සෛල ජෛව විද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රධානී ආචාර්ය චන්දිම ජීවන්දර පැවසීය. බ්‍රිතාන්‍යයේ පැතිර ඇති බී-117 විකෘති වයිරසයේ ප්‍රභේදයේ සහ ලංකාවේ පැතිර තිබූ සාමාන්‍ය වයිරසයේ විකෘතිතා ලක්ෂණ පවතින්නේ දැයි හඳුනා හඳුනා ගැනීම මෙම පරීක්ෂණයේ මූලික අරමුණ බව හෙතෙම සඳහන් කළේය.

## ඇඳන් 1,200ක විශාලම කොවිඩ් රෝහල සීදුවේ විවෘත වෙයි

## රෝහල්වල ඇඳන් ධාරිතාව තවත් ඉහළට

කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර ලබාදීමට අලුතෙන් ඇඳන් 10,000ක් වෙන් කිරීමට පියවර ගෙන ඇති බව සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි පැවසුවාය. එමෙන්ම කොවිඩ් රෝගීන් සඳහා දැඩි සත්කාර ඒකක ඇඳන් 104ක් වෙන් කර ඇති බවත් තවත් ඇඳන් 138ක් වෙන් කිරීමට සූදානම් කර ඇති බවත් අමාත්‍යවරිය සඳහන් කළාය.

මේ අතර කොරෝනා රෝගීන් සඳහා වෙන්කර ඇති ගාල්ල දිස්ත්‍රික්කයේ රෝහල් සියල්ලම පිරී ගොස් ඇති නිසා අක්මීමණ රුහුණු විද්‍යා පීඨයේ සහ බුස්ස නාවික හමුදා කඳවුරේ ඇඳන් 500කින් යුත් ප්‍රතිකාර මධ්‍යස්ථාන දෙකක් පිහිටුවීමට පියවර ගෙන ඇත. ඊට අමතරව ගම්පහ වැරැල්ලවත්තේ ප්‍රදේශයේ තවත් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම නාවික හමුදාව විසින් පසුගියදා ආරම්භ කළේය. එම අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය තුළ ඇඳන් 2,000ක පහසුකම් සැලසෙන අතර කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර ලබාදීමට කොළඹ ජාතික රෝහලේ වාට්ටු 3ක් වෙන්කර වෙන්කර ඇත. නැඟෙනහිර පළාතේ සියලුම ආයුර්වේද රෝහල් ද වහාම ක්‍රියාත්මක වන පරිදි කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන බවට පත්කර ඇති බව නැඟෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් පැවැසුවාය. ඒ අනුව එම පළාතේ ආයුර්වේද රෝහල්වල ඇඳන් 283ක් කොවිඩ් රෝගීන් සඳහා අලුතින් එක්වේ.

## ලේ දෙන්න එන්නැයි ලේ බැංකුව ඉල්ලයි

වසංගත තත්ත්වය සමඟ රුධිරය දන්දීමේ වැඩසටහන් අවලංගු වීම නිසා රුධිර හිඟයක් මතුව ඇති බව ජාතික රුධිර පාරවිලයන සේවය පවසයි. සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූලව රුධිර බැංකු තුළදී රුධිරය දන් දීම සඳහා කැමති අය සිටී නම්, දිවයිනේ ප්‍රධාන රෝහල් සහ රුධිර මධ්‍යස්ථානවලට ගොස් රුධිරය ලබාදෙන ලෙස එම සේවය ඉල්ලා සිටී. nbts.health වෙබ් අඩවිය හරහා පහසු වේලාවක් සහ ලියාපදිංචිය ලබාගෙන රුධිරය පරිත්‍යාග කළ හැකි අතර වැඩිදුර තොරතුරු 011 5332153 හෝ 011 2369931 - 4 දුරකථන අංකවලින් ලබාගත හැකිය.

ඡායාරූප - විමල් කරුණාතිලක/ සුදත් මලවීර/ රුක්මල් ගමගේ

ජර්මන් වෙක් | පළාත් උපාධි ගුරු | දුම්රිය ස්ථානාධිපති | පොලිස් ප්‍රවේශය
තරග විභාග පෙරහුරු පොත් පෙළ
සැකසුම - W.O.T. ප්‍රනාන්දු

LITRO GAS
PREMIUM Hybrid 18L
Rs. 1395/-
Rs. 77/50 per Liter
High Propane
COOK MORE
H C V




APX. GW - 22kg
1311
litrogas.com

# මහරගම නගර සභාවේ මාර යුද්දේ




වමේ සිට අර්බුදයට මැදිවූ නාගරික මන්ත්‍රිනී සාවිත්‍රී ගුණසේකර සහ නාගරික මන්ත්‍රී නිශාන්ත විමලචන්ද්‍ර

## මහරගම නගර සභාව රටම හිනස්සයි

## රූපවාහිනී තිරය මඟින් සිද්ධිය ලක්ෂ ගණන් ජනයා නරඹති




මහරගම නගර සභාවේ සාවිත්‍රී මන්ත්‍රීවරිය සහා ගර්භය තුළදී නිශාන්ත විමලචන්ද්‍ර මන්ත්‍රීවරයා අතර ඇතිවූ උණුසුම් තත්ත්වයක්

● **සමීර අබේසිංහ,** නුගේගොඩ සමූහ

**ගමක නගරයක වෙසෙන ජනතාව ගමකින් හෝ නගරයකින් තමන්ගේ ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන ආයතනයට සභිකයෙක් තෝරා පත් කර ගනු ලබන්නේ තම ග්‍රාමයේ හෝ නගරයේ ඇති සුභ සාධන කටයුතු මෙන්ම සංවර්ධන කටයුතු වඩාත් ඵලදායි මට්ටමෙන් ඉටුකර ගැනීමේ අභිලාෂයෙනි. නමුත් මැතිවරණයකින් පසු එසේ නගර සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට පත්වන සභිකයන් සභාවක් තුළ හැසිරෙන ආකාරය පිළිබඳව ජනතාව සෑහීමකට පත් පත්නොවන සිද්ධීන් නිතර නිතර වාර්තා වේ.**

එවන් කනගාටුදායක සිද්ධීන් කිහිපයක් පසුගිය දින කිහිපය තුළ මහරගම නගර සභාවෙන් වාර්තා වන්නේ එම ප්‍රදේශයේ ජීවත්වන මිනිසුන්ගේ ඉහමොළ රත් කරමිනි.

ඊට ආසන්නම සිද්ධිය වාර්තා වන්නේ ඉකුත් මැයි 06 වැනි දින මහරගම නගර සභාවේ මාසික සභා රැස්වීම පැවැති අවස්ථාවේදීය. මහරගම නගර සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනකු තම විවේකාගාර කාමරයක් තුළ සිට යම් විවාදයක නියැළෙන අයුරු ජංගම දුරකථනයකින් වීඩියෝ ගත කළ කොට්ටාව නගරය සහ මාකුඹුර දකුණ කොට්ඨාසය නියෝජනය කරන නාගරික සභිකවරියක් වන සාවිත්‍රී ගුණසේකර එම රූප රාමු මුහුණු පොතට මුදාහැර ඇති බවට චෝදනා කළෙය. සභාවේ ඇතිවූ කතිකාවතක් මත ස්වාධීන කණ්ඩායමකින් තරග කර නගර සභාවට තේරී පත්වූ විපක්ෂයේ මන්ත්‍රීවරයකු විසින් එයට විරුද්ධව අදහස් දක්වමින් සිටියදී තවත් විපක්ෂයට සම්බන්ධ නගර සභිකයකු විසින් විරෝධතා පුවරුවක් ප්‍රදර්ශනය කරමින් සිට ඇත. ඒ අවස්ථාවේදී එම දර්ශනද වීඩියෝ ගත කළ සාවිත්‍රී ගුණසේකර සභිකවරියට විපක්ෂයෙන් එල්ල වූයේ දැඩි විරෝධයකි.

සාවිත්‍රී ගුණසේකර වීඩියෝ දර්ශන දර්ශන ලබා ගනිමින් සිටියදී එම ස්ථානයට පැමිණෙන පාලක පක්ෂයේම ඇයගේ අසුනට අසුන් දෙකකට පමණ ආසන්නයේ අසුන් ගෙන සිටි නගර සභිකයකු වන නිශාන්ත විමල චන්ද්‍ර විසින් ඇයගේ අතේ තිබූ ජංගම දුරකථනය විසි වන ආකාරයෙන් ජංගම දුරකථනයේ දෙසට පහරක් එල්ල කර ඇති බවය. එයින් ආවේගයට පත්වූ නාගරික සභිකවරිය පරුෂ වචනයෙන් බැණ වදිමින් නගර සභික වරයාට කම්මුල් පහර කීපයක් එල්ල කර ඇති බවත් වාර්තා විය.

## මහජන නියෝජිතයන් රටට ආදර්ශයක් විය යුතු බව සමාජ මාධ්‍ය කියයි

## මීට පෙරද මහරගම නගරික මන්ත්‍රීවරියන් දෙදෙනෙක් කෙස් වලු පටලවා ගනිති

ඒ අවස්ථාවේ දී පහරකෑමට ලක්වෙමින් සිටී නිශාන්ත විමලචන්ද්‍ර රැස්වීම පැවති නගර සභා ශාලාවේ පාලක පක්ෂයේ සභිකයන් අසුන් ගෙන සිටි ආසන පිටුපසින් පස්සෙන් පස්සට ගමන් කරන විටත් සභිකවරිය දිගින් දිගටම කම්මුල් පහරවල් කිහිපයක් එල්ල කරන ආකාරය ද සභාවේ සිටි සියලුම දෙනාට දර්ශනය විය. ඒ වාගේම මෙම ගුටිබැට හුවමාරුව සහ කලහකාරී ලෙස හැසිරෙන නාගරික සභිකවරිය පාලනය කර ගැනීමට සභාවේ සිටි පාලක පක්ෂයේ හෝ විපක්ෂයේ කාන්තා සභිකවරියන්ට මෙන්ම සභිකයන්ට ද නොහැකි විය.

මෙම දර්ශනය මහරගම ප්‍රදේශයේ වෙසෙන මහජනයා දුටුවා නම් ඔවුන්ට සිතෙන්නේ පෙර පාසල් ළමුන් දෙදෙනෙක් නොදැනුවත්කම නිසා ගුටිබැට හුවමාරුවක නියැළෙන ආකාරයයි. මීට සති කීපයකට ඉහතදී මහරගම නගර සභාවේම නාගරික සභිකවරියන් දෙදෙනෙක් වන ඉනෝජා මුණසිංහ සහ රසිකා ගුණසිංහ හිටපු නාගරික සභිකයකු ගේ අවමඟුල් උත්සවයකට සහභාගී වී සිටින අවස්ථාවකදී තම කොට්ඨාසයේ සංවර්ධන කටයුත්තක් පිළිබඳව ඇතිවූ ගැටලුවක් මුල් කරගනිමින් බහින්බස්වීමක් මත දෙනෝදාහක් බලා සිටියදී ගුටිබැට හුවමාරුවක නියැළී තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අතකට සිදුවූ තුවාල මත එක් සභික වරියකට රෝහල් ගත වීමටද සිදුවිය. එය එයින් කෙළවර නොවී අවසානයේ මෙම සිද්ධිය අධිකරණය දක්වා ගොස් එක් සභිකවරියක් දැනට සිටින්නේ ඇප මතය.

මාසයකට වරක් පවත්වන මහා සභා රැස්වීම ඉදිරියේ සිදු කිරීමට නියමිත වැඩසටහන් හා සැලසුම් පිළිබඳව සාකච්ඡා නොකර මෙවන් පුහු සිද්ධීන් මුල්කරගනිමින් කා දමන්නේ මහජනතාවට වටිනා වැඩක් ඉෂ්ට කිරීමට ඇති කාලය නොවේද ?

මෙවන් සිද්ධියක් ඇතිවීමේදී සභාවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරන නගරාධිපතිවරයා මෙම සිද්ධිය වළක්වා නොගෙන ගුටි බැට හුවමාරුවට ඉඩදී බලා සිටින ආකාරයද එහි සිටි සියලු දෙනාටම දැකගන්නට හැකි විය. යම්කිසි හේතුවකට දෙදෙනෙක් ගුටිබැට හුවමාරුවක නියැළෙන්නේ නම් විනයක් හෝ සංස්කෘතියක් පිළිබඳව අදහසක් ඇත්තෙක් නම් එය බේරීමට උත්සාහයක් ගැනීම ස්ථානෝචිත දෙයකි. සභාපතිවරයා එසේ නොකරන්නේ මන්දැයි ඇතමුන් ගේ විමතියට කරුණකි. මෙම සිද්ධියේදී විශේෂිතම කරුණක් ලෙස එහි සිටින සියලුම දෙනා මෙන්ම නගරවාසී සියලු දෙනාත් විද්‍යුත් මාධ්‍යයෙන් මෙම ගුටිබැට හුවමාරුවේ දර්ශන දකින විට ඕනෑම කෙනකු සිතන්නේ අගතියට පත්වූ පහර කෑමට ලක්වූ නගර සභිකවරයා පොලිසියට ගොස් මෙම පහර දීම පිළිබඳව පැමිණිලි කරන්න ඇතැයි යන්නය. නමුත් සිදුවන්නේ අමුතුම ආකාරයේ සිද්ධියකි.

ප්‍රහාරය එල්ල කළ නගර සභිකවරිය ගුටිබැට හුවමාරු කිරීමෙන් අනතුරුව සභාවෙන් පිටව යන්නේ මහරගම පොලිස් ස්ථානය වෙත මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් සිදු කිරීමටය. අප මෙම සිද්ධිය පිළිබඳව මහරගම පොලිස් ස්ථානයෙන් සිදු කළ විමසීමේ දී එහි නිලධාරියෙක් පැවසුවේ නාගරික මන්ත්‍රීවරියක් වන සාවිත්‍රී ගුණසේකර නගර සභාවේ මාසික සැසිවාරයට සහභාගිවී සිටියදී තමන්ට නිශාන්ත විමලචන්ද්‍ර නම් සභිකයෙකු විසින් පරුෂ වචනයෙන් බැණ තම අතේ තිබූ ජංගම දුරකථනය විසිකර තමන්ට පහර දුන් බවට පැමිණිල්ලක් සිදුකර ඇති බවය.

අප කිහිප විටක්ම මෙම සිදුවීම පිළිබඳව දැනගැනීම සඳහා නාගරික සභිකවරිය හෝ නාගරික සභිකවරයා දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට කළ උත්සාහය ව්‍යාර්ථ වූයේ ඔවුන් දෙදෙනාගේ ජංගම දුරකථන ක්‍රියා විරහිත කර තිබූ බැවිනි.


SLIIT UNI
THE KNOWLEDGE UNIVERSITY

නව සිසුන් බඳවා ගැනීම
MAY INTAKE 2021
UNDERGRADUATE DEGREE PROGRAMMES




COMPUTING | BUSINESS | ENGINEERING | EDUCATION | PSYCHOLOGY | NURSING | LAW | ARCHITECTURE | QUANTITY SURVEYING | HOSPITALITY & COOKERY

4 YEARS BSC (HONS) DEGREE IN INFORMATION TECHNOLOGY SPECIALISING IN
4 YEARS BBA (HONS) DEGREE SPECIALISING IN
4 YEARS BSC ENGINEERING (HONS) DEGREE IN

SLIIT UNDERGRADUATE DEGREE PROGRAMMES - UGC APPROVED

Software Engineering
Information Technology
Computer Systems & Network Engineering
Data Science
Information Systems Engineering
Cyber Security
Interactive Media

AUSTRALIAN DEGREE PROGRAMMES — Curtin University
Bachelor of Computing (Software Engineering)
Bachelor of Information Technology
Bachelor of Science (Computer Systems and Networking)

BSC (HONS) ARCHITECTURE DEGREE
BSc (Hons) Architecture

Business Management
Human Capital Management
Marketing Management
Accounting & Finance
Logistics & Supply Chain Management
Business Analytics
Management Information Systems
Quality Management

BRITISH DEGREE PROGRAMMES — LIVERPOOL JOHN MOORES UNIVERSITY
Bachelor of Business Administration (Hons)

WILLIAM ANGLISS INSTITUTE @SLIIT
Hospitality Management
Commercial Cookery
Event Management
Patisserie

Civil Engineering
Electrical & Electronic Engineering
Materials Engineering
Mechanical Engineering
Mechanical Engineering (Mechatronics)

AUSTRALIAN DEGREE PROGRAMMES — Curtin University
Bachelor of Engineering (Hons) Civil & Construction Engineering
Bachelor of Engineering (Hons) Electrical & Electronic Engineering
Bachelor of Engineering (Hons) Mechanical Engineering
Bachelor of Engineering (Hons) Mechatronic Engineering

BRITISH DEGREE PROGRAMMES — LIVERPOOL JOHN MOORES UNIVERSITY
Bachelor of Engineering Quantity Surveying

BRITISH DEGREE PROGRAMMES — LIVERPOOL JOHN MOORES UNIVERSITY
BSc (Hons) Nursing (International)
BSc (Hons) Psychology
LLB (Hons) Law

HUMANITIES AND SCIENCES
BEd (HONS) in
Physical Sciences
Biological Sciences
English

BSc (HONS) in
Biotechnology
Financial Mathematics and Applied Statistics

These degrees are offered by SLIIT as approved by the University Grants Commission and Ministry of Education, Sri Lanka.

APPLICATION CLOSING DATE 20 MAY 2021

SCHOLARSHIPS
• FULL SCHOLARSHIP OFFERED TO THE TOP 3 GCE A/L (Sri Lanka) PERFORMERS IN SELECTED STREAMS*
• PERFORMANCE BASED SCHOLARSHIPS ARE OFFERED
*Conditions apply

22 MAY 2021

011 754 4801, 011 754 4802
SLIIT UNI
SLIIT Malabe Campus
New Kandy Road
Malabe

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5-9
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: editor.silumina@lakehouse.lk
වෙබ්: www.silumina.lk
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2021ක් වූ මැයි මස 09 වැනිදා ඉරිදා

# විසාලාවක් නොවීමට නම්...

තිස්වසරක යුද්ධය නිම කළ මානුෂීය මෙහෙයුමට මැයි 19 වැනිදාට වසර දොළහක් පූර්ණය වේ. ඒ දොළොස් වසර පුරාම අප බලා සිටියේ ආර්ථික වර්ධන වේගය හා පුද්ගල සංවර්ධනය ඉහළ තලයකට එසවෙන තෙක්ය. එහෙත් සක්‍රිය ලෙස ආර්ථික වර්ධනයක් සිදුවීමට මඟ හරස් කරන ප්‍රධාන බාධක දෙකකට අපි පසුගිය කාලයේ මුහුණ දුන්නෙමු. ඒ යහපාලනයේ සිදු වූ කුප්‍රකට බැඳුම්කර මගඩිය හා 2019 අප්‍රේල් 21 සිදුවූ පාස්කු ඉරිදා ප්‍රහාරයයි.

අද කොරෝනාව නිසා මේ තිබුණු ආර්ථිකයත් කබලෙන් ලිපට වැටී තිබේ; නැත්නම් පැදුරෙන් බිමට තල්ලු වී ඇත. මේ තත්ත්වය අපට පමණක් පොදු වූවක් නොවේ. ලෝක ආර්ථිකය ද මෙසේ ම ය. කොරෝනා නිසා ලෝකයේ මිලියන 60කට අධික පිරිසක් අන්ත දිළිඳු බවට පත් වෙතැයි ලෝක බැංකුව කියයි. පුද්ගලයකුගේ දිනක ආදායම ඇමරිකානු ඩොලර් 1.90කට වඩා අඩුවීම අන්ත දිළිඳු බවේ මිනුම් දඬුව ලෙස ලෝක බැංකුව විග්‍රහ කරයි. ඒ අනුව ගිය වසරේ ගෝලීය ආර්ථික වර්ධනය 5% කින් පමණ පහත වැටෙනු ඇතැයි ලෝක බැංකුවේ සභාපති මැල්පාස් පවසයි.

බටහිර රටවල් වැඩිහිටි ජනගහනය පාලනය කිරීමට කොවිඩ් 19 ආශීර්වාදයක් යැයි නොකියා කියන වාතාවරණයක; අප වැනි ආසියාතික රටවල් උත්සාහ කරනුයේ කෙසේ හෝ මානව සම්පත රැක ගැනීමට ය. එනිසාම අපේ ශ්‍රම සම්පත රැකුණු නිසා ඉදිරියේ ඇති ආර්ථික විපත අවම කරගැනීමට අපට හැකිවනු ඇත. කෙසේ කොහොම කීවද මේ වසරේ බරපතළ ආර්ථික පසුබෑමකට ලක්වීමට නම් සිදුවනු ඒකාන්ත ය. එබැවින් අප සිතිය යුත්තේ එය අවම කරගැනීමේ ක්‍රමවේද පිළිබඳ ව ය. වයිරසයේ බලපෑම අඩුවන තරමට ආර්ථික අවපාතය අඩුවනු ඇත. එනිසා මේ කරගෙන යන සාර්ථක ක්‍රමවේදය දිගින් දිගට ම පවත්වා ගෙන වයිරසය පැතිරීමේ අවධානමෙන් අප මිදෙන්නේ නම් ආර්ථිකය ගොඩගැනීම අසීරු නොවනු ඇත. වඩාත් ප්‍රශංසනීය ම කාර්යය වන්නේ රටේ ස්වදේශීය නිෂ්පාදන ක්‍රියාවලිය අක්‍රිය නොකර වසංගතය පාලනය කිරීම ය.

මේ වනවිට කෝවිඩ් 19 ව්‍යසනය නිසා අඩපණ වූ ඒක පුද්ගල ආදායම ගැන සැලකිල්ල යොමු කළ රජය ඒ සඳහා සහන රැසක් දැනටමත් ලබාදී තිබේ. සහන මල්ල ඒ අතරෙන් ප්‍රධාන ය. මේ අතර, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රධානී ටෙඩ්රෝස් ගේබ්‍රියාසෙස් ශ්‍රී ලංකාවේ ජනතාවට ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ දෙවන මාත්‍රාව ලබාදීමට අවශ්‍ය එන්නත් මාත්‍රා ලක්ෂ 6 සපයා ගැනීමට උදව් කිරීමට එකඟ වී ඇති බව ජනාධිපතිවරයා පවසා තිබේ. රජයක් වශයෙන් බිම් මට්ටමේ සිට සියලු ජනතාව වෙනුවෙන් ලබා දෙන මේ සහන නිසා ජනතාව සැනසුම් සුසුම් හෙළති.

කෙතරම් නීතිය ක්‍රියාත්මක කළ ද, නීතිය කැඩීමේ මනෝ ව්‍යාධියක් ජනතාවට තිබේ. එය ශ්‍රී ලංකාවට පමණක් පොදු ප්‍රශ්නයක් නොව මනුෂ්‍යයාගේ පොදු අර්බුදයකි. ඒ පොදු අර්බුදයෙන් මේ වසංගතය අබියස නොගැලවුණහොත් සිදුවන ව්‍යසනය බලපාන්නේ තනි පුද්ගලයකු ලෙස ඔබට පමණක් නොවේ. ප්‍රථමයෙන් සිය සමීපතමයන්ට අනතුරුව එතැනින් පොදු ප්‍රවාහයට ලෙසිනි. කිසිවකුත් නැති, බෙර හේව්සි නැති, ගරු බුහුමන් නැති හුදෙකලා මරණයක ඇති හුදෙකලාව හා ජීවතුන් අතර සිටින්නන්ට ඇති ශෝකය ගැන සිතත්දී නම් පෙරකී මනෝ ව්‍යාධි ඉබේ ම සුව වෙනු ඇත. අසල්වැසි ඉන්දියාව තුන්බියෙන් ඇලළුණු විසාලාවක් වී ඇති මොහොතක මුව විටට ම ලාවා ගලා එද්දීත් බජව් නටන්නට සිතෙන්නේ නම් එය මානසික වියවුලක් මිස අනෙකක් නොවේ. ඔක්සිජන් ගැන කෙතෙක් කිව්වත් එහි වටිනාකම තේරෙන්නට කොරෝනා මුව විටට ම හිර කරන තෙක් ඉදින්නට සිදු විය. රුපියල් 500 ට තිබූ ඔක්සිජන් ටැංකිය දැන් රුපියල් ලක්ෂයක් දී හෝ ඉන්දියාවේ මිලදී ගන්නට නැත. මරණාසන්නව සිටින රෝගියාගේ මුවට මුව තබා ආයාසයෙන් හුස්ම දෙන්නට තතනන දහස් ගණනක සමීපතමයන්ගේ දසුන සංවේගදායක ය. දහස් ගණනක් මිය යන රෝගීන් ආදාහනයට අවැසි දර මිටියක මිල තුන් හතර ගුණයකින් ඉහළ ගොස් තිබේ. එපමණක් නොව ආදාහනයට පැය පහක් හයක් බලා සිටිය යුතු ව තිබේ.

ඔක්සිජන් මොකටද කියූ අයට සොබාදහම ඔක්සිජන් ගැන පාඩම කියා දෙමින් සිටී. ඔක්සිජනීකෘත රුධිරය සැපයීම විනාඩි කිහිපයක් අක්‍රිය වුණොත් මරණය උරුම වේ. ඔක්සිජන් නැති විට කොන්ක්‍රීට් ගොඩනැගිලි දූවිලි බවට හැරේ; ඔක්සිජන් නැති විට ජීවීන් විනාශ වී යයි. ඔක්සිජන් කියන්නේ එවැන්නක් වුවත්, අගය තේරෙන්නට නම් නැති වන්නට ම අවශ්‍ය විය. මුදල් වටිනාකම වසංගත හමුවේ ක්‍රමයෙන් ක්ෂය වී යන්නේ එලෙසින් ය. ව්‍යසන ලෙස හඳුනා ගන්නා මෙවැනි සිදුවීම්වලින් අනතුරුව සමස්ත මානව ප්‍රජාවේ හැසිරීම් රිද්මය මෙන්ම චින්තන රටාව ද අර්ථාන්විත වෙනසකට ලක් වේ යැයි අපට උපකල්පනය කිරීමට හැක්කේ මේ වැනි තත්ත්ව යටතේ ය. ගෝලීය ශ්‍රම බළකායෙන් 81% ක සේවා ස්ථාන මේ මොහොත වනවිට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් වසා දමා ඇත. ස්ථිරව හෝ තාවකාලිකව මේවායෙහි වැඩකරන සේවකයන් ද ඉවත් කර ඇත. ඔවුන්ගේ රැකියාවේ පැවැත්ම තහවරු කිරීම පිළිබඳ කිසිම ප්‍රායෝගික බලාපොරොත්තුවක් නැත. මේ අනුව දළ ඇස්තමේන්තු ප්‍රකාර ව රැකියා අහිමි වන ලෝක ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව අන්තර්ජාතික කම්කරු සංවිධානය පවසන පරිද්දෙන් කෝටි 20කට අධිකය.

"වසංගතයක් කෙසේ වෙතත්, මහජන සෞඛ්‍ය ඉතිහාසයේ කිසි දිනෙක කණ්ඩායම් ප්‍රතිශක්තිය මේ අන්දමට රෝගී තත්ත්වයක් දරා ගත නොහැකි අන්දමට පුපුරා යෑමකට ප්‍රතිචාර දැක්වීමේ උපාය මාර්ගයක් ලෙස භාවිත කර නැත" යනුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ටෙඩ්රෝස් ගේබ්‍රියාසෙස් පවසා තිබේ. එය විද්‍යාත්මක ව හා සදාචාරාත්මක ව ගැටලු සහගත ය. මහජන සෞඛ්‍ය සන්දර්භයක් තුළ, කණ්ඩායම් ප්‍රතිශක්තිය සාමාන්‍යයෙන් විස්තර කරන්නේ රෝගයකින් එය පැතිරීම වැළැක්වීම සඳහා ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් එන්නත් කරනු ලබන අවස්ථාවක් වන අතර එමඟින් එන්නත් ලබා නොගත් සුළු පිරිසකට සුපුරුදු ආරක්ෂාව සැපයීම ලෙසිනි.

ඉදිරි සතිය තීරණාත්මක ය. සෞඛ්‍ය බලධාරීන් විසින් ලබා දෙන සෞඛ්‍ය උපදෙස් නිසි පරිදි අනුගමනය නොකරන්නේ නම් ශ්‍රී ලංකාවේ කොරෝනා අධිවසංගත තත්ත්වයක් ඇතිවිය හැකි බව ඔවුහු පවසති. ජනතාව වගකීම් විරහිතව ක්‍රියා කරන්නේ නම් මෙරට සෞඛ්‍ය පද්ධතිය බිඳ වැටී දෑස් ඉදිරිපිට රෝගීන් මිය යන්නට දී බලා සිටින්නට සිදුවනු ඇති බවට ඔවුහු අනතුරු අඟවති. ඔබ, ඔබේ සමීපතමයන්ට ආදරය කරන්නේ නම් රජය ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළට ඔබේ උපරිම සහය ලබා දෙන්න. මේ වසංගතය පරාජය කිරීමට ඇති ප්‍රධානතම ක්‍රියාමාර්ගය එය පමණි.

# ‘පාස්කු කොමිසමේ නිර්දේශ මත සත්‍ය ලෝකයට හෙළිදරව් කිරීම රජයේ වගකීමක්’

## මහාචාර්ය නීතිඥ ප්‍රතිභා මහානාම

● සුභද්‍රා දේශප්‍රිය



**මීට වසර දෙකකට පෙර එනම් 2019 වර්ෂයේ අප්‍රේල් 21 පාස්කු ඉරුදින තෝරාගත් පල්ලි අටක් ඉලක්ක කරමින් ප්‍රහාරයක් එල්ල විය. ඒ තුළින් ආගමික නොසන්සුන්තාවක් ඇති කරමින් යම් ආකාරයකට ඒ ප්‍රහාරයෙන් රට ලෙස අප අපහසුතාවට පත් කිරීමට ජාතික තවුහිද් ජමාත් සංවිධානය කටයුතු කරන ලදී. පාස්කු ඉරිදා එල්ල කළ එම මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය, එල්.ටී.ටී.ඊ ත්‍රස්ත්‍රවාදයෙන් පසු සාමාන්‍ය සිවිල් ජනතාව අරමුණු කරගනිමින් එල්ල කළ ප්‍රථම බෝම්බ ප්‍රහාර විය. මෙහිදී දක්නට ලැබෙන කරුණ මේ ප්‍රහාරය එල්ල කරනු ලැබූ අපරාධකරුවන්ට සාමාන්‍ය මිනිසුන්ගේ හැසිරීම් නොවූ බවයි. මූලධර්මවාදී අන්තගාමී පාසල් හරහා මේ අයගේ මානසික මට්ටම වෙනස් කර ඇති බවට තොරතුරු පසුකාලීනව හෙළිදරව් වෙමින් පවතී.**

මේ සංවිධානයේ අපරාධයට සම්බන්ධ ආධාරකරුවන් පසුකාලීනව අත්අඩංගුවට ගත හැකිවිය. යහපාලන කාලවකවානුව තුළ කුමන හේතුවකින් හෝ මේ සම්බන්ධයෙන් අනුබල දුන් ආධාරකරුවන් අත්අඩංගුවට ගැනීමේ කිසිදු උත්සාහක් අපි නොදුටුවෙමු.

නමුත් ඒ ආධාරකරුවන්ට එරෙහිව නුදුරේදීම අධිචෝදනා ගොනු කරන බව නීතිපතිවරයා සඳහන් කර ඇත. පාස්කු ප්‍රහාරය සිදු කිරීමට අදාළව 2016 වර්ෂයේ සිට ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ මොහොමඩ් සහරාන් සමඟ කුමන්ත්‍රණය කළ සියලු ආධාරකරුවන්ට නඩු පැවරීමට කටයුතු කරන බවත් මාවනැල්ල බුදු පිළිම කැඩීමේ සිද්ධිය සම්බන්ධයෙන් 20 වැනිදා කෑගල්ල උසාවියේ අධි චෝදනා ගොනු කිරීම මේ වනවිටත් සිදුවී ඇත.

බෝම්බ ප්‍රහාර 8 ට සම්බන්ධව අධි චෝදනා පත්‍ර 8ක් සහ 2019 අප්‍රේල් 16 වැනිදා කාත්තන්කුඩි ප්‍රදේශයේ පිපිරීමට අදාළ අධි චෝදනා පත්‍රයත් වනාතවිල්ලුව පුපුරන ද්‍රව්‍ය ගබඩාවක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් අධි චෝදනා පත්‍රයක්ද ඇතුළුව නීතිපතිවරයා විසින් පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියලු චූදිතයන්ට අධි චෝදනා ගොනු කිරීමට සියලු කටයුතු සම්පාදනය කර ඇති බව පසුගිය 20 වැනිදා දැනුම් දෙන ලදී.

කෙසේ වෙතත් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කතා කිරීමේදී මේ පාස්කු ඉරිදා ප්‍රහාර සම්බන්ධයෙන් සොයා බැලීමට කොමිෂන් කිහිපයක් පත් කරන ලදී. මුල්කාලීන කොමිෂන් කිහිපයක් පත් කර ඒ වාර්තාව ඇමැති කමිටුවට යොමු කර ඇමැති කමිටුව විසින් එය නීතිපතිවරයාට භාර දෙන ලදී. එනම් පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් මූලික වශයෙන් විමර්ශන පවත්වා විවිධ පක්ෂ නායකයන් ද ඒ පිළිබඳව විමර්ශනය කරමින් ඒ නිර්දේශ බාර දෙන ලදී.

> **වින්දිතයන්ට සාධාරණයක් ඉටුවිය යුතුය. එමෙන්ම මෙය කුමන ආකාරයෙන්ද සිදුවූයේද යන්න ලෝකයට හෙළිදරව් කිරීම ඉතා වැදගත්ය. අහිංසක ජනතාවක් එසේ ඝාතනය කළේ ඇයිද යන්න එහිදී හෙළිදරව් වනු ඇත.**

මූලික වශයෙන් මෙයට වගකිවයුතු සහ මේ ප්‍රහාරය වැළැක්වීමට ක්‍රියා නොකළ පුද්ගලයන්ට එරෙහිව අධිචෝදනා ගොනු කිරීම සිදුවෙයි. වඩාත් පැහැදිලි කළහොත් මෙහිදී අධිචෝදනා යනුවෙන් අදහස් කරනුයේ පවත්නා නීතිය යටතේ මෙවැනි වරදක් කළ බවට විමර්ශනය තුළින් හෙළිදරව් වී ඇත්නම් ඒ පිළිබඳ සර්ව සාධාරණ ස්වාධීන නඩු විභාගයක් කිරීමයි. මින් පෙර මේ සම්බන්ධයෙන් පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන සිදු කරන ලදී.

එහිදී පාස්කු කොමිසම පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේදීත් සොයා බැලිණි. ඒ අනුව මේ සම්බන්ධයෙන් විමර්ශන දෙපැත්තකින් සිදුවිය. මේ වන විට ලංකාවේ අධිචෝදනා පත්‍ර ලබා දීම පිළිබඳ ඉතා කඩිනමින් නීතිමය යාන්ත්‍රණයක් සිදුවන බව අපි දනිමු.

මේ සම්බන්ධයෙන් වැදගත් කරුණ නම් මේ ප්‍රහාරය සම්බන්ධයෙන් දැනසිටි අය මෙය වළක්වාලීමට කටයුතු නොකළ අතර වගකීම් විරහිතව ක්‍රියා කළ බව පෙනී යෑමයි.

එවකට සිටි යහපාලන රජය මේ සම්බන්ධයෙන් දැනුම්වත් වී සිටීම සුළුකොට තැකිය නොහැකි වරදකි. රාජ්‍ය යාන්ත්‍රණය ඒ පිළිබඳව දැනුම්වත් වී තිබුණද එය වළක්වා ගැනීමට පියවර නොගැනීම සුළු කොට සැලකිය නොහැකිය. එවකට පාර්ලිමේන්තු වරප්‍රසාද ලද මන්ත්‍රීවරුන් ද මේ පිළිබඳ දැනුම්වත් වී සිටි බව අපි දනිමු . මීට වඩා මේ පිළිබඳව සොයා බැලිය යුතුය.

දන්නා කරුණු පිළිබඳව හෝ මෙවැනි ත්‍රස්තවාදී ක්‍රියාවලියකදී අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට දැනුම්වත් කිරීම අතිශයින්ම වගකීමෙන් කළ යුතු කරුණකි. මේ සම්බන්ධයෙන් යම් කෙනෙක් අත්අඩංගුවට ගත් විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් යන කඩතුරාවට වැසී 1979 ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත යටතේ ඒ අත්අඩංගුවට ගත් තැනැත්තා මේ සම්බන්ධයෙන් වගකිව යුතු නැති බවට තර්ක නගයි. ජාතික ආරක්ෂාව පිළිබඳ මෙවැනි කරුණක් දේශපාලනීකරණය කරගැනීමට යෑම අතිශයින්ම භයානකය. මේ අවස්ථාවේදී විපක්ෂය සහාය දිය යුතු වන්නේ මේ ආකාරයට නොවේ. මෙය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය දක්වා ගිය ගැටලුවකි. අන්තර්ජාතික නීතියට පමණක් නොව, ශ්‍රී ලංකාවේ නීතියට අදාළව ද විශාල වරදකි. ඒ අයගේ භූමිකාව වන්නේ මේ අත්අඩංගුවට පත් වූවන් වැරදි කර නැති බව පවසමින් සත්‍යග්‍රහ පැවැත්වීම නොවේ. තමන් දන්නා දේ නිවැරදිව පැහැදිලිව සඳහන් කිරීමයි. අධිචෝදනා පත්‍රවලදී විශේෂයෙන් සමහර පුද්ගලයන්ට චෝදනා විශාල ප්‍රමාණයක් වෙයි.

ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත යටතේ සමහර හිටපු ඇමැතිවරුන් අත්අඩංගුවට ගෙන විමර්ශනය කෙරෙයි. ඒ වගේම දණ්ඩ නීති සංග්‍රහය යටතේ ද මෙහි වන සියලුම විමර්ශන සලකා බලා අධිචෝදනා බාර දීම සිදුවෙයි. හිටපු පොලිස්පතිවරයා, ආරක්ෂක ලේකම් සහ රාජ්‍ය නායකයන් සම්බන්ධයෙන් ද නීතිය ක්‍රියාත්මක වීම සිදුවෙයි.

විශේෂයෙන් යහපාලන රජය පැමිණීමත් සමඟ මේ රටේ හමුදා බුද්ධි අංශ හීන වීමක් සිදු විය. මාවනැල්ල බුදුපිළිම කැඩීමේ සිදුවීමේදී මෙවැනි දේ සිදු කරන බවට හිටපු ඇමැතිවරුන් පවා ප්‍රසිද්ධියේ යම් ප්‍රකාශ සිදු කළද ඒවාට කිසිදු පියවරක් නොගන්නා ලදී. කෙසේ වෙතත්, මාවනැල්ල බුදු පිළිම කැඩීමේ සිද්ධිය සම්බන්ධයෙන් කෑගල්ල උසාවියේ අධි චෝදනා ගොනු කිරීම මේ වනවිට සිදු වී ඇත.

අධිචෝදනාවේදී දෙපාර්ශ්වයන්ම වෙයි. මේ අනුව මහාධිකරණයේදී පැමිණිලි පාර්ශ්වය විත්තිකරුවන් කැඳවන අතර විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥවරුන් ද වන අතර වරදකරු ද නිවැරදි කරු ද යන කරුණ නඩු විභාගයෙන් අනතුරුව වෙයි. අධිචෝදනා ගොනු කිරීම වන්නේ එහි ආරම්භයයි.

මේ පාස්කු ප්‍රහාරය සිදු කිරීමට අදාළව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2 ( 1 උ ) වගන්තිය යටතේ ඉතා පැහැදිලිව සඳහන් කර ඇත්තේ වචනවලින් , චේතනාන්විතව, විවේචනයකින් වෙනත් වාර්ගික, ආගමික ජන කොට්ඨාස අතර ප්‍රචණ්ඩත්වයක් ඇති කිරීම ජාතීන් අතර අසමගිය ඇති කිරීමට ඒ පිළිබඳ චේතනාත්මකව ඒ පාර්ශ්වයන් අතර සට්ටනයක් ඇති කිරීමට විවිධ වර්ග ජනකණ්ඩායම් අතර ආගමික කණ්ඩායම් අතර සහ විවිධ ජාතීන් අතර එවැනි දේ කිරීමේ චෝදනාවන්ට එරෙහිව ද චෝදනා ගොනු කිරීම සිදුවෙයි.

ඒ අනුව මාවනැල්ලේ සිද්ධිය පමණක් නොව සිදුවීම් කිහිපයක් ගත් විට මෙවැනි දේ සිදුවී ඇත. මෙය දණ්ඩ නීති සංග්‍රහය යටතේ විශාල වරදක් වන හෙයින් පොලිස් විමර්ශනවලින් අනතුරුව නීතිපතිවරයාට යොමු කිරීමෙන් අනතුරුව අධිචෝදනා ගොනු කිරීමට හැකිවෙයි.

උදාහරණ ලෙස තෝප්පූර්, මාවනැල්ල, නුවරඑළිය, හම්බන්තොට, පොතුහැර හා කටුපිටිය යන ප්‍රදේශවලද මෙවැනි සිදුවීම් ඇත.

මාවනැල්ල බුදු පිළිම කැඩීමේ සිදුවීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක සිදුවීම ප්‍රමාද විය. ප්‍රමාද වීම හෝ මෙවැනි කටයුතු ඉදිරියට ඒම ඉතා හොඳ ක්‍රියාවකි. බුදු පිළිම කැඩීම යනු දණ්ඩ නීති සංග්‍රහය අනුව නම් ආගම් අතර ඇති සුහදතාව, ආගම් අතර ඇති සම්බන්ධීකරණය නැති කිරීමකි. ආගම් අතර ඇති සංහිඳියාව බිඳ දැමීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකි.

මෙය පොලිස් විමර්ශන අනුව සිදුවිය යුතුය. දේශපාලන අධිකාරිය මේවාට මැදිහත් විය යුතු නැත. එහෙත් එසේ ස්වාධීනව පොලිසියට කටයුතු කළ නොහැකි අවස්ථා පසුගිය රජය යටතේ තිබුණි.

මේ වන විට තවුහිද් ජමාහද් සංවිධානය පමණක් නොව සංවිධාන 11ක් තහනම් කර ඇත. නීති විරෝධී ආකාරයට ඒ අය කටයුතු කළේ කෙසේද යන්න අපි සොයා බැලිය යුතුයි.

මියගිය අයගෙන් තොරතුරු ලබා ගැනීමක් කිරීමට නොහැකි නිසා සංවිධාන හරහා විමර්ශන සිදුවිය යුතුයි. අධිචෝදනා ගොනු කිරීමේදී පැහැදිලි සාක්ෂි තිබිය යුතුයි.

මේ අපරාධයන්ට සම්බන්ධ වූවන්ගේ සංවිධානයේ කාත්තාන්කුඩි ප්‍රදේශයේ පාසල්වල ඉගැන්වීම් මෙන්ම නුවරඑළියේ පුහුණු කඳවුරු ඇති බවට විමර්ශනය කර තිබේ. එම පොලිස් විමර්ශනවලට එවකට ස්වාධීනව කටයුතු කිරීමට හැකියාවක් නොතිබුණු අතර දේශපාලන අධිකාරියේ බලපෑම් ද විය.

අපරාධ නඩුවක මානසික අංගය සහ ශාරීරික අංගයන් වෙයි. මානසික අංගය සැකසීමට පෙර පුහුණු කිරීම් වෙයි. ඒ නිසා පුළුල් වශයෙන් විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් තවත් අධ්‍යයනය කර අධිචෝදනා ගොනු කරනු ඇති.

මෙහිදී රටක් ලෙස අපි බැලිය යුතු වන්නේ ශ්‍රී ලාංකිකයන් වශයෙනි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් ලෙස අපි පෙන්විය යුත්තේ බහුවාර්ගික බහු ආගමික රටක් ලෙස අපි සමගියෙන් සමාදානයේ ජීවත් වන බවයි.


අපි රටක් ලෙස එල්.ටී.ටී.ඊ ත්‍රස්ත්‍රවාදය වැනි දරුණුතම ත්‍රස්තවාදී සංවිධානයක් පරාජය කළ ජාතියකි. පාස්කු ප්‍රහාරයෙන් මිය ගියේ අහිංසක ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉටුවන බව අපි ලෝකයට පෙන්විය යුතුය. මේ අපරාධය කිරීමට ත්‍රස්තවාදී කටයුතුවලට උදව් කළේ කවුද? කෙසේද? කුමක් නිසාද? යන කරුණු ගැන සොයා ත්‍රස්තවාදී කටයුතු දැනගෙනත් නිහඬ වූවන් සහ නොසැලකිල්ලෙන් කටයුතු කළ අයට නඩු පැවරිය යුතුය. නීතිය ඉටු කිරීමට සමත් රටක් බව අන්තර්ජාතිකව අපි පෙන්විය යුතුය.

ඒ සඳහා නිසි පරිදි විමර්ශන පැවැත්විය යුතුයි. නිසි විමර්ශනයකින් කරුණු විමසා නඩු විභාගයකින් අනතුරුව වැරදි කරුවන්ට දඬුවම් දිය යුතුය. එවිට එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් හෝ ගැටලුවක් ඇති නොවේ.

වැරදිකරුවන් කවුද යන්න ජාත්‍යන්තරයට පෙන්වීමට මෙය අපට හොඳ අවස්ථාවකි. මෙවැනි ස්වාධීන අධිකරණයක් මඟින් නඩු විභාගයක් සඳහා මේ අවස්ථාවේදී ඉඩකඩ දීම පාස්කු කොමිසමේ නිර්දේශ මත සත්‍ය ලෝකයට හෙළිදරව් කිරීමට නඩු විභාගය සිදු කිරීමෙන් අනතුරුව ලංකාවට හැකිවෙයි.

එමෙන්ම වින්දිතයන්ට සාධාරණයක් ඉටුවිය යුතුය. එමෙන්ම මෙය කුමන ආකාරයෙන්ද සිදුවූයේද යන්න ලෝකයට හෙළිදරව් කිරීම ඉතා වැදගත්ය. අහිංසක ජනතාවක් එසේ ඝාතනය කළේ ඇයිද යන්න එහිදී හෙළිදරව් වේ.

එසේ නොවන්නට මේ සම්බන්ධයෙන් විවිධ චෝදනා ලංකාවට පැමිණිය හැකියි. මෙහි සත්‍යය හෙළිදරව් කිරීම ජාතියක් ලෙස වැදගත් වන්නා සේම ලෝකය තුළ ශ්‍රී ලංකාවේ හොඳ නම රැකගැනීමට ද අතිශයින්ම බලපාන කරුණක් වෙයි.



# 2020 A/L හපන්නු

• සුභාෂිණී ජයරත්න

## විභාගයට පෙර විෂය නිර්දේශය ආවරණය කළා

**ජීව විද්‍යා අංශයෙන් ප්‍රථම ස්ථානය කොළඹ රාජකීය විදුහලේ මනුජය ප්‍රවීන් විජේසිංහ**



මනුජය ප්‍රවීන් විජේසිංහ මාපියන් සමඟින්

මෙවර ජීව විද්‍යා අංශයෙන් ප්‍රථම ස්ථානය හා දෙවැනි ස්ථානය ලබා ගත්තේ කොළඹ රාජකීය විදුහලේ මනුජය ප්‍රවීන් විජේසිංහ හා විහාන් ධිලක විජේසිංහය. ප්‍රථම ස්ථානය දිනාගත් මනුජය ගේ මව කොළඹ මහානාම විදුහලේ රසායන විද්‍යා ආචාර්යවරියක වන මනෝජා ප්‍රසන්ති ජයසිංහ වන අතර පියා කොළඹ මහ රෝහලේ වෛද්‍ය දමින්ද ප්‍රියාන් විජේසිංහය. ඔහු මෙවර 3.3 ක ඉසෙඩ් අගයක් ලබා ගනිමින් ඒ සාමාර්ථ තුනක් ලබා ගත්තේය.

"මම මුලින්ම ගියේ කේරි විදුහලට. ශිෂ්‍යත්ව විභාගය ලකුණු 171 ක් ලබා ගෙන මහානාම විදුහලට ගියා. එහිදී සාමාන්‍ය පෙළට ඒ 9 ක් ලබා ගෙන කොළඹ රාජකීය විදුහලට ගියා. මම විභාගයට මාස ගණනාවක් තිබියදී විෂය නිර්දේශය ආවරණය කර ඉතුරු කාලයේ ප්‍රශ්න පත්‍ර කරන්න ගත්තා. ඒ වගේම විෂය බාහිර දේ සඳහා වෙස් කළා. ඔන්ලයින් පන්ති නොකඩවාම සහභාගි වුණා වගේම විෂයට අදාළ විදෙස් පොත් පත් පවා කියවා දැනුම ලබා ගත්තා..." මනුජය පවසයි. ඔහුගේ එකම අරමුණ සිය පියා සේ වෛද්‍යවරයකු වීමය.

## අක්කයි මල්ලියි දෙන්නටම ඉහළම තැනක්

**ගණිත අංශයෙන් ප්‍රථමයා යාපනයේ චාවකච්චේරි හින්දු ජාතික විදුහලේ ටී. සුන්දරබවන්**



සුන්දරබවන් සිය ගුරුවරු හා පියා සමඟ

සිය මවටත් පියාටත් ස්ථිර රැකියාවක් නොමැතිවද දුෂ්කර ජීවිතයක් ගත කරමින් මෙවර ගණිත අංශයෙන් ප්‍රථමයා යාපනයේ චාවකච්චේරි හින්දු ජාතික විදුහලේ ටී සුන්දරබවන්ය. ඔහුගේ සහෝදරියද මෙවර ජීව විද්‍යා අංශයෙන් යාපනය දිස්ත්‍රික්කයේ තිස්වැනි ස්ථානයට පත්වීම විශේෂත්වයකි. යාපනයේ චාවකච්චේරියේ ජීවත්වන සුන්දරබවන්ගේ පියා සුන්දරම් කනරාජ්ය; මව සුජාතා කනරාජ්ය. තමන් අධ්‍යාපනයෙන් ඉහළට නොගියද මේ මව පියා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් අසීමිත කැපවීමක් කළහ.

" මම මේ විභාගයට මුහුණ දුන්නේ අසීරුකම් ගොඩාක් මැදයි. කොරෝනා වසංගතය නිසා පාසල් යාමට නොහැකි වුණත් විවිධ ක්‍රමවලින් ගුරුවරු අපිට ඉගැන්වුවා. අපි දුප්පත් වුණත් මගේ අම්මා තාත්තා අත්තා ඇතුළු සියලු දෙනාම මගේ මේ ජයග්‍රහණයට ශක්තියක් වුණා. මම විභාගය කියා එහිම එල්ලිලා හිටියේ නැහැ; ක්‍රීඩා කළා. අන්තර් ජාතික ඔලිම්පියාඩ් තරගවලට සහභාගි වුණා. ඒවායින් පදක්කම් දිනුවා....." සුන්දරබවන් සිසුවා පවසයි. ඔහුගේ එකම අරමුණ ඉංජිනේරුවකු වී රටට සේවයක් කිරීමටය.

## එකම අරමුණ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක් වීමයි

**වාණිජ අංශයෙන් ලංකාවෙන්ම පළමුවැනියා වූ ගාල්ල සංඝමිත්තා විදුහලේ අමන්දි ඉමාෂා මදනායක**



අමන්දි ඉමාෂා මදනායක සිය විදුහල්පතිනි, අංශ ප්‍රධාන ගුරුතුමා, මව සහ පියා සමඟ

ගාල්ල සංඝමිත්තා විදුහලේ අමන්දි ඉමාෂා මදනායක මෙවර ලංකාවෙන්ම පළමු වැනියා වූයේ වාණිජ අංශයෙන් විභාගයට පෙනී සිටිමිනි. ගාල්ල සංඝමිත්තා බාලිකා විදුහල ප්‍රදේශයේ කීර්තිමත් කාන්තා විදුහලක් වන අතර පසුගිය වසර කිහිපය පුරාවට උසස් පෙළ, සාමාන්‍ය පෙළ හා ශිෂ්‍යත්ව විභාගයෙන් ජයග්‍රහණ රැසක් හිමිකර ගත්තේය. ගාල්ල ඉමදූවේ පදිංචි අමන්දිගේ මව යමුනා හේවාවිතාරණය පියා සි. ඩී. මදනායකය. දෙදෙනාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැකියාව කරන අතර එකම සහෝදරයා පරිගණක ඉංජිනේරුවරයෙකි.

" මම එක වසරේ සිටම ගියේ ගාල් සංඝමිත්තාවට. ශිෂ්‍යත්වයෙන් 172 ක් ලකුණු ලබා ගත්තා. සාමාන්‍ය පෙළ විභාගයට ඒ 9 ක් ලබා ගත්තා.

ඒ අතර විෂය බාහිර වැඩ කටයුතු රැසකටත් මුල් තැන දුන්නා. පාසලේ විවිධ සමාජවලට මෙන්ම ශ්‍රී ලංකා විනිමය හා සුරකුම්පත් කොමිසමේ තරගවලට මුහුණ දී ජයගත්තා. ඒ වගේම පන්තියේ විභාගවලින් මුල් තුන් දෙනා අතර සිටියා.

පාසලේ අධ්‍යාපන කටයුතු වගේම උපකාරක පන්තිවල ඔන්ලයින් ඉගැන්වීම් කටයුතු අතපසු නොකර කර ගෙන ගියා. මගේ ජයග්‍රහණයට පාසලේ විදුහල්පතිතුමිය හා ගුරුවරු ලබා දුන් සහය විශාලයි...." අමන්දි පවසයි. ඇගේ එකම අරමුණ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක් වීමය.

## කොවිඩ් අභියෝගයක් කර ගත්තේ නැහැ.

**කලා අංශයෙන් දිවයිනේ ප්‍රථම ස්ථානය දෙහිවල ප්‍රෙස්බිටීරියන් බාලිකා විදුහලේ චමල්කා සෙව්මිණි**



චමල්කා සෙව්මිණි මවුපියන් සමඟ

කලා අංශයෙන් දිවයිනේ ප්‍රථම ස්ථානය දෙහිවල ප්‍රෙස්බිටීරියන් බාලිකා විදුහලේ චමල්කා සෙව්මිණිය. පසුගිය වසර කොවිඩ් වසංගතයත් සමඟ විභාගය අවස්ථා කීපයකදීම කල් යමින් තිබුණද අභියෝග රැසක් මැද පැවැත් වූ විභාගයේදී චමල්කා සෙව්මිණිට ඉහළ ජයක් ලබා ගන්නට හැකිවිය.

පියා වන ඩබ්ලිව්. වී.සරත්කුමාර රියදුරකු ලෙස ස්වයං රැකියාවක නිරත වෙමින් ඇයගේ පවුලේ අයියාගේත් නංගීගේත් අඩුපාඩු සපුරාලමින් ඇයට මේ ජයග්‍රහණය ලබන්නට පාර කැපුවේය. ඇයගේ මව වන නිලූෂා සඳමාලි අමරසිංහ මේ පාසලේම ආදි සිසුවියකි.

ඇය කලා විෂය ධාරාවට දේශපාලන විද්‍යාව, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය, ගෘහ ආර්ථික විද්‍යාව යන නව නිර්දේශ යටතේ පෙනී සිටි අතර පාසල් වැඩ කටයුතු පමණක් නොව බාහිර කටයුතුත් ඉටු කළාය.

" ඇත්තටම මා කිසේත්ම මෙවැනි ජයග්‍රහණයක් ලැබෙයි කියලා බලාපොරොත්තු වුණේ නැහැ. ඒත් අද මට ඒ ගැන තියෙන සතුට කියා නිම කළ නොහැකියි. මගේ මේ ජයග්‍රහණය අපේ විද්‍යාලයට ලොකු ගෞරවයක්. මේ ජයග්‍රහණයේ පිටුපස මාගේ අම්මා තාත්තා ඇතුළු පාසලේ විදුහල්පතිනිය ඇතුළු ගුරුවරු විශාල කැපවීමක් කළා. අපිව විභාගයට පූර්ව සූදානම් කළ නිසා විභාග වැඩ කටයුතු ගොඩාක් පහසුවුණා.

ඒ නිසා කලා අංශයෙන් ප්‍රථම ස්ථානය වන 2.8319 ක ඉසෙඩ් අගයක් ලබා දිවයිනෙන්ම ප්‍රථම ස්ථානය ලබාගන්න හැකිවුණා." ඇය පවසයි.

## හොරණ තක්ෂිලාවෙන් උසස් පෙළ විශිෂ්ටයෝ දෙදෙනෙක්

මෙවර අපොස උසස් පෙළ ප්‍රතිපල පිටවීමත් සමගම හොරණ තක්ෂිලාව මුල් පෙළේ ජයක් වාර්තා කළේ එම පාසලින්ම ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවෙන් මෙන්ම ජෛව තාක්ෂණවේදය විෂය ධාරාවෙන් ලංකාවේ පළවැනියන් දෙදෙනාම බිහි වීමය. ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවෙන් ලංකාවේ පළමුවැනියා වූයේ ලියනගේ අවිශ්ක චානුකය. ජෛව තාක්ෂණවේදය විෂය ධාරාවෙන් ලංකාවේ පළමුවැනියා වූයේ පුස්සේවෙළ කංකානම්ගේ සුසික සඳසරය.

**ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවෙන් ලංකාවේ පළමුවැනියා හොරණ තක්ෂිලාවේ ලියනගේ අවිශ්ක චානුක**



හොරණ තක්ෂිලාවේ ලියනගේ අවිශ්ක චානුක මව, පියා හා සහෝදරයා සමඟ

අවිශ්ක චානුක බණ්ඩාරගම වැල්මිල්ල ප්‍රදේශයේ පදිංචි අතර පියා ප්‍රියන්ත රත්නවීර ප්‍රේමනාත්ය. මව දිනූෂා කුමාරි මල්ලවාරච්චිය. අවිශ්ක චානුක මූලික අධ්‍යාපනය ලැබුවේ වැල්මිල්ල ශ්‍රී සාරාලංකාර මහ විදුහලෙනි. ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වීමට ලකුණු දෙකක මදිපාඩුවක් තිබුණෙන් හොරණ තක්ෂිලාවට යාමට තිබූ සිහිනය බොඳ විය. ශිෂ්‍යත්ව විභාගයෙන් අනතුරුව ඔහු ඇතුළු වන්නේ බණ්ඩාරගම ජාතික පාසලටය. කෙසේ වෙතත් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට ඒ 9 ක් ලබා ගැනිමට අවිශ්ක චානුකට හැකිවිය. ඉන්පසු ඔහු උසස් පෙළට හැදෑරීමට යන්නේ හොරණ තක්ෂිලා මධ්‍ය මහා විදුහලටය.

" මට සාමාන්‍ය පෙළට ඒ 9 ක් තිබුණා. ඒත් මගේ එකම ආසාව වුණේ තොරතුරු තාක්ෂණ විෂය හැදෑරීමට. මේ නිසා තොරතුරු තාක්ෂණ මෘදුකාංග හා නිර්මාණ තරග ආදියට සහභාගි වුණා. උපකාරක පන්ති ගියත් ඔන්ලයින් අධ්‍යාපන කටයුතු දිගටම කරගෙන ගියා. කවදාවත් පාසල් මග හැරියේ නැහැ. එය මගේ ජයග්‍රහණයට හේතුවක් වුණා....." අවිශ්ක පවසන්නේය. අවිශ්කගේ එකම බලාපොරොත්තුව කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් ව පරිගණක ක්‍රීඩා නිර්මාණ ශිල්පය හැදෑරීමටය.

**ජෛව තාක්ෂණවේදය විෂය ධාරාවෙන් ලංකාවේ පළමුවැනියා හොරණ තක්ෂිලාවේ පුස්සේවෙළ කංකානම්ගේ සුසික සඳසර**



සුසික සඳසර මව,පියා හා නැඟණිය සමඟ

සුසික සඳසරගේ මව ටිරුණි පතිරණය. ඇය පාණදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරිනියකි. පියා කණිෂ්ක කරුණාරත්නය ඔහු පොලිස් විදුහල් සැරයන් වරයෙකි. එකම සහෝදරිය පාණදුර බාලිකාවේ අධ්‍යාපනය ලබන්නිය. කළුතර දකුණ ඉසුරු උයනේ පදිංචි සඳසර සාමාන්‍ය පෙළ විභාගය තෙක් අධ්‍යාපනය ලබන්නේ කළුතර තිස්ස විදුහලේය.

" මම සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගත්තේ කළුතර තිස්ස විදුහලේ. ශිෂ්‍යත්වයෙන් ලකුණු 162 ක් ගත්තා. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඒ 8 හා බී 1 ක් ගත්තා. වෙන විෂය ධාරාවකට යාමට හැකි වුවත් මගේ ආසාව තිබුණේ කෘෂි- ජාන විද්‍යා තාක්ෂණවේදය හැදෑරීමටයි. මම විෂයයන් දෙකකට උපකාරක පන්ති ගියා. කොරෝනා නිසා විභාගය පහසු වෙයි කියා හිතුවක් තරමක් අමාරු වුණා. ඒත් කොහොම හරි හොඳින් කළා. මගේ එකම ආසාව ජාන තාක්ෂණවේදය හැදෑරීමට ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමටයි. " සඳසර පවසයි.

**පසුබිම් කතා සහ සේයාරූ**
• අසේල කුරුළුවංශ
• සිරංගිකා ලොකුකරවිට (කරාපිටිය සමූහ)
• අශ්රෆ් ඒ සමාඩ් (දෙහිවල / ගල්කිස්ස වාර්තාකරු) • සුමිති කණගරාජා (යාපනය සමූහ වාර්තාකරු)

## සැත්කම් 27 කට මුහුණ දී ඉහළම දස්කම්



සැත්කම් 27 කින් අනතුරුව මෙවර උසස් පෙළ විභාගයට මුහුණ දුන් දිරිය දියණියක් වූ වත්සලා කුමාරි ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළට මුහුණ දී ඒ සාමාර්ථ 2 ක් හා බී සාමාර්ථයක් ලබා ගනිමින් ඉහළ ජයක් වාර්තා කළේ සමස්ත දරු පරපුරටම ආදර්ශයක් ගෙන දෙමිනි. ඇය මහනුවර ස්වර්ණමාලි බාලිකා විදුහලින් සාමාන්‍ය පෙළ හදාරා ඒ 8 ක් හා බී 1 ක් ලබා ගනිමින් උසස් පෙළ හැදෑරීමට පිවිසෙන්නේ මහනුවර උසස් බාලිකාවටය.

ඇය උපතින්ම ආබාධ රැසක් සහිතව උපදින අතර ඇගේ මුල්ම සැත්කම සිදුවන්නේ මාස තුනෙනි. උසස් පෙළ විභාගයට මාස දෙකකට පමණ පෙර ඇය ඇගේ 27 වැනි සැත්කම අවසන් කරන්නීය. ඇයගේ දකුණු අතේ ආබාධයක් ඇති අතර ඒ සඳහා සැත්කම් 20 ක්ද, මුඛයේ සැත්කම් 7 ක්ද සිදුවන්නේ විටින් විටය. එවන් ආබාධ සහිතව සිය ජීවිතය ජයගත් මේ දියණිය සමස්ත දරු පරපුරටම ආඩම්බරයකි.

● සුභාෂිණී ජයරත්න

# කවදාවත් නොවිඳි අත්දැකීමක් විඳි අධ්‍යාපන බලධාරියෝ

**මාරාන්තික කොවිඩ් වයිරසයේ දෙවැනි රැල්ලට අභියෝගයක් වෙමින්, දරුවන් වෙනුවෙන් අධ්‍යාපන බලධාරීන් කොවිඩ් හමුවේ මෙතෙක් ගත් අසීරු තීරණයක මල්ඵල ගන්වමින් පසුගියදා උසස් පෙළ විභාගයේ ප්‍රතිපල නිකුත් විය. ලාංකීය විභාග ඉතිහාසයේ අභියෝගාත්මක පරිසරයක් මැද සිසුන් මුහුණ දුන් එකම උසස් පෙළ විභාගය ලෙස ඉතිහාසගත වන්නේද පසුගිය ඔක්තෝම්බර් මස පැවැත්වූ උසස් පෙළ විභාගයය. විභාගය පැවැත්වීමේ සිට උත්තර පත්‍ර පරීක්ෂාව, පිළිතුරු නිකුත් කිරීම දක්වා වූ බාර ධූර කර්තව්‍යයේදී විභාග හා අධ්‍යාපන බලධාරීන් ජාතියේ දරුවන් වෙනුවෙන් පෙනී සිටියේ කිසිදු දරුවකුට අසාධාරණයක් නොවන පරිදි හැකි ඉක්මනින් විභාග ප්‍රතිඵල නිකුත් කරන්නටය.**

කොවිඩ් මැද පැවැත්වූ මේ අභියෝගාත්මක විභාගයේදි අමතක නොවූ එක් අත්දැකීමක් වූයේ උදේ විභාගයට මුහුණ දුන් දරුවා සවසට කොවිඩ් රෝගියකු ලෙස හඳුනා ගැනීමය.

එසේම මේ දරුවන් සමඟ උරෙන් උර ගැටෙමින් විභාග කටයුතු කළ කාර්ය මණ්ඩලයද අවදානම කරට ගත්තේ දරුවන්ගේ මානසිකත්වය බිඳ නොවැටෙන්නටය. විභාගයට දින නියම කර ගන්නට උත්සහ කළ මොහොතක් මොහොතක් පාසා අධ්‍යාපන හා විභාග බලධාරීන්ට විඳින්ට සිදුවූ හා පැමිණි බාධා එකක් දෙකක් නොවේ. දිනෙන් දින හමායන කොවිඩ් රැල්ල හමුවේ තෙවරක්ම විභාගය කල් දමන්නට සිදු වූ අතර, අවසානයේ කුමන බාධා පැමිණියද තවත් එක් වරක් හෝ කල් නොදමන්නට අධ්‍යාපන ඇමැති, අධ්‍යාපන ලේකම් හා විභාග කොමසාරිස් ජනරාල්වරයා එක් තීරණයකට පිවිසියේ දරුවන් ඒ වන විට පත්ව තිබූ මානසිකත්වය හඳුනාගත් නිසාය.

" අවසානයේ උසස් පෙළ විභාගයට දින නියම කර ගත්තේ ඔක්තෝම්බර් 12 වැනිදා. ඒත් ඔක්තෝම්බර් 3 වැනිදා බ්‍රැන්ඩික්ස් පොකුර මතුවුණා. ඒ වන විට පොලිස් බල ප්‍රදේශ 19 ක් හුදකලා කළා. ගම්පහ, බස්නාහිර පාසල් වැසුවා. යම් යම් අය කතා කර කිව්වා මේ තත්ත්වය මැද විභාගය පවත්වන්න එපා කියා. එත් දරුවෝ වෙනුවෙන් අපි ආපස්සට ගියේ නැහැ. විභාගයට ආසන්න වෙද්දී සෞඛ්‍ය අංශ මගින් කිව්වා ගම්පහ ළමයින්ට කොළඹට එන්න දෙන්න බැහැ කියා. අපි තවත් අපහසුතාවකට පත්වුණා. මම මේ දින කිහිපයේම ඒ හැම ප්‍රදේශයකටම ගිහින් අවශ්‍ය කටයුතු සොයා බැලුවා. දිනෙන් දින කොවිඩ් වැඩි වෙද්දී අපි පළාත් බලධාරින්ට ශක්තියක් ලබා දෙමින් විභාගයට අවශ්‍ය කටයුතු සූදානම් කළා. විභාග කොමසාරිස් සමග එක්ව දිනපතාම එන බාධාවලට පිළියම් යෙදුවා. කොවිඩ් දරුවන් වෙනුවෙන්, නිරෝධායනය වන දරුවන් වෙනුවෙන් අතිරේක මධ්‍යස්ථාන සූදානම් කළා. විභාග දිනවල එක පාරටම යම් යම් ප්‍රදේශවලින් කොවිඩ් රෝගීන් මතු වුණා. සමහර දරුවන්ට ප්‍රශ්න පත්‍ර පවා නොලැබුණා. අපි ඒවා ෆෝටෝ කොපි කර සිසුන්ට ලබා දුන් අවස්ථා තිබුණා....විභාගය පැවැති ඒ දින 22 අපිට විශාල අභියෝගාත්මක කාලයක් වුණා..." ඒ අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල සි. පෙරේරාය.

කොතෙක් බාධා පැමිණියද විභාග කොමසාරිස් ජනරාල්වරයා පැවැසුවේ දරුවන් විභාගයට පැමිණිම 100% ක් වූ බවය.

" කොවිඩ් නිසා සෞන්දර්ය හා තාක්ෂණ ප්‍රායෝගික පරීක්ෂණවලට පෙනී සිටීමට නොහැකි වූ සිසුන් සිටියා. ඒ සිසුන් සුවවී ප්‍රායෝගික පරීක්ෂණ සඳහා පැමිණෙන තෙක් බලා සිටින්නට අපට සිදුවුවා. එසේ නැති වූයේ නම් මීට දින 30 කට පෙර ප්‍රතිඵල දීමට අපට හැකිවුණා. ඒ වගේම ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍ර ඇගයීමේදි ප්‍රමාණවත් පරීක්ෂකවරු සිටියේ නැහැ. එයත් අභියෝගයක් වුණා.." ඒ විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිතය.






වමේ සිට, අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.ඇල් පීරිස්, අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල සි. පෙරේරා, විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත සහ විවෘත විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නලින් අබේසේකර

බැරෑරුම්කම දැනුනත් විභාග රාජකාරි අතහැර නොයන්නට කැපවූ කාර්යය මණ්ඩලයට කොවිඩ් දීමනාවක් ලබා දීමටද කටයුතු කළේ ඔවුනගේ කැපවීම අගය කරන්නටය. මේ සියලු කටයුතු සම්පාදනය වූයේ අධ්‍යාපන ඇමැති ජී.එල් පීරිස් ගේ නායකත්වයෙනි. විභාග දෙපාර්තමේන්තුව විභාගය පැවැත්වීමෙහිලා ගත් ක්‍රමවේද පැයෙන් පැයට යාවත්කාලීන කළේ කොවිඩ්වලට අභියෝග කරමිණි.

" අපේ කාර්ය මණ්ඩල කොවිඩ් නොදැන දරුවා ළඟින් ආශ්‍රය කළා. සමහර දරුවන්ගේ මුළු පවුලම කොවිඩ්. ඒ දරුවන්ව විභාග මධ්‍යස්ථාන වලට ගේන්න කවුරුත් කැමැති නැහැ. සමහර විට පොලීසියේ අයට සිදු වෙනවා මේ දරුවන්ව විභාග මධ්‍යස්ථාන වලට ගේන්න..." එදා පළාත් අධ්‍යාපන බලධාරින් දරුවන්ගේ දුක් බලධාරීන්ට දැන්වූයේ ඒ ආකාරයෙනි.

විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත

**• විභාගයට පෙර දිනත් අභියෝග ආවා**

**• දුරස්ථ අධ්‍යාපනයෙන් ප්‍රසිද්ධ විභාගයට මුහුණ දුන් ප්‍රථම අවස්ථාව**

**• අපේ දරුවෝ ඒ අභියෝග ජය ගත්තා**

සියලු අභියෝගයන්ට මුහුණ දුන් අතර ඔහුගේ එකම අරමුණ වූයේ දරුවන්ගේ විභාගය පවත්වා හැකි පමණ ඉක්මනින් ප්‍රතිඵල ලබා දෙන්නටය. මෙවර උසස් පෙළ විභාගයට නව නිර්දේශය යටතේ සිසුන් 277,625 දෙනෙකු පෙනී සිටි අතර එයින් 178,337 දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඇයැදුම් කිරීමට සුදුසුකම් ලැබීය.

එසේම පැරණි නිර්දේශය යටතේ ඇයැදුම්කරුවන් 24,146 දෙනෙ විභාගයට පෙනී සිටි අතර එයින් 15,560 දෙනෙක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීය.

ඒ අනුව සුදුසුකම් ලැබූ සංඛ්‍යාව 64.39% කි. මේ අතර විභාගයේ ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම සඳහා විභාග තහංචි පෙර ආකාරයෙන්ම පැනවූ අතර 86 දෙනෙකුගේ ප්‍රතිඵල අත් හිටුවීමට විභාග දෙපාර්තමේන්තුවට සිදුවිය.

විභාග ඉතිහාසයේ ඔන්ලයින් හෙවත් දුරස්ථ අධ්‍යාපනය හරහා සිසුන් ප්‍රසිද්ධ විභාගයකට ලියූ මුල්ම අවස්ථාවද මෙය වෙයි. කොවිඩ් වසංගතය හමුවේ පාසල් වැසුණු දා සිට සිසුන්ට දුරස්ථ අධ්‍යාපන මෙවලම් ඔත්සේ අධ්‍යාපන කටයුතු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සියලු පසුබිම සැකසීය. දුරස්ථ අධ්‍යාපනයේ සාර්ථකත්වය පිළිබඳ සිළුමිණට අදහස් දැක්වූයේ විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යන අංශයේ මහාචාර්ය නලින් අබේසේකරය.

" පසුගිය උසස් පෙළ විභාගයට පෙනී සිටි දරුවන්ට 2019 වසරේ පාස්කු ප්‍රහාරයත් 2020 වසරේ කොවිඩ් නිසාවෙනුත් පාසල් ගමන අත්හිටවුණා. මේ දරුවෝ ප්‍රථම වරට ජාතික විභාගයකට මුහුණ දුන්නේ අසීරු කාලයක් පසු කරලයි. උසස් පෙළ සුනදරත්වය මේ දරුවන්ට අත්විඳින්ට ලැබුණේ නැහැ. මේ තත්ත්වයේ වින්දිතයන් බවට සාමාන්‍ය පෙළ හා ශිෂ්‍යත්ව දරුවනුත් පවත්වුණා. කෙසේ වෙතත් කොවිඩ් නිසාවෙන් අපේ රටේ අධ්‍යාපනය ඇරඹීමට රජය ගත් මේ ප්‍රතිපත්ති ඇත්තෙන්ම සාර්ථකයි. විභාග දෙපාර්තමේන්තුව

පවා විභාගයේ ප්‍රමිතිය ආරක්ෂා කරන්න කටයුතු කළා. මේ දරුවෝ විශ්වවිද්‍යාලයට පිවිසිමේදි විශේෂ සැලකිල්ලක් මේ අය වෙනුවෙන් යෙදිය යුතුයි.

විශ්වවිද්‍යාල නම්නීකරණ පාඨමාලාව පවා මේ දරුවෝ වෙනුවෙන් විශේෂයෙන් සැකසිය යුතු වෙනවා...."මහාචාර්ය නලින් අබේසේකරය.

මෙවර විභාගයේදි දරුවන්ගේ කැපවිම, අධිෂ්ඨානය මෙන්ම බාධක ජය ගැනිමේ හැකියාව අපි අගය කළ යුතුමය. ඇය කොළඹ මියුසියස් විදුහලේ වාණිජ අංශයෙන් ඉසෙඩ් ලකුණු 2.2 ක් හා ඒ සාමාර්ථ 3 ක් ලබා ගත් සමාදි සුමනරත්න දියණියගේ මවය. දුරස්ථ අධ්‍යාපනය ඔත්සේ දරුවන්ගේ ඉගැන්වීම් දෙමවුපියන්ට අභියෝගයක් මෙන්ම අත්දැකීමක්ද වුයේ මේ ආකාරයෙනි.

" උසස් පෙළ පන්තිවල අපේ දරුවන්ට ඉගෙන ගන්න ලැබුණේ සීමිත කාලයක් පමණයි. ඒ දරුවෝ මේ භාරදූර වගකීමට මුහුණ දුන්නේ වෙනස්ම ආකාරයෙන්. ඇත්තෙන්ම ඔන්ලයින් අධ්‍යාපනය අපිට ලොකු අත්දැකීමක් වුණා. ඒත් දරුවෝ ඒ සියල්ලම සාර්ථකව කළා. පාසල් අධ්‍යාපනය මෙන් සාර්ථක නොවුණත් අසාර්ථකත්වයක් ඒ තුළ තිබුණේ නැහැ. අපේ අධීක්ෂණය යටතේ මේ දරුවන් මෙහෙයවන්න අපිට හැකිවුණා. මේ ජයග්‍රහනය දරුවන්ට හිමි විය යුතුවා සේම බාධක මැද දරුවන්ට ඉගැන්විම් කළ ගුරුවරුන්ටත් එහි ගෞරවය හිමිවිය යුතුයි......" මේ මව පවසන්නීය.

# කෘෂි ඉතිහාසයේ යෝධ පිම්මක්

## රුපියල් කෝටි 12,000 ක් රටට වසරකට ඉතිරි වෙයි

## රසායනික පොහොර කෘමිනාශක නොමැති ලොව ප්‍රථම රට බවට අපේ රට පත්කරන්න ජනපති තීරණය කරයි

● නිහාල් පී. අබේසිංහ


**මෙරට ඉතිහාසයේ පමණක් නොව ලොව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අලුත් වාර්තාවක් තබමින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ප්‍රමුඛ ඇමැති මණ්ඩලය ඓතිහාසික තීරණයකට එළඹ ඇත. ඒ වනාහි වසරකට රුපියල් කෝටි 12,000 ක් ප්‍රතිලාභ අපේ රටේ සියලු ජනතාවට හිමිවන හා සෞභාග්‍යවත් දේශයක් ගොඩනංවන පරිදි රසායනික පොහොර, වල්නාශක හා කෘමිනාශක මෙරටට ගෙන්වීම තහනම් කිරීමට ගත් සුවිශේෂී තීරණයයි. මේ අනුව රසායනික පොහොර භාවිතය මුළුමනින්ම ඉවත් කළ ලෝකයේ පළමු රට බවට ශ්‍රී ලංකාව පත් කිරීමේ අභියෝගය භාර ගන්නා බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් අවධාරණය කරයි.**

රසායනික පොහොර භාවිතයෙන් ඉවත් වූ කිසිදු රටක් ලෝකයේ නැතිවීම අරමුණට ළඟා වීමට බාධාවක් නොවේ. කථා කර කර නොසිට ගොවියා දැනුම්වත් කර වගා බිමට බැස නිරෝගීමත් පරපුරක් බිහි කිරීමට එක්වන්නැයි ජනාධිපතිතුමා සියලු දෙනාගෙන් ඉල්ලා සිටී.

"නිරෝගීමත් සහ ඵලදායී පුරවැසියෙක් බිහි කිරීමට රජය විසින් වස විසෙන් තොර ආහාර වේලක් සඳහා ජනතාවට ඇති අයිතිය සහතික කළ යුතුය. ඉදිරි දශකය තුළ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා මුළුමනින්ම කාබනික පොහොර යොදා ගැනීමට ඒ නිෂ්පාදන වේගවත් කළ යුතුය." යන්න "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ පොරොන්දුව විය.

එය යථාර්ථයක් බවට පත්කිරීමේ අඩිතාලම දමමින් දේශගුණික විපර්යාසයන්ට තිරසර විසඳුම් සහිත හරිත සමාජ - ආර්ථික රටාවක් අරමුණු කර ගනිමින් විසි වැදෑරුම් අමාත්‍ය මණ්ඩල සන්දේශය පසුගියදා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබ එය අනුමත කළේය.

### රසායනික පොහොර කෘමිනාශක තහනම අපි අත් දෙකම උස්සා අනුමත කරනවා



- කවුඩුල්ලේ ගොවි නායක එම්.කේ. ජයතිස්ස

ශ්‍රී ලංකාව රසායනික පොහොර ආනයන සඳහා 2019 දී ඩොලර් මිලියන 221ක් වැය කළේය. තෙල් මිල වැඩිවීම සමඟ එම වියදම ඩොලර් මිලියන 300 - 400 අතර ප්‍රමාණයකින් ඉහළ යනු ඇත. රසායනික පොහොර, වල් නාශක සහ පළිබෝධ නාශක සඳහා අතිවිශාල වියදමක් කළ ද කෘෂිකාර්මික නිෂ්පාදනයෙහි ගුණාත්මක වර්ධනයක් සිදුව නැතැයි ජනාධිපතිතුමා පෙන්වා දෙයි.

පස නිසරු වී අස්වැන්න අඩුවීමත්, ජෛව විවිධත්වය විනාශවීමත් දක්නට තිබේ. රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතය ගංගා, ඇළ දොළ ජලය දූෂණය කරන අතර ගුණාත්මක පානීය ජල සම්පාදනයට ප්‍රබල අභියෝගයක් වී ඇත. වකුගඩු, පිළිකා ඇතුළු බෝ නොවන රෝග රැසකට රජය විසින් දරන වියදම වාර්ෂිකව ඉහළ යමින් පවතී. ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය මාර්ග අහිමිවීම, සෞඛ්‍ය තත්ත්වය දුර්වලවීම සහ ජනතාවගේ ඵලදායීතාව අඩුවීම රට මුහුණ දෙන අභියෝගයක් බවට පත්වී ඇත.

රසායනික පොහොර භාවිතය අත්හැරීමෙන් නිෂ්පාදනය අඩුවනු ඇතැයි ගොවීන් කල්පනා කිරීමට පිළිවන. එසේ වන්නේ නම් රසායනික පොහොර සහනාධාරයට වාර්ෂිකව වැය කෙරෙන රුපියල් බිලියන 50ක මුදලින් අඩුවන ආදායම ගෙවන බවට ජනාධිපතිතුමා සහතික වෙයි. අභියෝගය ජය ගැනීමට තමා පෞද්ගලිකව ගොවි ජනතාව අතරට පැමිණීමට සූදානම් යැයි ද ජනාධිපතිතුමා පැවසීය.



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් හා ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂයන් රසායනික පොහොර තහනම් කිරීම පිළිබඳ සාකච්ඡාවට එක්වූ අවස්ථාව

දිස්ත්‍රික් මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදන දිරි ගැන්වීමට අවශ්‍ය සියලු පහසුකම් නිෂ්පාදකයන්ට සැපයීමට රජය සෘජුව මැදිහත්වන බව ද ජනාධිපතිතුමා සඳහන් කළේය.

කෘෂි ක්ෂේත්‍රයේ නිරත බොහෝ පිරිසකට සංවේදී විෂයයක් බැවින් විරෝධතා පැමිණිය හැකිය. ආගමික නායකයන්, ගොවි සංවිධාන, වෘත්තිකයන්, පර්යේෂකයන්, රාජ්‍ය නිලධාරීන්, මාධ්‍ය සහාය සහ සියලු පාර්ශ්ව එක්වීමෙන් අරමුණට පහසුවෙන් ළඟාවිය හැකි බව ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂයන් සඳහන් කළේය.

මෙරට ගොවි පවුල් ලක්ෂ 18.5කට සෘජුව හා අපේ රටේ ලක්ෂ 200 ක්වූ සියලු ජනතාවට පොදුවේ සෙත සලසන මේ සුවිශේෂී කටයුත්ත මෙරට කෘෂි ක්ෂේත්‍රයේ පමණක් නොව පාරිසරික හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල ප්‍රවර්ධනයට මෙන්ම නිරෝගීමත් පුරවැසියන් බිහි කිරීමට ප්‍රයෝජනවත් වන බව කෘෂි විද්‍යාඥයෝ පවසති.

ජනාධිපතිතුමා පවසන පරිදි ඉදිරියේ ඛනිජ තෙල් මිල වැඩි වුණොත් අපේ රටට රසායනික පොහොර ගෙන්වීමට වසරකට රුපියල් කෝටි 8000 ක් පමණ වැය වේ. එමෙන්ම අපේ රටේ පොහොර සහනාධාරය වෙනුවෙන් රජය වසරකට රුපියල් කෝටි 5000 ක වඩා වැය කරයි.

### වකුගඩු රෝග අඩු වෙයි; පරිසර දූෂණය අවම වෙයි; වස විස නැති ආහාර ලැබෙයි



- පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය උපුල් ගලප්පත්ති

ජාතික පොහොර ලේකම් කාර්යාලීය සංඛ්‍යා ලේඛන අනුව අපේ රටට වසරකට සාමාන්‍යයෙන් පොහොර මෙට්‍රික් ටොන් 1260000ක් පමණ අවශ්‍ය වේ. ඒ සඳහා වාර්ෂිකව වැයවන මුදල රු. කෝටි 5600 කි. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සංඛ්‍යා ලේඛන අනුව වසරකට අපේ රටට පළිබෝධනාශක වල්නාශක මෙට්‍රික් ටොන් 5500 ක් පමණ ගෙන්වනු ලැබේ. ඒ සඳහා වසරකට වැයවන මුදල රු. කෝටි 900 ක් පමණ වේ.

එම කාර්යාලයේ කටයුතු පිළිබඳ කළ විගණක පරීක්ෂණය අනුව හෙළිවී ඇත්තේ මෙරටට ගෙන්වන කෘමිනාශකවල හා වල්නාශකවල අන්තර්ගත විෂ ද්‍රව්‍ය 200 න් මෙරටදී පරීක්ෂා කරනු ලබන්නේ විෂ වර්ග 18ක් පමණක් බවයි.

### මේ අභියෝගය බාර ගන්න දෙපාර්තමේන්තුව සූදානම්



- කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය වීරකෝන්

සෞඛ්‍ය රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන වසර ගණනාවක් කළ පර්යේෂණ අනුව මෙරට අනුරාධපුරය, පොලොන්නරුව, කුරුණෑගල, පුත්තලම, මොනරාගල ඇතුළු දිස්ත්‍රික්ක 12ක නිදන්ගත වකුගඩු රෝගය දැන් වැඩිවෙමින් තිබේ.

දැනට නිල නොවන සංඛ්‍යා ලේඛන අනුව මෙරට වකුගඩු රෝගීන් 145,000ක් පමණ සිටින බව පර්යේෂකයෝ පවසති. එමෙන්ම පුද්ගලයන් 24,000 ක් පමණ මේ නිසා ජීවිතක්ෂයට පත්වී ඇති බවද පර්යේෂණ දත්ත අනුව හෙළිවෙයි.

මෙම රෝගයට ප්‍රධාන හේතුවක් වන්නේ රසායනික පොහොරවල වල් නාශකවල කෘමිනාශකවල අඩංගු විෂ රසායනික බවට මේ ගැන පර්යේෂණ කරන එතෙර මෙතෙර පර්යේෂකයෝ පවසති.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්. වීරකෝන් පවසන පරිදි මේ මගින් වස විස නැති ආහාර රටටම ලැබෙන අතර වකුගඩු රෝගය, නිල් දරු උපත් අවම වීම සිදු වේ.

මේ සියලු කරුණු අනුව ජනපති හා ඇමැති මණ්ඩලය ගත් තීරණ අනුව මේ නව තීරණය නිසා රටට වාර්ෂිකව රුපියල් කෝටි 12,000 - 14,000 අතර මූල්‍ය ප්‍රතිලාභ ද ලැබේ.

"අපිට මේක අභියෝගයක්. ඒත් අපි මේ අභියෝගයට සාර්ථකව මුහුණ දෙනවා. දැනට අප සතුව ඇති කාබනික පොහොර ඒකක දියුණු කරන අතර පාරම්පරික වල්නාශක ද, පළිබෝධනාශක ද තව නිපදවා ව්‍යාප්ත කරනවා." ආචාර්ය වීරකෝන් පවසයි.

අලුත් තොරතුරු අනුව අපේ රටට වී වගාව සඳහා පොහොර මෙට්‍රික් ටොන් 383000 ක් හා අනෙක් බෝග වලට පොහොර මෙට්‍රික් ටොන් 877054 ක් ගෙන්වන බව ජාතික පොහොර ලේකම් කාර්යාලයේ හිටපු අධ්‍යක්ෂ හා පොහොර පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මහේෂ් ගම්මන්පිල පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන පොදු ජන පෙරමුණේ මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඉංජිනේරු නාලක කෝට්ටේගොඩ පවසන්නේ අපේ පොහොර භාවිතය ඕස්ට්‍රේලියාවේ මෙන් පස් ගුණයක් පමණ වන බවයි. නමුත් අපේ අස්වැන්න ඕස්ට්‍රේලියාව මෙන් සියයට 50ක් පමණක් බවත් ඔහු පවසයි.

දකුණු ආසියාවේ වැඩියෙන්ම රසායනික පොහොර භාවිතා කරන රට තමයි ශ්‍රී ලංකාව. අපි හෙක්ටයාර් එකට කිලෝග්‍රෑම් 284ක් රසායනික පොහොර භාවිතා කරනවා. බංග්ලාදේශය අපිට යටින් තියෙන රට. ඔවුන් හෙක්ටයාර් එකට කිලෝග්‍රෑම් 264ක් පමණ භාවිත කරනවා. නමුත් ඉන්දියාව, ඕස්ට්‍රේලියාව වගේ රටවල් අපි තරම් රසායනික පොහොර භාවිත කරන්නේ නැහැ. ඉන්දියාවේ හෙක්ටයාර් එකට කිලෝග්‍රෑම් 153යි භාවිත කරන්නේ. ඕස්ට්‍රේලියාවේ භාවිත කරන්නේ හෙක්ටයාර් එකට කිලෝග්‍රෑම් 64යි. අපිට වඩා සාපේක්ෂව දෙගුණයක වැඩි අස්වැන්නක් ලබාගන්නවා. ඒ නිසා රසායනික පොහොර ඉවත් කරලා කාබනික පොහොර භාවිත කිරීම මැජික් එකක් නෙමෙයි. කරන්න පුළුවන් නිසි ක්‍රමවේද සහ අනිකුත් පියවරයන් නීති රීති ඇතුව ක්‍රියාත්මක කරන්න පුළුවන්." මන්ත්‍රීවරයා පවසයි.

### අපි දමන පොහොර ප්‍රමාණය ඕස්ට්‍රේලියාව මෙන් පස් ගුණයක්; ඒත් අපේ අස්වැන්න සියයට 50ක් අඩුයි



- පාර්ලිමේන්තු මන්ත්‍රී නාලක කෝට්ටේගොඩ

කෘෂිකර්ම අමාත්‍යාංශයේ මේ සම්බන්ධව ඉදිරි කටයුතු පිළිබඳව කරුණු පැහැදිලි කරන කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ පවසන්නේ කාබනික පොහොර නිපදවීම දිරි ගැන්වීමට ලබන වසරට රුපියල් කෝටි 100ක් වෙන්කර ඇති බවයි.

කාබනික පොහොර මහා පරිමාණයෙන් නිපදවීමට නිෂ්පාදකයන් 19ක් මේ ව්‍යාපෘතියට ළඟදීම එක්කර ගන්නවා. කොමර්ෂල් පොහොර සමාගම කාබනික පොහොර නිෂ්පාදන හා සැපයුම සඳහා වන මහා පරිමාණ ආයතනයක් ලෙස ස්ථාපිත කරනවා. ඒ සමගම සෑම ගොවිජන සේවා කොට්ඨාසයකටම පොහොර ලේකම් කාර්යාලයේ අනුයුක්ත සංවර්ධන නිලධාරීන් 562ක් පත්කරනු ලබනවා.

ඊට අමතරව පළාත් පාලන ආයතන 341ක් මගින් දිනපතා එකතු වෙන කසළ යොදාගෙන කාබනික පොහොර ඒකක 341ක් බිහිකරන බවත් අමාත්‍යවරයා පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන පොදුජන පෙරමුණු හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී උපුල් ගලප්පත්ති පවසන්නේ අපේ රටේ පිළිකා හා වකුගඩු රෝගත් අවම කිරීමට ගත් මේ ඓතිහාසික තීන්දුවට සියලු දෙනා සහාය දිය යුතු බවයි.

### ලබන වසරේ සිට කාබනික පොහොර නිපදවීමට කෝටි 100ක් වෙන් කරනවා



- කෘෂි ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ

අපේ රටේ වර්තමානයේ දවසකට අලුතෙන් පිළිකා රෝගීන් 64ක් පමණ හඳුනා ගන්නවා. ඉන් 38ක් පමණ දවසකට මිය යනවා. 2018 වසරේදී අලුතින් පිළිකා රෝගීන් 23,530ක් හඳුනාගෙන තියෙනවා. ඒකෙන් 14,000ක් පමණ මිය ගිහින් තියෙනවා. වකුගඩු රෝගීන් ගත්තොත් එහෙමයි අනුරාධපුරය, පොළොන්නරුව, හම්බන්තොට යන දිස්ත්‍රික්ක වකුගඩු රෝගීන් බහුල කලාප බවට පත්වෙලා තියෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි විෂ රසායනික ද්‍රව්‍ය සහ බැර ලෝහ ජලයට එකතු වීම. ඒකට ප්‍රධානතම දායකත්වය සපයන්නේ රසායනික පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය. ඒ නිසා අපේ මේ තීරණය ගත්තේ ඉතා අපහසුවෙන්. මේ ජනාධිපතිතුමා ගත් තීරණයට අපි ඉතා ගරු කරනවා. මෙය මේ රටේ උපන් නූපන් දරුවන් වෙනුවෙන් ගත්ත ඓතිහාසික තීන්දුවක් යැයිද මන්ත්‍රීවරයා පවසයි.

මේ පිළිබඳව අපට කරුණු දැක්වූ ප්‍රගතිශීලී ගොවි ජන සම්මේලනයේ සභාපති කවුඩුල්ලේ ගොවි නායක එම්.කේ. ජයතිස්ස පවසන්නේ මේ තීන්දුව ගත්ත එක වටිනා පියවරක් බවයි. මේක අත් දෙකම උස්සලා අපි අනුමත කරනවා ඔහු පවසයි.

මේ කාබනික ගොවිතැන මගින් මේ පොළොව සුවපත් කරපු කට්ටියක් ඉන්නවා. ඒ අය අතීතයේ හුදෙකලා ලෙස මේ වැඩේ කරගෙන ආපු ආකාරය සොයා ගත යුතුයි. අපි විශ්වාස කරනවා මේකට සම්බන්ධ සේරම අය එකතු වෙලා මේ වැඩේට ආදරෙන් මේ කටයුත්ත කළොත් මේක අපට ජය ගන්න පුළුවන් අවුරුදු දෙකක් ඇතුළත. ආණ්ඩුව අදියර තුනකින් හතරකින් පිළිවෙළට මේ වැඩේ කළ යුතුයි.

මේ සඳහා සම්බන්ධ විය යුතු අමාත්‍යාංශ 9ක් තිබෙනවා. කෘෂිකර්ම, මහවැලි, ඉඩම්, වාර්මාර්ග වැනි ඒ අමාත්‍යාංශවල නිලධාරීන් බලධාරීන් එක්වී මේ පොහොර තහනමට සහාය දැක්විය යුතු බවද ජයතිස්ස මහතා පවසයි.

# මන්ත්‍රී සංජීව එදිරිමාන්නගෙන් කළුතරට තවත් කොවිඩ් ප්‍රතිකාර වාට්ටුවක්

● රසික කොටුදුරගේ

**ශ්‍රී ලංකාවෙන් ඉහළ යන කොවිඩ් 19 වසංගතයත් සමඟ රෝහල්වල ඇඳන් ධාරිතාව පිළිබඳ බොහෝ දෙනාගේ අවධානය යොමු වන්නට පටන් ගෙන තිබේ. දෛනිකව වාර්තා වන කොවිඩ් 19 නව ආසාදිතයන් සංඛ්‍යාව ඉහළ යෑමත් සමඟ එම අභියෝගයට මුහුණ දීමට සෞඛ්‍ය අංශ ප්‍රමුඛ රජය මේ වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.**



කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර ලබාදීමට අලුතෙන් ඇඳන් 10,000ක් වෙන් කිරීමට පියවර ගෙන ඇති බව සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි පැවසුවේ එවැනි පසුබිමකදීය. ඊට අමතරව සෑම දිස්ත්‍රික්කයක් තුළම ඇඳන් ධාරිතාව 200ට වැඩි කොවිඩ් 19 අතරමැදි සත්කාර සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන රාජ්‍ය ඇමතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ පියවර ගෙන ඇත. වැඩිවන කොවිඩ් රෝගීන් නිසා රෝහල් පද්ධතියට ඇතිවිය හැකි බර අවම කිරීම එහි අරමුණයි.

රජයේ සහ පෞද්ගලික ආයතන සතු ගොඩනැගිලි එම අතරමැදි සත්කාරක සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා ලබාගැනීම කෙරෙහි අවධානය යොමුකර ඇති අතර මේ වන විට ආයතන කිහිපයක්ම තම ගොඩනැගිලි ඒ සඳහා ලබාදීමට කැමැත්ත පළ කර තිබීම ද අගය කළ යුත්තකි. ඇතැම් ස්ථානවල මේ වන විටත් එවැනි අතරමැදි සත්කාර සේවා මධ්‍යස්ථාන ඉදිවෙමින් පවතී.

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න ද පසුගියදා එවැනි සමාජ සත්කාරයකට මුල පිරුවේය. ඒ, ඉංගිරිය රෝහලේ තාවකාලිකව භාවිතයෙන් ඉවත් කර තිබූ වාට්ටුවක් ප්‍රතිසංස්කරණය කර අලුත් ඇඳන් 20ක් සහ ඊට අදාළ අනෙකුත් මූලික පහසුකම් සහිතව කොවිඩ් ප්‍රතිකාර වාට්ටු සංකීර්ණයක් ලෙස ස්ථාපිත කිරීමෙනි. එසේ ස්ථාපිත කරනු ලැබූ නව කොවිඩ් ප්‍රතිකාර වාට්ටු සංකීර්ණය ඉකුත් 5 වැනිදා පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න විසින් කළුතර දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිල වශයෙන් භාරදෙනු ලැබිණි.

එම ව්‍යාපෘතිය මන්ත්‍රීවරයාගේ සහ ඔහුගේ හිත මිතුරන්ගේ පෞද්ගලික මූල්‍ය සහ ශ්‍රම දායකත්වයෙන් ක්‍රියාත්මක වීම ද විශේෂත්වයකි. මේ පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න සිළුමිණට මෙසේ පැවසීය.







" මෙම ජාතික ආපදා අවස්ථාවේදී සම්මත සීමාවන්ගෙන් ඔබ්බට යමින් පුළුල් මහජන සේවාවක් ඉටුකිරීම මහජන නියෝජිතයන්ගේ වගකීම බව මගේ පෞද්ගලික හැඟීමයි. මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමට මා අදහස් කළේ ඒ අදහස ඇතිවයි. මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ කොවිඩ් ආසාදිතයන් බවට පත්වන පුද්ගලයන් සඳහා රෝහල්ගතව ප්‍රතිකාර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට මෙන්ම ආසාදිතයකු හඳුනාගත් මොහොතේ සිය නිවෙසේ රැඳී සිටීමට සිදුවන කාලය හැකිතාක් අවම කර පවුලේ අනෙකුත් සාමාජිකයන්ගේ සහ අසල්වැසියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත් මෙම වාට්ටු සංකීර්ණය ඉවහල් වන බව මගේ විශ්වාසයයි. ඒ වගේම මගේ මේ ප්‍රයත්නය මෙයින් අවසන් වන්නේ නැහැ. කොවිඩ් ප්‍රතිකාර සඳහා රෝහල්වල ඇඳන් ධාරිතාවට තවත් ඇඳන් 100ක් අලුතින් එකතු කිරීම මගේ සමස්ත වැඩපිළිවෙළේ අවසන් ඉලක්කයයි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ දෙවැනි කොවිඩ් ප්‍රතිකාර වාට්ටු සංකීර්ණය මතුගම රෝහලේ ස්ථාපිත කිරීමටත් මම අපේක්ෂා කරනවා."

මහජන නියෝජිතයකු ලෙස ඔහුගේ ඒ ප්‍රයත්නය සෑම මහජන නියෝජිතයකුටම නිහඬ ආදර්ශයක් වන්න.

# කොවිඩ් නළුවෝ




**"අපි රඟපාන්නේ නැහැ. අපි නළුවෝ නෙවෙයි. ඒක නිසා අපිට ඔය බොරු රඟපෑම් ඕන නැහැ. අපි වැඩේ හරියට කරනවා" යනුවෙන් පසුගිය 05 වැනි සිකුරාදා පාර්ලිමේන්තුවේ දී උස් හඬින් කියා සිටියේ පාර්ලිමේන්තුවේ සභානායක දිනේෂ් ගුණවර්ධන අමාත්‍යවරයායි.දිනේෂ් ගුණවර්ධන මේ චෝදනාව පාර්ලිමේන්තුවේ දී මුහුණට ම එල්ල කළේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයාට ය. කවුද රඟපාන්නේ ඇයි රඟපාන්නේ යන ප්‍රශ්නය මෙහිදී මතු වේ. එය හරියට "මේ කවුද? මොනවද කරන්නේ" කතාව සිහිපත් කරවන ආකාරයේ සිද්ධියකි.විදෙස් රටවල් කිහිපයක තානාපතිවරුන් කැඳවීමට සජිත් තීරණය කළේ ඇයි?**



● මංජුලගේ ප්‍රසාද්

එක් පැත්තකින් කොරෝනා මැඩීමට ආණ්ඩුවට උදව් ලබා දෙන බව ප්‍රකාශ කරන සජිත් අනෙක් පැත්තෙන් කරන්නේ කුමක් ද?

විදෙස් රටවල තානාපතිවරුන් කැඳවා සජිත් විපක්ෂ නායක වශයෙන් ඔවුන්ට කීවේ මොනවාද? ඔවුන් සජිත්ට කීවේ මොනවාද?

මේ සිද්ධිය අතරතුර "අපි රඟපාන්නේ නැතුව වැඩේ කරනවා" යනුවෙන් දිනේෂ් ගුණවර්ධන ප්‍රකාශ කළේ ඇයි?

සමගි ජන බලවේගයේ ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගයන්ත කරුණාතිලක පසුගිය 05 වැනි දා පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළේ සජිත් ප්‍රේමදාස වැනි විපක්ෂ නායකයකු මීට පෙර නොසිටි බවයි.

"මේ විපක්ෂ නායකතුමා තමයි කොරෝනා ගැන මුලින්ම පාර්ලිමේන්තුවේ දී කතා කළේ. අද වගකීමෙන් කටයුතු කරනවා; තානාපතිවරුන් දිනපතා මුණගැහෙනවා; ඇඳන් දෙන්න කියනවා. ඉල්ලීම් කරනවා; රෝහල්වලට පහසුකම් දෙන්න කියනවා. විවිධ ඉල්ලීම් කරනවා." යනුවෙන් ගයන්ත කරුණාතිලක ප්‍රකාශ කළේය.

ඒ අවස්ථාවේදී ම නැඟී සිටි විදේශ කටයුතු අමාත්‍ය මෙන් ම පාර්ලිමේන්තුවේ සභානායක දිනේෂ් ගුණවර්ධන එම චෝදනාව තරයේ ප්‍රතික්ෂේප කළේය.

"රජය, අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අගමැතිතුමාගේ උපදෙස් පරිදි විදේශ කටයුතු අමාත්‍යවරයා වශයෙන් මා ඇතුළු අදාළ පිරිස් විදේශ රටවල තානාපතිවරුන් රැසක් සමඟ දීර්ඝ ලෙස සාකච්ඡා කළා. මේ රටේ සිටින තානාපතිවරුන් සමඟ පමණක් නොවෙයි; විදෙස් රටවල සිටින තානාපතිවරුන් සමඟ පවා සාකච්ඡා කරලා තියෙනවා.

"ඒ නිසා චිත්‍රපටිවලට අපි කොවිඩ් වෙනුවෙන් පෙනී ඉන්නේ නැහැ. චිත්‍රපටි නළුවෝ ඉන්නවා ඒ පැත්තෙ, ඒක නිසා ඒගොල්ලන්ට ඕනෑම තානාපති කෙනෙක් හමුවෙලා නළු වෘත්තිය කරන්න පුළුවන්" යනුවෙන් දිනේෂ් ගුණවර්ධන අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.

විදේශ කටයුතු අමාත්‍යාංශය නිසි පරිදි කටයුතු කරද්දී සජිත් මෙලෙස රඟන්නෙ ඇයි? යනුවෙන් බොහෝ දෙනකු තුළ යම් සැකයක් ඇති වීම සාධාරණය.

ලෝකයේ දරුණුතම වසංගතයක් මඟින් මුළු ලෝකයම වසා ගනිද්දී එය සත පහකට මායිම් නොකරමින් වර්තමාන විපක්ෂය කොරෝනා වයිරසයේ සම්පූර්ණ බරපැන වර්තමාන ආණ්ඩුව වෙත එල්ල කිරීමට කටයුතු කළේය.

කොරෝනා මුල්ම අවස්ථාවේ දී චීනයේ වුහාන් ප්‍රාන්තයේ සිරවී සිටි ශ්‍රී ලාංකික සිසුන් ගෙන ඒම සඳහා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා තීරණය කරන විට ඊට විරෝධය පළ කළේ එක්සත් ජාතික පක්ෂයයි. ඒ අවස්ථාවේදී සමගි ජනබලවේගය සිටියේ එක්සත් ජාතික පක්ෂය තුළ ය.

නිරෝධායනය කිරීම, බුද්ධි අංශ මඟින් කොරෝනා ආසාදිතයන් සොයා යැම, නිසි ප්‍රතිකාර සිදු කිරීම වැනි කාරණා සෞඛ්‍ය අංශ සහ ආරක්ෂක අංශ මේ සඳහා යොදා ගැනීම ගැන විරෝධය පළ කළ බව රහසක් නොවේ.

සෞඛ්‍ය අංශ සහ ආරක්ෂක අංශ අතර මත ගැටුමක් ඇති කිරීමට ද විපක්ෂය සියුම් උපායමාර්ග දියත් කළ ද පලක් වූයේ නැහැ.

එන්නත් ලබා ගැනීම සඳහා මුලින්ම රජය කටයුතු කරන විට එයට ද විවිධ චෝදනා එල්ල කළේය.

ඉන්දියාවෙන්, චීනයෙන්, රුසියාවෙන් එන්නත් ලබා ගැනීමට කටයුතු කරන විට විපක්ෂය කීවේ ඒවා සාර්ථක නොවන බවයි.

චීනයෙන් සයිනොෆාම් එන්නත් ලක්ෂ 06 ක් මෙරටට ප්‍රදානයක් වශයෙන් ලැබෙන විට විපක්ෂය ප්‍රකාශ කළේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) අනුමැතියකින් තොරව සයිනොෆාම් එන්නත භාවිතයට සුදුසු නොවන බවයි.

එමඟින් විපක්ෂය උත්සාහ කළේ එන්නත්කරණය සඳහා ජනතාව තුළ යම් බියක් හා සැකයක් ඇති කිරීමටයි. නමුත් සයිනොෆාම් එන්නත ලොව පුරා සාර්ථකව එන්නත්කරණය කෙරෙමින් පවතී.

මෙරට සිටින චීන ජාතිකයන් 2500 දෙනෙකු සයිනොෆාම් එන්නත මාත්‍රා දෙකම එන්නත් කරගෙන ඇති අතර ඔවුන් කිසිවකුට කිසිදු අතුරු ආබාධයක් ඇති වී නැත.

සයිනොෆාම් එන්නත මෙරට එන්නත්කරණය කිරීම සඳහා සියලු සැලසුම් සකස් කර ඇති අතර අප බලා සිටින්නේ ඒ සඳහා අනුමැතිය ලැබෙන තුරුය.

රුසියාවෙන් ස්පුට්නික් එන්නත් ලක්ෂ 27 ක් මිලදී ගැනීමට රජය ඇණවුම් කළේ බොහෝ කාලයකට පෙර සිට ය.

ඇස්ට්‍රාසෙනිකා එන්නතට සාපේක්ෂව ස්පුට්නික් එන්නත මිල අධිකය. එක් ස්පුට්නික් එන්නතක වටිනාකම ඇමරිකානු ඩොලර් 9.95 කි. ස්පුට්නික් එන්නත් ලක්ෂ 27 ක් මිලදී ගැනීම සඳහා රජය විසින් දැනටමත් රුපියල් මිලියන 5304 වෙන්කර තිබේ.

මීට අමතරව තවත් එන්නත් රුසියාව ඇතුළු වෙනත් රටවල් කිහිපයකින්ම මිලදී ගැනීම සඳහා දැනටමත් කටයුතු කරමින් සිටී. ප්‍රධාන රෝහල් ඇතුළු ප්‍රාදේශීය රෝහල්වල ඇඳන් සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු සිදු කරමින් සිටින අතර ඔක්සිජන්වල කිසිදු හිඟතාවක් නොමැති බව ඔක්සිජන් සමාගම් ද ප්‍රකාශ කරයි.

ගැටලුවක්ව පවතින්නේ කොරෝනා වයිරසය ආසාදනය වී සිටින සමහර ප්‍රදේශවල පුද්ගලයන් තවමත් රෝහල්ගත වීමට නොහැකිව ඔවුන්ගේ නිවාස තුළම රැඳී සිටීමයි.

එවැනි රෝගීන් රෝහල් සඳහා ගෙන යාමට ගිලන් රථවල යම් ගැටලුවක් මතුව ඇති නිසා "සුවසැරිය 1990" ගිලන් රථ සේවය සඳහා අලුතින් ගිලන් රථ 112 ක් ලබාදීමට ජනාධිපතිවරයා පියවර ගෙන තිබුණි.

මෙවැනි තත්ත්වයක් ඇතිකරමින් රජය කටයුතු කරන විට සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයා මෙරට සිටින තෝරාගත් රාජ්‍ය තාන්ත්‍රිකයන් පිරිසක් පමණක් විපක්ෂ නායක කාර්යාලය කැඳවන්නේ ඇයි?

පසුගිය 04 වැනි දා රුසියාවෙන් ස්පුට්නික් එන්නත් 15000 ක් මෙරටට එවීමට රුසියාව කටයුතු කළේය.

එන්නත් 15000 ක් රුසියාව එවන්නේ මෙම ස්පුට්නික් එන්නත් තොගය නිවැරදිව ලබාගෙන නිවැරදිව ගබඩා කර ඉන් අනතුරුව ප්‍රවාහනය කරමින් නියමිත පරිදි ජනතාවට එන්නත් කරනවා ද යන්න සොයා බැලීමටය.

අලුත් ම වාර්තාවලින් කියවෙන්නේ ස්පුට්නික් එන්නත් ලක්ෂ 130 ක් මේ වසර අවසන්වීමට පෙර අදියරෙන් අදියර මෙරටට එවීමට රුසියාව සමඟ ගිවිසුම් අත්සන් කර ඇති බවයි.

රුසියානු එන්නත පසුගිය 04 වැනිදා මෙරටට ගෙන ඒම සඳහා රුසියාවේ ගුවන් යානයට මොස්කව්වල දී එන්නත් තොගය පටවන විට මෙරට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස එදින ම මෙරට සිටින රුසියානු තානාපතිවරයා හමු වීමට කටයුතු කරයි.

එම හමුවීමේ දී ඔහු ඉල්ලා සිටින්නේ රුසියානු ස්පුට්නික් එන්නත මෙරටට ලබා දීමට ක්‍රියා කරන ලෙසයි. ඒ වන විටත් මෙරටට ගෙන ඒම සඳහා රුසියාවේ දී අදාළ ගුවන් යානයට එන්නත් පටවා අවසන්ය.

සජිත්ට අවශ්‍ය වූයේ මාධ්‍ය සන්දර්ශනයක් සිදුකර ඔවුන්ගේ ඉල්ලීම මත රුසියානු ස්පුට්නික් එන්නත මෙරටට ලැබුණු බවට කියාපෑමටය. නමුත් සත්‍යය එය නොවන බව ඕනෑම කෙනෙකුට වැටහෙන අතර බොහෝ දෙනෙකු මෙම සිදුවීම සම්බන්ධයෙන් සජිත්ට දක්වන්නෙ අනුකම්පාවකි. ඔහු ඒ තරමටම දේශපාලනයට ළද බොළඳ වී ඇත. ඔහු සිතන්නේ ළද බොළඳ දේශපාලනයෙන් මේ රටේ ජනතාව ඉතාම පහසුවෙන් රැවටිය හැකිය කියාය.

රුසියාවෙන් ස්පුට්නික් එන්නත මෙරටට ගෙන්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය රුසියාවේ අදාළ සමාගම සමඟ සාකච්ඡා කළේ මීට මාස කිහිපයකට පෙරය.

රජයේ අවසරය පරිදි අදාළ සෞඛ්‍ය නිලධාරීන් දිවා රාත්‍රී නොතකමින් 'zoom' තාක්ෂණය ඔස්සේ දින ගණන්, වරු ගණන් සාකච්ඡා කරමින් කේවල් කළේ ස්පුට්නික් එන්නත ඉතා කඩිනමින් මෙරටට ගෙන්වා ගැනීමටය.

තවත් රටවල් තරගකාරී මට්ටමින් ස්පුට්නික් එන්නත ඉල්ලා සිටිය දී ඒ එන්නත් තොග මෙරටට ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීම, කේවල් කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ.

කොරෝනා නිසා එම රටවල්වලට යැමට නොහැකි අතර සියලු සාකච්ඡා සහ තීරණ ගනු ලබන්නේ 'zoom' තාක්ෂණය ඔස්සේය. ඊට අමතරව දුරකථන සංවාද, ෆැක්ස් පණිවිඩ ද එමටය. මෙය ප්‍රායෝගිකව සිදු කිරීම තවත් අභියෝගයකි.

මෙසේ ගන්නට යන්නේ ඉලෙක්ට්‍රොනික උපකරණ වැනි භෞතික භාණ්ඩ නොවේ. මේ ගන්නට යන්නේ ජීවිත බේරා ගැනීම සඳහා වන එන්නත්ය. මෙම එන්නත්වල ප්‍රමිතිය ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ ඇතුළු අදාළ තත්වයන් ගැන ද දැඩි ලෙස විමසිය යුතුය.

එසේ විමසා ස්පුට්නික් එන්නත රුසියාවෙන් ගෙන්වීමට කටයුතු කරන විට මෙරට විපක්ෂ නායක පැයක් ඇතුළත මෙරට සිටින රුසියානු තානාපති හමුවී ස්පුට්නික් එන්නත ලබාදෙන ලෙස ඉල්ලයි.

තමා ස්පුට්නික් එන්නත කඩිනමින් ලබාදෙන ලෙස රුසියානු තානාපතිවරයාගෙන් ඉල්ලා සිටි බව සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයා මාධ්‍යයට ප්‍රකාශ කරන්නේ කිසිදු හිරිකිතයකින් තොර වීම තවත් විශේෂ සිද්ධියකි.

"කොවිඩ් වෙනුවෙන් අපිට රඟපාන්න අවශ්‍ය නැහැ. අපිට නළුවන් වෙන්න අවශ්‍ය නැහැ." යනුවෙන් දිනේෂ් පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළේ ඇයි ද කියා දැන් ඉතා හොඳින් පැහැදිලිය.

රුසියාවෙන් ස්පුට්නික් එන්නත මෙරටට ලැබෙන්නේ තමා නිසා යැයි සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයා ප්‍රකාශ කළහොත් එය ද පුදුමයට කරුණක් නොවේ.

මෙසේ කටයුතු කරමින් විපක්ෂය කියා සිටින්නේ කොරෝනා මැඩපැවැත්වීම සඳහා ආණ්ඩුවට සහය ලබාදීමට සූදානම් බවයි.

මෙහෙම සහාය ලබාදීමට සූදානම් බව ප්‍රකාශ කරන විපක්ෂයේ තවත් ප්‍රබලයකු වන හිටපු සෞඛ්‍ය අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න ප්‍රකාශ කරනු ලබන්නේ මෙරට ජනගහනය ලක්ෂ 210 ක් එන්නත් කළ යුතු බවයි.

දරුවන්ට කොවිඩ් මර්දන එන්නත ලබා නොදේ. එය ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) නිර්දේශයකි. ඊට අමතරව මෙම එන්නත නොදෙන කාණ්ඩයට ගැබිනි මවුවරු ද අයත් වෙති.

එම කොටස් මුළු ජනගහනය වන ලක්ෂ 210 න් වෙන් කළ විට එන්නත ලබා ගැනීම සඳහා සුදුසු මෙරට සිටින ජනගහනය ලක්ෂ එකහමාරකට ආසන්න වේ. ඒ බවවත් නොදැන මේ ආකාරයට එන්නත්කරණය ගැන කතා කිරීම තරම් තවත් විහිළුවක් තිබෙනවාද?

ඇස්ට්‍රාසෙනිකා එන්නත පළමු මාත්‍රාව 925000 කට මේ වන විට ලබා දී ඇති අතර එම පුද්ගලයන්ට දෙවැනි මාත්‍රාව ලබාදීමට කටයුතු ආරම්භ කර තිබේ.

ඉන්දියාවේ ඇති වූ හදිසි තත්වය හේතුවෙන් ඉන්දියාවෙන් එන්නත් ලබා ගැනීමේ ගැටලුවක් පවතින නිසා ඇස්ට්‍රොසෙනිකා එන්නත දෙවන මාත්‍රාව සම්පූර්ණ කිරීමේ මතුවන ගැටලුවට දැනටමත් ආණ්ඩුව විසඳුම් ලබා දී ඇත.

එන්නත් අතිරික්තයක් ඇති ඉන්දුනීසියාව, සූඩානය ඇතුළු රටවල් කිහිපයක් සමඟ රජයේ නියෝජිතයන් සාකච්ඡා කර ඇති අතර ඇස්ට්‍රාසෙනිකා එන්නත් ඉන්දුනීසියාවෙන් කඩිනමින් ලබා ගැනීම සම්බන්ධයෙන් රජයේ අවධානය දැනටමත් යොමුවී තිබේ.

ස්පුට්නික් එන්නත් ලක්ෂ 130 ක් ද, ෆයිසර් එන්නත් ලක්ෂ 50 ක් ද මේ වසර අවසන්වීමට පෙර මෙරට ජනතාවට ලබාදීමට නියමිතයි.

චීනයෙන් ලැබී ඇති සයිනොෆාම් එන්නත් ලක්ෂ 06 ක් මෙරට සතුවන අතර ඊට WHO අනුමැතිය ලද විගස සයිනොෆාම් එන්නත මෙරට ජනතාවට ලබාදීමට නියමිතය.

මේ වන විට දැනටමත් 925000 කට ඇස්ට්‍රාසෙනිකා එන්නත ලබා දී ඇත.

මේ සියල්ලෙහි එකතුව ගත්විට මේ වන විට මේ වසර තුළ දී මෙරට ජනගහනයෙන් ලක්ෂ 103 කට කොවිඩ් මර්දන එන්නත ලබාදීමට සැලසුම් කර තිබේ.

ඉතිරි ලක්ෂ 32 කට ද ලබාදීමට අවශ්‍ය එන්නත් ලබා ගැනීම සඳහා දැනටමත් රටවල් කීපයක් සමඟ සාකච්ඡා කරමින් සිටින අතර එම එන්නත් කඩිනමින් ඇණවුම් කිරීමට ද කටයුතු කර ඇත.

එන්නත්කරණය සම්බන්ධයෙන් මෙවැනි පැහැදිලි වැඩසටහනක් ක්‍රියාත්මක වෙද්දී තානාපතිවරුන් පිරිසක් ගෙන්වා ගරු රඟපෑම්වල යෙදෙන්නේ කවුරුන් ද කියා අමුතුවෙන් පෙන්වා දිය යුතු නොවේ.

මෙරට එන්නත්කරණ වැඩසටහන සාර්ථක ලෙස ආරම්භ වන විට එන්නත් නොගෙන එම වැඩසටහන කෙරෙහි ජනතාව තුළ යම් සැකයක් ඇති කිරීමට විපක්ෂය ක්‍රියා කළේ ඉතා පටු දේශපාලන වාසි ලබා ගැනීමේ අරමුණෙනි.

එන්නත්කරණය කඩාකප්පල් වූවා නම් විපක්ෂයට රජ මඟුල් ය. නමුත් එය එසේ නොවීය.

අවුරුදු සමයේ දී යම් යම් සංචරණ සීමා පැන වූවා නම් හොඳ බව දැන් සමහරු කියති. විපක්ෂය නම් කියන්නේ ඒ අවස්ථාවේ දී lockdown කළ යුතුව තිබුණු බවයි.

එසේ හුදෙකලා කළා නම් විපක්ෂය කියන්නේ ජනතාවට අවුරුදු සැමරීමට යම් නිදහසක් ලබාදිය යුතුව තිබුණු බවයි.

එසේ කළ විට දැන් කියන්නේ හුදෙකලා කළ යුතුව තිබුණු බවයි. මේ අපේ රටේ විපක්ෂයේ හැටිය.

යහපාලන ආණ්ඩුව වෙනුවෙන් එදා කඩේ ගිය විවිධ සෞඛ්‍ය සංවිධාන මෙදා දිනපතා මාධ්‍ය හමු පවත්මින් විවිධ කතා කියන්නේ රටට හා ජනතාවට ආදරය නිසා නොව ආණ්ඩුව අර්බුදයක් කරා ගෙනයාමට මණ්ඩලය කවල් කිරීමට බව කවුරුත් දනිති.

අවාසනාවකට කැස්බෑව, පිළියන්දල ප්‍රදේශවල රජයේ දේශපාලනඥයන්ගෙන් සිදුවූ ඇතැම් බලපෑම් මත කරමින් කරුණු කාරණා ලබා දෙන්නේ රවි කුමුදේශ්ලාට, සමන් රත්නප්‍රියලාට හයේ පාරවල් එල්ල කිරීමටය.

T20 තරගයකදී ෆුල්ටෝස් පන්දුවක් දැම්මොත් පන්දුව නවතින්නේ කොහෙද කියා ආණ්ඩුවේ ඇතැම් දේශපාලනඥයන් තවමත් තේරුම් නොගැනීම කනගාටුවට කරුණකි.

මෙසේ දමන ෆුල්ටෝස්වලට 6 පාරවල් ලැබුණ විට විසිල් ගසමින් උඩ පනිමින් ලබාගන්නා චූන් එක නියම චූන් එකක් ද මෝඩ චූන් එකක් ද කියා ප්‍රකාශ කිරීමට තවමත් කල් මදිය.

ඒක නිසා කොවිඩ්වලින් දේශපාලන වාසි ලබා ගැනීමට විපක්ෂයේ විකට රංගනවල යෙදෙන නළුවන් ලෙස හැසිරෙන විට ආණ්ඩුවේ සමහර දේශපාලනඥයන් ඊටත් වඩා විකට රංගනවල යෙදෙන විට කොවිඩ් මර්දනය කිරීම සඳහා ආණ්ඩුව සාර්ථකව මේ දක්වා කරගෙන පැමිණි වැඩපිළිවෙළට සිදුවන්නේ කුමක්ද?

විපක්ෂයේ හැම සටන් පාඨයක් ම පරාජය වී දේශපාලන වශයෙන් බංකොළොත් වී සිටින අවස්ථාවක විපක්ෂයට හයේ පාරවල් එල්ල කිරීමට ආණ්ඩුවෙන් ම ෆුල්ටෝස් දැමීම මේ රටේ ජනතාව අනුමත නොකරති.

සෑම සටන් පාඨයක් ම මේ දක්වා අසාර්ථක වී ඇති නිසා විපක්ෂයට අවශ්‍ය ආණ්ඩුව ඇතුළේ මණ්ඩලය කවල් කිරීමට බව ආණ්ඩුව නියෝජනය කරන සෑම පාර්ශ්වයක් ම හොඳින් සිහි තබාගත යුතුය. එසේ නොමැති වුවහොත් සිදුවන්නේ කුමක්ද යන්න තේරුම් ගැනීම එතරම් අපහසු නොවනු ඇත.


MEDICINE
ENGINEERING
(China, Malaysia & Bangladesh)

University of Science & Technology Chittagong (Bangladesh)

Zhengzhou University (China)

Quest University (Malayasia)

Institute of Vocational Studies (Pvt) Ltd.
No. 476, Kandy Road, Dalugama, Kelaniya.
Telephone : 0777 444 500 / 0112 969 435
E-mail : ivsltd@hotmail.com Web : www.ivsedu.net



සංස්ථාගත නීති අධ්‍යාපන සභාව

ශ්‍රී ලංකා නීති විද්‍යාලය

විශේෂ දැන්වීමයි

අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා කාල සීමාව

අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා පහත පරිදි කාල සීමාවක් නියම කිරීමට සංස්ථාගත නීති අධ්‍යාපන සභාව තීරණය කර ඇත.

- 2021 වර්ෂයේ සිට නීති විද්‍යාලයට ඇතුළත් කර ගන්නා ඕනෑම ශිෂ්‍යයෙකු ඇතුළත් වීමේ දිනයේ සිට ඉදිරි වසර දහය (10) තුළ අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
- 2021 වර්ෂයට පෙර ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ලියාපදිංචි වී ඇති ඕනෑම ශිෂ්‍යයෙකු සිය අධ්‍යයන පාඨමාලාව මෙදින සිට ඉදිරි වසර දහය (10) තුළදී සම්පූර්ණ කළ යුතුය.

**ලේඛකාධිකාරී,**
**සංස්ථාගත නීති අධ්‍යාපන සභාව,**
**ශ්‍රී ලංකා නීති විද්‍යාලය,**
**අංක 244, අළුත්කඩේ වීදිය, කොළඹ 12.**
**2021.05.09**

1 රට වැහුවොත් අපේ ආර්ථිකය කඩා වැටෙනවා. තත්ත්වය පාලනය කරගතහොත් තවම රට වහන්න තරම් අවශ්‍යතාවක් නැහැ. රට වහන්න තරම් උග්‍ර තත්ත්වයක් ඇතිවෙයි කියලා මා හිතන්නේ නැහැ. වර්ධනයක් තියෙනවා සහ කොවිඩ් 19 පැතිර යාමක් තියෙනවා; එය පාලනය කරගත යුතුයි. හුදෙකලා කරන්න අවශ්‍ය නම් අපිට පුළුවන් තෝරාගත් වැඩියෙන් පැතිරෙන පළාත් පමණක් හුදෙකලා කරන්න. කොච්චර ලෙඩ්ඩු ඉන්නවාද ශීඝ්‍රයෙන් පැතිර යනවාද කියන කාරණාවත්; ඒ පළාතෙන් අනික් පළාත්වලට යෑම් ඊම්වලින් යම් පැතිරයාමක් සිදුවෙයි ද කියලත් සලකලා බලලයි එසේ හුදෙකලා කිරීම් කළ යුතුව ඇත්තේ. රටම වහන්න අවශ්‍යයි කියලා මම හිතන්නේ නැහැ. ආර්ථිකමය අංශයෙන් සලකා බලා එසේ කිරීමට හැකියාවක් ඇතැයි කියලත් මම හිතන්නේ නැහැ. මේ රෝගය පාලනය කරන්න පුළුවන් සාර්ථකව ඒ සඳහා නිසි ක්‍රමවේදයක් සෞඛ්‍ය අධ්‍යාපනයක් සියලු මාධ්‍ය පාවිච්චි කරලා ප්‍රචාරණයක් ලබා දිය යුතුයි. සතියකින් දෙකකින් වුවත් හැකියාව තියෙනවා මෙය පාලනය කරන්න. ජනතාවට මෙහි ඇති බැරෑරුම්කම වටහා දිය යුතුයි. තමන්ගේ ජීවිත බේරා ගන්න අවශ්‍යයි; එමෙන්ම මෙය ශීඝ්‍රයෙන් බෝවන බවත් ජනතාව දැනුම්වත් විය යුතුයි. මුහුණු ආවරණය පැලඳීම, දුරස්ථ භාවය, දෑත් සේදීම ආදිය හැඩ ගස්වා ගැනීමට නිසි සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබා දිය යුතුයි. එය කළහොත් මේ රෝගය පාලනය කළ හැකියි.

2 මා මුලින් කිවා වගේ සංචරණ සීමා යෝග්‍යයයි කියලා තීන්දු කළයුතු වන්නේ ද අවශ්‍යතාව අනුවයි. ගමන් කිරීමේදි නිසි සෞඛ්‍ය පුරුදු පිළිපදිනවා නම් එක් දිස්ත්‍රික්කයෙන් අනෙක් දිස්ත්‍රික්කයට පැතිරීම අඩු වෙයි. සෞඛ්‍ය අංශවලට පාලනය කරන්න බැරි ආකාරයට දිස්ත්‍රික්කවල පැතිරෙනවා නම් එවැනි දිස්ත්‍රික්කයකින් පිටව යෑම තහනම් කිරීමට සිද්ධ වෙයි. දැනට ඇති තත්ත්වය අනුව එසේ කළ යුතුයි කියලා මා හිතන්නේ නැහැ. එය කළ යුතු වන්නේ පැතිරෙන වේගය පිළිබඳව සලකා බලලයි.

3 වැඩි අනතුරුදායක තත්ත්වයක් ඇත්තේ ආබාධ ඇති අය, වයසක අය සහ වෙනත් ආබාධ ඇති අයටයි. එවැනි අයව එන්නත් කළ යුතුයි. දියුණු රටවලත් තවම එන්නත්කරණය කිරීම සම්පූර්ණයෙන් කිරීමට නොහැකි වෙලා තියෙනවා. එන්නත්කරණය කිරීමෙන් පාලනය කරන්න නම් අපිට අඩුම වශයෙන් සියයට අසූවක්වත් එන්නත්කරණය කරන්න වෙයි. ඒ මට්ටමට යන්න මම හිතන විදිහට කාලයක් ගත වෙයි. වයිරස විශේෂඥයකු ලෙස මට කියන්න තියෙන්නේ කොතරම් කාලයක් එන්නතක ආරක්ෂාව ශරීරයක පවතීද කියලා අපි දන්නේ නැහැ. තීරණවලට එළඹෙන්නට පෙර මේ තත්ත්වය නිසා එන්නත් ගැන වුවත් අලුත් කරුණු අපිට එකතු කරන්න වෙනවා. එන්නතක ආරක්ෂාව අවුරුද්දක් පමණ වෙන්න පුළුවන්. මෙය අවුරුද්දෙන් අවුරුද්ද එන්නත් කරන්න වෙනවා. තීන්දු තීරණවලට බහින්න කාලය මදි. ඒ කියන්නේ වයිරසය ඇතිවෙන්නේ කොහොමද; එන්නත්කරණය මගින් කොතරම් කාලයක් ආරක්ෂාව පවතිනවා ද කියලා අපි තවම තෝරා බේරාගෙන නැහැ. ස්ථිර තීරණ වලට බැසගන්න පුළුවන් වෙන්නේ නිසි අධ්‍යයනයකින් පසුවයි. එතෙක් අපි විවෘත මනසකින් නිරන්තර ප්‍රවේශම් වෙමින් දත්ත එකතු කළ යුතුයි;මේ වයිරසය පිළිබඳව. එන්නත ලබා දීම කළාට පසුව දෙවැනි එන්නත දෙන්න හොඳ කොතරම් කාලයක් ගියාට පසුව ද; එන්නත්කරණයෙන් පසු ආරක්ෂාව කොතරම් කල්පවතිනවාද වගේ දේවල් අපි හැදෑරිය යුතුයි.

4 කෙසේ පැතිරුණාද කියනවාට වඩා පැතිරීම වැළැක්වීමයි අපි කළයුතු හොඳම දේ. මෙරටට පැමිණෙන සංචාරකයන්ගෙන් ආවද කියල හරි සැලකිය යුතු වෙනසක් වුණාද කියල හරි අපි දන්නේ නැහැ. ඒ ගැන අපිට කියන්න බැහැ. නමුත් කෙසේ හෝ පැතිරෙමින් පවතිනවා. ඒ සඳහා අපි සෞඛ්‍ය පුරුදු අනුගමනය කරමින් අපි පරිස්සම් විය යුතුයි.

5 අනිවාර්යෙන් සියලු දේශපාලන බලවේග එකතු විය යුතුයි. සෞඛ්‍ය කමිටුවේදී මා කිව්වා පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන්ගෙ කොමිටියක් පිහිටුවන්න කියලා මේ වෙනුවෙන්. ඒ කොමිටිය දැනුම්වත් කරන්න කියලත් මා කිව්වා. ඒ සඳහා සියලු දේශපාලන පක්ෂ සහය දෙන්න අවශ්‍යයි. එය ක්‍රියාත්මක කිරීමට හැකිනම් හොඳයි. පොදු ප්‍රශ්නයක් ලෙස සලකා සියලුදෙනා සහය දෙන්න ඕන කියලා මා කියලා තියෙනවා.



ලෝක සෞඛ්‍ය සංවිධානයේ හිටපු උපදේශක,
වයිරස පිළිබඳ විශේෂඥ වෛද්‍ය
පොදු ජන පෙරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රී
**මහාචාර්ය තිස්ස විතාරණ**



## මත ගැටෙන තැන

● සුභදා දේශප්‍රිය

# රට හුදෙකලා කිරීමෙන් කොවිඩ් පාලනය කළ හැකිද?

## සිළුමිණෙන් ප්‍රශ්න 05 ක්

1 - රට වසා දැමීමෙන් කොරෝනා පාලනය කළ හැකිවෙයිද?
2 - එසේ නැති නම් දිස්ත්‍රික් අතර සංචරණ සීමා පැනවීමක් කළ යුතුද?
3 - එන්නත් ගෙන්වීමේ වැඩපිළිවෙළ අසාර්ථක බවට චෝදනා නැඟෙන්නේ ඇයි?
4 - විදේශිකයන් ගෙන්වීම නතර කර රට වසා දැමීමෙන් රෝගය පාලනය කරගත හැකි වෙයිද?
5 - දේශපාලන වාසි නොතකා කොරෝනා පාලනයට සියලු දේශපාලන බලවේග ඒකරාශී වීමට අවස්ථාව එළඹිලා නේද?



ජනතා විමුක්ති පෙරමුණේ
පාර්ලිමේන්තු මන්ත්‍රී
**විජිත හේරත්**

1 රට හුදෙකලා කරනවාද සංචරණ සීමා පනවනවාද කියන තීන්දු ගන්න ඕන දේශපාලඥයන් නොවෙයි. ඒ පිළිබඳ විශේෂඥ දැනුම තියෙන වෛද්‍යවරුන් විසිනුයි. සිංහල හින්දු අලුත් අවුරුද්ද පෙර අප්‍රේල් 8 වැනිදා මේ බ්‍රිතාන්‍ය ප්‍රභේදය ලංකාවෙ පැතිරෙන බවට හඳුනා ගත්තා. ශ්‍රී ජයවර්ධන විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායමක් විසින් ඒ බව දැනුම් දුන්නා. ඒ වෙලාවේ රජයක් විදිහට යම් යම් පියවර ගත යුතුව තිබුණත් ආණ්ඩුව පියවර ගත්තේ නැහැ. ජනතාව අලුත් අවුරුදු සමරන්න ගිහින් මේ දේ වුණා නොවෙයි. ඊට කලින් මේ ප්‍රභේදය පැතිරෙමින් තිබුණා. ඒ නිසා සංචරණ සීමා පනවන්න ඕන කියලා වෛද්‍යවරුන් කිව්වත්, ඒ පිළිබඳ ක්‍රියාත්මක වුණේ නැහැ. අඩු තරමින් ඒ පිළිබඳව ජනතාව දැනුම්වත් වීමක්වත් වුණේ නැහැ, විෂයභාර ඇමැතිවරියටම කියන්න වුණා. සෞඛ්‍ය අංශවලින් කරපු යෝජනාව බාර ගත්තේ නැහැ. පරාජය වුණා නම් යෝජනාව ඒ කවුද පරාජයට පත් කළේ. මේ කාරණා පිළිබඳව තීන්දු ගත යුතු වන්නේ වෛද්‍යවරුන් මිසක ඇමැතිවරුන් නොවෙයි. ඒ නිසා මේ පිළිබඳව ඒ අයගේ නිර්දේශ සැලකිල්ලට ගෙනයි ගතයුතු ක්‍රියාමාර්ග ගතයුතු වන්නේ.

2 දිස්ත්‍රික් අතර සංචරණය සීමා කළ යුතු ද යන තීන්දු ගත යුතු වන්නේ ද දේශපාලන අධිකාරිය නොවෙයි, වෛද්‍ය උපදෙස් අනුවයි. දේශපාලඥයන්ට කියන්න බැහැ, කුමන දිස්ත්‍රික්කයේද සංචරණ සීමා පැනවිය යුත්තේ, දිස්ත්‍රික් අතර යන්න පුළුවන්ද එපාද යන දේ ගැන. ඒ වගේම හමුදාවට කියන්නත් බැහැ, වසංගත රෝග පිළිබඳව වෙනම ඒකක තියෙනවා, ඒවගේම ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් ඉන්නවා. මේ ක්ෂේත්‍රයේ ඉන්න අය කියන දේ සැලකිල්ලට ගෙනයි මේ දේ කරන්න අවශ්‍ය වන්නේ. එසේ නැතිව වෙනත් අය තීන්දු කිරීම විද්‍යාත්මක නැහැ.

3 එන්නත තමයි පාලනය කිරීමට ඇති එකම ක්‍රමවේදය කියලා රජයත් කියන්නේ. නමුත් එන්නත් කිරීමේ දී අනුගමනය කරන ක්‍රමවේදය සාර්ථක නැහැ. තවම දීලා තියෙන්නේ ලක්ෂ නවය හමාරයකට පමණයි. පළමු මාත්‍රාව දුන්න අයට දෙවන මාත්‍රාවත් දීමට වැඩපිළිවෙලක් නැහැ; එයත් අසාර්ථකයි. එන්නත නම් මේකට තියෙන පිළියම කලින් ඇණවුම් කරලා, මුදල් ඒ වෙනුවෙන් යොදවා, ඒ වෙනුවෙන් මැදිහත් විය යුතුයි. ඒ වගේම පීසීආර් පරීක්ෂණ කළ යුතුයි. පරික්ෂණ කළහොත් පමණයි ව්‍යාප්තිය වර්ධනය පිළිබඳව දැනුම්වත්වීම් වෙන්නේ. රෝහල්වල අඩුපාඩු බොහොමයක් තියෙනවා. ඇතැම් රෝහල්වල මුව ආවරණ ලබා ගැනීමට ලිපි ලියා ඉල්ලීම් කරන්න අවශ්‍ය මට්ටමක් තියෙන්නේ. දැඩි සත්කාර ඒකකවලට අවශ්‍ය ඇඳන් නැහැ. ගිය සතියේ වෙනතුරු කොරෝනා රෝගීන්ට ඇඳන් තිස්අටයි වෙන් කරලා තිබුණේ. එය එකසිය හතළිහ දක්වා වැඩි කළේ දිනදෙකකට තුනකට පෙරයි. තවත් රෝහල්වලට පහසුකම් අත්‍යවශ්‍යයයි. මේ රෝගය ශීඝ්‍ර වර්ධනයක් තියෙනවා කියලා වෛද්‍යවරුන් කියන්නේ. රෝහල්වල ඉඩ නැති නිසා බොහෝ අය ගෙදර නිරෝධායනය වෙනවා. ඒ රෝගීන් රැගෙන යන්න තැනක් නැහැ; රෝහල් පිරිලා ඉඩ නැහැ. රෝගය දරුණු තත්ත්වයකට ආවොත් කොහොමද මුහුණ දෙන්නේ කියලා ගැටලුවක් තියෙනවා. එහෙම අර්බුදයක් මතු නොවුණත් ඔක්සිජන් සහ රෝහල් ධාරිතාව මදි වෙන්න පුළුවන් ඉදිරියට. ඒ සඳහා දැනටමත් ක්‍රියාත්මක විය යුතුයි. ඒ සඳහා සැලසුම් සහගත වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. එන්නත් ගැන කිව්වෙත් විශාල ප්‍රමාණයක් ලංකාවට එනවා කියලා. ඒත් තාම මුකුත් නැහැ වැඩපිළිවෙළාක්. කලින් වගේ ප්‍රමාද නොකර දැන්වත් මේ ඔක්සිජන් සඳහා අදාළ ආයතන දැනුම්වත් කර ඒ සඳහා සූදානම් විය යුතුයි.

4 පැතිරීම වැළැක්වීමට ක්‍රියාමාර්ග රැසක් තියනවා. එකක් පමණක් නොවෙයි. සෞඛ්‍ය පුරුදුත් ප්‍රධාන වෙනවා. ලෝකය පුරා මේ රෝගය පැතිරීම වැළකීමට ක්‍රියාමාර්ග රැසක් අරගෙන තියෙනවා. ඒ ක්‍රියා මාර්ග නිසි අනුපිළිවෙළකින් ගැනීමෙන් වැළැක්වීම කළ හැකි වෙන්නේ. ලෝකයේ මේ වගේ රෝග පාලනය කරපු රටවල් තියෙනවා. ඒ රටවලින් පූර්වාදර්ශ අරගෙන මේ අවස්ථාවේ කටයුතු කළ යුතුයි. එකම පිළිතුර රට හුදෙකලා කිරීම කියලා අපි කියන්නේ නැහැ. නමුත් විවිධ ක්‍රියාමාර්ග තියනවා පිළිවෙළින් ගත යුතු. දේශපාලන බල අධිකාරියේ වුවමනාවට අති විශාල පැතිරීමක් ඇති පිළියන්දල නගරය ඇරියා වගේ කටයුතු නොකළ යුතුයි. සමහර තැන් විවෘත වුවහොත් බරපතළ අනතුරුදායක තත්ත්වයන්ට මුහුණ දීමට වෙනවා.

5 සියලු දේශපාලන පක්ෂ එකතු විය යුතු බව අපි පළමු රැල්ලේදිම කිව්වා. ඒ සඳහා නිසි වැඩපිළිවෙළක් හදන්න කියලා අපි කිව්වා. ඒවා කරන්නේ නැහැ. දේශපාලන වාසි ලබා ගැනීමටයි උත්සාහ කළේ. දෙවැනි රැල්ලේ දි 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තා. විසි වැනි ව්‍යවස්ථාව ඒ අවස්ථාවේ සම්මත කර ගත්තා පාර්ලිමේන්තුව හදිසියේ කැඳවලා. දැන් පෝට්සිටිය සම්මත කරගන්න උත්සාහ කරනවා. මෙවැනි ව්‍යසනයක් පැතිරෙමින් කොවිඩ් තුන්වැනි රැල්ල පිළිබඳ ව ජනතාව භීතියෙන් සිටින අවස්ථාවක් මේක. හඬක් නගන්න පාරට එන්න බැරි අවස්ථාවක් මේක. ආණ්ඩුව උත්සාහ කරන්නේ ජනතා විරෝධ කොරෝනා පාවිච්චි කරලා මැඩ පැවැත්වීමටයි. සියලුම දේශපාලන බලවේග සංවිධාන අනිවාර්යෙන්ම මේ අවස්ථාවේදි එකතු විය යුතුයි. ඒ සම්බන්ධයෙන් කිසිදු විවාදයක් නැහැ. රජය ඒ සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේ නැහැ. එසේ එකමුතුවක් වෙනවා නම් ඒ පිළිබඳ හොඳ ක්‍රමවේද තියෙනවා. ආපදා කළමනාකරණ පනතක් තියෙනවා. 2005 මාර්තු මාසයේ සම්මත වූ පනත අනුවත් සියලු දේශපාලන ක්‍රියාන්විත සැදිය යුතුයි. එහෙත් සියලු දේශපාලන බල කඳවුරුවල එකතු විය යුතුයි යන අවශ්‍යතාව එලෙසම අදටත් පවතිනවා.



සමගි ජනබලවේගයේ මහලේකම්
පාර්ලිමේන්තු මන්ත්‍රී
**රංජිත් මද්දුමබණ්ඩාර**

1 රට වැසිය යුතුද කියන දේ සෞඛ්‍ය අංශ ගන්න ඕනෑ තීන්දුවක්. අපි දිගින් දිගටම දැක්කා සෞඛ්‍ය පරීක්ෂකවරු, දොස්තරවරු මේ රට ඇරීම, වැහීම ගැන අදහස් පළ කරනවා. නව ප්‍රභේද පැතිරීම් ගැන දැනුම්වත් කිරිම් කරනවා. ඒ විෂය දැනුම් ඇති අය මට මතකයි විෂය භාර ඇමැතිවරියට කිව්වා රට වහන්න කියලා. මේක දේශපාලන තීන්දුවක්. එන්නත ලබා දීම හෝ රට වැසීම යන දෙකෙන් එකක් අනිවාර්යෙන්ම සිදු කළ යුතුයි. නමුත් ආණ්ඩුවට මේ දෙකෙන් එකක්වත් කර ගන්න බැරි වෙලා තියෙනවා. ඒක නිසා ලෝකයේ භයානකම රටක් බවට අද ලංකාව පත් වෙලා තියෙනවා. එංගලන්තය වගේ රටවල අපිට වැඩිය බොහොම දරුණුවට මේ වයිරසය පැතිරුණා. එංගලන්තය වහලා තිබ්බා. යන්තම් දැන් එංගලන්තේ හොඳ තත්ත්වෙකට පත් වෙලා තියෙනවා. නමුත් මේ ආණ්ඩුව අසාර්ථකයි. ආණ්ඩුව පළවෙනි රැල්ල පාලනය කරනකොට කිව්වා, ඒ අයගේ ජයග්‍රහණයක් කියලා. ලෝකයේ පළවෙනි 10 වැනි යන් අතර ඉන්න රටක් කියලා. අද මේ covid වසංගතයේ පැතිරීම ගැන වගකීම ආණ්ඩුව බාර ගන්න ඕනේ. සෞඛ්‍ය අංශවල උපදෙස් නොතකා දේශපාලන සහ හමුදා තීන්දු අරන් තමයි අද රට මේ තත්වෙට පත් වෙලා තියෙන්නේ. වගකීම ගන්න ඕන ආණ්ඩුවයි. අපිට චෝදනා එල්ල කළා පාස්කු ඉරිදා සිද්ධියෙන් දෙසිය ගානක් මැරෙනකොට.අද 700 ගානක් මැරිලා. තව මොනවා වෙයිද කියලා කියන්න බෑ. අපි ප්‍රාර්ථනා කරමු ජනතාවට මුකුත්ම වෙන්න එපා කියලා නමුත් ආණ්ඩුව මේකත් එක්ක සෙල්ලම් කරපු නිසා මෙය වුණේ. මේ ව්‍යසන දේශපාලනීකරණය කරපු නිසා තමයි මේ තත්වෙට පත් වුණේ. ආණ්ඩුව එන්නත් ගේන්නේ නැතිව මිත්‍යාව පස්සේ දුවනවා. ආණ්ඩුව හිතුවා මිත්‍යා කණ්ඩායම් පස්සේ ගිහින් බලයට ආවා වගේ කිරිමුට්ටි පැණි පස්සේ ගියාම මෙය හරි යයි කියලා. මාධ්‍යයයි, ආණ්ඩුවයි මේවා පිටිපස්සේ දුවන එක නොවෙයි කළ යුතු වන්නේ; විද්‍යානුකූල ක්‍රමවේද වලට යෑමයි. විශේෂයෙන් එන්තත්කරණය කිරිම ඉක්මන් කළ යුතුයි.


2 පළමුවැනි රැල්ල අවස්ථාවේදි රට වැසුව නිසා ඒ රැල්ල පාලනය කරගන්න පුළුවන් වුණා. අපි වගේ දූපත් රාජ්‍යයක පුළුවන් වුණා පාලනය කරගන්න. විපක්ෂනායකවරයා එදා කිව්වා වසංගතය පාලනය කරගන්න පාර්ලිමේන්තුවේ අවශ්‍ය පියවර ගන්න කියලා . ඒ වෙලාවේ ආණ්ඩුවේ ඇමැතිවරු බොළඳ පිළිතුරු දුන්නා. අපි කිව්වා විපක්ෂය විදිහට එන්නත් ඇණවුම් කරන්න කියලා. ආණ්ඩුව එය ගණන් ගත්තේ නැහැ නොමිලේ ඉන්දියාවෙන් හම්බ වුණ ටිකයි ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් නිකන් හම්බ වුණ ටිකයි විතරයි, ලංකාවට ඇවිත් තියෙන්නේ. දැන් තමයි එන්නත් ගේන්න ලෝක බැංකුවෙන් ණය ගන්නේ කොහොමද කියලා හිතන්නේ. සීනිවලට ගජමිතුරන්ට සහන දෙද්දි ඒ බදු මුදලින්ම එන්නත් ගෙන්නන්න තිබුණා. රජයට උදවු කරපු රජයට සහය දෙන ගජමිතුරන්ට සහන දෙන්න විතරයි, ආණ්ඩුව කල්පනා කරන්නේ. මිනිසුන් ගැන හිතන්නෙ නැහැ. එන්නත ගෙන්වන්න ඕන නැති නම් රට වහන්න ඕන. ඒ දෙකින් එකක්වත් ආණ්ඩුව කරන්නේ නැහැ. හමුදාපතිවරයා කියනවා මේ වසරේ අවසානය වනවිට සියයට හැටකට ජනගහනයෙන් එන්නත දෙනවාලු එතකොට අශ්වයා ස්ථාලයෙන් පැනලා ඉවරයි .

3 එහෙම වුණොත් දිස්ත්‍රික්ක සියල්ල වහන්න වෙනවා, එයට හේතුව මේ වන විට සියලු දිස්ත්‍රික්කවල පැතිරිලා තියනවා. එසේ නම් රට ම ලොක් ඩවුන් කරන්න වෙනවා. රට වහන්න බැරි නම් සංචරණ සීමා හෝ පැනවිය යුතුයි. ආර්ථිකය වට්ට ගත්තා බදු සහන දිලා ගජ මිතුරන්ට. දැන් ඒ ගජ මිතුරන්ට දුන් බදු සහන වල වන්දියත් අද ගෙවන්න වෙන්නේ අහිංසක ජනතාවටයි. රට වහන්න විදිහක් නැහැ ආර්ථිකය කඩාවැටෙයි කියලා අඩු තරමින් ශීඝ්‍රයෙන් පැතිරෙන ගම් ටිකවත් වැසිය යුතුයි කියලා අපිට හිතෙන්නේ.

4 ආණ්ඩුවට පුළුවන් කමක් තිබුණේ නැහැ, එන්නත් ටික ඇණවුම් කරන්න. මහාචාර්ය ජයසුමන කිව්වා එන්නත් එනවා කියලා. ආණ්ඩුවේ පිළිවෙළක් නැතිකම පේනවා ඉතා පැහැදිලිව. පළවෙනි එන්නත්කරණය කළ අයට දෙවැනි එක දෙන්න විදිහක් නැහැ. ආණ්ඩුවේ අය කියනවා දෙවන එන්නතට වෙන එන්නතක් දෙන්න පුළුවන් කියලා. නමුත් විෂය දන්න රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කියනවා, එහෙම දෙන්න බැහැ කියලා. ආණ්ඩුව යන්නේ අවිධිමත් ගමනක්, එන්නත් ගෙන්නපු නැති එක ගැන ආණ්ඩුව වග කියන්න ඕන. නැවත වරක් ආණ්ඩුව මිත්‍යාව පැත්තට යනවා. රජයට වැඩපිළිවෙළක් නැති නිසායි රට මේ තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. මේ තත්තවයට මුහුණ දුන්න රටවල් අද වයිරසය පාලනය කරගෙන තියෙනවා. ආණ්ඩුව කල්පනා කරන්නෙ කොහෙන් හරි එන්නත් ගෙනත් දෙන්න. අපි කියන්නෙ දේශපාලඥයන්ට බැහැ වෛද්‍ය විද්‍යානුකූල තීන්දු ගන්න. ඒවගේම හමුදාව යුද්ධ කළාට වෛද්‍ය විද්‍යාව දන්නේ නැහැනේ. ඒ නිසා මේ අවස්ථාවේ වැඩකරන්න ඕන විශේෂඥ වෛද්‍ය උපදෙස් මතයි. මේ ප්‍රභේදය පිළිබඳව අදාළ අංශවලින් අහලා සොයා බලා කටයුතු කරන්න කියලා මම ආණ්ඩුවට කියනවා. රට නොවසා පැතිරීම වැළැක්විය හැකිවන්නේ එන්නත්කරණය මගින් නම් එසේ කළ යුතුයි. මේ දරුණු අවස්ථාවේ නැතිනම් රට වැසිය යුතුයි. ආණ්ඩුවේ තීරණය විපක්ෂයට ගන්න බැහැ. හුඟක් අය හිතන්නේ යුද්ධය දිනුවා වගේ වසංගත පාලනය කරන්න පුළුවන් කියලා. යුද්ධ කරන්නෙ එක විදිහකට වසංගත පාලනය කරන්නේ තව විදිහකට මේ ගැන ඇත්තටම ආණ්ඩුවට අදහසක් නැහැ. ඒ නිසා ආණ්ඩුව මේ දෙක වරද්ද ගත්තා.

5 පළමු රැල්ල අවස්ථාවේදී ප්‍රධාන විපක්ෂයේ පක්ෂය ලෙස සමගි ජන බලවේගයේ අපි අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කළා. මේ සම්බන්ධයෙන් විපක්ෂයේ සහයෝග දෙන්න කැමැතියි කියලා. අපිත් සම්බන්ධ කරගන්න කියලා. අපිව කැඳෙව්වේ අගමැතිතුමාගෙ එක් රැස්වීමකට පමණයි. අපි දේශපාලන වාසි ගන්නේ නැහැ. රටක් ලෙස ව්‍යසනයෙන් මේ රටේ ජනතාව බේරා ගන්නයි අපිට ඕන. විපක්ෂයේ සහය දෙන්න උත්සාහ කරන්නේ ඒකයි, අද මොකක්ද කරන්නේ පාර්ලිමේන්තුවේදි විපක්ෂයට ප්‍රහාර එල්ල කිරීම කරන්නේ. විපක්ෂය මේ පිළිබඳ කාරණා ඉදිරිපත් කළාම හාස්‍යයට ලක්කළා. මුලින්ම අපි කියන්නේ අපිව හාස්‍යයට ලක්නොකර හාස්‍යයට ලක්වන තමන්ගේ මන්ත්‍රීවරුන් ටික පාලනය කරගන්න කියලා. ඒ වගේම විපක්ෂයේ සහයත් මේ සඳහා ගන්න කියලා අපි කියන්නේ.

# මැතිසබය රත් කළ සරත්-සරත්ලා



රාජකීය හැල්ල

රුවන් පතිරණ කියයි... edmediaunit@gmail.com

**පාර්ලිමේන්තුව පසුගිය සතියේ පැවතියේ දින දෙකක් වුව ද එම දින දෙක ම වඩාත් උණුසුම් වූයේ කොවිඩ් - 19 වත්මන් තත්ත්වය පිළිබඳව පාර්ලිමේන්තුව කල් තැබීමේ අවස්ථාවේ විවාදය පැවැත්වුණු නිසාය. පසුගිය 04 වැනිදා කොවිඩ් - 19 ගැන පාර්ලිමේන්තුව කල් තැබීමේ විවාදය පැවැත්වීමට නියමිතව තිබුණු අතර 05 වැනිදා පැවැත්වීමට නියමිතව තිබුණේ කොළඹ වරාය නගරයේ ආර්ථික කොමිෂන් සභාව ගැන පාර්ලිමේන්තුව කල් තැබීමේ අවස්ථාවේ විවාදයයි.**

කොළඹ වරාය නගරයේ ආර්ථික කොමිෂන් සභාව ගැන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මහින්ද යාපා අබේගුණවර්ධන කථානායකවරයාට ලැබී නොතිබුණු නිසා 04 සහ 05 යන දෙදින පුරාම පාර්ලිමේන්තුවේ පැවතුණේ කොවිඩ් - 19 සහ එහි වත්මන් තත්ත්වය පිළිබඳ පාර්ලිමේන්තු විවාදයයි.

මෙහිදී විශේෂත්වයක් වූයේ සරත්ලා දෙදෙනකු අතර ඇති ඇතිවූ උණුසුම් විවාදයයි.

එක් සරත් කෙනකු වූයේ හිටපු යුද හමුදාපති, සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකායි. අනෙක් සරත් වූයේ හිටපු සිවිල් ආරක්ෂක බළකායේ ප්‍රධානී, මහජන ආරක්ෂක ඇමැති විශ්‍රාමික රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකරයි.

මෙම මත ගැටුම විනාඩි කිහිපයක් තිස්සේ පැවතීම නිසා මැතිසබය තුළ ඇතිවූයේ දැඩි උණුසුම්කාරී තත්ත්වයකි.

විවාදයට එක්වූ සරත් වීරසේකර අමාත්‍යවරයා ප්‍රකාශ කළේ සරත් ෆොන්සේකා හමුදාව පාවා දෙන ආකාරයට ප්‍රකාශ නිකුත් කරන බවයි.

හමුදාවේ සිටි අයකු ලෙස එවැනි ප්‍රකාශ නිකුත් කිරීම ගැටලු සහගත බව ද සරත් වීරසේකර විසින් පෙන්වා දෙන ලදී.

මිරිසුවිල් සිද්ධියේ දී සුනිල් රත්නායක රණවිරුවාට නිදහස දුන් එක සම්පූර්ණයෙන්ම වැරදි යැයි ෆොන්සේකා පසුගියදා ප්‍රකාශ කළා. ඒ චෝදනා ලැබූ සෙබළුන් සියලු දෙනා හිරේ දැමිය යුතු යැයි ඔහු පැවසුවා. යනුවෙන් සරත් වීරසේකර ප්‍රකාශ කළේය.

මේ අවස්ථාවේදී සරත් ෆොන්සේකා කතා කිරීමට උත්සාහ කරයි.

ඇමැති වීරසේකර:- ඔබතුමා ඉන්න මම කතා කරලා ඉවර වෙනකල්. පොයින්ට් ඔෆ් ඕඩර් එකක් මෙතන නැහැ.

මන්ත්‍රී සරත් ෆොන්සේකා:- යුද්දෙ කතා කියලා රණවිරුවෝ කියලා මිනීමරන්න බැහැ. මිනී මැරුවා නම් කවුරු වුණත් හිරේ යන්න ඕන. කරන්නාගොඩ කළත්, තමුන්නාන්සේ කළත් නීතිය කාටත් එකයි. මම කියපු දේ හමුදාව පාවාදීමක් නෙමෙයි.

ඇමැති වීරසේකර:- දෙමළ සංවිධානයට ඕන විදිහට ඩයස්පෝරාවට ඕන විදිහට ගහෙන් ගෙඩි එන්නා වාගේ මේ වගේ ප්‍රකාශ තමුන්නාන්සේ කරන්නේ ඩොලර්වලටයි.

මන්ත්‍රී ෆොන්සේකා:-

ජිනීවා ගිහිල්ලා කොහෙන්හරි ඩොලර් උස්සගෙන ආවට අපි ඒ තුට්ටු දෙකේ වැඩ කරලා නැහැ.

ඇමැති වීරසේකර:- තමුන්නාන්සේ හමුදාව පාවා දෙන්න එපා.

මන්ත්‍රී ෆොන්සේකා:- අපි එදා යුද්ධ කළේ බෝම්බ කාගෙන.

ඇමැති වීරසේකර:- ඇයි අපි යුද්ධ කළේ නැද්ද? යුද්ධය දිනලා ජාතියේ ප්‍රණාමය ලබාගත්තු පස් දෙනාගෙන් එක්කෙනෙක් මම. දැනගන්නවා, ඔයා විතරක් නෙවෙයි යුද්ධ කළේ.

තමන්ගේ සෙබළුන් පාවා දෙනවා නම් තමුන්නාන්සේ ෆීල්ඩ් මාෂල් කෙනකුට නෙවෙයි, ලාන්ස් කෝප්‍රල් කෙනෙකුටත් සුදුසු නෑ.

මන්ත්‍රී ෆොන්සේකා:-

මම කිව්වේ නඩු තීන්දුවේ තියෙන ඒවා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල ඒවා කිව්වා.

ඇමැති වීරසේකර:- තමුන්නාන්සේ ඒවා කියන්නේ දෙමළ ඩයස්පෝරාවෙන් සල්ලි අරගෙන, නැත්නම් මොකක්ද හේතුව.

(ෆොන්සේකා යළිත් මහ හඬින් කෑ ගසයි)

(ඇමැති වීරසේකරට බැණ වදී)

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක්:-

කමෝන්..... කමෝන්.....

ඇමැති වීරසේකර:- යුද්ධයෙන් පස්සේ ජනාධිපතිවරණයේදී ඔබතුමා දෙමළ දිස්ත්‍රික්ක ඔක්කොම දින්නේ කොහොමද? ඔබතුමාට එල්.ටී.ටී.ඊ. දෙමළ ඩයස්පෝරාව එක්ක ගිවිසුමක් තියෙනවා. ඒක ඉතා පැහැදිලියි.

## අතරමැදි රෝහල් හදන්න ප්‍රසන්න මුල්වෙයි

මේ අතර කොවිඩ් - 19 යළි ව්‍යාප්ත වීම හා එය මැඩපැවැත්වීම සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ද දැඩි අවධානය යොමු වී තිබුණි. සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග පසුගිය සඳුදා උදෑසන බස්නාහිර ආණ්ඩුකාර රොෂාන් ගුණතිලකට දුරකථන ඇමතුමක් දුන්නේය.

"ආණ්ඩුකාරතුමා.. අපි වැලිල්ලවත්තේ ඇඳන් 2,000 ක් දාන්න පුළුවන් කොවිඩ් අතරමැදි රෝහලක් හදනවා. ඒක නාවික හමුදාව යොදවලා කරගන්න පුළුවන්. අවශ්‍ය පහසුකම් ටික ගන්න ප්‍රතිපාදන ටිකක් දෙන්න.." ප්‍රසන්න ඉල්ලුවේය. "හොඳයි.. මම අද එන්නම්, එතැන බලලම තීන්දුවක් ගමු..." ආණ්ඩුකාරවරයා කීවේය.

ඒ අනුව ඇමැති ප්‍රසන්න හා බස්නාහිර ආණ්ඩුකාර රොෂාන් ගුණතිලක සඳුදා යක්කල වැලිල්ලවත්තට ගියේ වසා දමා තිබෙන කර්මාන්තශාලාව පරීක්ෂා කිරීමටයි.

"මෙතැන මුල් අදියර යටතේ ඇඳන් 1,000 ක් දාන්න ප්‍රතිපාදන දෙන්න. ඊට පස්සේ ඉතිරි එක කරමු..." ප්‍රසන්න ආණ්ඩුකාරවරයාට කීවේය. ඊට ආණ්ඩුකාරවරයා ද එකඟතාවය පළ කළේය.

ප්‍රසන්න එතැන සිටම ඇමැති නාමල්ට කතා කළේය.

"මල්ලී.. මට පොඩි උදව්වක් ඕනෑ... අපි කොවිඩ් අතරමැදි රෝහලක් හදනවා. නාවික හමුදාව වැඩේ කරනවා. බස්නාහිර පළාත් සභාවෙන් සල්ලිත් හම්බෙනවා. මෙතන වැඩට තව ටිකක් කට්ටිය යොදවගන්න පුළුවන් නම් ඉක්මන් කරගන්න පුළුවන්.." ප්‍රසන්න කීවේය.

ඇමැති නාමල් කීවේ තරුණ සංවිධාන හරහා ඒ සඳහා පිරිසක් යෙදවිය හැකි බවයි.

මේ අතර වැලිල්ලවත්තේ මේ ප්‍රතිකාර මධ්‍යස්ථානය පිළිබඳ පුවත්පත් වාර්තා දුටු හිටපු ඇමැති බැසිල් රාජපක්ෂයන් ද ඇමැති ප්‍රසන්නට කථා කළේය. ඔහු කීවේ මෙය ඉතා හොඳ වැඩක් බවය. ඒ වෙනුවෙන් අවශ්‍ය දෙයක් ලබාදීමට ඔහු ද එකඟතාව පළ කළේය.

පවතින කොවිඩ් තත්ත්වය හේතුවෙන් මෙවර කැබිනට් මණ්ඩලය පැවැත්වුණේ ඔන්ලයින් තාක්ෂණය ඔස්සේයි. සවස 05.00 ට ආරම්භ වීමට නියමිතව තිබූ කැබිනට් මණ්ඩලයට ඇතැම් ඇමැතිවරු ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ කලින්ම පැමිණ සිටියහ. ඒ අතර අලි සබ්රි හා එස්. එම්.චන්ද්‍රසේන ඇමැතිවරුන්ට සුබ පැතීමට ද ඇමැතිවරු කටයුතු කළහ. ඒ ඔවුන් දෙදෙනාගේම උපන්දින එදිනට යෙදී තිබුණු බැවිනි.

"මම උදේම ගත්තා. ඔබතුමාව අල්ලගන්න බැරිවුණා සුබ පතන්න. .." අගමැති මහින්ද අලි සබ්රිට කීවේය.

"ඔව් සර්...මම පස්සේ ඔබතුමාට ගත්තා නමුත් සම්බන්ධ කරගන්න බැරි වුණා...." සබ්රි කීවේ අගමැති මහින්දට කනගාටුව පළ කරමිනි.

## ජනපති ඇමැතිවරුන්ට කියපු දේ

"කොවිඩ්වලට තියෙන එකම විසඳුම එන්නත්කරණය. අපි මේ වන විට එන්නත්කරණය සඳහා සියලුම දේ කරමින් ඉන්නවා. ස්පුට්නික් එන්නතත් ගෙන එන්න කටයුතු කරලා තියෙනවා. චීන එන්නතටත් හෙට අනිද්දාට අනුමැතිය හිම්වෙයි කියලා හිතනවා. සෞඛ්‍ය අංශ කියන විදිහට එන්නත දීපු ප්‍රදේශවල රෝගය පාලනය වෙලා තියෙනවා.." ජනාධිපති ගෝඨාභය කීවේය.

"කළුතර දිස්ත්‍රික්කයේ කොවිඩ් වැඩිවෙන නිසා පසුගිය දින දෙක තුන ඇතුළත තියෙන ඇඳන් ප්‍රමාණයට වැඩිය ඇඳන් 1,000 ක් එකතු කර ගත්තා. ට්‍රේනින් සෙන්ටර්ස් වගයක් තමයි ගත්තේ. සමහර වෙලාවට අපේ දිස්ත්‍රික්කයේ රෝගීන් ගෙනියන්නේ නැගෙනහිර පළාතට. යවන්නේ තියෙන ඇම්බියුලන්ස් එක. එතකොට ගැටලු කීපයක් පැනනගිනවා.." රෝහිත කීවේය.

"වෙන වෙනම ගෙනියන්න ඕනෑ නෑ ඇමැතිතුමා. සියලුදෙනාම එකතු කරලා ගෙනියන ක්‍රමවේදයක් හරිගස්සලා තියෙනවා. රෝගීන් සියලු දෙනාව එක තැනකට ගෙනල්ලා එකවර අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවලට ගෙනියන්න කටයුතු යොදලා තියෙන්නේ.." ජනාධිපතිවරයා පැහැදිලි කළේය.

"අපි නිරෝධායන මධ්‍යස්ථාන දැන් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන බවට පත් කරලා තියෙනවා. ඇදන් 10,000 ක් අපි සූදානම් කළා.." ජනාධිපතිවරයා කීවේය. "අපිට දිස්ත්‍රික් වශයෙන් මේ රෝගීන් කළමනාකරණය කරගන්න පුළුවන් නම් හොඳයි. ගාල්ලේ ඇදන් 500 ක් වැඩි කරලා." ඇමැති රමේෂ් කීවේය. "අපි ගම්පහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන 03 ක් හදන්න කටයුතු කරගෙන යනවා. වහලා දාපු කර්මාන්තශාලා 03 ක් අරගෙන.."ඇමැති ප්‍රසන්න රණතුංග කීවේය.

"හැම දිස්ත්‍රික්කයේ ම එහෙම තැන් නෑ. පුළුවන් තරම් ඒ පහසුකම් හදාගන්න එක හොඳයි. හැම කෙනෙක්ම ඒ ගැන මැදිහත්වෙලා කටයුතු කරන්න.." ජනාධිපතිවරයා කීවේය. "දිස්ත්‍රික්ක මට්ටමින් දේශපාලන නායකත්වය මේ වෙලාවේ අපිට ලොකු සහායක් දෙනවා. අපි හැම දිස්ත්‍රික්කයකම සෞඛ්‍ය අංශවලට කියලා තියෙනවා දිස්ත්‍රික්කයකට ඇඳන් 1,000 ක් වත් දාන්න පුළුවන් ස්ථානයක් තෝරාගෙන සූදානම් කරලා තියාගන්න කියලා.." පවිත්‍රා ඇමැතිවරිය කීවාය.

"අද අපි උසස් අධ්‍යාපන ආයතන කීපයක්ම හොස්ටල් කීපයක්ම මේ සඳහා ලබා දුන්නා..." කීවේ අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල් ය.

## අගමැති මහින්ද ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ මුලසුනට

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) පසුගිය (05) පස්වරුවේ පැවති 54 වන වාර්ෂික මහා සභා රැස්වීමේ දී 2021/2022 වර්ෂය සඳහා ආසියානු සංවර්ධන බැංකු අධිපතිවරුන්ගේ මුලසුනට මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයා තේරී පත්විය.

මුදල් අමාත්‍යවරයා වශයෙන් මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයා මෙම තනතුරට පත්වනවිට ශ්‍රී ලංකාවේ ආසියානු සංවර්ධන බැංකු (ADB) අධිපතිධුරය හොබවමින් සිටියේය.

ජෝර්ජියාවේ ටිබිලිසි හි පැවැත්වීමට නියමිතව තිබූ මෙම වාර්ෂික මහා සභා රැස්වීම වර්තමානයේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් අන්තර්ජාල වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවැත්විණි. ඔස්ට්‍රියාවේ සහ මොන්ගෝලියාවේ ඒ.ඩී.බී අධිපතිවරුන් මෙම රැස්වීමේ දී ආසියානු සංවර්ධන බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරු ලෙස තේරී පත්වූහ.

ආසියානු සංවර්ධන බැංකුවේ 55 වන වාර්ෂික මහා සභා රැස්වීම ලබන වසරේ කොළඹ දී පැවැත්වීමට නියමිතය.

## දෙවැනි වරටත් 12 දෙනෙක් පක්ෂ නායක රැස්වීම වර්ජනය කරති

මේ අතර මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයා කැඳවා තිබුණු පක්ෂ නායක රැස්වීම ආණ්ඩුවට සහයෝගය පළ කරන දේශපාලන පක්ෂ 12 ක නායකයන් විසින් දෙවනිවරටත් වර්ජනය කිරීම දේශපාලන ක්ෂේත්‍රයේ කතාබහට ලක්වෙමින් තිබේ.

අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පැවති මෙම රැස්වීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහභාගී වී සිටි අතර ආණ්ඩුව නියෝජනය කර මහජන නියෝජිතයන් 50 ක් පමණ ඊට සහභාගී වී ඇති බව ද වාර්තා වේ.

රැස්වීම වර්ජනය කළ එම දේශපාලන පක්ෂ අග්‍රාමාත්‍යවරයාගෙන් ඉල්ලා ඇත්තේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සහයෝගය දක්වන දේශපාලන පක්ෂ 14 ක නායකයන් පමණක් කැඳවා සාකච්ඡාවක් පවත්වන ලෙසයි.

## යුතුකම ගෙවිඳු අගමැතිතුමාගෙන් ඉල්ලුවේ කුමක්ද?

ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම් රැස්වීම පසුගිය 04 වැනිදා දහවල් 12.00 ට මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණේ පාර්ලිමේන්තු සංකීර්ණයේ පිහිටි කමිටු ශාලා අංක 1 දීය.

කොවිඩ් ගැන මැති ඇමැතිවරු මන්ත්‍රීවරු එහිදී අදහස් දක්වන්නට වුණා. රාජ්‍ය ඇමැතිනී වෛද්‍ය සීතා අරඹේපොළ කියා සිටියේ යම් යම් සංචරණ සීමා පැනවීමට ක්‍රියා කරනවා නම් වඩාත් හොඳ බවයි.

එන්නත්කරණ වැඩසටහන ගැන දීර්ඝ පැහැදිලි කිරීමක් කළේ රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන විසිනි. පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග කියා සිටියේ මීට පෙර අවස්ථාවලදී උණු වතුර පානය කිරීම, දුම් ඇල්ලීම, ආම්ලික පලතුරු ආහාරයට ගැනීම වැනි දේවල් ගැන සමාජයේ අවධානය පෙරට වඩා යොමු කළ යුතු බවයි.

චීනයේ ජනතාව දිනකට පස් වතාවක් උණුවතුර පානය කරන්නත්, උණු තේ බොමින් ඉතා පරිස්සමින් සිටින බවත් ඔවුන් දිනපතාම මේ දේවල් සිදු කරන්නේ යහපත් සෞඛ්‍යයට එමගින් තිබෙන බලපෑම නිසා බවත් ගෙවිඳු කුමාරතුංග මෙහිදී පෙන්වා දෙන ලදී.

මැති ඇමැතිවරුන් ඇතුළු මන්ත්‍රීවරුන් මෙම සියලු කරුණු ගැන අවධානය යොමු කරන බව මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයා මෙහිදී ප්‍රකාශ කළේය.

## සූම්, ටීම් හා වට්ස්ඇප් මඟින් රනිල් වැඩ

කොවිඩ් - 19 රෝගීන් නැවත වරක් වැඩි වැඩියෙන් වාර්තාවීමට පටන් ගැනීමත් සමග එක්සත් ජාතික පක්ෂය ද සිය පක්ෂ කටයුතු, මහජන හමු තාවකාලිකව අත්හිටුවීමට තීරණය කළේය. අන්තර්ජාල පහසුකම් ඔස්සේ කටයුතු කරනවා විනා මහජන හමු හෝ වෙනත් රැස්වීම් නොපවත්වන ලෙස නායක රනිල් වික්‍රමසිංහ පක්ෂ මහලේකම් පාලිත රංගේ බණ්ඩාරට උපදෙස් දී තිබුණි.

නායකයා ද පස් වන පටුමගේ පිහිටි සිය නිවසේ රැඳීමට තීරණය කළ අතර මැයි මස මුල් සති දෙක නිවසින් බැහැර නොයන්නැයි නායකයාට විද්වතුන් මෙන්ම වෛද්‍යවරුන්ද උපදෙස් දී තිබිණි. ඒ අනුව නායකයා ද සියලු හමුවීම් සූම්, ටීම් හා වට්ස්ඇප් මඟින් කිරීමට තීරණය කළේය.

කාර්ය බහුලත්වයෙන් මිදී නිවසට කොටුවූ කාලය ආසියානු දේශපාලනය සම්බන්ධයෙන් තමන් සකස් කරමින් පවතින පොතේ කටයුතු නැවත ආරම්භ කිරීමට ද නායකයා පියවර ගෙන තිබුණි. නව තාක්ෂණය ඔස්සේ පක්ෂ ක්‍රියාකාරීන් හමුවී සාකච්ඡා කරන අවස්ථා හැර අන් සෑම අවස්ථාවක්ම අලුත් පොත ලිවීමේ කටයුතුවලට වෙන් කිරීමට නායකයා වගබලා ගත්තේය.

## සජිත් තානාපතිවරුන්ට කීවේ මොනවාද?

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසට පසුගිය සතියම බෙහෙවින්ම කාර්යබහුල විය. ඒ රාජ්‍යතාන්ත්‍රික හමුවීම් රැසක් මෙන් ම පාර්ලිමේන්තුවේ විශේෂ කටයුතු රැසක් ද යෙදී තිබුණ බැවිනි.

යුරෝපා සංගමයේ තානාපති Denis Chaibi, ප්‍රංශ තානාපති Mr.Eric Lavertu, ඉතාලි තානාපතිනි Ms. Rita giuliana Mannella, ජර්මන් තානාපති Mr. Holger Seubert", රොමේනියානු තානාපති Mr.Victor chiujdea යන රාජතාන්ත්‍රික නිලධාරීන් ගිය සතියේ හමුවූ සජිත් එදිනම හවස තවත් තානාපතිවරු පිරිසක් හමු වූහ.

රුසියානු තානාපති, ජපන් තානාපති සහ කැනේඩියානු තානාපති මෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය නියෝජිත හැනා සිංගර් ද මේ සතියේ හමුවීමට විපක්ෂනායකවරයා අමතක කළේ නැත. මෙහි විශේෂත්වය වූයේ මේ හමුවීම සඳහා ඉල්ලීම් කොට තිබුණේ ද එම රටවල්වල තනාපතිවරුන් විසින්ම වීමය.


"දිගටම නායකතුමා විදෙස් තානාපතිවරු හමුවෙනවා. මොකක්ද රහස?" එහෙම ඇසුවේ ගයන්ත කරුණාතිලකය. "ඒකනේ, සති දෙකක් ඇතුළත සැහෙන තානාපතිවරු පිරිසක් හමුවුණා. ඒක වාර්තාවක් වෙන්නත් පුළුවන්" මනූෂ කීවේ අසල සිටි නලින් බණ්ඩාර සමඟය.

"ඇත්තටම මම නොවේ හමුවුණේ. එතුමන්ලා තමයි ඉල්ලීම කළේ. හැබැයි එහෙම අවස්ථා අපි උපරිමව රට වෙනුවෙන් ප්‍රයෝජනයට ගන්නවා." සජිත් කීවේය.

"හරින් ගැන ඔබතුමා තානාපතිවරු එක්ක සාකච්ඡා කළ එක හොඳයි. මේක විපක්ෂය දඩයම් කරන ආණ්ඩුවක්." හෙක්ටර් අප්පුහාමි කීවේය.

"හරින්ගේ රිපෝර්ට්ස් දැක්කම මම පුදුම වුණා. හැමෝගෙන්ම පොඩි ඉල්ලීමක් කරන්න තියෙනවා. එතුමා බලන්න නිතර යන්න එපා. ඒකෙන් එතුමට ඩිස්ටර්බ් වෙන්න පුළුවන්. මේ ටික දවස විවේක අරගෙන එතුමා ආපහු පුරුදු සටන් බිමට එනවා. එතෙක් එතුමට විවේක ගන්න දෙමු." සජිත් කීවේය.

"මේ දවස්වල හරින් පොත් කියවනවාලු" හර්ෂණ කීවේය. "ඒක ඉතාම හොඳයි" එහෙම කීවේ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාරය.

# කහ වැව්වොත් සල්ලි තමයි



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් මිරිහානේ පිහිටි සිය ගෙවත්තේදී කහ පැළයක් රෝපණය කළ අවස්ථාව. වෙළෙඳ ඇමති ආචාර්ය බන්දුල ගුණවර්ධන, වැවිලි ඇමති වෛද්‍ය රමේෂ් පතිරණ, වැවිලි රාජ්‍ය ඇමති ජානක වක්කුඹුර ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

● නිහාල් පී. අබේසිංහ

**අපේ රටේ වැවීමට හැකි නමුත් රුපියල් කෝටි ගණන් ගෙවා පිටරටවලින් ගෙන්වන ආහාර ද්‍රව්‍ය අපේ රටේ වගා කිරීමට "සෞභාග්‍යයේ දැක්ම" අනුව දැන් රජය කටයුතු කරයි.**

ඒ අනුව ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි කහ මෙරටට ගෙන්වීම නතර කර ඒ කහ ගෙන්වීම සඳහා පිටරට යැවූ රුපියල් කෝටි 75ක පමණ මුදල මෙරට ගොවීන්ටම ලබාදීමේ නව වැඩපිළිවෙළක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ආරම්භ කර ඇත. ඒ අනුව දැන් කහ අක්කරයක් වැව්වොත් මල්ලක් පිරෙන්න සල්ලි සෙවිය හැකිය.

ඉන්දියාවේ කහ ගොවීන් පවසන්නේ ශ්‍රී ලංකාවට කහ ගෙන්වීම නතර කිරීම නිසා තමන්ට සිදුවූ පාඩුව ඉන්දියන් රුපියල් කෝටි 50 කට වැඩි බවයි. මේ අනුව අපේ ගොවි ජනතාව කහ වැවීමට උනන්දු වුවහොත් අති විශාල ධනස්කන්ධයක් අපේ රටේම ඉතිරි කර ගොවි ජනතාවටත් රුපියල් කෝටි ගණනක ආදායමක් ලබාගත හැකි වනු ඇත.

මේ අනුව පසුගිය වසරේ රට පුරා කහ වගා කිරීමට අපේ ගොවි ජනතාව කටයුතු කළහ. කහ වගාවට අපේ රටේ ජනතාව පමණක් නොව ජනාධිපතිතුමා පවා උනන්දුවක් දැක්විය. පසුගියදා එතුමා තම මිරිහාන ගෙවත්තේදි තමාගේ කහ අස්වැන්න නෙළීය.

සියරට දේ සිරිසැප දේ යන අභිමානවත් අදහස අනුව යමින් මෙවර යල කන්නයේ රටපුරා කහ වගාව ජනප්‍රිය කරවීමට ජනාධිපතිතුමා ප්‍රමුඛ වත්මන් රජය දැන් අලුත් වැඩපිළිවෙළක් යොදා ඇත. ඒ අනුව රටපුරා ජනතාව කහ වගාවට උනන්දු කරවීම පිණිස මේ කහ වවන වැඩපිළිවෙළේ ප්‍රථම කහ පැළය පසුගියදා තම මිරිහාන ගෙවත්තේ සිටුවීමට ජනාධිපතිතුමා කටයුතු කළේ රටටම ආදර්ශයක් දෙමිනි. මේ වැඩපිළිවෙළ යටතේ අපේ රටේ පවුල් ලක්ෂ 60කට කහ පැළ 5 බැගින් ලබාදීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පියවර ගෙන ඇතැයි වැවිලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ පවසයි.

"මේ වැඩසටහනේ අරමුණ රටේ සෑම ගෙවත්තකටම කහ පැළ 5 බැගින් ලබාදීමයි. ඒ වැඩසටහනේ සමාරම්භය පසුගිය මැයි 1 වැනිදා ජගත් කම්කරු දිනයේදි ජනාධිපතිතුමාගේ මිරිහාන නිවෙස පිහිටි ගෙවත්තේදි අපි ආරම්භ කළා. මුල්ම අදියර යටතේ කහ පැළ 5 බැගින් අපි පවුල් ලක්ෂ 15 කට ලබාදීම ආරම්භ කර තිබෙනවා. මේ යටතේ ගුණාත්මක බවින් ඉහළ කහ පැළ සෑම ප්‍රදේශයකම ගොවිජන සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ති නිලධාරින් මඟින් ජනතාවට ලබා ගන්න පුළුවන්. මේ සඳහා ජනාධිපති කාර්යාලය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සියලු කටයුතු සිදු කරනවා." රමේෂ් පතිරණ ඇමැතිවරයා කියයි.

කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මේ වැඩසටහන මෙහෙය වන අතර සියලු කහ වවන ගොවීන්ට කෘෂි තාක්ෂණික උපදෙස් හා වෙළෙඳපොළ සම්බන්ධ උපදෙස් ලබාදීමට ද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සූදානම් වෙයි.

අලුත් කහ වගා වැඩපිළිවෙළ යටතේ 2023 දි අපේ රට කහවලින් ස්වයංපෝෂිත කිරීමේ ඉලක්කයක් ඇතැයි රාජ්‍ය ඇමැති ජානක වක්කුඹුර පවසයි. ඉන්දියාවේ වියළි කහ කිලෝවක් ඉන්දියාවේ රුපියල් 70කි. නමුත් අපේ රටේ කහ කිලෝවක් රුපියල් 4000 ක් පමණ වේ.

> **කහ පැළ 5 බැගින් අපි පවුල් ලක්ෂ 15 කට ලබාදීම ආරම්භ කර තිබෙනවා. මේ යටතේ ගුණාත්මක බවින් ඉහළ කහ පැළ සෑම ප්‍රදේශයකම ගොවිජන සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ති නිලධාරින් මඟින් ජනතාවට ලබා ගන්න පුළුවන්.**

කහ පිරිසුදු බව පෙන්වන සංකේතයකි. කහ වතුර ඉසීම් හා අමුකහ පාවිච්චිය මගින් වස්දොස් සමනය වන බවට ජනප්‍රවාද පවතී. ඊට අමතරව කහ හොඳ දේශීය ඖෂධයකි. ආයුර්වේද බෙහෙත් හා කැඩුම් බිඳුම්වලට අමු කහ බහුලව යොදා ගනී.

පිළිකා රෝගයට ගොදුරු වී මිය යන්නන්ගේ සංඛ්‍යාව අඩු කිරීම හෝ පාලනය කිරීම සඳහා වර්තමානයේදි යොදා ගන්නා පියවරක් ලෙස කහ රෙසෝමයෙන් ලබාගන්නා කකරීයුමින් නම් ශාක රසායනික කාණ්ඩය යොදා ගන්නා බව අලුත් පර්යේෂණ මඟින් අනාවරණය වී ඇත. මෙමඟින් පිළිකා වර්ධනය වන සෛල විනාශ කරන බවත් මේ ගුණය අපේ රටේ කහවල වැඩි බවත් පර්යේෂණ අනුව හෙළිවී තිබේ. ඉන්දියාවේ කහවලට වඩා සියයට 200ක් අපේ කහවල පිළිකා සෛල විනාශ කරන බලයක් ඇතැයි ඒ පිළිබඳ කළ පර්යේෂකයෝ පෙන්වා දෙති.

කුරුණෑගල, මහනුවර, මාතලේ, ගම්පහ, කොළඹ, කෑගල්ල, නුවරඑළිය, කළුතර, ගාල්ල, මාතර, මොනරාගල කහ වගාව ව්‍යාප්තව ඇති අතර ජල සම්පාදනය යටතේ අම්පාර පොළොන්නරුව ඇතුළු වියළි කාලපයේ ද කහ වගාව ව්‍යාප්ත කළ හැකිය.

කහ බෝගයේ සම්භවය දකුණු හා ගිනිකොන දිග ආසියානු රටවල සිදු වුණු අතර වර්තමානයේ සමස්ත කහ නිෂ්පාදනයෙන් 75% පමණ නිෂ්පාදනය කරනු ලබන්නේ ඉන්දියාවේය. මීට අමතරව බංග්ලාදේශය, පකිස්තානය, තායිලන්තය, චීනය, මියන්මාරය, ඉන්දුනීසියාව, ජැමෙයිකාව, හයිටි, පේරු සහ ශ්‍රී ලංකාව යන රටවල් ද කහ වගා කරනු ලබයි. කහ ප්‍රධාන වශයෙන් ආනයනය කරනු ලබන්නේ ඉරානය ඇතුළු මැද පෙරදිග රටවල්, උතුරු හා දකුණු අප්‍රිකානු රටවල්, යුරෝපය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය හා මැලේසියාවයි.

ශ්‍රී ලංකාව තුළ 2018 සංඛ්‍යාලේඛන දත්ත වලට අනුව වාර්ෂික වියළි කහ පරිභෝජනය මෙට්‍රික්ටොන් 7000 වේ. ඒ අනුව මෙ.ටො. 5000 වැඩි වියළි කහ ප්‍රමාණයක් වාර්ෂිකව ආනයන කර ඇති බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාව තුළ කහ ප්‍රධාන වශයෙන් ආහාර පිළියෙල කිරීමේදී වර්ණකාරකයක් සහ කුළුබඩු මිශ්‍රණවල සංඝටකයක් ලෙස භාවිත කරන අතර ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයේදී ද රූපලාවන්‍ය කටයුතු වලදී ද වැදගත් අමුද්‍රව්‍යක් ලෙස ද යොදා ගනී. මීට අමතරව සායම් නිෂ්පාදනයේදී ද වර්ණ ගැන්වීමට ද විෂබීජ නාශකයක් ලෙස ද කහ වැදගත් කාර්යක් ඉටු කරයි. හින්දු භක්තිකයන්ගේ ආගමික කටයුතු වලදී ද බහුලව කහ මිශ දියර යොදා ගනු ලබයි. ඒ අනුව බලන විට අපගේ එදිනෙදා කටයුතුවලදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍යක් ලෙස කහ හැඳින්විය හැකිය. කහ ශාකය භූගත රෛසෝමයකින් අඩි 3 - 4 උසට වැඩෙන පළල පත්‍ර සහිත ව්‍යාජ වායව කඳකින් සමන්විත වේ. ව්‍යාජ කඳේ පත්‍ර 6 - 10 ක් පමණ හට ගනී. පත්‍රයක දිග අඩි 1.5 - 2 ක් පමණ වන අතර තද කොළ පාටය. පත්‍ර වල අග්‍රස්ථ කෙළවර පාදස්ත කෙළවරට වඩා පළල්ය. ශල්ක පත්‍ර සහිත භූගත කඳ සත්‍ය කඳ වන අතර එහි සංචිත ආහාර අඩංගු වේ. ප්‍රධාන භූගත කඳෙන් ශාඛා ලෙස කහ අල හට ගනී. වාණිජව අස්වැන්න ලෙස ලබා ගන්නේ මෙම අලයි. රෛසෝමයේ අභ්‍යන්තරය තද තැඹිලි පැහැයේ සිට කහ පැහැයක් ගන්නා අතර කහ වලට ආවේණික වූ සුවඳක් සහ රසයක් ඇත. මාංශලමය වූ මුල් රෛසෝමයෙන් හට ගනී. පුෂ්ප මංජරිය පාදස්තයෙන් හට ගන්නා අතර පුෂ්ප ළා කහ පාටකින් යුක්ත වේ. ඵලය ස්පෝටිකාවකි.

කහ සම්පූර්ණ වියළි ස්වරූපයෙන් හෝ කුඩු ආකාරයෙන් වෙළෙඳපොළේ තිබේ. ව්‍යංජන මිශ්‍රණය සකස් කිරීමේදී එය අමුද්‍රව්‍යයක් ලෙස ද භාවිතා කරයි. කහ වලින් තෙල් හා ඔලියෙරොසීන් නිස්සාරණය කරනු ලබන අතර එය ප්‍රධාන වශයෙන් ආහාර කර්මාන්තයේ වර්ණක හා රසකාරකයක් ලෙස භාවිත කරයි. රෙදිපිළිවල වර්ණ ගැන්වීම සහ විශේෂිත තීන්ත සකස් කිරීම සඳහා ද එය භාවිත වේ. ආයුර්වේද හා චීන වෛද්‍ය විද්‍යාවේ කහ යනු පොදුවේ භාවිතාවන අමුද්‍රව්‍යයකි. බොහෝ දුරට එදිනෙදා ජීවිතයේදී විෂබීජ නාශකයක් ලෙසත් ආගමික උත්සවවලදීත් ඉන්දියානුවෝ කහ භාවිත කරති.

> **පිළිකා සෛල විනාශ ගුණය අපේ රටේ කහවල වැඩි බවත් පර්යේෂණ අනුව හෙළිවී තිබේ. ඉන්දියාවේ කහවලට වඩා සියයට 200ක් අපේ කහවල පිළිකා සෛල විනාශ කරන බලයක් ඇතැයි ඒ පිළිබඳ කළ පර්යේෂකයෝ පෙන්වා දෙති.**

මුහුදු මට්ටමේ සිට මීටර් 1,500 ක් දක්වා උස් ප්‍රදේශවල කහ වගා කළ හැකිය. තවද වියළි කලාපයේ ජල සම්පාදන තත්වයන් යටතේ ද කහ වගා කළ හැකිවේ. වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1500 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අවශ්‍ය වන අතර මනා වර්ධනයක් සඳහා සුදුසු පරිසර උෂ්ණත්වය 20-35C අතර වේ. විවිධ පස් වර්ගවල කහ වගා කළ හැකි වුවත් මනා ජල වහනයක් ඇති කාබනික ද්‍රව්‍ය සහිත වැලි ලෝම පස ඉතා යෝග්‍ය වේ. දුර්වල ජල වහනයක් සහිත පස්, ගල් බොරලු අධික පස් සහ මැටි පස ද කහ වගාවට සුදුසු නොවේ. පසෙහි පී.එච්. අගය 5.5 - 6.5ක් වීම වඩාත් උචිත වේ. තෙත් කලාපයේ කහ වගා කරනු ලබන්නේ යල කන්නයේ වැසි සමඟ මාර්තු හෝ අප්‍රේල් මාසවලදීය. කහ බෝගය හිරු එළිය සඳහා වැඩි කැමැත්තක් දැක්වුවත් බහුලව වගා කරනුයේ මඳ සෙවණ තත්ත්වයක් ඇති ගෙවතු හා පොල් කෙසෙල් වැනි බෝග සමඟ අතුරු බෝගයක් ලෙසටය.

කහ වගාවට බලපාන ප්‍රධාන පළිබෝධකයා වන්නේ කඳ විදින්නාය. වැඩිහිටි සලබයා කොළ කොපුවල බිත්තර දමන අතර දළඹුවා ව්‍යාජ කඳට ඇතුළුව ශාකයේ අභ්‍යන්තර පටක වලට හානි කරයි. පළමුව ශාක පත්‍ර කහ පැහැයට හැරී පසුව දුඹුරු පැහැයට හැරී ශාක මිය යයි.

අස්වනු නෙළීම සිදු කරනුයේ සිටුවීමෙන් මාස 9කට පමණ පසුවය. මාර්තු - අප්‍රේල් කන්නයේ කහ සිටුවන්නේ නම් දෙසැම්බර් - ජනවාරි වන විට අස්වැන්න නෙළා ගැනීමට හැකි වේ. එම කාලය තුළ ශාක කහ පැහැයට හැරී කොළ වියළීමට පටන් ගනියි. අස්වනු නෙළීම සිදු කරනු ලබන්නේ රෛසෝම වලට හානි නොවන ලෙසයි. රෛසෝම වල ඇලී ඇති පස් කොටස් ප්‍රවේශමෙන් ඉවත් කළ යුතුයි.

රෛසෝම හෙවත් කහ අල වල මුල් කොටස් කපා ඉවත් කොට පස් ඉවත් වන තුරු හොඳින් සෝදා මවු අල සහ ඇඟිලි අල වෙන් කළ යුතුයි. රෛසෝම වැසෙන තුරු ජලය යොදා ඇඟිලි අල මිනිත්තු 30කුත්, මවු අල මිනිත්තු 45 කුත් තම්බා ගත යුතුයි. නිසි ලෙස තම්බා ගත්විට රෛසෝම මෘදු වේ. නිසි පරිදි තැම්බී ඇති බව පරීක්ෂා කර ජලය වෙනුවට වාෂ්පයෙන් ද තම්බා ගත හැකිය. කහ කිලෝග්‍රෑම් කිහිපයක් තම්බා ගැනීමට පීඩන උදුන ද භාවිතා කළ හැකිය. තම්බා ගත් කහ දින කිහිපයක් පවනේ වියළා ගත යුතුයි. උදෑසන 11.00 ත් 2.00 ත් අතර තද හිරු එළිය නොවැටෙන පරිදි මුල් දින තුන සෙමින් වියළීම සිදු කළ යුතුයි. ඉන්පසුව අඛණ්ඩව හිරු එළියේ වියළීම කළ යුතුයි. සම්පූර්ණ වියළීමේ ක්‍රියාවලියට දින 10ක් පමණ අවශ්‍ය වේ. නිසි ලෙස වියළූ කහ සොලවන විට ලෝහමය ශබ්දයක් ඇසේ. දීප්තිමත් කහ පැහැයක් ලබා ගැනීමට වියළි රෛසෝම රළු මතුපිටක අතුල්ලනු ලැබේ. මේ සඳහා සුදු යකඩ වලින් තැනූ කහ පොලිෂ් කරන යන්ත්‍රය ද භාවිත කළ හැකිය. මේ අනුව අපේ රටේ ගොවීන්ට පමණක් නොව සාමාන්‍ය ගෙවත්තක් හිමි ජනතාවට ද කහ පැළ 10ක් 15ක් හෝ තම ගෙවත්තේ වගාකර ගතහොත් එමගින් තමන්ගේ පරිභෝජනයට අවශ්‍ය කහ ප්‍රමාණයක් ලබාගත හැකි බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි විද්‍යාඥයෝ පවසති.

විශේෂයෙන් නව කහ වගා වැඩපිළිවෙළ යටතේ ලැබෙන කහ පැළ සුරක්ෂිතව නිවැරදි ක්‍රම අනුව වගා කිරීමට පියවර ගැනීම මගින් රටේ කෘෂි සංවර්ධනයට ද අපට දායක වීමට අවස්ථාවක් ලැබේ.

---

# නළා ගසා රටම හැල්ලු කළ තරුණයාට වැඩ වරදී

වසර දහයක් ඕස්ට්‍රේලියාවේ සිටි අයෙක්

දැඩි සේ අවවාදකොට රුපියල් පනස්දහසක ඇපයක් මත මුදා හැරේ

'මගේ අතින් වරදක් සිදුවුණා. රජයෙන් සහ පොලිසියෙන් සමාව ගන්නවා' තරුණයා කියයි

• අමිල මලවිසූරිය

**ශ්‍රී ලංකාව සහ චීනය අතර පවතින මිත්‍රත්වය ඈත අතීතයේ සිට පැවත එන්නකි. එම ඓතිහාසික මිතුදම සාක්ෂාත් කරමින් පසුගිය 27 වැනිදා ප්‍රථම වරට චීන ආරක්ෂක ඇමැතිවරයකු මෙරටට සැපත් විණි. ඒ, චීන ආරක්ෂක ඇමැති ජෙනරාල් වෙයි පෙන්ග්හිය.**

චීනයේ තෙවැනි බලවත්ම රාජ්‍ය නායකයා වන ආරක්ෂක ඇමැති ජෙනරාල් වෙයි පෙන්ග්හිගේ නිල සංචාරය සඳහා මෙරට රජයද විශේෂ සැලැකිල්ලක් දක්වන්නට වූයේ චීනය ලොව බලවත්ම රාජ්‍යයන් පහෙන්ද එකක් වන හෙයිනි.

පසුගිය 27 වැනිදා රාත්‍රියේ කටුනායක ගුවන් තොටෙන් මෙරටට පැමිණි වෙයි පෙන්ග්හි රැගත් රථ පෙළපාළිය කොළඹ නගරයට ළඟා වෙමින් තිබිණි.

එම රථ පෙළපාළිය බොරැල්ල මංසන්ධියට ළඟා වන විට රාත්‍රී 11.30ට පමණ විය. ඒ අවස්ථාවේ චීන ආරක්ෂක ඇමැතිවරයාට උපරිම ආරක්ෂාව සැපයීම සහ පහසුකම් සැපයීමට ද ශ්‍රී ලංකා රජයේ වගකීම වූ හෙයින් මාර්ග කීපයක් විනාඩි දහයක් වැනි කෙටි කාලයකට වසා දැමීමට පොලිසිය කටයුතු කෙරිණි.

## රථවාහනවල සිටි අයවලුන් උසිගන්වලා

එලෙස බොරැල්ල මංසන්ධියේ මාර්ග කීපයක් වසා දමා තිබියදී එලෙස වැසූ මාර්ගයක වූ රථවාහන අතුරින් මතුවූ තරුණයකු ඉදිරියට පැමිණ "කට්ටිය ඔක්කෝම හෝන් ගහන්න... ලොක්කන්ට යන්න මේ පාරවල් වහලා තියෙන්නෙ... අකමැත්ත පෙන්වන්න හෝන් ගහන්න... දිගටම හෝන් ගහන්න..." යැයි පවසමින් රථවාහනවල සිටි අයවලුන් උසිගැන්වීය.

පසුව එම පිරිස් විසින් තම රථවාහනවල නළා ශබ්ද කිරීම නිසාවෙන් මහත් ඝෝෂාවක් නැගුණේ එම ප්‍රදේශය පුරා ගිගුම් දෙමිනි. අනතුරුව එම පුද්ගලයා විසින් වීඩියෝ ගතකළ එම අශෝභන සිදුවීම සමාජ මාධ්‍යයේද සැරිසරනු දක්නට ලැබිණි.

සමාජ මාධ්‍යයේද 'උණු කැවුම්' සේ සැරිසැරූ විනාඩි කිහිපයක් පුරා දිවෙන එම වීඩියෝව විදේශ තාන්ත්‍රිකයකු මෙරටට සපැමිණෙන අවස්ථාවකදී සිදු නොවිය යුතුම දෙයක් බව සඳහන් කළ යුතුය. මන්ද ඉන් පිළිබිඹු වන්නේ රටේ ජනයාගේ නොහික්මුණු හැසිරීම් විලාසය වන හෙයිනි. සාමාන්‍යයෙන් විදෙස් රටවල රථයක නළා ශබ්දයක් ඇසෙනුයේ කලාතුරකිනි.

එම අවස්ථාවේ රථවාහනවල නළා නාද කරමින් ඝෝෂා කරන ලෙසට ජනයාටද උසිගන්වා එම ස්ථානයේ රාජකාරියෙහි නිරත පොලිස් නිලධාරින්ගේ රාජකාරියටද බාධා කරනු ලැබූ එම පුද්ගලයා පිළිබඳව පොලිසිය විසින් විමර්ශනයක් ඇරැඹීය.

බොරැල්ල පොලිසිය විසින් සිදුකළ විමර්ශනයෙන් අනතුරුව 31 හැවිරිදි මාධව විජේරත්න නමැති තරුණයෙක් පසුගිය 30 වැනිදා පොලිස් අත්අඩංගුවට පත් වූහ.

ඒ, එම පුද්ගලයා විසින් නළා ශබ්ද කරමින් ඝෝෂා කරන ලෙසට ජනතාව උසිගන්වමින් පොලිස් නිලධාරින්ගේ රාජකාරියටද බාධා කරනවාට අමතරව නීති විරෝධි රැස්වීමක සාමාජිකයෙක් වීමට තවත් පිරිස්ද පොලඹවමින් අනුබලදීමක් සිදු කළ හෙයිනි.

පොලිස් අත්අඩංගුවට පත් බත්තරමුල්ල, පැලවත්ත, පෙරේරා ගාඩ්න්හි වෙසෙන එකී තරුණයා වසර දහයක පමණ කාලයක් ඉගෙනීම් කටයුතු සඳහා ඕස්ට්‍රේලියාවේ වාසයකොට මෑතකදී මෙරටට පැමිණි අයෙකි.



පොලිස් අත්අඩංගුවට ගත් මාධව විජේරත්න අධිකරණයට රැගෙන යන අයුරු

## රාජ්‍ය තාන්ත්‍රිකයෙක්ට ආරක්ෂාව සැපයීම ශ්‍රී ලංකා රාජ්‍යයේ පරම වගකීමක්

එලෙස චීන ආරක්ෂක ඇමැතිවරයා සැපත් වන මොහොතකදී කළ කී දේ නිසාවෙන් එම තරුණයා අත්අඩංගුවට ගැනීම සම්බන්ධව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ සඳහන් කළේ, "කිසියම් රටක රාජ්‍ය නායකයෙක් රාජ්‍ය දූතයෙක් නැත්නම් රාජ්‍ය තාන්ත්‍රිකයෙක් මෙරටට පැමිණෙන මොහොතකදී ඔවුනට ආරක්ෂාව සැපයීම ශ්‍රී ලංකා රාජ්‍යයේ පරම වගකීමයි.

එසේම ලොව සුපිරිම බලවතුන්ගෙන් එක් රාජ්‍යයක් වන චීනයේ තුන්වැනි බලවත්ම රාජ්‍ය නායකයා වන ආරක්ෂක ඇමැතිවරයා මෙරටට පැමිණි මොහොතකදී උපරිම ආරක්ෂාවක් සැපයීම අපේ රටේ වගකීම. ඒ වගේම ආරක්ෂක ඇමැතිවරයා මෙරටට පැමිණි අවස්ථාව වන විට රාත්‍රි එකොළහට පමණ. ඒ වන විට මෙරට මාර්ගවල රථවාහන ගමනාගමනය ද යම් ආකාරයක සීමාවීමක් සිදු වෙලා තිබුණේ.

එසේම රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා බලපැවැත්වෙන වියානා ප්‍රඥප්තිය අනුවද අනිවාර්යයෙන්ම රාජ්‍ය තාන්ත්‍රිකයන්ට ආරක්ෂාව සහ රථවාහන පෙළපාළි පැවැත්වීමටද මෙරට රජය බැඳී සිටිනවා.

එම නිසා අත්අඩංගුවට පත් එම තරුණයා පොලිස් නිලධාරින්ගේ රාජකාරියට බාධා කිරීම, නීති විරෝධි රැස්වීමක් සංවිධානය කිරීම මෙන්ම ඒ සඳහා අනුබල දීම යන චෝදනා යටතේ අත්අඩංගුවටගෙන අධිකරණයට ඉදිරිපත් කළ" බව නියෝජ්‍ය පොලිස්පතිවරයා කීය. පසුගිය 30 වැනිදා බොරැල්ල පොලිසිය විසින් අත්අඩංගුවට ගත් එම තරුණයා එදිනම කොළඹ අතිරේක මහේස්ත්‍රාත් රජින්ද්‍රා ජයසූරිය වෙත ඉදිරිපත් කළාය.

අතිරේක මහේස්ත්‍රාත්වරිය විසින් එම තරුණයා රුපියල් 50,000ක ශරීර ඇපයක් මත මුදා හැරියත් දැඩි සේ අවවාද කරමින් මහේස්ත්‍රාත්වරයා සඳහන් කළේ රාජ්‍ය නායකයකු මෙරටට පැමිණීමේ අවස්ථාවකදී පොලිසිය ක්‍රියාකරන ආකාරයට තමන්ද අනුගත විය යුතු බවයි.

එසේම තමන් සිදුකළ ක්‍රියාව තුළින් රටට සිදුවූ අපකීර්තිය සුළු කොට තැකිය නොහැකි බවද මෙරට නීතියට තමන් අවනත විය යුතු සේම මෙය ඕස්ට්‍රේලියාව නොවන බවටත් මහේස්ත්‍රාත්වරිය සඳහන් කරමින් අදාළ නඩුව මැයි 12 වැනිදාට යළි කැඳවන ලෙසටද නියෝග කළාය.



මාධව විජේරත්නට අධිකරණයෙන් ඇප ලැබීමෙන් පසු ඉන් පිටතට පැමිණ මාධ්‍යයට පබ0 .ඩටඉ අදහස් දැක්වූ අයුරු


අධිකරණය ඉදිරියේ සිදුවූ වරදට සමාව අයැද සිටි මාධව විජේරත්න තරුණයා එදින අධිකරණයෙන් පිටතට පැමිණීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් සඳහන් කළේ,

"මගේ අතින් වරදක් සිදුවුණා... ඊට ශ්‍රී ලංකා රජයෙන් සහ ශ්‍රී ලංකා පොලීසියෙන්ද මම සමාව ඉල්ලනවා. ඒ වගේම මගේ ක්‍රියා කලාපය නිසාවෙන් ශ්‍රී ලංකා රජයටත්, ශ්‍රී ලංකා පොලීසියටත් මුහුණදීමට සිදුවූ අපහසුතාවන් පිළිබඳ කනගාටු වෙනවා..."

ස්වාධීන රටවල් අතර රාජ්‍ය දූත සබඳතා සඳහා පාදක ව්‍යුහය නියම කරන ලද වසර 1961 අප්‍රේල් 18 වැනිදා ඔස්ට්‍රියාවේ, වියානා අගනුවරදී අස්සන් කරන ලද 1964 අප්‍රේල් 24 වැනිදා සිට බලපැවැත්වෙන මේ වන විට ලංකාව ඇතුළු රටවල් 190ක් පාර්ශ්වකරුවන් වන අන්තර්ජාතික ගිවිසුම වන වියානා ප්‍රඥප්තිය අනුව කිසියම් රාජ්‍ය නායකයෙක්, රාජ්‍ය දූතයෙක් නැතිනම් රාජ්‍ය තාන්ත්‍රිකයෙක් කිසියම් රටකට පැමිණි මොහොතේ සිට එරටින් බැහැරව යන තෙක්ම එකී පුද්ගලයා හෝ කණ්ඩායමේ ආරක්ෂාව සැපැයීමට ඒ රාජ්‍යය බැඳී සිටී.

ශ්‍රී ලංකාවද වියානා ප්‍රඥප්තියේ පාර්ශ්වකරුවකු වන හෙයින් ශ්‍රී ලංකා රජයද සෑම විටෙකම මෙරටට පැමිණෙන රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ ආරක්ෂාව සැපයීමට බැඳි සිටින රාජ්‍යයකි.

හීය



● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

# වහාම නතර කළ යුතු සොඳුරු මාෆියාව

ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයක් පවතින කවර රටක වුවද බලහත්කාරය යනු මුළුමනින්ම නීති විරෝධී ක්‍රියාවකි. එසේම එය මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්ද වේ. එහෙයින් කවර අන්දමකට කෙරෙන බලහත්කාරයක් වුවද වැළැක්වීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින සියලුම රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉඩ ලබා දී තිබේ.

එහෙයින් නීතිමය පැත්තෙන් බලන විට බලහත්කාරය යනු බරපතළ දඬුවම් ලැබිය හැකි වරදකි. එසේ වුවද වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල බලහත්කාරය ප්‍රසිද්ධියේ ම ක්‍රියාත්මක වන අයුරු ඉතා සුලබ ලෙස පෙනෙන්නට තිබේ.

කෙසේවෙතත් එහි ඇති විශේෂත්වය වන්නේ එකී බලහත්කාරය ඉතා සොඳුරු ලෙස ක්‍රියාත්මක කිරීමට ඊට අදාළ පුද්ගලයන් වග බලා ගෙන තිබීමයි. එහෙයින් දත් විලිස්සා ගෙන එදෙස බලා සිටිනවා විනා රටේ නීතියට ද ඒ ගැන කළ හැකි දෙයක් නැත. එසේ වන්නේ එම සොඳුරු බලහත්කාරයට ගොදුරු වන වින්දිතයන් හැම දෙනෙකුම පාහේ සිය කැමැත්තෙන්ම ඊට නතු වන බැවිනි.

ඉහත සඳහන් බලහත්කාරය සොඳුරු ලෙස ක්‍රියාත්මක කරනු ලබන්නේ ආහාර පාන, ඇඳුම් පැලඳුම් ඇතුළු අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන හෝ විදෙස් රටවල් වලින් ආනයනය කරනු ලබන බහු ජාතික වෙළඳ සමාගම්ය. ආයතන ය. එම දෙපාර්ශ්වය විසින් සාමූහිකව ක්‍රියාත්මක කර ගෙන යන සොඳුරු බලහත්කාරයට ගොදුරු වන පාරිභෝගිකයන්ට සිදු වන්නේ තමන් දුක් මහන්සියෙන් උපයා ගන්නා ලද මුදල් ගෙවා ඉතාමත් අඩු වටිනාකමකින් යුත් පාරිභෝගික භාණ්ඩයක් රැගෙන යෑමටය. උදාහරණයක් වශයෙන් අද වෙළඳපොළේ විකිණීමට ඇති සුවඳ සබන් කැටය ක මිල රුපියල් 70 - 110 ක් පමණ වේ. විශේෂිත වර්ගයක මිල රුපියල් 150 කටත් වැඩිය.

විවිධ ජනප්‍රිය නම් වලින් හැඳින්වෙන එම එක් එක් වර්ගයේ සබන් වල මිල එකිනෙකට අඩු වැඩි වන්නේ රැපියල් 05 ක් හෝ ඊටත් අඩු මුදලකිනි. ඔබ වෙළඳපොළේ රුපියල් 70 ක් හෝ 110 ක පමණ මුදලක් ගෙවා මිලට ගන්නා සුවඳ සබන් කැටයක නිෂ්පාදිත මිල රුපියල් 20 කටත් අඩු වන බව ඔබ දන්නවාද?

නිෂ්පාදකයන් විසින් රුපියල් 20 ක් වැනි ඉතා සුළු මුදලකට නිපදවනු ලබන සුවඳ සබන් කැටයක් එහි නියම මිල මෙන් හතර ගුණයකටත් වැඩි මුදලකට විවෘත වෙළඳපොළේ අලෙවි කරන්නේ ඒවා විවිධ ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම සඳහා වැය වන මුදල ද ඊට එකතු කරමිනි. රෙදි සේදීමට ගන්නා දියර හා කුඩු වර්ග ද අද විවෘත වෙළඳපොළේ මෙතරම් අධික මිලකට අලෙවි කරන්නේ ඉහත සඳහන් අන්දමේ වෙළඳ ප්‍රචාරණයට වැය වන මුදල ද ඊට එකතු වන බැවිනි.

එකී නිෂ්පාදන ආයතන මඟින් ප්‍රචාරක සමාගම් හරහා කරන වෙළඳ ප්‍රචාරණයට යන වියදම් නොවන්නට රෙදි සෝදන කුඩු කිලෝවක් රුපියල් 10 කට පමණ අලෙවි කර ගත හැකිය. පැණි බීම වර්ග, කෝලා වර්ග, හා සෝයා වර්ග පමණක් නොව බයිසිකල් , මෝටර් බයිසිකල් හා මෝටර් රථ ආදියේ වුව ද මිල ඉහළ ගොස් ඇත්තේ එම නිෂ්පාදන සමාගම් විසින් එකිනෙකා පරයමින් කෙරෙන ප්‍රචාරක වියදම් අනුවය.

ඕනෑම දහ ජරාවක් වුවද පාරිභෝගිකයන් අතර දැඩි ඉල්ලුමක් ඇති වන අයුරින් රුවැති සිනමා තාරකා සහභාගී කරවා ගෙන වෛවර්ණ රූපවාහිනී දැන්වීම් නිර්මාණය කිරීම අපේ දැන්වීම් ප්‍රචාරක ආයතන වලට ඉතා සුළු දෙයකි.

තත්පර ගණනක ආයු කාලයකින් යුත් අතිශය චිත්තාකර්ෂණීය වෙළඳ දැන්වීමක් නිපදවීම සඳහා එවැනි ප්‍රචාරක ආයතයන් විසින් අය කෙරෙන ගාස්තුව රුපියල් මිලියන පහකටත් වැඩිය රූපවාහිනී තිරය මත දිස්වන එවැනි අනුරාගී බවින් යුතු වෙළඳ දැන්වීම් දෙස නෙත් දල්වා බලා සිටින ප්‍රේක්ෂකයන් ඊළඟ මොහොතේ ළඟම පිහිටා ඇති සුපිරි වෙළඳ සැල වෙත දිව යන්නේ තරුණ කතුන් ආකර්ෂණය කරන සබන් වර්ගය හෝ කොලෝන් වර්ගය සොයා ගෙනය.

ශත පනහකටත් වඩා අඩු පිරිවැයකින් නිපදවන ලද එම කොලෝන් කුප්පියක් සුපිරි වෙළඳසැලේ අලෙවි කරන්නේ එකක් රුපියල් එක්දහස් දෙසිය ගණනකටය. එහෙත් ඒ ගැන වගක් වත් නැති තරුණ පාරිභෝගිකයන් තමන් දුක් මහන්සියෙන් උපයා ගන්නා ලද මුදල් ඒ සඳහා වැය කරනු ලබන්නේ දැඩි උන්මාදයකිනි. ඒ එකී වෙළඳ දැන්වීම දැක සිතේ ඇති වූ පෙලඹවීමෙනි.

අද එම තත්ත්වය වැඩි පුරම දක්නට ලැබෙන්නේ හිරිමල් වියේ සිටින ළඳුන් අතරය. ඒ තම රූ සිරිය වැඩි දියුණු කර ගෙන අන්‍යයන් අතර වැඩි පුරම කැපී පෙනීමට වෙර දරන්නේ තරුණ ළඳුන් වන බැවිනි. මේ බව මනාව අවබෝධ කර ගෙන සිටින දැන්වීම් ප්‍රචාරක ආයතන එම බොළඳ චින්තනයට සරිලන රූප රාමු දෙක තුනක් සහිත වෙළඳ දැන්වීම් නිපදවනු ලබන්නේ එක දැන්වීමක් සඳහා රුපියල් මිලියන ගණනින් ගාස්තු අයකර ගෙනය. එවැනි රූපවාහිනී දැන්වීම් වල පෙනී සිටීම සඳහාම කැපවූ නිරූපණ ශිල්පිනියෝ දැන්වීම් නිෂ්පාදන ක්ෂේත්‍රයේ කොතෙකුත් සිටිති.

මේ අතර අපගේ බොහෝ විද්‍යුත් මාධ්‍ය ආයතන විසින් සිදු කරන එක්තරා සදාචාරාත්මක නොවන ක්‍රියාවක්ද මෙකල බහුල වශයෙන් දකින්නට ලැබේ. එමගින් ඔවුන් කරන්නේ විවිධ නම් වලින් හැඳින්වෙන එකම මාදිලියේ පාරිභෝගික භාණ්ඩ ප්‍රවර්ධනය කිරීම සඳහා නිපදවන ලද වෙළඳ දැන්වීම් කිහිපයක් එක ළඟ ළඟ විකාශනය කිරීමය. අතිශය සිත් ගන්නා සුළු එවැනි වෙළඳ දැන්වීම් දකින කාන්තා හා පිරිමි පාරිභෝගිකයන් ඊළඟට පැටලෙන්නේ ඒ අතරින් කුමන වෙළඳ නාමයකින් යුත් භාණ්ඩයක් තෝරා ගත යුතු දැයි යන ප්‍රශ්නයටය.

අත මිට යහමින් තිබෙන සෙල්ලක්කාර තරුණ තරුණියන් එවැනි පඹගාල් වල පැටලීම අපට ඒ හැටි ප්‍රශ්නයක් නොවේ. එහෙත් අපේ සිතට දුකක්, වේදනාවක් දැනෙන්නේ හසරක් නොදත් කිරිසප්පයන්ගේ කෑම බීම, ඇඳුම් පැළඳුම්, හා ශරීර සෞඛ්‍ය රැකගැනීම සඳහා අවශ්‍ය ආලේපන වර්ග පිළිබඳව නිපදවා ඇති වෙළඳ දැන්වීම් පුංචි තිරයේ එක ළඟ විකාශය කිරීම ගැනය. එම කුඩා දරුවන්ගේ දෙමාපියන් ඒ අතුරින් කවරක් තෝරා ගත යුතු දැයි වටහාගත නොහැකිව පඹගාලක පැටලීම එහි නියත ප්‍රතිඵලය වේ.

ඇතැම් දේශීය වෛද්‍යවරුන්ගේ විස්මය ජනක ප්‍රතිකාර සඳහන් වෙළෙඳ දැන්වීම් කීපයක්ම මේ දිනවල විද්‍යුත් මාධ්‍ය ඔස්සේ විකාශය කෙරේ. එම වෙළඳ දැන්වීම් මඟින් දක්වා ඇත්තේ අදාළ වෛද්‍යවරුන්ගේ විස්කම් දස්කම් ගැනය. එම වෛද්‍යවරුන් විසින් නිපදවා ඇති තෙල් වර්ග ආලේප කර දිනට පසු දිනම අදාළ රෝගියා සුවපත් වී ව්‍යායාම කරන අයුරු තිරය මත දිස්වන්නේ ඒවා නරඹන්නන්ගේ පවා නෙත් සිත් ආකර්ෂණය කර ගනිමිනි. අන්තිමේදී බලන විට අදාළ විශ්වකර්ම තෙල් කුප්පියක මිල රුපියල් අටදහස් පන්සීයකි. ඒ මොහොතේම ඇණවුම් කරන්නේ නම් රුපියල් හත් දහසකට ගෙදරටම ලබා ගත හැකිය.

සැබැවින්ම එහි ඇති ගුණා ගුණ කෙසේ වෙතත් එම තෙල් කුප්පියක නිෂ්පාදිත වියදම රුපියල් තුන්සීයකටත් අඩුය. එහෙත් රෝගියාට එම විශ්වකර්ම තෙල් කුප්පියකට රුපියල් අටදහස් පන්සීයක් ගෙවීමට සිදු වී ඇත්තේ තත්පර ගණනක ධාවන කාලයකින් යුත් වෙළඳ දැන්වීම් නිෂ්පාදනය කිරීම සහ එය විවිධ චැනල ඔස්සේ නිෂ්පාදනය කිරීම සහ එය විවිධ චැනල ඔස්සේ විකාශය කිරීම සඳහා වූ පිරිවැයටත් සම්මාදම් වෙමිනි.

අපට පෙනෙන අන්දමට නම් මෙය තනිකරම ගසාකෑමකි. නැතහොත් මහා පරිමාණයෙන් පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කරන දේශීය හා විදේශීය වෙළඳ සමාගම් මඟින් සිදු කර ගෙන යන බරපතළ ගණයේ මාෆියාවකි. අසරණ පාරිභෝගිකයා ගොනාට අන්දන මේ සොඳුරු මාෆියාව රජයේ මැදිහත් වීමෙන් වහාම නතර කළ යුතුය. මන්ද එය ඇඟට නොදැනෙන ලෙස කරන බලහත්කාරකමක් වන බැවිනි.



මුතුරාජවෙල ජලධාරා



මුතුරාජවෙල භූමිය ඇතුළත සිදුකර ඇති අනවසර ගොඩකිරීම්

# කොළඹට, ගම්පහට ඔක්සිජන් සපයන මුතුරාජවෙල ජාතික වනෝද්‍යානයක් වෙයි

● හර්ෂා සුගතදාස

**ලංකාවේ ජන ඝනත්වයෙන් පෙරමුණේ සිටින කොළඹ සහ ගම්පහ ප්‍රදේශයේ හරිත පෙණහලු ලෙස සැලකෙන්නේ මුතුරාජවෙල තෙත් බිම් කලාපයයි. මෙම මුතුරාජවෙල තෙත් භූමිය ජාතික වනෝද්‍යානයක් බවට පත්කිරීම සඳහා මූලික පිඹුරුපත සැකසෙන බව පසුගියදා අසන්නට ලැබිණි. ඒ සඳහා මූලිකත්වය ගෙන තිබෙන්නේ පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ ය. මුතුරාජවෙල අභයභූමිය ජාතික වනෝද්‍යානයක් බවට පත් කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර තිබෙන බව ඔහු අනාවරණය කළේ මහාචාර්ය තිස්ස විතාරණගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේ පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක (කෝප්) සභාවේදී ය.**

කෝපා කමිටුව මගින් පෙර රැස්වීමේදි නිර්දේශ කළ පරිදි මුතුරාජවෙල අභයභූමිය සංරක්ෂණය කිරීම සඳහා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය සහ වනජීවී අමාත්‍යාංශය යන අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සම සභාපතිත්වයෙන් යුතු ඒකාබද්ධ කමිටුවක් පත් කර ඇති බවද ඔහු තවදුරටත් සඳහන් කළේය. මෙම කමිටුව බලාත්මක කිරීම සඳහා මේ වන විට සාකච්ඡා පවත්වා කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර ඇති අතර එය අනුමත වූ විගස ක්‍රියාත්මක වීම ආරම්භ කළ හැකි බවත් එම කමිටුවට සහය වීම සඳහා අදාළ සියලු ආයතන සහ පරිසර සංවිධානවල නියෝජිතයන්ගෙන් සමන්විත ක්‍රියාකාරි කමිටුවක් පත් කිරීම අත්‍යවශ්‍ය බවත් මෙහිදි අවධාරණය කෙරිණි.

මෙය පරිසරවේදීන්ටත් සොබාදහමට ඇලුම් කරන අයටත් සුබ ආරංචියකි. මෑතකදී මුතුරාජවෙල සම්බන්ධයෙන් අසන්නට ලැබුණු සතුටුදායකම පුවත මෙය විය හැක්කේ මුතුරාජවෙල සම්බන්ධයෙන් බොහෝ විට අසන්නට ලැබෙන්නේ අසුබ ආරංචි නිසා ය.

ලංකාවේ බටහිර වෙරළ තීරය දිගේ පැතිරුණු උතුරින් මීගමු කලපුවටත් දකුණින් කැලණි ගඟටත් බටහිරින් වෙරළ තීරයටත් නැඟෙනහිරින් කොළඹ - මීගමුව ප්‍රධාන පාරටත් මායිම්ව පිහිටි මුතුරාජවෙල හෙක්ටයාර් 3,068ක ප්‍රමාණයකින් යුතු භූමියකි. “මුතු වන් සහල් ලබා දුන් වෙල්යායක්“ යන අරුතින් මුතුරාජවෙල යන නම බිහි වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. කැලණි ගං මෝයේ සිට මීගමුව කලපුව දක්වා පෘතුගීසින් විසින් මෙම වෙල්යාය හරහා ඇළ මාර්ගයක් කැපීමෙන් ලුණු මිශ්‍ර ජලය වෙල් යායට කාන්දු වීම නිසා වෙල්යායේ සාරවත් බව අඩු වී පුරන් විය. පෘතුගීසින් විසින් කැපූ ඇළ, ලන්දේසින් විසින් වැඩිදියුණු කර භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගත් බැවින් එම ඇළ මාර්ගය ඕලන්ද ඇළ ලෙස හැඳින්විණි. ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශය යටත් කර ගැනීමත් සමඟ මුතුරාජවෙල මුහුදට ආසන්නයේ තවත් ඇළ මාර්ගයක් ඉදි කළ අතර එය හැමිල්ටන් ඇළ ලෙස හැඳින්විණි. හැමිල්ටන් ඇළ ඉදි කිරීමත් සමඟ මුහුදු ජලය මුතුරාජවෙලට පැමිණීම ඉහළ ගොස් මුතුරාජවෙල වගුරු බිමක් බවට පත් විය. සිංහලයන් විසින් හැමිල්ටන් ඇළ මෝඩ ඇළ ලෙස හැඳින්වූයේ එමනිසාය.

මුහුදු ජලය මුතුරාජවෙලට පැමිණීමට හේතු වූයේ මුතුරාජවෙල මුහුදු මට්ටමඩ වඩා අඩි 2ක් 3ක් පහතින් පිහිටා ඇති නිසාය. මෙම ස්වාභාවික පිහිටීම ගම්පහ දිස්ත්‍රික්කයට වෙස් වළා ගත් ආශිර්වාදයක් විය. ඊට හේතුව දඬුගම් ඔය, ජා-ඇළ යන ඇළ මාර්ගවලින් මුහුදට ගලා එන ජලකඳේ අතිරික්තය මුතුරාජවෙල භූමියේ තාවකාලිකව රඳවා ගත හැකි වීමයි. දියකඳ මුතුරාජවෙල රඳවා ගැනීමට නොහැකි වුවහොත් ගම්පහ දිස්ත්‍රික්කයම ජලයෙන් යට වීම වැළැක්විය නොහැකිය. එමෙන්ම නාගරික ප්‍රදේශයේ අධික කාබන්ඩයොක්සයිඩ් මට්ටම නියාමනය කිරීම, වැසි ජලයේ රොන්මඩ තැන්පත් කරගෙන පිරිසිදු ජලය මුහුදට එකතු කිරීම ද මුතුරාජවෙල තෙත් බිමෙන් සිදු වන සුවිශේෂී කාර්යභාරයකි. පරිසර උෂ්ණත්වය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම ද මෙම තෙත් බිමෙන් ඉටුවන තවත් කාර්යයකි. කඩොලාන බිම්, ලවණ වගුරු බිම්, ලවණ ජලය හා මිරිදිය ජලය සහිත ඇළ මාර්ග, තෘණභූමි, පඳුරු වනාන්තර, ගංගාශ්‍රිත වනාන්තර ආදි වශයෙන් විවිධ පරිසර පද්ධති රාශියකින් සමන්විත මුතුරාජවෙල වගුරු බිම ජෛව විවිධත්වයෙන් අනූන කලාපයකි.

## මුතුරාජවෙල අභයභූමිය වනෝද්‍යානයක් කිරීමට කෙටුම්පතක්

## මුතුරාජවෙල ආරක්ෂා නොවුණොත් ගම්පහ දිස්ත්‍රික්කයම වැසි වතුරෙන් යට වේවි

## මුතුරාජවෙල තෙත් බිම් කලාපය දැනටමත් රැම්සා තෙත් බිමක්



මුතුරාජවෙල භූමිය ඇතුලත ඉදිකර ඇති අනවසර කර්මාන්තශාලා කිහිපයක්

මුතුරාජවෙල තෙත් බිම් කලාපයේ සමනලුන් බත්කූරන් මත්ස්‍යයන් උභයජීවීන් උරගයන් පක්ෂීන් ක්ෂීරපායින් යන සත්ව කාණ්ඩ 7ට අයත් විශේෂ 449ක් වාර්තා වී ඇත. ඉන් විශේෂ 27ක් මෙරටට ආවේණික සත්ව විශේෂ වේ. ඊට අමතරව නේවාසික පක්ෂීන් විශේෂ 86 ක්ද සංක්‍රමණික පක්ෂීන් විශේෂ 43 ක්ද වාර්තා වී තිබේ. ශාක කුල 66 කට අයත් ශාක විශේෂ 194 ක් ද මුතුරාජවෙල වගුරු බිමෙන් හඳුනාගෙන ඇත.

මේ සා වටිනා සම්පතක් වූ මුතුරාජවෙල භූමියට නීතිමය ආරක්ෂාව ලැබුණේ 1996 වසරේදීය. ඒ 1996 ඔක්තෝබර් 31 වැනි දින නිකුත් කළ අංක 947/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව තෙත්බිමේ හෙක්ටයාර් 1028.62 ක භූමි ප්‍රදේශයක් මුතුරාජවෙල අභය භූමිය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟිනි.

මීට අමතරව ජාතික පාරිසරික පනතේ “24 ඇ“ හා “24 ඈ“ උප වගන්තිවලට අනුව මුතුරාජවෙල ස්වාරක්ෂක කලාපය ලෙස වෙන් කළ තෙත් බිම් ප්‍රදේශය ලංකාවේ ප්‍රථම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. ඒ 2006 ඔක්තෝබර් 13 වැනි දින නිකුත් වූ අංක 1466/26 දරන ගැසට් නිවේදනය මගිනි. මේ අනුව ස්වාරක්ෂක තෙත් බිම් කලාපයේ තෙත් බිම් හෙක්ටයාර් 206.67 ක් මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කෙරිණි.

ඉන්පසුව 2018 සැප්තැම්බර් 25 වැනි දින අංක 2090/11 දරන ගැසට් නිවේදනය මඟින් මුතුරාජවෙල තෙත් බිමේ හෙක්ටයාර් 162.10 ක් පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට එක් කර තිබේ. එහෙත් මෙම තෙත් බිම් සංරක්ෂණය සඳහා සැලසුම් සකස් කිරීමට පෙර 1989 වසරේදී සකස් කෙරුණු ආසියානු තෙත් බිම් නාමාවලියේ ජාත්‍යන්තරව වැදගත් වන තෙත් බිම් 41 අතරින් එකක් ලෙස මුතුරාජවෙල නම් කර, ලංකාවේ ප්‍රමුඛ තෙත් බිම් පද්ධති 12න් 1ක් ලෙස හඳුනාගෙන තිබේ. 1990 ඔක්තෝබර් 15 වැනි දින ශ්‍රී ලංකාව එළැඹි රැම්සා සම්මුතියට අනුව මුතුරාජවෙල තෙත් බිම් කලාපය රැම්සා තෙත් බිමක් ලෙස නම් කර ඇත.

මුතුරාජවෙල අභයභූමියට නීතියෙන් කොපමණ ආරක්ෂාව ලැබුණත් දේශපාලකයන්, ව්‍යාපාරිකයන් හා මැර කණ්ඩායම් විසින් මෙය විනාශ කිරීමට කටයුතු කර තිබීම කනගාටුදායකය.

භූමිය ගොඩ කරමින් ගම්මාන ඉදි කිරීම, කන්ටේනර් අංගණ ඉදි කිරීම, ඉවතලන කුණුවලින් පිරවීම, හෝටල් ඉදි කිරීමට සූදානම් වීම වැනි විවිධ සංවර්ධන ව්‍යාපෘති රාශියක් මුතුරාජවෙල භූමියේ ඉදි කිරීමට පියවර ගෙන තිබුණේ රාජ්‍ය නිලධාරින් තම වගකීම් නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීමෙනි. මුතුරාජවෙල අභයභූමිය රැක ගැනීම සඳහා කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ මූලිකත්වයෙන් ස්වෙච්ඡා සංවිධාන රාශියක් පෙරට පැමිණියේ එබැවිනි.



පාහියංගල ආනන්ද සාගර හිමි

“මේ මුතුරාජවෙල භූමියේ රජයේ ඉඩම් තිබෙනවා. පෞද්ගලික ඉඩම් තිබෙනවා. රජයේ බලපත්‍රලාභී ඉඩම් තිබෙනවා. පෞද්ගලික ඉඩම් 2ක් තියෙන කෙනා ඒ ඉඩම් 2ට මැද්දෙ තියෙන රජයේ ඉඩමත් අල්ලා ගන්නවා. මේ විදිහට මුතුරාජවෙල ඉඩමට අයිති භූමි ප්‍රමාණය අඩුවෙලා තියෙන්නේ. ඒනිසා මුලින්ම මේවා නිරවුල් කර ගන්න ඕනෑ. අභයභූමියක පෞද්ගලික ඉඩම් තියෙන්න පුළුවන්. ඒත් ජාතික වනෝද්‍යානයක පෞද්ගලික ඉඩම් තිබෙන්න බැහැ. මුතුරාජවෙල ජාතික වනෝද්‍යානයක් කිරීම හොඳ දෙයක්. ඒත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ආරක්ෂා කර ගත යුතු භූමියකට නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ කර ගන්නේ ඇයි කියන එක අපිට ලොකු ගැටලුවක්.“ යනුවෙන් පැවසුවේ මුතුරාජවෙල අභයභූමිය සුරැකීමේ සංවිධානයේ ක්‍රියාකාරිකයකු වන දිනූෂ නානායක්කාරය.

මුතුරාජවෙල තෙත් බිම් කලාපය තුළ අනවසර ඉදිකිරීම් පිළිබඳ ලැබෙන පැමිණිලි අදාළ රාජ්‍ය ආයතන මඟින් නිසි පරිදි විමර්ශනයට ලක් නොවීම පිළිබඳ විගණකාධිපතිවරයාගේ අවධානය යොමුවී තිබේ. මෑතකදී හෙක්ටයාර 06ක් ගොඩ කිරීම සම්බන්ධයෙන් විගණන විමසුමක් දැනටමත් පවතින බවත් අනවසර ගොඩ කිරීම සඳහා රාජ්‍ය ආයතන නිසි පරිදි මැදිහත් නොවීම පිළිබඳවත් මහාචාර්ය තිස්ස විතාරණගේ මූලිකත්වයෙන් පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානයට ලක් විය.

මීට අමතරව මුතුරාජවෙල තෙත්බිම සහ අවට කලාපය තුළ දැනට පවතින තත්ත්වය පිළිබඳව අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කළ සමීක්ෂණයේදී තෙත්බිම් කලාපයෙන් 15%ක් සහ අභයභූමියෙන් 15%ක්ද මේ වන විට විනාශයට ලක් වී ඇති බව මෙහිදී අනාවරණය විය. ඉතිරි කලාප ද විනාශ වී යෑමේ තර්ජනයට ලක් වී ඇති බැවින් සංරක්ෂණ ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කළ යුතු බවට සඳහන් කරනු ලැබීය.

මුතුරාජවෙල අභයභූමියේ සීමා මායිම් හඳුනා ගැනීම සහ මායිම් ලකුණු කිරීම මේ වන විට අරඹා ඇත. එමෙන්ම මෙහි ඇති අනවසර ඉදි කිරීම් සහ ගොඩ කිරීම් පවරා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන පනත භාවිත කිරීමේ ශක්‍යතාව ද එදින කෝප් කමිටුවේදී සාකච්ඡාවට භාජනය විය. 2021 ජනවාරි 27 වැනිදා බස්නාහිර ආණ්ඩුකාරවාරයා විසින් මුතුරාජවෙල අධි සංවේදී පරිසර කලාපයේ සියලු පෞද්ගලික ඉඩම් රජයට පවරා ගන්නා බවට ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී යෝජනා සම්මත කර තිබීමත් සාකච්ඡා කෙරිණි.



පරිසරවේදී දිනුක්ෂ නානායක්කාර

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්ය ප්‍රශාන්ති ගුණවර්ධන පසුගියදා කළ ගණනය කිරීම්වලට අනුව මුතුරාජවෙල වටිනාකම රු.මිලියන 3700 කි. “සුරකිමු ශ්‍රී ලංකා“ සංවිධානයේ සභාපති පාහියන්ගල ආනන්ද හිමි සඳහන් කළේ අභයභූමියේ මැනුම් කටයුතු කර නිරවුල් කර ගැනීමෙන් අනතුරුව මුතුරාජවෙල අභයභූමිය, ජාතික වනෝද්‍යානයක් බවට පත් කිරීම කාලෝචිත ක්‍රියාමාර්ගයක් බවයි. මෙම පියවර ගැනීම පිළිබඳව රජයට ස්තුතිය හිමි විය යුතු බව ද උන්වහන්සේ වැඩිදුරටත් සඳහන් කළහ.



# රටේම හදවත් දිනූ ළාබාලතම මිලියනපතියා

## ප්‍රශස්ත කවිශ්‍යාද්

● සුරේකා නිල්මිණී ඉලංකෝන්

**හොඳම දේ දරුවන්ට බව ප්‍රකට කියමනකි. ඒ හොඳම දේ තුළින් උකහා ගන්නා දෙයින් පෝෂණය වන දරුවන් රටේ අනාගතය නිර්මාණය කරන බවට සාධක දැස් හමුවේ පෙනෙන්නට තිබීම සතුටකි.සිරස ලක්ෂපති වැඩසටහනට තරග කොට රුපියල් මිලියනක් දිනූ කොළඹ ආනන්ද විද්‍යාලයේ 8 වැනි වසරේ ඉගෙනුම ලබන 13 හැවිරිදි නවම් ප්‍රශස්ත කවිශ්‍යාද් පෙරේරා රටේ අනාගත පරපුර ගැන සුබ නිමිති දල්වන පහන් සිලක් වැනිය.**

ප්‍රශස්ත කවිශ්‍යාද් මේ දක්වා සිරස ලක්ෂපති තරගයෙන් ජයගත් ළාබාලයා වන අතර ඔහු පිළිබඳ ප්‍රේක්ෂක අවධානය වැඩිපුර යොමු වූයේ ප්‍රශස්ත රුපියල් මිලියනයක් දිනාගත් නිසාම පමණක් නොවේ. වැඩසටහන පුරාවටම ප්‍රශස්ත කවිශ්‍යාද් දරුවා පෙන්වූ දැනුම් සම්භාරය, චතුර කථිකත්වය පමණක් නොව ඔහුගේ ප්‍රියමනාප බව ද මනාව කැපී පෙනුණි. ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී ඔහු පෙන්වූ බුහුටිකම ඉතා ආකර්ෂණීය විය. එපමණක් නොව ඔහුගේ කුඩා හදවතින් ගලා ආ ආකල්ප, සිතුම්පැතුම් තුළ අපූර්වතම චමත්කාරයකි. විටෙක ඒ සිතිවිලි තෙතමනයක් නැති වැඩිහිටි හිත්වලට ආදර්ශයකි.

"මම හරිම ආසයි නිදහසට. කුරුල්ලෙක් වගේ පියාඹන්න. ලෝකයේ කවුරුත්ම දැකපු නැති දේවල් දකින්න. සොබාදහමත් එක්ක කතා කරන්න."

වරක් ප්‍රශස්ත එසේ කීවේය. වාග් චාතුර්යයෙන් මෙන්ම ආකර්ෂණීය සුන්දර සිනාවකින් ප්‍රේක්ෂකයන් ආකර්ෂණය කරගත් ඒ මුවට වදන් ගලා එන අපූරුව ඇතැම් විට සිතට ගෙන ආවේ විස්මයකි. ගහට කොළට, ඇළට දොළට මෙන්ම සතා සිවුපාවා ඇතුළු පරිසරයට බොහෝ පෙම් බඳින ඒ පුංචි හදවතේ පරිසරය ගැන ඇත්තේ දැඩි විශ්වාසයකි. "අපි පරිසරයට හානි නොකර හිටියොත් අපිටත් හොඳින් ජීවත් වෙන්න පුළුවන්" යැයි පුංචිකමට ඔහු කියන සත්‍ය බොහෝ වැඩිහිටි හිත්වලට නොවැටහීම අවාසනාවකි.

"මනුස්සයකුට වැඩිය සතකුට තේරෙනවා. සත්තුන්ට කතා කරන්න බැරිවුණාට අපිත් එක්ක හැඟීම් හුවමාරු කරගන්නවා. මම දඟ වැඩක් කරලා ගුටියක් එහෙම කාලා කාමරේට වෙලා දුකෙන් ඉන්න වෙලාවට අපේ පූසා, බ්ලැක් ඇවිත් මං දිහා බලාගෙන ඉන්නවා. දිගටම බලාගෙනම ඉන්නවා. මගේ දුක ඉවර වෙනකම්ම බලාගෙන ඉඳලා තමයි එයා යන්නෙ. ඒ වගේ වෙලාවට අපිට එයාගෙන් හරි සතුටු වෙන්න පුළුවන්; අපේ දුක කවුරුහරි තේරුම් ගත්තා කියලා."

මිනිසුන්ට මෙන්ම සතාසිවුපාවා ඇසුරෙන් පවා ආදරය, කරුණාව අත් විඳින සංවේදී හදවතක් සහිත දරුවකු වන ප්‍රශස්තගේ හුරුබුහුටි කතාව විටෙක දෑස්වලට ගෙන ආවේ සතුටු කඳුළු ය. සිරස ලක්ෂපතියෙන් මිලියනයක් දිනූ ප්‍රශස්ත පුතු සිය දක්ෂතාව විදහා පෑ පළමු අවස්ථාව මෙය නොවේ. සිරස එෆ්. එම් සමනල සිරස' 2018 පුංචි ප්‍රාඥයා' වැඩසටහනේ පළමු අදියරේ අවසන් තරගයෙන්ද ඔහු ජය ගත්තේය. සිරස ලක්ෂපති වැඩසටහනෙන් ඔහු රුපියල් මිලියනයක් දිනාගනිද්දී ප්‍රේක්ෂකයන්ට ද ඒ පුංචි හදවතේ සතුට දැනුණි. වැඩසටහන ඉදිරිපත් කළ ප්‍රවීණ මාධ්‍යවේදී චන්දන සූරියබණ්ඩාර පවා ඒ ජයග්‍රහණය හමුවේ වඩාත් සංවේදී විය.

"ප්‍රශස්ත පුතාට හීන දකින්න, පියාඹන්න, අලුත් දේවල් හොයාගන්න, යෝධ බල යෝධ ශක්තිය ලැබෙන්න " කියා ඔහු ප්‍රාර්ථනා කළේ සතුටු කඳුළක් දෑසේ රඳවාගෙනය.

බෙල්ලන්විල පදිංචි ප්‍රශස්ත පුතුගේ පියා එම්. ඒ. ඩැනිස්ටර්. පෙරේරා පෞද්ගලික අංශයේ රැකියාවක නිරතව සිටී. ඔහුගේ මව නිමාලි දිනූෂා ඇන්තනී ගෘහණියකි. ප්‍රශස්තගේ එකම සොයුරිය තස්වි කවිශ්‍යාදි 17 හැවිරිදිය. ගල්කිස්ස බෞද්ධ බාලිකා විද්‍යාලයේ සිසුවියක වන ඇය මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටියාය. ප්‍රශස්ත පුතු පළමු වසරේ සිට 5 වැනි වසර දක්වා අධ්‍යාපන ලබා ඇත්තේ ගල්කිස්ස විද්‍යා විද්‍යාලයේය. ඔහු කොළඹ ආනන්ද විදුහලට ඇතුළුවීමට වරම් ලැබුවේ පහේ හපනෙක් ලෙස ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 185ක් ලබාගෙන ය. පවුලේ ම ජයග්‍රහණයක් බඳු ප්‍රශස්තගේ ජයග්‍රහණය ගැන ඔහුගේ පියා කතා කළේ නිහතමානී ආඩම්බරයකිනි.

" ඒ ගැන ගොඩක් සතුටුයි; හිතුවේ නැහැ පුතා මෙච්චර දුරක් එයි කියලා. පුතාට මුලින්ම පළමු වසරට ඇතුළත් වෙන්න පාසලක් ලැබුණෙ නැහැ. ඒ දවස්වල මමත් රැකියාව කළේ පිටරට. පුතාට පාසලක් නැතිව මාස 6ක්ම ගෙදර ඉන්න වුණා. පුංචි කාලේ ඉඳලම පුතා ඉගෙන ගන්න දක්ෂකම් පෙන්නුවා. ඒ වගේම කියවන්න පුදුම ආසාවක් තියෙන්නේ. සමහර වෙලාවට බාත්රූම් යන්නෙත් කියවන්න පොතක් අරගෙන. සමහර වෙලාවට අම්මා බණිනවා. ඒ වගේ වෙලාවක පුතා හංග ගෙන පොතක් අරගෙන ගිහින් කියවනවා. දවසක් එහෙම කියව කියව හිටපු පොත ඇඳුම් එක්ක බේසමට වැටිලා. පුතාගේ අම්මා දන්නෙ නැතුව ඒක වොෂින් මැෂින් එකට දාලා ඒ පොත ආයේ කියවන්න බැරි තරමට විනාශ වෙලා තිබුණා. එයා ඒ ගැන දුකෙන් හිටියෙ. ඒ පොත තමයි එදා චන්දන මහත්තයා පුතාට තෑගි කළේ. ඒ ගැනත් පුතාට පුදුමාකාර සතුටක් තියෙන්නෙ. ඒ වගේම ගමනක් ගියත් ඒ හැම තැනින්ම කරුණු එකතු කරන එක පුතාගේ විනෝදාංශයක්. "



ප්‍රශස්ත පුතු සිය බළල් සුරතලා බ්ලැක් සමඟින්



**මම කැමති ඉංජිනේරුවෙක් වෙන්න**

කියවන්න කැමති, දැනුම් පිපාසිත ප්‍රශස්තට සිරස ලක්ෂපතියේ දොරගුළු විවර වූ අයුරු ගැන ද ඔහු කීවේය.

"පුතාගේ සීයා (අම්මගේ තාත්තා) ගාමිණී ඇන්තනී (75) තමයි පුතාව මේ වැඩසටහනට ඉදිරිපත් කරන්න කියලා කිව්වේ. ඒ වෙලාවේ පුතා බෑ කිව්වා ටීවී එකට ගිහින් උත්තර දෙන්න බැහැ කියලා. පුතා වැඩසටහනට මුහුණ දුන්න විදිහ ගැන වෙලාවකට මටත් පුදුම හිතුණා. පුතා දන්න සමහර දේවල් මමවත් දන්නෙ නැහැනේ කියලා මට හිතුණා."

පිය සෙනෙහස එසේ දෝරගලා යද්දී ප්‍රශස්ත පුතුගේ මව නිමාලිට ද පුතු ගැන කියන්නට බොහෝ දේ තිබුණි.

"දුවයි පුතයි අතර වයස් පරතරය අවුරුදු හතරයි. පුතා ලැබෙන්න ඉන්නකොට ස්කෑන් එකෙන් අපි දැනගත්තා පුතෙක් තමයි ලැබෙන්නෙ කියලා. පුතා ඉපදුණේ 2008 පෙබරවාරි (නවම්) මාසේ 16 වැනිදා. උපන් නැකත අනුව ලැබුණු අකුරුවලට පුතාට නවම් ප්‍රශස්ත කවිශ්‍යාද් කියලා නම තිබ්බේ මමයි මහත්තයයි. පුංචි කාලේ ඉඳලම පුතා කාටවත් කරදරයක් නැති එයාගේ පාඩුවේ ඉන්න දරුවෙක්. පොඩිකාලේ ඉඳලම පොත්වලට එයාගේ තියෙන්නෙ පුදුම කැමැත්තක්. බස් එකකට පොත් අරගෙන වෙළෙන්දෙක් නැග්ගොත් පොතක් අරගෙන නොදී ඉන්න බැහැ. සෙල්ලම් වාහනවලට ආස වුණත් පුංචි කාලේ පුතා ආසාවෙන් බදාගෙන හිටියේ පොත් මිසක් සෙල්ලම් බඩු නෙවෙයි.

මට මතකයි යන්තම් තේරෙන වයසෙදි මම මුලින්ම පුතාට ගෙනත් දුන්නේ පින්තූර පොතක්. එයා හරි ආසාවෙන් ඒ පින්තූර,අකුරු දිහා බලාගෙන ඉන්නවා. පුතා හොඳට ඉගෙන ගනී කියලා දැනුණු නිසාම මම පුතාව හොඳ ළඳරු පාසලකට දැම්මා. කේම්බ්‍රිජ් කියන ඒ ජාත්‍යන්තර මට්ටමේ ළදරු පාසලේදී පුතාගේ මුල්ම ගුරුවරිය වූ පත්මිණී ටීචර් නිසා තමයි පුතා ආශාවෙන් අකුරු ලියන්න පුරුදු වුණේ. මුල් දවස්වල පුතා මොන්ටිසෝරි ගියේ යන්න බෑ කිය කියා අඬ අඬා. පස්සේ ටීචර්ගේ අවධානය ගන්න පුංචි පුංචි දඟ වැඩ කරලා ටීචගෙන් පුංචි දඬුවම් එහෙමත් ලැබුවා. ඒත් පත්මිණී ටීචර් තමයි මුලින්ම පුතාගේ දක්ෂකම් හොඳින්ම අඳුන ගත්තේ. පුතාට හොඳ මතකයක් තියෙනවා. පුංචි කාලේ මම එයාට කියපු දේවල් තාමත් ඒ විදිහටම මතකයි. පුතා ලැබෙන්න ඉන්නකොට අපි හිටියේ කුරුණෑගල රිදී විහාරය කිට්ටුව. ඒක හරි ලස්සන ගමක්. ඒ විස්තර පුතාට කිව්වහම පුතා කිව්වා එයා ලොකුවෙලා වාහනයක් අරගෙන කුරුණෑගල අපි හිටපු ඒ ගෙදර, ගම බලන්න යනවලු. ගමේ පරිසරයට පුතා හරිම ආදරෙයි.අපේ ගේ පිටිපස්සේ තියෙන මී ගහේ වටිනාකම ගැන එයා හරි ආදරෙන් කතා කරන්නෙ."

ප්‍රශස්ත පුතුට ඉගෙනීමේ කටයුතු සහ බාහිර කටයුතු සමබරව කරගෙන යෑම සඳහා නිවෙසින් ලැබෙන ඉඩහසර ගැනත් අප ඇයගෙන් විමසුවෙමු.

"පුතාට අපි නීතිරීති දාලා නැහැ. පාඩම් වැඩ කළාට පස්සේ ටිකක් සෙල්ලම් කරනවා. ටී.වී එකේ යන කාටූන් දෙකක් විතර බලනවා. අපේ ගෙදර ටීවී එකේ යන නාට්‍ය නම් බලන්නෙම නැති තරම්. තෝරාගත් වැඩසටහන් විතරයි පුතාට බලන්න දෙන්නෙ. පුතා බෙල්ලන්විල ශ්‍රී බෝධිරාජ දහම් පාසලෙන් දහම් අධ්‍යාපනයත් ලබනවා. පුතා කියවන්න කොයිතරම් උනන්දුයි ද කියනවා නම් කියවන්න එයාට පොතක් නැත්තම් එයාම කතාවක් ලියාගෙන හරි කියවනවා. ලක්ෂපති වැඩසටහන ගෙදර ඉඳන් බලනකොට පුතා ගොඩක් වෙලාවට ඒ හැම ප්‍රශ්නෙකටම හරියට උත්තර දෙනවා. අපි ඉතින් පුතාට විහිළු කරනවා මෙතන ඉඳන් කියන්නෙ නැතුව වැඩසටහනට යන්න කියලා. ඒත් පුතාට ටීවී එකට යන්න ආසාවක් තිබුණේ නැහැ. මගේ තාත්තගේ ආසාව නිසාම තමයි ගියේ. හැබැයි මට නම් හිතුණා පුතා දක්ෂ නිසා එයාට මිලියන දෙකම දිනාගන්න පුළුවන් වෙයි කියලා. නමුත් මේ ලැබූ ජයග්‍රහණයත් අපිට ගොඩාක් වටිනවා. ප්‍රශස්ත පුතු වැඩසටහන පුරාවට දැක්වූ චතුර බව

**සිරස ලක්ෂපතියට ගියේ සීයාගේ ඉල්ලීමට**



ප්‍රශස්ත සිය ගුරුවරයකු සමඟ

පෙර පුහුණුවක ප්‍රතිඵලයක් දැයි ඇසූ පැනයට ප්‍රශස්තගේ මව පිළිතුරු දුන්නේ සිනාසෙමිනි.

"එහෙම කිසිම පුහුණුවක් ලැබුවේ නැහැ. ලක්ෂපති ටීම් එකේ ළමයි පුතාට කිව්වා පුතාට කිව්වා පුතා බය නැතුව චන්දන සර් එක්ක කතා කරන්න. පුතා දන්න දෙයක් තියෙනවා නම් සර් ටත් කියලා දෙන්න කියලා. ඒ කතාවට පුතාට ගොඩක් සතුටු හිතුණා. පුතා පුංචි කාලේ ඉඳලා උගන්වන්න හරි දක්ෂයි. ශිෂ්‍යත්ව පන්ති යනකොට ටීචට හරි සර් ට වැරදීමක් වුණොත් පුතා ඒක කියනවා. ළඟදිත් එක මිස් කෙනෙක් කිව්වා ප්‍රශස්ත ඉතින් අපිටත් ඉගැන්නුවානේ කියලා. පුතා 5 වසරේ ඉන්නකොට ශිෂ්‍යත්ව පන්තියේ සර් පුතාට පන්තිය බාරදීලා ගිහින් සර් ආපහු එනකොට ළමයින්ගේ කිසිම සද්දයක් නැහැලු. බලනකොට පුතා ළමයින්ගෙන් ප්‍රශ්න අහනවලු.දෙන උත්තරවලට බෝඩ් එකේ ලකුණු දානවලු. පුතා මිලියනය දිනුවට පස්සේ සර් කතා කළා. සර් ට හරිම සතුටුයි. පුතාගේ දක්ෂකම සර් ත් මුල ඉඳලම අඳුන ගෙන හිටියා. මේ දක්වා පුතාට ඉගැන්වූ හැම ගුරුතුමෙක්ම ගුරුතුමියකගේම ආදරය දිනාගන්න පුතා වාසනාවන්ත වුණා. ඒ ගැන මට ගොඩක් සතුටුයි.

ඇය පුතු නිසා නිම්හිම් නැති සතුටක් විඳිද්දී අප ඇගෙන් විමසුවේ දරුවන්ගේ ජීවිත සම්බන්ධයෙන් මවුපියන්ට පැවරෙන වගකීම ගැනය.

"දෙමවුපියෝ නිතරම දරුවාගේ පස්සෙන්ම ඉන්නවා නම් හොඳ දරුවෙක් හදාගන්න පුළුවන්. ඒ වගේම දරුවට නිදහස දුන්නට දරුවා කරන්නෙ මොනවද කියන එක ගැන නිතරම විමසිල්ලෙන් ඉන්න ඕන. පවුලක් විදිහට අපි හතරදෙනා නිතරම එකටමයි ඉන්නෙ. මම හිතන්නේ දරුවාගේ දියුණුවට ඒකත් හේතුවක්

ඊළඟට අපේ කතාබහට එක්කර ගත්තේ රටටම කතා කරන ප්‍රශස්ත පුතු යි. ජයග්‍රහණයේ සතුට ගැන විමසද්දී ඒ මුවේ ඇඳුණේ සුරතල් සිනාවකි.

"ගොඩාක් , ගොඩාක් සතුටුයි. මෙච්චර දුරක් එන්න පුළුවන් වෙයි කියලා නම් හිතුවේ නැහැ. හොට් සීට් එකට ආවට පස්සේ ටිකක් බයත් හිතුණා. කතාකරගෙන යද්දි බය නැතිවෙලා හොඳට කතා කරගෙන යන්න පුළුවන් වුණා. චන්දන සර් ආදරෙන් කතා කරද්දි බය නැතිවෙලාම ගියා.

ජයග්‍රහණය ගැන බොහෝ දෙනකුට ස්තුති කරන්නට ද ඔහු අමතක කළේ නැත.

"අම්මා, තාත්තා, සීයා, ආච්චි, අක්කාට ගොඩක් ස්තුති කරනවා. අක්කා මට අලුත් දේවල් හොයාගන්න ගොඩක් උදවු කරනවා. කියවන්න පොත් හොයලා දෙනවා. මොන්ටිසෝරියේ ඉඳන් මේ දක්වා මට උගන්වපු හැම මිස් කෙනෙකුටම සර් කෙනෙකුටම ස්තුති වන්ත වෙනවා. ඒ වගේම මගේ මුල් පාසලේ සහ දැන් ඉගෙන ගන්න පාසලේ විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලයටම ගොඩක් ස්තුතියි කියනවා. සිරස ආයතනයටත් ස්තුතිවන්ත වෙනවා".

පොත් කියවීමට අමතරව චිත්‍ර ඇඳීමටත් සතුන් ගැන පොත් ලිවීමටත් කැමති ප්‍රශස්ත වඩාත් ප්‍රියකරන්නේ චෙස් ක්‍රීඩාවට සහ බාස්කට් බෝල් ක්‍රීඩාවටය. අනාගතයේ ඉංජිනේරුවරයෙක් වීමට කැමැත්තෙන් සිටින ඔහු පරිසරය ගැන වැඩිදුර ඉගෙන ගැනීමට ද ප්‍රිය කරයි.

"ඉස්කෝලේ වැඩ හොඳින් කරලා ගුරුවරුන්ට, මවුපියන්ට කීකරුව පොත් ගොඩක් කියවලා අමතර දැනුමත් හොයාගෙන ක්‍රීඩා කටයුතුත් කරලා අනාගතේ හොඳ රැකියාවක් කරලා රටට සේවයක් කරන්න. ඒ වගේම පරිසරයටත් ආදරය කරන්න කියලා මම නංගිලා මල්ලිලාට කියන්න කැමතියි".

ප්‍රශස්ත පුතුගේ සිතිවිලි ද ඔහු මෙන්ම පියකරු ය; ප්‍රශස්ත ය. අවසාන වශයෙන් ප්‍රශස්ත පුතු දිනාගත් රුපියල් මිලියනය ගැන අප ඔහුගේ මවගෙන් විමසුවේ මේ වන විට ඒ පිළිබඳ විවිධ අසත්‍ය පුවත් සමාජ ජාලා ඔස්සේ පළ වෙමින් තිබෙන නිසාය. "ඒ මුදල මුළුමනින්ම පුතාගේ ඉදිරි අධ්‍යාපන කටයුතු වෙනුවෙන් වෙන් කිරීමයි අපේ බලාපොරොත්තුව".

**මිලියනය පුතාගේ ඉදිරි අධ්‍යාපන කටයුතු වෙනුවෙන් යොදවනවා - මවුපියෝ කියති**



ප්‍රශස්ත පුතු පියා ඩැනිස්ටර්, මව නිමාලි සහ එකම අක්කා තස්වි සමඟ

**පුතා පුංචි කාලෙත් සෙල්ලම් බඩු වෙනුවට බදාගෙන හිටියෙ පොත්**



**මම හරිම ආසයි නිදහසට; කුරුල්ලෙක් වගේ පියාඹන්න; ලෝකයේ කවුරුත්ම දැකපු නැති දේවල් දකින්න; සොබාදහමත් එක්ක කතා කරන්න**

ලැනරෝල් පරපුරේ කතන්දරේ පිටුව 21
නයින්ට පොළඟුන්ට ආදරේ තරුණියක් පිටුව 22
'කැරකෙන රෝදේ' ලියා අමරණීය වූ සිරිල් පිටුව 24



ද්විත්ව කර්ණ සංඛ බද්ධ සැත්කමෙන් පසු



# බිහිරි බව නැති කිරීමේ අලුත්ම සැත්කම

## රජයේ රෝහලකදී කෙරුණු ප්‍රථම ද්විත්ව කර්ණ සංඛ බද්ධය



● රසික කොටුදුරගේ

**ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට රජයේ රෝහලකදී ද්විත්ව කර්ණ සංඛ බද්ධයක් 'Cochlear Nucleus Freedom Series' සාර්ථකව සිදුකර තිබේ. ඒ පසුගිය මාර්තු 11 දින කොළඹ ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ උගුර කන නාසය පිළිබඳ උපදේශක ශල්‍ය වෛද්‍ය සංජීවනී රූපසිංහ ප්‍රමුඛ කණ්ඩායමක් විසිනි. මීට ප්‍රථම එක් කනක කර්ණ සංඛ බද්ධයක් මෙරටදී සිදු කර ඇත්තේ 2004 වසරේදී විදේශීය වෛද්‍යවරයකු විසින් පෞද්ගලික රෝහලකදීය.**

පසුගිය පෙබරවාරි මාසයේදී, වයස අවුරුදු දෙකහමාරක දරුවෙකු සඳහා ද්විත්ව කර්ණ සංඛ බද්ධය සිදු කරන ලද අතර, මේ සඳහා භාවිතා කරන ලද්දේ, ලොව දැනට පවතින දියුණුතම ශ්‍රවණ උපාංගය ලෙස සැලකෙන, රැහැන් රහිත N7 කථන ප්‍රොසෙසරයක් සහිත **'Cochlear Nucleus freedom contour advance'** උපාංගයකි පෙබරවාරි 25 දිනට යෙදුණු ලෝක කර්ණ ශංඛ බද්ධ දිනය සැමරීමක් වශයෙන්, පෙබරවාරි 24 වැනි දින නුගේගොඩ වික්‍රමාරච්චි ශ්‍රවණ ආයතනයේදී එම ප්‍රොසෙසරය ක්‍රියාත්මක කරන ලදි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ උගුර කන නාසය පිළිබඳ උපදේශක ශල්‍ය වෛද්‍ය සංජීවනී රූපසිංහ සහ වික්‍රමාරච්චි ශ්‍රවණ ආයතනයේ සභාපති මිහිර වික්‍රමාරච්චි සමඟ සාකච්ඡා කළෙමු.

**Cochlear** අධිරෝපණය යනු සාමාන්‍ය මට්ටමේ සිට බරපතළ මට්ටම දක්වා ශ්‍රවණාබාධ සහිත පුද්ගලයන් සඳහා පිළිගත්, සාර්ථක හා දීර්ඝකාලීන විසඳුමකි. මෙමගින් සිදුකෙරෙනුයේ හානි වී ඇති ඇතුළු කන වෙනුවට විකල්පයක් ලෙස ක්‍රියා කරමින්, මොළය වෙත ශබ්ද සංඥා ලබා දීමය. සාමාන්‍ය ශ්‍රවණාධාර උපාංග මඟින් සිදුවන්නේ හුදෙක් ශබ්දය වැඩිකර දීම පමණි.

කන් දෙකෙහිම සාමාන්‍ය මට්ටමේ සිට බරපතළ මට්ටම දක්වා ශ්‍රවණාබාධ සහිත පුද්ගලයන්ට හෝ සාමාන්‍ය ශ්‍රවණාධාරවලින් ප්‍රමාණවත් ප්‍රතිඵල නොලබන පුද්ගලයන්ට මෙම ශ්‍රවණ උපාංගය **(Cochlear)** මඟින් සාර්ථක ප්‍රතිඵල අත්කර දෙයි. තවද මෑතදී සිදු කළ ද්විත්ව අධිරෝපණ සැත්කම රජයේ රෝහලකදී සාර්ථක ලෙස සිදුකිරීමට හැකිවීම මඟින්, රජයේ සෞඛ්‍ය සේවා අරමුණුවලට සමගාමීව රාජ්‍ය සෞඛ්‍ය ප්‍රතිපත්ති ප්‍රායෝගික ලෙස ක්‍රියාවට නැංවෙන බව සනාථ වේ. මේ නිසා ශ්‍රී ලාංකිකයන්ට මින් ඉදිරියට මෙම සැත්කම සඳහා විදේශගත වීමට අවශ්‍ය නොවන අතර, මෙරටදීම පහසුවෙන් එම සැත්කම සිදුකර ගැනීමට හැකියාව පවතී.

මෙය ශ්‍රී ලාංකිකයන්ට විශාල මුදලක් ඉතිරි කරදෙනු ඇති අතර, මෙවැනි සැත්කම් සාර්ථක ලෙස සිදුකිරීමට හැකිවීම මඟින් ශ්‍රී ලංකාව සතු කීර්තියද ඉහළ යනු ඇත. රට තුළ වෛද්‍ය සේවා සංචාරක ක්ෂේත්‍රය **(Medical tourism)** වැඩිදියුණු කිරීමට රජය මෙන්ම පෞද්ගලික අංශයද අවධානය යොමුකර ඇති පසුබිමක් තුළ මෙය එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහාද උපකාරී වේ.

ශ්‍රවණාබාධ සහිත දරුවන් සඳහා මෙම ශෛලකර්මය සිදු කරන අතර, විශේෂයෙන් උපතින් ම කන් නො ඇසෙන දරුවන් කෙරෙහි වැඩි අවධානයක් ලබාදෙයි. මෙරට ප්‍රධාන ප්‍රධානපෙළේ ආරෝග්‍යශාලාවන්හි ශ්‍රවණාබාධ ඇත්දැයි පරීක්ෂා කිරීමේ හැකියාව තිබේ. මීට ප්‍රථම ශ්‍රවණාබාධ ඇත්දැයි පරීක්ෂා කිරීම සිදු කරනු ලැබූයේ අවදානම් සහගත දරුවන්ගේ පමණි.

එනම්, අඩුවයසින් උපදින, නොමේරූ ළදරු ඒකකයේ සිටින සහ මවට දියවැඩියාව වැනි කිසියම් රෝගී තත්ත්වයක් ඇති දරුවන්ට පමණි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශයන්ට අනුව මෙවැනි දරුවන් ඉපදුණු වහාම ශ්‍රවණ පරීක්ෂණය කළ යුතු බවට නිර්දේශ කර ඇත. නමුත් අද වනවිට එම මාර්ගෝපදේශය අනුව උපදින සෑම දරුවකුගේම ශ්‍රවණ පරීක්ෂණය සිදු කිරීමට නිර්දේශ කර තිබේ.

2016 වසරේදී ජයවර්ධනපුර රෝහලේ ශ්‍රවණ පරීක්ෂණ ඒකකය ආරම්භ වූ අතර, මේවනවිට රජයේ රෝහල් කිහිපයක හා පෞද්ගලික රෝහල් කිහිපයක මෙම පරීක්ෂණය සිදු කෙරේ. මෙම පරීක්ෂණය සිදු කිරීමෙන් දරුවකුගේ කන් ඇසීම

**ශ්‍රී ලාංකිකයන්ට මින් ඉදිරියට මෙම සැත්කම සඳහා විදේශගත වීමට අවශ්‍ය නොවන අතර, මෙරටදීම පහසුවෙන් සැත්කම සිදුකර ගැනීමට හැකියාව පවතී. මෙය ශ්‍රී ලාංකිකයන්ට විශාල මුදලක් ඉතිරි කරදෙනු ඇති අතර, මෙවැනි සැත්කම් සාර්ථක ලෙස සිදුකිරීමට හැකිවීම මඟින් ශ්‍රී ලංකාව සතු කීර්තියද ඉහළ යනු ඇත**

පිළිබඳ දළ අදහසකට එළඹිය හැකිය. දරුවකු ශබ්දවලට ප්‍රතිචාර නොදක්වන විට සහ ඔහුගේ කථන හැකියාව වර්ධනය නොවන විට කන් ඇසීම දුර්වල බව අපට නිගමනය කළ හැකිය.

සාමාන්‍යයෙන් මාස 8ත්-10 ත් අතර කාලයේදී දරුවකු බහ තේරීමට පටන් ගනී. එසේ නොකරන විට එම දරුවා කතා නොකරන බව මවුපියන් වටහාගනී. එවිට වෛද්‍ය ප්‍රතිකාර සඳහා දරුවන් යොමු කිරීම මා පියන්ගේ සාමාන්‍ය සිරිතය. එහිදී අවබෝධ වන්නේ මෙම දරුවන් කතා නො කරන්නේ ඔවුන්ට කිසිවක් නො ඇසෙන නිසා බවය.

උප්පත්තියෙන් ගොළු ළමයින් බිහිරි නොවන අතර, කන් නො ඇසීම නිසා ඔවුන් ගොළු



රැහැන් රහිත N7 ප්‍රොසෙසරයක් සහිත Freedom Nucleus freedom contour advance උපාංගය සවි කළ පසු පෙනෙනයුරු දැක්වෙන මුහුණෙහි පැති කඩක්

බවට පත්ව තිබේ. ලොව පුරා සිදු කර ඇති ශ්‍රවණ පරීක්ෂණය මඟින් මේ බව හඳුනාගෙන තිබේ.

### සැත්කම කළ යුතු අවස්ථාව

අලුත උපන් දරුවකුගේ මොළය විකාශනය වීමේදී එහි ඇති එක් එක් කොටස්වලින් අදාළ කාර්යයන් සිදු කරයි. එනම්, ඇස් පෙනීම, කථනය, අත් පා චලනය වීම සහ කන් ඇසීම සම්බන්ධයෙන් ක්‍රියාකරන එක් එක් කොටස් අප මොළය තුළ පවතී. ඒ අනුව මේ එක් එක් අවයවයන්ගේ ක්‍රියාකාරකම් තීරණය කරනු ලබයි. මේ අතරින් කන් ඇහීම සම්බන්ධ කොටස හා කථනය සම්බන්ධ කොටස සමඟ සම්බන්ධතාවයක් පවතින අතර එය නිවැරදිව සිදු විය යුතුය. කෙනෙකුට ඇසෙන විට ඉන් කතා කළ හැකි කොටසට සංඥා නිකුත් කරයි. කෙනෙකුගේ උපතින් කන් නො ඇසෙන අවස්ථාවක කතා කළ හැකි කොටස ඊට අනුරූපව ප්‍රතික්‍රියා නොදක්වයි. එයින් හැඟී යන්නේ එහි ක්‍රියාකාරිත්වය නිසිපරිදි සිදු නොවන බවයි. මේනිසා ඔහු ගොළු අයකු බවට පත්වේ.

### සැත්කමේ සාර්ථකත්වය

සාමාන්‍යයෙන් දරුවකු වසර 3ක් පමණ ගතවනවිට මොළයේ විකාශනය වීම සිදුවේ. එනිසා කන් ඇසීම දුර්වල බව දැනගත් වහාම කුඩා දරුවන්ගේ කර්ණ සංඛ බද්ධය සිදු කිරීම කළ යුතුය. එවිට ඉතාම සාර්ථක ප්‍රතිඵල ළඟාකරගත හැකිය. කාල වකවානුවක් දක්වන්නේ නම් වසර තුනක් ගෙවීයාමට මත්තෙන් කර්ණ සංඛ බද්ධය සිදු කිරීම වඩාත් සුදුසු වේ.

සමහරවිට බොහෝ කාලයක් ගත වී ඊට ප්‍රතිකාර කර කර්ණ සංඛ බද්ධයක් සිදු කළ ද කථනය හා සම්බන්ධ කොටස කාලයක පටන් අක්‍රියව පැවැති නිසා කතා කිරීමට නොහැකි වේ. එනිසා වයස අවුරුදු 16 සිට වැඩිහිටි අවදිය දක්වා වයස්ගත වූ උදවිය මෙම ශල්‍යකර්මය කර ගැනීමට පැමිණියද ඔවුන්ට බලාපොරොත්තු වූ ප්‍රතිඵල අත් කරගත නොහැකිය. ඊට හේතු වන්නේ ඔවුන්ගේ කථන කොටස ක්‍රමානුකූලව දියුණු වී නොමැති වීමය. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන මොළයේ කොටස හීනවී තිබීමය. එනිසා වැඩිවියට පත් වූ පසු මෙම ශෛලකර්මය සිදු කර ගැනීමෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල අත්කරගත නොහැකිය. කල්ගත වී සිදු කරන කර්ණ සංඛ බද්ධයෙන් කිසියම් ප්‍රතිඵලයක් අත් වුවද 100% ප්‍රතිඵල අත්කරගත නො හැකිවේ.



ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ උගුර කන නාසය පිළිබඳ උපදේශක ශල්‍ය වෛද්‍ය සංජීවනී රූපසිංහ

මාස 8 දරුවන්ට මෙම ශල්‍යකර්මය සිදු කර ඇති අතර, ශල්‍යකර්මය සිදු කර තුවාල සුවවී සති දෙකක් පමණ ගෙවුණු තැන ශ්‍රවණේන්ද්‍රිය මත සවිකළ ඉලෙක්ට්‍රොනික උපකරණය සක්‍රීය කරනු ලබයි. ඉන් අනතුරුව දරුවාට සාමාන්‍ය ලෙස ශ්‍රවණය වීමට පටන් ගනී. මෙලෙස ශබ්ද ඇසුණු සැණින් දරුවා කතා නොකරන අතර, මෙතෙක් නොඇසුණු ශබ්ද වචනවලට පෙරළා ගැනීමට වාචික චිකිත්සක ක්‍රම භාවිතා කළ යුතුය. එය හඳුන්වන්නේ 'ස්පීච් තෙරපි' කියාය. ඔහුට කිසියම් ශබ්දයක් ඇසෙන්නට සලස්වා එය හඳුන්වා දීම මඟින් ඒවා වචනවලට පෙරළා ගැනීමට ඔහුට උපකාරීවීම මින් සිදු කෙරේ. කර්ණ සංඛ බද්ධය සිදු කළ දරුවකුට මෙම වාචික චිකිත්සාව ඉතාම වැදගත් වන අතර එසේ නොකර ශල්‍යකර්මය පමණක් සිදු කළ දරුවන් කතා කිරීමට මාස 6-8 පමණ කල් ගතවේ. වාචික චිකිත්සාව නැතිනම් කථන චිකිත්සාව සිදු කළ දරුවන් මාස දෙක තුන පමණ ගතවනවිට කතා කිරීමට පටන් ගනී.

### ශල්‍යකර්මයේ අවදානම

ඕනෑම ශල්‍යකර්මයක අවදානමක් පවතී. අප ඖෂධ පාවිච්චි කළද එහි අතුරු ආබාධ තිබේ. මෙම ශල්‍යකර්මයේ අතුරු ආබාධ පිළිබඳ විමසීමේදී මෙම ශල්‍යකර්මය මඟින් ඉලෙක්ට්‍රොනික උපකරණයක් කර්ණ සංඛයට ඇතුළු කිරීම සිදු කරයි. එය ජීවිත කාලය තුළම එහි රැඳී තිබෙන උපකරණයකි. එලෙස කාලාන්තරයක් තිස්සේ කිසියම් උපකරණයක් ශරීරය තුළ පවතිනවිට එමඟින් ආසාදන ඇති විය හැකිය. එනිසා එම ආසාදන පාලනය කිරීමට ශල්‍යකර්මය සිදු කිරීමට ප්‍රථම ප්‍රතිශක්තිකරණ එන්නත් මාලාවක් ලබාදීම සිදු කරයි. ප්‍රතිශක්තිකරණය මඟින් රෝගවලින් ආරක්ෂාවන්නා සේම මෙම උපකරණය නිසා ඇතිවිය හැකි ආසාදිත තත්ත්වයන් ද පාලනය වේ.

අනෙක් අතට මෙම ශල්‍යකර්මය පැය හතරක් හෝ පහක් ගතවන ඉතාම සංකීර්ණ ශල්‍යකර්මයක් වන අතර, මොළයට ඇතුළු කරන මෙම ඉලෙක්ට්‍රොනික උපකරණය ඉතාම සියුම් ස්නායු, රුධිරනාල හරහා ගමන් කර සවි කළ යුතුය. එවැනි සියුම් කටයුත්තක් සිදු කිරීමේදී කිසියම් අවදානමක් නොපවතිනවාම නොවේ.

එසේ වුවත් මේ දක්වා එවැනි අවස්ථාවන් ලොව පුරාම වර්තාවී ඇත්තේ ලක්ෂයකට එකක් හෝ දෙකක් පමණි. වෛද්‍ය සංජීවනී රූපසිංහ පවසන ආකාරයට මෙම ශල්‍යකර්මය මෙරට දරුවන් 1,200කට පමණ ඉතාම සාර්ථකව සිදු කර ඇත. මේ දක්වා ඇය විසින් කළ

**මෙම ශල්‍යකර්මය පැය හතරක් හෝ පහක් ගතවන ඉතාම සංකීර්ණ ශල්‍යකර්මයක් වන අතර, මොළයට ඇතුළු කරන මෙම ඉලෙක්ට්‍රොනික උපකරණය ඉතාම සියුම් ස්නායු, රුධිරනාල හරහා ගමන්කර සවි කළ යුතුය**

කිසිදු ශල්‍යකර්මයක් අවදානම්කාරී තත්වයකට මුහුණපා නැති අතර, ශල්‍යකර්මය සිදු කරන කාලසීමාව පුරාම අදාළ ස්නායුවේ ක්‍රියාකාරිත්වය අධපණ කිරීම මඟින් එකී අවදානම වළක්වා ගනී. එසේම මෙම ශල්‍යකර්මය සිදු කිරීමට ප්‍රථම සිටී ස්කෑන් සහ එම්ආර්අයි ස්කෑන් සිදු කරනු ලබන අතර, එමඟින් අදාළ ස්නායුව සම්බන්ධයෙන්, කර්ණ සංඛය, මොළයට සංඥා ගෙන යන ස්නායුව සොයාගනී. එසේම ශල්‍යකර්මයට භාජනවන පුද්ගලයාගේ වෙනත් රෝගී තත්ත්වයන් හා ඊට මුහුණදීමේදී ඇති විය හැකි වෙනත් සංකූලතා ඇත්දැයි මින් සොයා බලන නිසා මෙම ශෛල්‍යකර්මය සිදු කිරීමේදී ඇතිවන අවදානම ඉතාම අල්පය.

මෙය දරුවා ගෙදරට සමාජයට රටට බරක් නොවී යහපත් පුරවැසියකු කිරීමට යොදන සාර්ථක අඩිතාලමකි. එමෙන්ම එය ඔවුන්ගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යයකි. ඇතැම් අය මෙම ශල්‍යකර්මය පෞද්ගලික රෝහල් මඟින් සිදු කරගත්තද එසේ කළ නොහැකි දරුවන්ට ගැටලුවක්ව පවතින්නේ මෙම ශල්‍යකර්මය රජයේ රෝහල් මඟින් සිදු කර ගැනීමට යාමේදී පොරොත්තු ලේඛනයේ සිටීමට සිදු වීමය.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි.
ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ඡායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න.
සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි.
සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ.
සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : 011-2429262 -3-4-5
ෆැක්ස් : 011-2429260
විද්‍යුත් ලිපිනය : silbiz@lakehouse.lk
දැන්වීම් කළමණාකරු : 011 2429429 දිගුව 351

# වාණිජ මණ්ඩලී

## 'හෙළවිරු' ඩිජිටල් වෙළෙඳපොළ SLT-MOBITEL Epic Technology වෙතින්

SLT-MOBITEL සහ Epic Technology Group එක්ව මෑතකදී "හෙළවිරු" කෘෂි නිෂ්පාදන සහ කෘෂි වෙළෙඳ භාණ්ඩ අලෙවි සහ හුවමාරු ඩිජිටල් වෙළෙඳපොළ හඳුන්වා දෙනු ලැබීය. මෙම නව ඩිජිටල් වෙළෙඳපොළ ඔස්සේ පුළුල් පාරාසයක කෘෂි නිෂ්පාදන සහ කෘෂි වෙළෙඳ භාණ්ඩ පාර්ශ්ව රැසක් සමඟ අලෙවි කටයුතු කිරීමේ සහ හුවමාරු කරගැනීමේ අවස්ථාව උදාවේ.

"හෙළවිරු" මඟින් ගොවීන්ට සහ වගාකරුවන්ට සිය නිෂ්පාදන කඩිනමින් සාධාරණ මිලකට ඩිජිටල් තාක්ෂණය ඔස්සේ, භෞතික වෙළෙඳපොළකට පැමිණීමකින් තොරව අලෙවි කරගැනීමට අවස්ථාව නිර්මාණය කරදී තිබේ.වසංගත තත්ත්වය හමුවේ ගොවීන්හට තම අස්වැන්න විකුණාගැනීමට අවහිරතා පවතින මෙවන් අවධියක මෙවැනි සේවාවක් ඉතාමත් ප්‍රයෝජනවත් වේ.

Epic Technology Group විසින් "හෙළවිරු" ඩිජිටල් වෙළෙඳපොළ සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම කරනු ලැබූ අතර,SLT-MOBITEL වෙතින් එහි ඩිජිටල් බලගැන්වීම සිදුකරනු ලබයි.

එමෙන්ම SLT හි අති නවීන දත්ත මධ්‍යස්ථානය මඟින් සමාගම් දෙක සම්බන්ධීකරණය කරමින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක කරයි.

මේ අතර LAUGFS සුපර්මාකට් පුද්ගලික සමාගම සහ Softlogic Holdings PLC සමාගම් ද මෙම වැඩසටහනට සම්බන්ධ වී සිටියි. ඒ අනුව එම සමාගම් හරහා, "හෙළවිරු" ඩිජිටල් වෙළෙඳපොළ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැළෙන්නන් අතර ප්‍රවර්ධනය කිරීමත්, ඔවුන්ට මෙම වැඩසටහන් සමඟින් සක්‍රියව සම්බන්ධ කරවීමත් සිදුකරයි.




## ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උළලේදී IIT ට සම්මාන රැසක්



ශ්‍රී ලංකාවේ පුරෝගාමී අධ්‍යාපනික ආයතනයක් වන ඉන්ෆොමැටික් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (IIT) විසින් පසුගියදා කොළඹ BMICH පරිශ්‍රයේදී උත්සවාකාරයෙන් අවසන් වූ 2020 ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී ගෞරවනීය සම්මාන රැසක් හිමිකර ගත්හ.

මෙවර සම්මාන උළෙලේ සුවිශේෂීත්වයක් වන්නේ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර නවෝත්පාදන උදෙසා වැඩිම සම්මානලාභී සිසුන් සංඛ්‍යාවක් IIT ආයතනයෙන් බිහි වීමත් සමඟ ඔවුන් අගයමින් BCS Chairman's Award, IIT වෙත හිමි වීමයි.

මෙවර උළෙලේදී තොරතුරු තාක්ෂණ (IT) කාණ්ඩය යටතේ, ස්ටෙලාන් බ්‍රයන් විසින් Smart Shoe සඳහා රිදී පදක්කම දිනාගත් අතර, දිලුම් ඩී සිල්වා විසින් DAugmentor සඳහා ලෝකඩ පදක්කමද, නිසල් සුදිල් විසින් Cadia Rhythm සඳහා කුසලතා සම්මානයද දිනා ගන්නා ලදී.

"ව්‍යාපාර" (Business) කාණ්ඩය යටතේ Trustcredit සඳහා රන් සම්මානය ඉර්ෆාන් ඉස්මාත් දිනා ගත් අතර, කවිෂ්මා ජයසිංහ විසින් Style Guide සඳහා රිදී පදක්කමද, ගයලි ජයවර්ධන සහ හනා නටාෂා විසින් පිළිවෙළින් TransAssistසහ Chain of Ownership සඳහා වූ කුසලතා සම්මාන දිනා ගන්නා ලදී.

## තිස්ස නාගොඩවිතාන චිත්‍රපට එකතුව Mobile App ඔස්සේ

දුරකථන සේවා සමාගම් වෙනුවෙන් අගය එකතුකළ සේවාවන් පිරිනැමීමේ ප්‍රමුඛයා වන Evoke International සමාගම, චිත්‍රපට සංරක්ෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු වන තිස්ස නාගොඩ විතාන මහතා සතුව පැවති චිත්‍රපට එකතුවේ ජංගම බලපත්‍ර හිමිකම් (Mobile Licensing Rights) ලබාගෙන තිබේ. දශක ගණනාවක් පුරා නිර්මාණය වූ චිත්‍රපට රාශියක් මෙම එකතුවට ඇතුළත් වී ඇත. මින් ඉදිරියට මෙම චිත්‍රපට, දකුණු ආසියාවේ ජනප්‍රියම streaming සේවාව ලෙස සැලකෙන Hungama Play Mobile App ඔස්සේ නැරඹිය හැක.




මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් Evoke International සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ ලහිරු වික්‍රමසිංහ මහතා මෙසේ පැවසී ය.

"දේශීය සමාගමක් ලෙස, විශේෂයෙන්ම සිංහල චිත්‍රපට විශාල සංඛ්‍යාවක් ඇතුළත් මෙවැනි සුවිශේෂී චිත්‍රපට එකතුවක හිමිකම් ලබාගැනීමට මෙන්ම එම චිත්‍රපට ප්‍රේක්ෂකයන්ට සමීප කරවීමට හැකිවීම පිළිබඳව අප බෙහෙවින් ආඩම්බර වනවා. මේ වැඩසටහන ඔස්සේ දේශීය සිනමාව සම්බන්ධයෙන් තරුණ පරපුර තුළ ඇති උනන්දුව තවදුරටත් වර්ධනය වනු දැකීම අපගේ බලාපොරොත්තුවයි."

## සෙලින්කෝ ලයිෆ් රක්ෂණ ඔප්පු හිමියන්ට 'ෆැමිලි සවාරි' රන් තිළිණ

ජීවිත රක්ෂණ ක්ෂේත්‍රෙය් ප්‍රමුඛයා වන සෙලින්කෝ ලයිෆ්, කැරට් 22 රන් ප්‍රභාවෙන් තවත් රක්ෂණ ඔප්පු හිමියන් 103 දෙනෙකුගේ දිවි ආලෝකවත් කිරීමට පසුගියදා සමත් විය. සමාගමේ 14 වැනි 'ෆැමිලි සවාරි' ප්‍රවර්ධන වැඩසටහනේ 3 වැනි දිනුම් ඇදීමේ ජයග්‍රාහකයන් සඳහා පිරිනමන ලද රන් තිළිණවල සමස්ත වටිනාකම රුපියල් මිලියන 5 ක් විය.

ප්‍රධාන ත්‍යාගය වූ රුපියල් මිලියනයක් වටිනා රත්තරන් මාතර ප්‍රදේශයේ වාසනාවන්තයකු විසින් හිමිකරගත් අතර රුපියල් 250,000 බැගින් රන් තිළිණ මොරටුව සහ පිළියන්දල ප්‍රදේශ වල ඔප්පුහිමියන් දිනාගත්හ. මීට අමතරව බද්දේගම, බණ්ඩාරවෙල, මඩකලපුව, කොටහේන සහ වැල්ලවත්ත යන ප්‍රදේශයන්හී ජයග්‍රාහකයන් 5 දෙනෙකුට රුපියල් ලක්ෂයක් වටිනා රත්තරන් බැගින් හිමි විය.

තවත් රක්ෂණ ඔප්පු හිමියන් 25 දෙනෙකු සඳහා රුපියල් 50,000 බැගින් වටිනා රන් තිළිණ සහ තවත් වාසනාවන්තයන් 70 දෙනෙකුට රුපියල් 25,000 බැගින් වටිනා රන් තිළිණ පිරිනමන ලදි.

මෙම වසරේ තවත් දිනුම් ඇදීම් 3ක් පැවැත්වීමට නියමිත අතර සමස්ත වශයෙන් රක්ෂණ ඔප්පු හිමි 618 දෙනෙක් මිලියන 30 ක් වටිනා රන් තිළිණ හිමිකර ගැනීමට සමත් වනු ඇත.

මීට පෙර ෆැමිලි සවාරි ප්‍රවර්ධන වැඩසටහන තුළින් පිරිනමන ලද විදෙස් රටවල සහ ලංකාව තුළ විදේශීය සහ දේශීය සංචාර වෙනුවට රන් තිළිණ පිරිනැමීමට පියවර ගන්නා ලද්දේ කොවිඩ්-19 වසංගත රෝගී තත්වය හේතුවෙන් පැන නැඟුණු සංචාරක සීමාවන් සහ සෞඛ්‍යාරක්ෂිත පියවර අනුගමනය කිරීම සැලකිල්ලට ගනිමිනි.




ඉහළ ඡායාරූපයෙන් දැක්වෙන්නේ රුපියල් මිලියනයේ රන් තිළිණය හිමිකරගත් ජයග්‍රාහකයා වන අතර පහළ ඡායාරූපවල රුපියල් 250,000 සහ රුපියල් 100,000 රන් තිළිණ හිමිකරගත් ජයග්‍රාකයන් දැක්වේ.

## රථවාහන සිහිනයට CLC වෙතින් නම්‍යශීලි ලීසිං පහසුකම්

රථවාහන ආනයනය සීමාකර ඇති මෙවන් කාලයක ලියාපදිංචි රථවාහන සඳහා වෙළඳපොළ තුළ අධික ඉල්ලුමක් පවතී. මිස් කරගන් නැතුව ලීස් කරගන්න, යන තේමාව යටතේ ක්‍රියාත්මකවන මෙම ප්‍රවර්ධන වැඩසටහන හරහා වාහනයක් මිලදී ගැනීමට අපේක්ෂාවෙන් සිටින පෞද්ගලික පරිහරණය සඳහා මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කටයුතු උදෙසා භාවිත කරන ලොරි රථ ට්‍රක් රථ ආදිය සඳහාත් මෙම පහසුකම අත්විඳිය හැකිය. ළඟමපිහිටි කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් ශාඛාවක් වෙත ගොස් ආකර්ෂණීය පොලී අනුපාත යටතේ අවම ලියකියවිලි සමඟින් ලීසිං පහසුකම් ලබාගැනීමට හැකියාව හිමිවේ.

තවද මේ හරහා ගනුදෙනුකරුවන්ගේ අදායම් මට්ටම්වලට ගැලපෙන වඩාත් නම්‍යශීලි ගෙවීම් හිමිවන අතර ඉතාමත් කඩිනමින් එක්දිනක් තුළදී මෙම පහසුකම් ලබාගැනීමට අවස්ථාව හිමිවේ.

## ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයට රන් සම්මාන දෙකක්



ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගමක් වන ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය සංවිධානය කළ වසරේ ව්‍යවසායකයා සම්මාන උළෙලේදී ජාතික මට්ටමේ, මහාපරිමාණ කාණ්ඩයේ, රන්සම්මානයෙන් සහ බස්නාහිර පළාතේ, මහාපරිමාණ කාණ්ඩයේ, රන්සම්මානයෙන් පිදුම් ලැබීය. සම්මාන උළෙල ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් ලෙස පැවැත්විණි.

ත්‍රී සිංහ සමූහව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ මංජුල ආරියකුමාර එහිදී සම්මානය ලබා ගත්තේය."නිෂ්පාදන සහ සේවා විශිෂ්ට මට්ටමින් සැපයීම අපගේ ප්‍රධාන දැක්ම වනනිසා ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය නිරන්තරයෙන්ඇගැයීමට ලක් වෙමින් සම්මාන දිනා ගන්නවා.

කුඩා පරිමාණයෙන් අරඹා වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගමක් බවට පත්වී තිබෙන ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය පිරිනැමූ කර්මාන්ත විශිෂ්ටතා රන් හා රිදීසම්මාන සහ ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය පිරිනැමූ විශිෂ්ටතම ව්‍යවසායකයා රන් හා රිදී සම්මාන හිමිකර ගැනීමත්, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පිරිනැමූ නිෂ්පාදන විශිෂ්ටතා සම්මාන වලින් අඛණ්ඩව පිදුම් ලැබීමත් ඒ අතරින් ප්‍රධානය.




## 'හච් දැනුමයි මිලියනයයි' ජයග්‍රාහකයින්ට මුදල් ත්‍යාග

ශ්‍රී ලංකාවේ ජංගම දුරකතන සන්නිවේදන සේවා සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ ප්‍රියතම තේරීම වන හච්, ස්වකීය පාරිභෝගිකයන්ගේ දැනුම උරගාමින් පැවැත්වූ 26 වැනි හච් දැනුමයි මිලියනයයි" ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනේ ජයග්‍රාහකයන් හට මුදල් ත්‍යාග පිරිනැමීම කොළඹ පිහිටි හච් මූලස්ථානයේ දී පසුගියදා පැවැත්විණි.

මෙහි පළමු ත්‍යාගය හිමිකර ගැනීමට මොරවක පදිංචි එම්.එස්. ගර්ට් සමන්මලී සමත්වූ අතර දෙවැනි සහ තුන්වැනි ත්‍යාග පිළිවෙළින් කොළඹ 05 පදිංචි වයි.කේ.පී.පී. සේනානායක සහ කිතුල්හිටියාව පදිංචි බී.එම්.ඒ.එස්. ශ්‍රීපාල් සමත් වූහ. ජයග්‍රාහකයන්ට ත්‍යාග ලබාදීම හච් පසුගෙවුම් සාමාන්‍යාධිකාරී, ඉඳුනිල් ප්‍රනාන්දු අතින් සිදුකෙරිණි.

## කොමර්ෂල් බැංකුවේ යාපනය ශාඛාව නව හරිත ගොඩනැගිල්ලකට

ඓතිහාසික මතකය යළි කැන්දමින් 1930 ගණන්වල සිට බැංකු සේවා හා සබැඳි ලිපිනයක කොමර්ෂල් බැංකුව විසින් සිය යාපනය ශාඛාව පසුගිය දා නැවත විවෘත කරන ලදී.

යාපනය ජනතාවට ලබාදෙන සේවාව තවදුරටත් පුළුල් කරමින් අංක 474, රෝහල පාර, යාපනය යන ලිපිනයේ සම්පූර්ණයෙන්ම පරිසර හිතකාමී සැලසුම් වලට අනුකූලව අලුතෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ලක නව ශාඛාව මෙහෙයුම් ඇරඹීය.

මෙම ස්ථානයේ පිහිටි මුල්ම ගොඩනැගිල්ල 1973 වසරේදී මර්කන්ටයිල් බැන්ක් ඔෆ් ඉන්ඩියා හි ශාඛා තුනක් කොමර්ෂල් බැංකුව විසින් අත්පත් කරගත් අවස්ථාවේදී බැංකුවේ අයිතියට පත්වූ අතර පරම්පරා ගණනාවක ගනුදෙනුකරුවන් වෙනුවෙන් මෙහි සිට බැංකු සේවා ලබාදීමට බැංකුව කටයුතු කර ඇත.

මෙම බැංකු ශාඛාව 1973 වසරේ සිට අඛණ්ඩව මෙහෙයුම් පවත්වා ඇති අතර මේ වනවිට කොමර්ෂල් බැංකුව යාපන අර්ධද්වීපය තුළ ශාඛා 12 ක් සහ උතුරු පළාත තුළ ශාඛා 18 ක් පවත්වාගෙන යයි.

මහල් පහකින් සමන්විත කොමර්ෂල් බැංකුවේ නව යාපනය ශාඛා ගොඩනැගිල්ල 2021 මාර්තු 15 වැනිදා උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

මෙහි Cash Recycler යන්ත්‍ර පහක් (CRMs) eSlip චෙක්පත් එකතු කිරීමේ ස්ථානයක් සහ චෙක්පත් තැන්පතු කිරීමේ යන්ත්‍රයක් ස්වයංක්‍රීය බැංකුකරණ මධ්‍යකස්ථානයක් පිහිටුවා තිබේ.



බැංකුව සඳහන් කරන්නේ මෙම පහසුකම් තුළින් දිනයේ පැය විසිහතර පුරාම වසරේ දින 365 තුළම මුදල් ලබාගැනීමට සහ තැන්පත් කිරීමට පහසුකම් ලබාදී ඇති බවයි.

## මහජන බැංකුවේ ඩිජිටල් බැංකු සේවා අසමසම ගනුදෙනු වාර්තාවක

මහජන බැංකුව, 2021 අප්‍රේල් 01 වැනිදා සිට 15 වැනිදා දක්වා කාලසීමාව තුළ රුපියල් 5822504 ක අති දැවැන්ත ගනුදෙනු ප්‍රමාණයක් වාර්තා කරමින් සහ රුපියල් බිලියන 65.3 ක මුදල් ප්‍රමාණයක් නිකුත් කරමින් යළිත් වරක් සිය ඩිජිටල් බැංකුකරණයේ ශක්තිය පෙන්නුම් කර තිබේ.

බැංකුවේ ඉන්ටර්නෙට් බැන්කින්, පීපල්ස් වේව් මොබයිල් බැන්කින් යෙදුම හා ස්වයං බැංකුකරණ ඒකක හරහා සිදු කරන ලද සියලුම ගනුදෙනු මීට ඇතුළත් වේ.

මහජන බැංකුව ග්‍රාමීය ප්‍රදේශවලට ඩිජිටල් මූල්‍ය සේවා සැපයීමේ ප්‍රමුඛත්වය දරන අතර, ශ්‍රී ලංකාව ඩිජිටල් සමාජයක් බවට පත් කිරීමේ වෑයම අතිසාර්ථකව ජයගෙන තිබේ. ජනතාවට වසරේ දින 365ම පැය 24 පුරා තමන්ට අවශ්‍ය බැංකු සේවා ලබාගැනීමට අවකාශ සලසන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර සහ කියෝස් අන්තර්ගත සංකල්පයක් වන ස්වයං බැංකුකරණ ඒකක හඳුන්වාදීමේ පුරෝගාමියා වන්නේ ද මහජන බැංකුවයි. මෙම ස්වයං බැංකුකරණ ඒකක සංකල්පය මහජන බැංකුවේ අතිසාර්ථක පියවරක් මෙන්ම මෙරට ජනතාව අතර, අතිශය ජනප්‍රියත්වයට පත් හඳුන්වා දීමකි.

## AMF සහ Arpico Finance මූල්‍ය සමාගම් ඒකාබද්ධ වෙයි

මෙරට මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ පැරණිතම සමාගම් දෙකක් වන ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් පී.එල්.සී සමාගම සහ ආර්පිකෝ ෆිනෑන්ස් පී.එල්.සී සමාගම කොළඹ කොටස් හුවමාරුවේ පසුගියදා නිල වශයෙන් ඒකාබද්ධ විය.

දීර්ඝකාලීන උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙන් සිදුවූ මෙම ඒකාබද්ධවීම සියලුම නීති රෙගුලාසීන්ට අනුකූලව සිදුකර තිබේ. ඒකාබද්ධවූ සමාගම් ද්විත්වය මින් ඉදිරියට AMF නාමය යටතේ සිය අත්දැකීම් හා පළපුරුද්ද උපයෝගී කරගනිමින් ව්‍යාපාර මෙහෙයුම් පවත්වාගෙන යාමට නියමිත අතර, ශ්‍රී ලංකාවේ මූල්‍යසේවා ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛතම නාමයක් බවට ඉක්මණින්ම පත්වෙනු ඇත.

මෙම සුවිශේෂී අවස්ථාව පිළිබඳව අදහස් දක්වමින් AMF සමාගමේ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී, ටී.එම්.ඒ. සලේ මහතා මෙසේ පවසා සිටී. "මේ අවස්ථාව අපගේ සමාගමට ඉතාමත් වැදගත් සංධිස්ථානයක් බව මුලින්ම කියන්න කැමතියි.

අත්දැකීම් බහුල පළපුරුදු මූල්‍ය සේවා සමාගම් දෙකක හැකියාවන්, ශක්තීන් ඒකාබද්ධවීම හරහා අනාගත මූල්‍යසේවා ක්ෂේත්‍රයට ලබාදියහැකි දායකත්වයන් බොහෝමයි. මෙය සැබැවින් මනව පරිච්ඡේදයක ආරම්භය වනවාමෙන්ම සමාගම් දෙකෙහිම පාර්ශ්වකරුවන්ට වැදගත් ප්‍රතිලාභ හිමිවන ගමනක ආරම්භයවන බවත් කියන්න කැමතියි.

මෙතැන් සිට එක්ණ්ඩායමක් වශයෙන් එකම හැඟීමකින් කටයුතු කරමින් පාරිභෝගිකයා අංක එකෙහි තබා සලකන පාරිභෝගික සේවාවක්, විශිෂ්ට මූල්‍යසේවා හා නිපැයුම්පෙළක් ඔස්සේ ලබාදෙන්නට අපි සූදානමින් සිටිනවා."



# නිවැරැදිව ප්‍රහේළිකාව පුරවා

රුපියල් 50,000ක මුදල් ත්‍යාග දිනන්න

පළමු ත්‍යාගය - මුදලින් රුපියල් 25,000ක්

දෙවැනි ත්‍යාගය - මුදලින් රුපියල් 15,000ක්

තෙවන ත්‍යාගය - මුදලින් රුපියල් 10,000ක්

## සිළුමිණ ප්‍රහේළිකා - අංක 122

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | ■ | 5 | 6 | 7 | 8 | 9 |
| 10 | | | | 11 | ■ | 12 | | | |
| 13 | | ■ | 14 | | 15 | | ■ | | ■ |
| 16 | | 17 | ■ | 18 | | ■ | 19 | | |
| | ■ | 20 | 21 | | | | | | ■ |
| 22 | 23 | | | ■ | | ■ | | ■ | 24 |
| ■ | 25 | | ■ | 26 | ■ | 27 | | | |
| 28 | ■ | 29 | 30 | | 31 | | ■ | ■ | |
| 32 | 33 | ■ | | ■ | 34 | | | 35 | |
| 36 | | | | | ■ | | ■ | 37 | |

නම : ..........

ලිපිනය : ..........

..........

දුරකථන අංක : ..........

අත්සන : ..........

දිනය : 2021, ..........

### හරහට

1. බොරු / පච
5. කාන්තා ඝාතන රැල්ලක් නිසා කුප්‍රකට වූ රත්නපුරේ ගමකි
10. වෙඩි තබන අවිය
12. කුලයෙන් උසස්
13. ක්‍රිෂ්ණාගේ ප්‍රේමවන්තිය
14. ණයට මුදල් ගත් තැනැත්තා
16. පියා හෙවත් උපදවන්නා යන අරුත දේ
18. ස්වර
19. මෙය ගැසිය යුත්තේ තැනේ හැටියටලු
20. සූර්යග්‍රහණයක් සිදුවූ අවස්ථාවක ලංකාවේ ඇතැම් කතුන් ලස්සන වෙතැයි සිතා බිව් බව කියන ආයුර්වේදය ඔසුව
22. මවට නමකි
25. හිංසාව / පීඩාව
27. සමඟි නැති
29. පැඟිරි කුලයට අයත් කැඳ සෑදීමට ද ගන්නා හෙළ ඔසුවකි
32. ගස්වලට නැගීමට පහසුවනු පිණිස බැඳි ලී කැබලි
34. දක්ෂිණ ලංකාව
36. ආච්චි අම්මා
37. ආචාර්යවරයා

### පහළට

1. අගනුවරට නුදුරු ජෛව විවිධත්වයෙන් අනූන පරිසර කලාපයකි
2. අවධාන සහිත
3. වචන /වාග්
4. වම නොවේ
6. සක්කරා
7. කැලය
8. ප්‍රවේගය වෙනස්වීමේ ශීඝ්‍රතාව භෞතික විද්‍යාවේ හැඳින්වෙන්නේ මේ නමිනි
9. වීණාතන්ත්‍රිය
11. මහලු වූ / වයස්ගත
15. දිය බෙදාදීමට ඇළෙහි තබන සිදුරු සහිත ලී කැබැල්ල
17. හිස නැති මළකඳ
19. 70 දශකයේ මෙරට පාසල් දරුවන්ට නොමිලේ බිස්කට් ලබා දුන් අමෙරිකානු වැඩසටහන
21. ලබුවැව
23. අම්මා
24. ඇඟිලි දෙකක් අතර ප්‍රදේශය
26. අම්බලමට වළං ගෙනාවේ මොහුය
27. ආධුනික / නවක
28. ධාර්මික
30. කිංකිණී
31. රාජයා / රාජ්‍යය
33. රතු / රක්ත
35. සැහැල්ලු / කෙටි යන අරුත් දේ

### කොන්දේසි:

(1) කුසපත් ඇදීමෙන් තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 3ට මෙහි සඳහන් පරිදි රුපියල් 50,000 තෑගි මුදල හිමි වේ.

(2) තරගකරුවකුට විසඳුම් පත් ඕනෑම සංඛ්‍යාවක් යොමු කළ හැකි අතර ඒ සඳහා සිළුමිණ පුවත්පතේ පළවන මෙම කූපනය පමණක් එවිය යුතුය.

(3) සිළුමිණ පුවත්පතේ පළවන මෙම ප්‍රහේළිකාව විසඳා කූපනය පුරවා එය ලියුම් කවරයක බහා, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේළිකා අංක 122 යනුවෙන් සඳහන් කර සිළුමිණ ප්‍රහේළිකාව 122, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2021 ජූනි 30 ට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය, දුරකතන අංකය සහ ඊමේල් අංකයක් ඇත්නම් එයද ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. විස්තර අවශ්‍යය වන්නේ නම් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය ඇමතිය හැකිය. (දුරකතන අංකය 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය. තරගයේ අවසන් තීරණය ලේක්හවුස් ආයතනය සතුය.

විසඳන ලද ප්‍රහේළිකාව ලියුම් කවරයක බහා එවන්න

ඔබේ නිවැරැදි විසඳුම්පත්
**ප්‍රහේළිකා අංක - 122,
සිළුමිණ කර්තෘ මණ්ඩලය,
ලේක්හවුස්, කොළඹ 10.**
යන ලිපිනයට
ජූනි 30 වැනිදාට පෙර
එවිය යුතුය.

# ජාතික සමඟියේ සංකේතයක් වූ එම්. ඒ. බාකීර් මාකාර්

**ප්‍රවීණ දේශපාලඥයකු මෙන්ම හිටපු කථානායකවරයකු වූ එම්.ඒ. බාකීර් මාකාර්ගේ 104 වන ජන්ම සංවත්සරය 2021 මැයි 12 වෙනි දිනට යෙදේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

● ජිනසේන වේලාරත්න

**වෙද පෙළපතකට උරුමකම් කියන බාකීර් මාකාර් 1917 මැයි 12 වෙනි දින බේරුවල මරදානේදී උපත ලැබීය. බේරුවල පිහිටි ලංකාවේ පළමු මුස්ලිම් බාලිකා විදුහලින් මුලකුරු ඉගෙනීම ඇරඹූ බාකීර් මාකාර් වයස අවුරුදු 7දී ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගැනීම සඳහා කොළඹ සාන්ත සෙබස්තියන් විදුහලට ඇතුළත් විය. කොළඹ සහිරා විදුහලින් ද්විතීය අධ්‍යාපනය හැදෑරූ මොහු 1939 වර්ෂයේදී නීති ශිෂ්‍යයකු වශයෙන් නීති විද්‍යාලයට ඇතුළත් වීමට වරම් උදාකර ගත්තේය.**

1947 වර්ෂයේදී බේරුවල නගර සභාවට අභිනව සභිකයන් තෝරා ගැනීමේ මැතිවරණය පැවැත්විණි. මේ අවස්ථාවේදී ප්‍රදේශයේ සිටි උගතුන් හා ක්‍රියාකාරීන් බේරුවල මරදාන " සකරියා විලා හිල් " හිදී සාකච්ඡාවක් පවත්වනු ලැබිණි. සමාජයේ වෙනසක් බලාපොරොත්තු වූ මේ පිරිස බේරුවල නගර සභාවට, මරදාන කොට්ඨාසය නියෝජනය කිරීමට එකම සුදුස්සා බාකීර් මාකාර් බව තීරණය කළේය. " සකරියා විල් හිල් " හිදී පැවැත්වූ මේ සාකච්ඡාව බාකීර් මාකාර්ගේ ජීවිතයේ තීරණාත්මක අවස්ථාවක් වූ අතර, ක්‍රියාකාරී දේශපාලන දිවියට ආගමනය වීමට මූලික හේතුවක් විය. නගර සභා මැතිවරණයෙන් ජය ගත් බාකීර් මාකාර් බේරුවල නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරී පත් විය.

නීති විද්‍යාල අවසන් විභාගයෙන් සමත් බාකීර් මාකාර් 1949 වර්ෂයේදී නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන්නේය. නඩත්තු ඉල්ලා උසාවියට එන අසරණ කාන්තාවන්ගෙන් මුදල් අය කිරීම වරදක් බව බාකීර් මාකාර් කල්පනා කළේය. නඩත්තු නඩුවලට පෙනී සිටීම සඳහා ඔහු කිසිදු මුදලක් අය කළේ නැත. බොහෝ අවස්ථාවලදී නොමිලේ නඩු හබවලට පෙනී සිටින බාකීර් මාකාර් මුදල් බලාගෙන නඩු හබ බාරගත්තේ නැත. 1951 වර්ෂයේදී බාකීර් මාකාර් කළුතර නීතිඥ සංගමයේ සභාපති තනතුරට පත්විය.

1950 වසර බාකීර් මාකාර්ගේ ජීවිතයේ තවත් වැදගත් සිදුවීමක් වූ පෙරළිකාර වසරක් විය. ඒ බේරුවල නගර සභාවේ නගරාධිපති ධූරයට පත් වීමයි. නව නගරාධිපති බාකීර් මාකාර් මෙතෙක් කල් බේරුවල නගර සභාවේ බටහිර පාර්ශ්වයේ දුප්පතුනට සිදු වූ අසාධාරණකම් වැළැක්වීමට වහා පියවර ගත්තේය. බේරුවල නැඟෙනහිර හා බටහිර වශයෙන් බෙදී පැවති නගර සභා බල ප්‍රදේශය එක් නගර සභා බල ප්‍රදේශයක් බවට පරිවර්තනය කරමින් නැඟෙනහිර හා බටහිර සියලු ජනතාවට සාධාරණව සේවය කළේය. මේ නිසා මෙතෙක් කල් බෙදී වෙන් වී සිටි බේරුවල බටහිර හා නැඟෙනහිර ජනතාව සමගි විය. සාමයේ හඬ මුළු නගර සභා බල ප්‍රදේශය පුරා පැතිර ගියේය.

සිංහල රාජ්‍ය භාෂාව විය යුතු බව ප්‍රථම වරට නගර සභාවකින් යෝජනාවක් සම්මත කළේ බාකීර් මාකාර් නගරාධිපතිතුමාය. ඔහුගේ ඒ අරගලය සිංහල රජ බස කරවීම සඳහාය.

1960 මාර්තු මස පැවති මහා මැතිවරණයෙන් බාකීර් මාකාර් ජය ගත් අතර, බේරුවල පළමු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් තේරීපත් විය.

සියලු ජාතීන් අතර ජාතික සමගිය ඇති කරමින් ප්‍රභූවරයකු ලෙස මෙරට ජනතා ප්‍රසාදයට පත් බාකීර් මාකාර් සැබෑ ලෙසින්ම මහත්මා දේශපාලඥයකු ලෙස දැකිය හැකිය. මේ පිළිබඳව එතුමන් පාර්ලිමේන්තුවේදී කළ සිය මංගල කතාවෙන් මොනවට පැහැදිලි වනු ඇත.



එම්. ඒ. බාකීර් මාකාර්

සිංහල රාජ්‍ය භාෂාව ලෙස භාවිත කිරීම පිළිබඳව සිංහල ජාතියට දොස් පැවරීම නිවැරදි නොවන බව පැවසූ බාකීර් මාකාර් කොටස්වලට කැඩුණු ශ්‍රී ලංකාවක් වෙනුවට නොබෙදුණු ජාතියක් බිහි කළ යුතු බව අවධාරණය කොට තිබේ.

"මම මුස්ලිම් ජාතිකයකු වීම ආඩම්බරයක්" "ශ්‍රී ලංකිකයකු වීම ආඩම්බරයක්" අපි මුස්ලිම්වරු විදියට මිත්‍රත්වයේ දෑත සියලුම වාර්ගිකයනයට දිගු කරන්නේ ඔවුන් සියලු දෙනාම එක් ජාතියක් ලෙස සලකන නිසාය. ඔහු සිය දේශපාලන දිවිය පුරාම කළේ ජාතීන් අතර ජාතික සමඟිය ඇති කරවීමේ උදාර අරමුණ පෙරදැරී කරගෙනය.

1977 වර්ෂයේ පැවති මහා මැතිවරණයෙන් වැඩි ඡන්ද 27,000 ක් ලබා ගනිමින් බාකීර් මාකාර් බේරුවල බහු මන්ත්‍රී කොට්ඨාසයේ පළමු මන්ත්‍රීවරයා වීමේ වාසනාව උදා කර ගත්තේය.

සිංහල අතිබහුතර මහජනතාවගේ මහජන මතයෙන් මුස්ලිම් ජාතිකයකු ජනතා නියෝජිතයකු ලෙස පත් කර ගැනීම ඓතිහාසික සිදු වීමකි. බේරුවලින් ජනතා අභිෂේකය ලැබූ මේ ජන නායකයා " සිංහල බාකීර් " කෙනෙකු ලෙස ඉස්මතු වන්නේ බහුතරයක් වූ බේරුවල සිංහල ජනතාවගේ කර මතිනි.

1977 අගෝස්තු 04 වෙනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උපකථානායක ධූරයට පත් වූ බාකීර් මාකාර් ජනතාවගේ දහසකුත් බලාපෙරොත්තු හදවතට තුරුලු කර ගනිමින් සිය මහජන සේවාව ආරම්භ කළේය. බේරුවල නව උදානයට අනුව කිසිම කෙනෙක් මෙතෙක් කල් ලබා නොදුන් වරප්‍රසාද නිසා සෑම කෙනෙකුටම වාසනාවන්ත කාලයක් විය.

1978 සැප්තැම්බර් 21 වෙනි දින බාකීර් මාකාර්ගේ ජීවිතයේ තීරණාත්මක දිනයක් විය. ඒ එතුමා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ධූරයට පත් වීමයි. ශ්‍රී ලංකා පැරණි පාර්ලිමේන්තුවේ අවසාන කථානායක වශයෙන්ද ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තුවේ ප්‍රථම කථානායක වශයෙන්ද බාකීර් මාකාර් මෙරට ඉතිහාසයට එක් විය.

ආරම්භයේ පටන්ම සංචාරක ක්ෂේත්‍රය බාර නිලධාරිවාදයෙන් කොතෙක් බාධා පැමිණිය ද, බෙන්තොට ප්‍රදේශයට සීමා වී තිබූ සංචාරක ව්‍යාපාරය බේරුවලට ගෙන ඒමට මුල් වූයේ බාකීර් මාකාර්ය. බේරුවල සංචාරක කලාපයේ නිර්මාතෘ ලෙස බේරුවල ප්‍රදේශයේ ආර්ථිකයේ විප්ලවයක් ඇති විය.

නව රැකියා,විසිතුරු භාණ්ඩ වෙළෙඳසැල්, සංචාරක හෝටල් ප්‍රදේශයේ බිහි විය. ඔවුන්ගේ ආරක්ෂාවට මොරගල්ල ප්‍රදේශයේ සංචාරක පොලිසියක් ද පිහිටුවනු ලැබිය. සංචාරක කලාපය පුළුල් කිරීම සඳහා බේරුවල මොරගල්ල ගාලු පාරට මුහුණලා තිබූ විශාල ඉඩම අත්පත් කර ගත්තේ ද බාකීර් මාකාර්ගේ අදහසකට අනුවය.

1983 අගොස්තු මස 31 වෙනි දින කථානායක ධුරයෙන් සමුගත් බාකීර් මාකාර් එදිනම කැබිනට් අමාත්‍යවරයකු වශයෙන් දිවුරුම් දුන්නේය.

අති විශාල මුදලක් වැයකොට අමාත්‍යාංශ ගොඩනැගිල්ලක් පවත්වාගෙන යෑමට එතුමා කැමැත්තක් දැක්වූයේ නැත. ඒ වෙනුවට ඔහු කළේ නිවසේම කොටසක් ඒ සඳහා යොදා ගැනීමය. ඔහු අනුගමනය කළ මේ ආදර්ශවත් ක්‍රියාමාර්ගය එවකට මුදල් ඇමතිව සිටි රොනි ද මැල් ඔහුගේ පාර්ලිමේන්තු කථාවේදී ඉහළින්ම අගය කළේය.

නීතිගරුක, විනීත, තරුණ පරපුරක් මේ ජන සමාජයට උරුම කිරීමේ පරම චේතනාවෙන් සමස්ත ලංකා මුස්ලිම් තරුණ පෙරමුණ බාකීර් මාකාර් මෙරට තරුණ පරපුරට දයාද කළේය.

ඔහු කිසි දිනක ආගම්වාදියෙක් වූයේ නැත, ජාතිවාදීයකු වූයේ නැත, ජාතික සමඟිය ඇතිකරවීම සඳහා මහඟු සේවාවක නිරත වූ බාකීර් මාකාර් ජාතික සමඟිය ඇතිකර ගත යුතුය යන හඬ මුළු රට වටා ගෙන ගියේය. ඔහුගේ වියදමින් "ඇයි අපට සිංහල" ? (යේන් සිංහලම්) පොත මුද්‍රණය කර මුළු රට පුරාම මුස්ලිම් ජනතාව අතර බෙදා හැරියේය. මේ සඳහා කොතරම් බාධක පැමිණියාද කිවහොත් එදා ඔහුට කිසිම දෙමළ පුවත්පතකින් මුදල් ගෙවා හෝ දැන්වීමක් පළ කරවා ගැනීමට නොහැකි විය.

1988 ජුනි මස 31 වෙනි දින පාර්ලිමේන්තු දිවියෙන් සමුගත් බාකීර් මාකාර් දකුණු පළාතේ ආණ්ඩුකාර ධුරයට පත්විය.

දේශපාලන දිවිමගේ අඩසිය වසකටත් වැඩි කාලයක් කළ උතුම් ජන මෙහෙවර අවසන් කරමින් 1993 දෙසැම්බර් මස 21 වෙනි දින දකුණු පළාතේ ආණ්ඩුකාර ධුරයෙන් හා දේශපාලන දිවියෙන් ඔහු සමුගත්තේය.

නිලයට බලයට ගිජුකමින් ඔහු කිසි දිනක ප්‍රතිපත්ති පාවා දී නැත. ඔහු වචුල් දේශපාලනය පිළිකුල් කළේය. ඔහු දේශපාලන දිවි මඟට ආගමනය වූ එක්සත් ජාතික පක්ෂය හැර වෙනත් පක්ෂයට පැන ගියේ නැත. ඔහු ඉපදුනේ මෙන්ම මිය ගියේද එක්සත් ජාතික පාක්ෂිකයකු වශයෙනි.

නාගරික මන්ත්‍රීවරයකු, නගරාධිපතිවරයකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, කැබිනට් අමාත්‍යවරයකු, කථානායකවරයකු හා ආණ්ඩුකාරවරයකු වශයෙන් ඔහු කළ සේවාවත්, බහුවාර්ගික ජනතාවක් ජීවත්වන බේරුවල වැනි ප්‍රදේශයක ජාතික සමඟිය රැකගත් අයුරුත්, එතුමාගේ උපන් දිනය සමරන දිනක විශේෂයෙන් බේරුවල ජනතාවත්, ඔහු කළ සේවා අගයන මෙරට වැසියනුත් සෙනෙහෙබර සිතින් සමරනු නියතය.



## කලාසූරී අරීසෙන් අහුබුදු සූරීන් ගේ දස වන සමරුව නිමිත්තෙනි

බුදු කෙනකුන් උපත - මඟුලෙකි ලොව නිවන
කුදු පණු දිවිය සිටැ ඇරැඹූ බව ගමන
බුදු පදවියෙන් නිමවා ලැබ අම නිවන
උදු මඟ සතට පෑ කුලුණින් බව නිමන
බුදු කෙනකුන් උපත මඟුලෙකි ලොව නිවන
සි දු විය බුදු උපත අද දිනැ ගසක් යට
සි දු විය බුදු මඟුල අද දිනැ ගසක් යට
සි දු විය පිරිනිවන අද දිනැ ගසක් යට
පොදු ම ය ගහට කොළට ද මේ වෙසක් තුට
ප ව් පින්, ලෝ මැවුම, පරලොව ගැන අඳුරු
සෙවු මට වෙහෙස වුණු යුගයෙක නන් ඇදුරු
දෙ ව් බඹ නැණ ද පසු කොටැ නුවණින් විදුරු
ග වු තම ම-හිමි වූවා තිලොවට ඇදුරු
"එම් බා කාළාමයෙනි, තෙපි ම-බස් අසවු
සම් බුදු බස වුව ද සිය නුවණින් විමසවු"
තුම් නිදහස් සිතුම් මතු කළ මනසෙහි සවු
දම් මඟ ම-හිමි වෙ ද, විමැසුම දොරට අසවු
"සාමිනි මම ද ඔබ සවුවෙකි පටන් අද
නෑ දන් මගෙන් මින් මතු නිවටුනට දද"
කී සඳ සිටු උපාලී වාදෙන් පැරැද
හා, ඔබ ඔහුට වදහළ උවදෙස මඳි ද
ගැ න් මෙන් බමුණු කුල වාදය මුඳුන් කොට
කොන් වී එ දා පෑගුණු නන් දනන් හට
ගෙ න් ගෙට සිර මැඳිරි ඉදි වුණු කතුන් හට
දු න් සහනය මැ ඇති හිමි දම් මඟින් සෙට
බේදය කිසි දු නො තකා සව් සත එක ම
නෑ හිතවතුන් මෙන් ගෙන වදහළ දහම
මේ තරම්නුදු රැකැගත් හෙළ දැය අසම
සේවය ලොවට සැලැසූ වග කියනු කිම!

– අරීසෙන් අහුබුදු

# ශාස්ත්‍ර පරාභවයේ ශතවර්ෂාවලෝකනය




**රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාව පුද්ගල චරිත කේන්ද්‍ර කර ගනිමින් ලාංකේය නූතන බුද්ධි විෂයක විකාසනය පිළිබඳව සම්පාදනය කෙරෙන මේ ලිපි මාලාව බුද්ධි විෂයක හා සම්බන්ධ ආයතන කේන්ද්‍ර කොට ගෙන ජනිත වූ අවලෝකනයක් ලෙස මෙවර සම්පාදනය කිරීමට අදහස් කළේ සියවසක් අවසානයේ අප ගමන් කොට තිබෙන්නේ ඉදිරියටද පසුපසටද යන වග අවබෝධ කර ගැනීමට එය අගති විරහිත මාපකයක් වන බැවිනි.**

ලංකාවේ ආරම්භ කෙරුණු විද්වත් ශාස්ත්‍රීය පර්ෂද අතුරින් රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවට ප්‍රමුඛස්ථානය හිමි වෙයි.

එකුන් විසි වන සියවසේ යුරෝපීය මිනිසාට පෙරදිග ජීවන ව්‍යවහාර මෙන්ම චින්තන සම්ප්‍රදායන් පිළිබඳ පැවතියේ අරුමැසි කුතුහලයකි. ඉන්දුවේදය නමින් හැඳින්වෙන අභිනව ශාස්ත්‍ර ධාරාවක් ඔස්සේ පෙරදිග සමාජයේ පැවති ආගමික සම්ප්‍රදාය භාෂා සාම්ප්‍රදායික සමාජ ක්‍රම හා ජීවන රටා කෙරෙහි වූ සැබෑ කුතුහලය හේතු කොට ගෙන එකී ක්ෂේත්‍ර පිළබඳ අධ්‍යයනයට බට යුරෝපීය ශාස්ත්‍රඥයන් විසින් බ්‍රිතාන්‍යය අධිරාජ්‍යයේ යටත් විජිත ලෙස පැවති ඉන්දියාව කේන්ද්‍ර කර ගනිමින් ප්‍රාචීන අධ්‍යයන පිළිළිබඳ පුරෝගාමී සංගමය බෙංගාලයේ ස්ථාපනය කරන ලද්දේ 1784 වර්ෂයේ ශ්‍රීමත් විලියම් ජෝන්ස් විනිසුරුවරයාගේ ප්‍රධානත්වයෙනි.

පසුව බොම්බායේද රාජකීය ආසියාතික සංගමයේ ශාඛාවක් ආරම්භ කෙරුණු අතර නේපාලය, බුරුමය හා චීනය යන රටවලද රාජකීය ආසියාතික සංගමයේ ශාඛා ස්ථාපනය කෙරිණ. 1845 පෙබරවාරි මස 07 වැනි දින රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාව ආරම්භ කරන ලද්දේ ජේ. ස්ටාර්ක් නමැති එවක සිටි යටත් විජිත විනිසුරුවරයාගේ සභාපතිත්වයෙනි. ආසියාතික රටවල ස්ථාපනය කෙරුණු රාජකීය ආසියාතික සංගමයේ සියලු ශාඛා බ්‍රිතාන්‍යයේ හා අයර්ලන්තයේ ස්ථාපිත ප්‍රධාන සංගමයට අනුබද්ධ විය.

1845 වර්ෂයේ ඇරඹුණු රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාව මුල් අඩ සියවසෙහි මෙරට සිටි බ්‍රිතාන්‍ය ජාතික සිවිල් සේවකයන්, විනිසුරුවරුන්, ආයතන ප්‍රධානීන්, ස්වදේශික මුදලිවරුන් සහ ක්‍රිස්තියානි පූජකවරුන් අතර සිටි විද්වතුන් විසින් ලාංකේය සමාජයේ විවිධ අංශ සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණ සහ අධ්‍යයන හේතු කොට ගෙන දෙස් විදෙස් ශාස්ත්‍රඥයන්ගේ මහත් ආකර්ෂණයට ලක් වූ ශාස්ත්‍රීය පර්ෂදයක් ලෙස තහවුරු වියග විසි වැනි සියවස මුල් භාගයේ සිට විවිධ ජාතීන්ට අයත් ස්වදේශික උගතුන් ද රාජකීය ආසියාතික සංගමය ලංකා ශාඛාව සමඟ එක්ව ඉතිහාසය, ආගම, සාහිත්‍යය සහ කලා සංස්කෘතික ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණ ලිපි සම්පාදනයට දායක වී තිබේ.

ඔවුහු රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවට සම්බන්ධ වී ස්වකීය පර්යේෂණ සහ අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රීය ලිපි ඒ සංගමයේ සඟරාවේ පළ කළහ. මේ තත්ත්වය හමුවේ බුදු දහම සහ පාලි භාෂාවල ඉතිහාසය සහ පුරාවිද්‍යාව පිළිබඳ මෙන්ම මානව විද්‍යාව වැනි විෂයයන් පිළිබඳවද විවිධ ශාස්ත්‍රඥයන් විසින් සම්පාදිත වැදගත් තොරතුරු රැසක් ශාස්ත්‍රීය ලිපි සහ ප්‍රකාශන ලෙස සංරක්ෂණය වීම සහ විවිධ ආයතන සහ ව්‍යාපෘති ආරම්භ වීම පසු ගිය සියවසේ සිදු වූ වැදගත් සංසිද්ධීන් සේ දැක්විය හැකිය. ජාතික කෞතුකාගාරය, පාලි පොත් සංගමය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා සිංහල ශබ්දකෝෂය ආරම්භ කිරීමටද සෘජුව සහ වක්‍රව දායක වූයේ ද රාජකීය ආසියාතික සංගමයයි.

එවක ලංකාවේ සිටි ඩී. ජේ. ගොගර්ලිල කොළඹ අගරදගුරු ආර්. එස්. කොප්ලෙස්ටන්, ජෝන් ස්කොට්, ඩේවිඩ් ද සිල්වා, ස්පෙන්ස් හාර්ඩි ප්‍රමුඛ ශාස්ත්‍රාභිලාෂී පූජකවරුන්ගේ පුරෝගාමිත්වයෙන් රාජකීය ආසියාතික සංගමය මඟින් ඇරඹුණු බුදු දහම පිළිබඳ අධ්‍යයන හේතු කොට ගෙන පාලි භාෂාවල ජාතක කථා හා බුදු දහම පිළිබඳ අන්තර්ජාතික අධ්‍යයන සඳහා පදනම සැකසිණ. මේ කටයුතු සඳහා දායක වූ රීස් ඩේවිඩ්ස් ලංකාවේදී පාලි භාෂාව උගෙන බුදු දහම කෙරෙහි ආකර්ෂණය වී 1881 වර්ෂයේ ලන්ඩනයේ පාලි පොත් සංගමය ආරම්භ කිරීමට පුරෝගාමී විය. රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ සාමාජිකයකු වූ ආර්. සී. චිල්ඩර්ස් පාලි පොත් සංගමය සඳහා බෞද්ධ ග්‍රන්ථ රැසක් පාලි භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම නිසා බුදු දහම සහ පාලි භාෂාව පිළිබඳ බටහිර උගතුන්ගේ අවධානය යොමු වී එය විශ්ව අධ්‍යයන ක්ෂේත්‍රයක් බවට පත් විය.

රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ ප්‍රධාන අරමුණු සහ පරමාර්ථ අතුරින් ලංකා ජනතාවගේ ඉතිහාසය, ආගම්, භාෂා, සාහිත්‍යය සහ කලාවන් මෙන්ම මානව විද්‍යාත්මක අංශ පිළිබඳ අධ්‍යයනය සහ විමර්ශනය සඳහා වැදගත් ස්ථානයක් හිමි විය.

පැරණි කාසි වර්ග, මානව විද්‍යාත්මක වටිනාකමකින් යුත් කෞතුක සහ පෞරාණික වස්තු එක් රැස් කොට සංරක්ෂණය කිරීම සංගමයේ පුස්තකාලය සහ කෞතුකාගාරය ස්ථාපනය කිරීමේ ඒක් අරමුණක් විය. ශ්‍රීමත් චාල්ස් මැකාර්ති ආණ්ඩුකාරවරයා චක්‍රලේඛයක් නිකුත් කරමින් ස්වදේශික මුදලි මුහන්දිරම්වරුන්ගේ මාර්ගයෙන් සංගමය සඳහා යෝග්‍ය කෞතුක වස්තු මිලදී ගැනීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට දැන්වූයේය.

මෙසේ ලැබුණු කෞතුක වස්තු තැන්පත් කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් රාජකීය ආසියාතික සමිතියට නොවූයෙන් ඒ සඳහා ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා පෞද්ගලික මට්ටමෙන් විශේෂ උනන්දුවක් දරා 1877 ජනවාරි මස 01 වෙනි දින කොළඹ කෞතුකාගාරය ආරම්භ කළේය. අගය මෙතෙකැයි කියා නිම කළ නොහැකි ජාතික වැදගත්කමකින් යුත් සුවිශේෂ ආයතනයක් වන ජාතික කෞතුකාගාරය බිහි වීමෙහි ලා රාජකීය ආසියාතික සංගමයෙන් ඉටු වූයේ යුගකාරක මෙහෙයකි.

ජාතික කෞතුකාගාරය ස්ථාපනය කිරීමට නොදෙවෙනි යුගකාරක මෙහෙයක් රාජකීය ආසියාතික සංගමයෙන් ඉටු වූයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට පුරෝගාමී වීමෙනි.

ආරම්භක අවස්ථාවේ සිට රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ සඟරාවේ ලංකාවේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් කාසි, ශිලා ලේඛන සහ තවත් විවිධ තේමා යටතේ ලිපි රැසක් පළ විය.

මේ සම්බන්ධයෙන් ඊ ළඟ වැදගත් පියවර වන්නේ 1884 වර්ෂයේදී ශ්‍රීමත් ආතර් ගෝර්ඩන් ආණ්ඩුකාරවරයා විසින් උතුරු මැද පළාතේ පුරාවිද්‍යාත්මක නටබුන් ගවේෂණය සඳහා විශේෂ අරමුදලක් ආරම්භ කිරීමයි. මේ අරමුදල යොදාගනිමින් රාජකීය ආසියාතික සංගමය මඟින් අනුරාධපුර මිරිසවැටි දාගැබේ කැණීම් කටයුතු ආරම්භ කරන ලද අතර 1890 වර්ෂයේ පුරාවිද්‍යාත්ම ගවේෂණය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේතුව ස්ථාපනය කෙරිණ.

රාජකීය ආසියාතික සංගමය මඟින් අරඹන ලද තවත් වැදගත් ව්‍යාපෘතියක් වූයේ සිංහල ශබ්ද කෝෂ සම්පාදනයයි.

ජේම්ස් ද අල්විස් පඬිවරයා විසින් සංගමයේ සඟරාවට සපයන ලද ලිපි මඟින් සිංහල භාෂා අධ්‍යයනය පිළිබඳ දෙස් විදෙස් පඬිවරුන්ගේ අවධානය සිංහල භාෂාව සහ එහි ප්‍රභවය නෙරෙහි යොමු විය. 1881 වර්ෂයේදී සිංහල - ඉංග්‍රීසි ශබ්ද කෝෂයක අවශ්‍යතාව කෙරෙහි සංගමයේ අවධානය යොමු විය.

ක්‍රිස්තියානි හා කතෝලික පූජකවරුන්, බෞද්ධ භික්ෂූන් හා සිංහල පඬිවරුන් සංගමයේ කමිටුවක් ලෙස සංවිධානය වී වර්ෂ කිහිපයක් දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කොට 1923 වර්ෂය වන විට ඒබ්‍රහම් මැන්දිස් ගුණසේකරගේ ප්‍රධානත්වයෙන් ශබ්දකෝෂ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවිණ.

රාජකීය ආසියාතික සංගමයේ පුරෝගාමිත්වයෙන් ඇරඹුණු සිංහල ශබ්දකෝෂ ව්‍යාපෘතිය පසුව ලංකා විශ්වවිද්‍යාලයට පැවරී වර්තමානය වන විට සංස්කෘතික අමාත්‍යාංශය යටතට පත්ව තිබේ.

1920 වර්ෂයේ රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ 73 වන සඟරා කලාපය අතීත කඩඉමක් සේ සලකා ශතවර්ෂාවලෝකනයක යෙදෙන කල මේ සංගමය කෙතරම් පෘථුල ජාතික නියෝජනයකින් සමන්විතව පැවතියේද යන්න අවබෝධ කර ගත හැකි වනු ඇත. 1921 වර්ෂය සඳහා නිලධාරී මණ්ඩලය මුල් පිටුවේ ඇතුළත සඳහන් වෙයි. පොන්නම්බලම් අරුණාචලම් සංගමයේ සභාපතිය.

ශ්‍රීමත් ඇන්ටන් බර්ට්‍රම්, වෛද්‍ය ජෝසප් පියර්සන් සහ ආර්. ජී. ඈන්තනීස් උප සභාපතිවරුය. වාසල මුදලි ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන, සී. ඩබ්ලිව් හෝර්ස්ෆල්, වාසල මුදලි සයිමන් ද සිල්වා, වෛද්‍ය සී. ඒ. හේවාවිතාරණ, වෛද්‍ය එස්. සී. පෝල්, රාජ්‍ය මන්ත්‍රී ඊ. ඩබ්ලිව් පෙරේරා, වාසල මුදලි ඒබ්‍රහම් මැන්දිස් ගුණසේකර, ඩබ්ලිව්. ආතර් ද සිල්වා, එෆ්. ලෙවිස් ජේ. ජේ. බී. ටර්නර්, ඒ. එම්. හෝකාර්ට් සහ ඩී. බී. ජයතිලක පාලක සභා සාමාජිකයෝ වූහ. මේ සියලු දෙනාම පාණ්ඩිත්‍යයෙන් අගතැන්පත් විද්වත්හුය.

සියවසකට පසුව සංගමයේ ප්‍රතිමූර්තිය අවලෝකනයෙහිදී මේ විචිත්‍ර චිත්‍රය කෙමෙන් අඳුරු වන සෙයක් දිස්වෙයි.

---

● ඔස්වල්ඩ් ගොඩකුඹුර
රඹුක්කන විශේෂ





# නයින්ට පොළඟුන්ට ආදරේ කරන හසන්ති

## සර්පයෝ ගෙදර ගේන්නේ පොත් බෑග් එකේ දාගෙන

## පිඹුරෙක් කියලා පොළඟෙක් ගෙදර ගෙනැල්ලා

## සර්ප වෙදකම විතරක් නෙවෙයි සර්වාංග වෙදකමත් කරනවා

**"දුව සමහර දවස්වල ඉස්කෝලේ ඇරිලා ගෙදර ආවාම පොත් බෑග් එක මේසය උඩ නොතියා දොර ළඟ බිමින් තියනවා. පොත් බෑග් එක බිමින් තිබ්බේ ඇයි කියලා ඇහුවාම එයා කියන්නේ බෑග් එකේ සර්පයෙක් ඉන්නවා කියලා. මම දවසක් දුව එහෙම කීවාම එයාගේ පොත් බෑග් එක හෙමින් ඇරලා බැලුවා. ඒ බෑග් එක ඇතුළේ තුවාල වුණු නයෙක් හිටියා. තවත් දවසක් දුව පන්ති ගිහිල්ලා මගෙත් එක්කම ගෙදරට ආවා. මම ගේ ඇතුළට ගිහිල්ලා ටිකකින් බලන කොට දුව ගෙදර නැහැ. අපි ආව ත්‍රීවීලර් එකෙන් බහින කොටම එයාට කෝල් එකක් ඇවිත් එයා සර්පයෙක් අල්ලන්න ගිහින්." සර්පයන්ට බය නැති දියණියගේ මව පවසන්නේ ආඩම්බරයෙනි.**

විවිධ අනතුරුවලට මුහුණදී තුවාල ලබා සිටින නයි පොළොගුන් වැනි විෂඝෝර සර්පයන් ඇයට තවත් වටිනා ජීවිතයකි. එම සර්පයන් අල්ලාගෙන නිවසට ගෙනැවිත් ප්‍රතිකාර කර මුදා හැරීමට ඇය ඕනෑම මොහොතක සූදානම්ය.

බොහෝ විට පිරිමියකු පවා සර්පයන් ඇල්ලීමට බිය වන බව නොරහසකි. එසේ තිබියදී තවමත් පාසල් ශිෂ්‍යාවක වන හසන්ති භාග්‍යා හිටිබංඩාර දැරියට සර්පයන් ඇල්ලීම සෙල්ලමකි. මොලගොඩ අළුලෙන විහාරස්ථානය සමීපයේ පදිංචි ඇය පින්නවල ජාතික පාසලෙන් වාණිජ විෂය ධාරාව හදාරා මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිටීමට නියමිතය.

''මගේ අත්තා සර්ප වෙදකම කරනවා. සර්පයන් දෂ්ට කළාම අත්තා ළඟට බේත් කරන්න එනකොට කාපු සර්පයා මරාගෙන ගේනවා. එහෙම මරාගෙන ආපු සර්පයන් මම මොන්ටිසෝරි යන කාලේ ඉඳලා අතපත ගාලා බැලුවා.

මීට අවුරුදු තුනකට විතර කලින් මොලගොඩ පෙට්‍රල් ෂෙඩ් එක ළඟ ටික කාලයක් වහලා තිබුණු අපේ කඩයක් සුද්ද කරනවිට සර්පයන් දෙදෙනෙක් සිටියා. එක්කෙනෙක් ටිකක් සැර පාටයි. මම එයාට යන්න ඇරලා අනිත් එක්කෙනා ගෙදර ගෙනාවා. ඒ වෙනකොට සර්පයන් හඳුනන්නේ නැහැ. මම හිතුවේ පිඹුරෙක් කියලා.

මගේ යාළුවෝ එයාගේ පොටෝ අරගෙන පින්නවල සත්තුවත්තට ගිහින් ඒ පිංතූර පෙන්නලා මේ සර්පයා මොකාද කියලා අහලා. ඊට පස්සේ සත්තුවත්තේ අය ඒ පොළඟෙක් කියලා. සර්පයන් ඇති කරන්න තහනම් කියලාත් කියලා තියෙනවා. පොළඟෙක් කීවාම මමත් බය වුණා.

අපි එයාව යන්න ඇරියා. ඒත් එයා යන්නේ නැතිව ගෙදරට ආවා. ඒ පොළඟා මගේ අතේ තියාගෙන ගත්ත පිංතූරයක් සමාජ මාධ්‍යවල ගියා. ඒක දැකලා සජිත් කුමාර අයියා මට කතා කළා. ඔහු තමයි මට සර්පයන් අල්ලන්න මට කියලා දුන්නේ.

හසන්ති භාග්‍යා මේ වන විට නයි අසූ පහක් පමණ අල්ලා නිදහස් කර ඇත. පසුගිය මාර්තු විසි හත්වෙනිදා එකම දවසේ නයි නව දෙනෙක් ඇල්ලුවා. සර්පයෙක් ඉන්නවා කියලා කීව ගමන්ම මම යනවා. විනාඩියක්වත් ඉන්නේ නැහැ.

පරක්කු වුනොත් කවුරු හරි සර්පයාව මරනවා. ඉස්කෝලේ ගෙනියන බෑග් එකේ දාගෙන මම සර්පයාව ගෙදර ගේනවා. මම නයි තමයි ගොඩක් අල්ලන්නේ. දැන් මේ පැත්තේ කවුරුවත් සර්පයන් මරන්නේ නැහැ. මෙච්චර කාලෙකට මට සර්පයෙක් දෂ්ට කරලා නැහැ.

හුඟාක් සර්පයන් විෂ නැහැ. සුළු විෂ සත්තු ගෙනත් ගෙවල් ළඟ තිබෙන අක්කර විසි හතරක වන වගාවට නිදහස් කරනවා. උග්‍ර විෂ අය දමන්නේ බොලගම රක්ෂිතයට. මේ සර්පයන් පින්නවල සතුන්වත්තට දුන්නත් එහි සර්පයන්ට වෙනම තැනක් නැහැ. දුර්ලභ සර්පයෙක් නම් දෙහිවල සතුන්වත්තට ගෙනියනවා." හසන්ති පවසන්නේ සතුටිනි.

"මිනිස්සුන්ට උදවු කරන්න මිනිස්සු ඉන්නවා. සතුන්ට උදවු කරන අය සමාජයේ හරිම අඩුයි. මම ඉල්ලන්නේ සර්පයන්ට ඒ අයගේ පාඩුවේ ඉන්න ඉඩදෙන්න කියලයි මම ඉල්ලා සිටින්නේ. මේ දැනුම තිබෙන ගොඩක් දෙනෙක් ඒක තව කෙනෙක්ට කියලා දෙන්න කැමැති නැහැ.

උග්‍ර විෂ සතුන්ට වඩා අපට වැඩිපුරම හමුවන්නේ නිර්විෂ සර්පයන්. නමුත් මේ ගැන සමාජයේ වැටහීමක් නැති නිසා සර්පයකු දකින විට මරන්න පෙළඹෙනවා. මේ සර්පයන් පිළිබඳව පාසල් දරුවන්ට උගන්වා ඒ මඟින් හෝ සමාජය දැනුම්වත් කරන්න අවශ්‍යයි.

මගේ 076-7335313 දුරකතන අංකයට කතා කළොත් මම ඕනෑම වෙලාවක සර්පයෙක් බේරාගන්න ඉදිරිපත් වෙනවා.''හසන්ති භාග්‍යා (හසී) දැරිය තිර හඬින් පවසයි.

හසන්තිගේ පියා ප්‍රදීප් රවීන්ද්‍ර කුමාර හිටිබංඩාර යුධ හමුදා සේවාවේ යෙදී සිටින්නෙකි. ඔහු තම දියණියගේ මෙම අපූරු හැකියාව පිළිබඳව පවසන්නේ මෙබන්දකි.

"දුවට නොතේරෙන කුඩා කාලයේ ඉඳලාම අපි මෙයාගේ සමහර වැඩ ගැන කල්පනාවෙන් සිටියා. එයා සතුන් සර්පයන් ගැන නිතරම නිරීක්ෂණය කළා. මෙයාගේ සර්පයන් සමඟ වැඩ මම දැනගත්තෙත් පිංතූර වලින්. පාසලේ අධ්‍යාපන කටයුතු සමඟ දුව සර්පයන් ගැනත් ඉගෙන ගන්නවා.

ලෙඩ රෝගවලට බෙහෙත් කරනවා. අපේ අත්තාගේ ගෙදර පින්නවල අලි අනාථාගාරය ළඟමයි තිබිලා තියෙන්නේ. මුල් කාලයේ උඩරටට රේල් පාර හදනකොට අලින්ගෙන් වැඩ අරගෙන තියෙනවා. ඒ අලින්ට බේත් කරලා ගාල් කරලා තිබුණු අලිවත්ත තමයි පසුකාලෙක අලි අනාථාගාරයට අරගෙන තිබෙන්නේ. අපේ අත්තාගේ පවුලේ සත්ව වෙදකම පාරම්පරිකවම තිබිලා තියෙනවා. දැන් ඒ හැකියාව දුවටත් තියෙනවා. දවසක් දුව පිඹුරෙක් කියලා නොදැන පොළඟෙක් ඇති කළත් අපි ඒකට බාධා කළේ නැහැ. පොළඟා හවස පහ හමාර හය වෙනකොට දුව හිටිය උඩ තට්ටුවට පඩිපෙළ දිගේ යනවා.

දුව මටත් නයි අල්ලන්න කියලා දුන්නා. දුව ගෙදර නැති වෙලාවට මමත් අහල පහල ගෙදරකට නයෙක් ආවොත් යන්න හිතාගෙන මේ වැඩේ ඉගෙන ගත්තා .මේ වෙනකොට මමත් නයි දෙදෙනෙක් බේරාගෙන තියෙනවා.ජීවිත දෙකක් බේරාගන්න ලැබීම ගැන මටත් තිබෙන්නේ පුදුම සතුටක්.''හසන්තිගේ මව ඒශිකා සඳමාලි වීරසිංහ පවසන්නීය.

''සර්පයන් අල්ලන එක ඕනෑම කෙනෙක්ට ඉගෙන ගන්න පුළුවන්.හැබැයි බය නැතිවෙන්න ඕනෑ.

මේ නංගිව සමාජ මාධ්‍යවල පොළඟා සමඟ දාලා තිබුණු ඡායාරූපවලින් හඳුනා ගත්තා. බොහෝ දෙනෙක් නොදන්නාකම නිසා නිර්විෂ සර්පයන්ව මරා දමනවා. විෂ සහිත සර්පයන් වුණත් අල්ලලා කැලේට නිදහස් කරන්න අපි කටයුතු කරනවා. මේ වනවිට එකසිය දහඅට දෙනෙක්ට මම මේ ශිල්පය උගන්වලා තිබෙනවා.

ඒ අතර හාමුදුරු නමක්ද සිටිනවා. මේ ගැන ඉගෙන ගන්න කැමැති කෙනෙක් ඉන්නවා නම් මගේ 071-3103852 දුරකතන අංකයට කතාකළොත් උගන්වන්න පුළුවන්.'' හසන්තිට සර්පයන් පිළිබඳව කියාදුන් හොරණ, සජිත් කුමාර (සජී)පවසයි.

''අපේ පවුලේ සර්ප විෂ වෙදකම අවුරුදු ගණනාවක සිට පැවත එන පාරම්පරික වෙදකමක්. සර්පයෙක් කෑවාම සතා මරාගෙන එන්න ඕනෑ නැහැ.

මේ වෙදකම ඉදිරියට ගෙනියන්න කෙනෙක් නැතිවෙයි කියලයි මට දුක තිබුණේ. ඒත් මේ දුව ඉස්කෝලේ යන ගමන්ම ඒක ඉගෙන ගත්තා. දැන් බය නැතිව ලෙඩ්ඩුන්ට බෙහෙත් කරනවා.

සර්ප වෙදකම විතරක් නෙවෙයි එයා සර්වාංග වෙදකමත් කරනවා.

ඇය මගෙන් පස්සේ නැතිවෙන්න නොදී මේ වෙදකම එයා ඉදිරියට ගෙනියන බව මට විශ්වාසයි. ''හසන්තිගේ අත්තා වන සර්ප විෂ වෙදැදුරු ජී. පී. වීරසිංහ පවසන්නේ මහත් සතුටිනි.

> **"හුඟාක් සර්පයන් විෂ නැහැ. සුළු විෂ සත්තු ගෙනත් ගෙවල් ළඟ තිබෙන අක්කර විසි හතරක වන වගාවට නිදහස් කරනවා. උග්‍ර විෂ අය දමන්නේ බොලගම රක්ෂිතයට"**








වමේ සිට, මව සඳමාලි වීරසිංහ, පියා ප්‍රදීප් රවීන්ද්‍ර කුමාර හිටිබණ්ඩාර, වෙදැදුරු ජී.පී . වීරසිංහ

> **"අපේ පවුලේ සර්ප විෂ වෙදකම අවුරුදු ගණනාවක සිට පැවත එන එකක්. සර්පයෙක් කෑවාම සතා මරාගෙන එන්න ඕනෑ නැහැ"**

# "ජනප්‍රිය" සංකල්පය වටහාගත හැකිද?

## සන්නිවේදන සංවාද



● මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

"ජනප්‍රිය යන යෙදුම සන්නිවේදන අධ්‍යයනයේදි බහු අරුත් සපයන අතර විවාදාපන්න අරුත් ද සපයන බව අමතක නොකරන්න. එක් අයකුට හෝ කණ්ඩායමකට ජනප්‍රිය (Popular or favourite) යමක් ඇත්නම්, එයම තවත් අයකුට හෝ තවත් කණ්ඩායමකට එසේ නොවනු ඇත. මේ නිසා 'ජනප්‍රිය' යන්න අර්ථ සමුදායක් රැගත් යෙදුමක් වශයෙන් සලකන්නට වෙනවා. මම කැමති දේකට ඔබ බාගදා අකැමැති වන්නට පුළුවන." මෙසේ පවසන්ට පටන් ගත්තේ සන්නිවේදනයේ 'ජනප්‍රිය' සංකල්පය (Popular Concept) ඉගැන්වීමට පැමිණි සන්නිවේදන ගුරුවරයා වන ජේම්ස් ඩී. හැලැරස් (James D Halliras) මහාචාර්යවරයා. ඔහු පන්තිකාමරයට පැමිණ වෙනත් බොහෝ ගුරුවරුන් මෙන් සම්පූර්ණ සම්මත ඇඳුම් කට්ටලයකින් හෙවත් ගෞරවනීය ලෙස සැලකෙන ඇඳුම් කට්ටලයකින් (Full suit or tradition bound suit) සැරසී නොවේ. මේ නිසා තමන්ගේ ඇඳුම් කට්ටලයම නිදසුනකට ගැනීමට කැමති බවක් පෙන්නුම් කළා. "බලන්න, මම මේ ඇඳගෙන ඇවිත් තියන ඇඳුම. මම ටයි එකක් දාගෙන නැහැ. කමිස කර පියවලත් නැහැ. මම කෝට් (Coat)එකක් ඇඳගෙනත් නැහැ. මට නිකමට හිතුණා, මම ටයිකෝට් වලින් සැරසෙන්න වුවමනා නැහැ කියලා. ඇයි මට එහෙම හිතුණේ? කිසි කෙනෙක් මට බලකෙරුවෙත් නැහැ. මගෙන් කිසි කෙනෙක් ඉල්ලුවෙත් නැහැ. අසවල් ඇඳුම් කට්ටලයෙන් සැරසී පන්ති කාමරයට පැමිණිය යුතුයයි නියමයක් ඇත්තෙත් නැහැ. දැන් මම අහන ප්‍රශ්නය මෙපමණය.

"මගේ මේ ඇඳුම් කට්ටලයට බොහෝ දෙනෙක් කැමතිද? නැද්ද? කැමතියි පවසන අයට අත උස්සන්න කිව්වොත් කී දෙනෙක් අත උස්සයිද? අකැමැති පවසන අය අත උස්සන්න කිව්වොත් කී දෙනෙක් අත් උස්සයිද? අනිත් අතට මම ඒ කාරණා දැන ගත යුතුද? දැන ගැනීමට කැමති නම් මට ඒ මත විමැසුම කරන්නට පුළුවන්. ඒත් එහෙම මත විමසුමක් අවශ්‍යද නැද්ද? (Necessity) යන්න විමසිය යුතුනම් එසේ විමසිය හැකිය. මේ නිසා අපට එක් ප්‍රධාන සන්නිවේදන සූත්‍රයක් (communication theory) ගොඩ නැඟීමට පුළුවන් වෙනවා."

"මොකක්ද ඒ න්‍යාය?"

"කැමැත්ත හෝ අකැමැත්ත හෝ රුචිය හා අරුචිය විමසීමේ අවශ්‍යතාව"

'The necessity to know the likes and dislikes, preferences and precedences in some matter'

"මේ කාගේ න්‍යායක්ද? කාගේ සූත්‍රයක් ද?"

"මේක පරපුරින් පරපුරට පැවැත එන පරපුරු න්‍යායක් (a generation theory) පරපුරු න්‍යායට පටන්ගත් පුද්ගලයන් නැහැ. පටන් ගත් තැනක් නැහැ. පටන්ගත් හේතු සමුදායක් නම් පවතිනවා."

"ඒ කුමක්ද?"

"අවශ්‍යතාව (the necessity)

"සුළඟ අපට අවශ්‍යය. ජලය අපට අවශ්‍යය. කෑම්බීම් අවශ්‍යය. ගින්දර අවශ්‍යය. කතාබහ අවශ්‍යය. කෙතරම් අවශ්‍යද? අවශ්‍යතාවේ මිනුම කුමක්ද?"

"අවශ්‍යතාවට මිනුමක් නැහැ කියල සමාජ සම්මතයක් පවතිනවා. (there is no measure for necessity)මේ න්‍යාය වටහාදීමත් අපහසුයි. වටහාදීමට පරපුරින් පරපුරට වෑයම් කලත් ඒක තවමත් නොවැටහී පවතිනවා. බාගදා ජීව විද්‍යාත්මක අවශ්‍යතාවක් (a biological need) වෙන්ට පුළුවන්. බාගදා පැවැත්මේ සාධකයක් (a factor in .........) වෙන්නටත් පුළුවන්. අපේ මිනුම් වෙනස්වීමට පුළුවන්. ඒ කොහොමද එහෙම වෙන්නේ? අපි මිනුමට ගන්නා මිනුම් දණ්ඩ කෘත්‍රිම සාධක මත පවතින්නක් වෙන්ට පුළුවන්. ඒ තත්ත්වය කොහොමද වටහා ගන්නේ? අපි කතාබහ කරමින් හිටිය 'ජනප්‍රිය' සංකල්පය ගැන. මේ සංකල්පය වුවමනා නම් කෘත්‍රිම සාධක මත පවතින්නක් බවට පත් කරන්න පුළුවන්. ඒ කොහොමද?

අපි ගනිමු අපේ සංවාදයට මුල්වුණු ඇඳුම් කට්ටලයම. ඇඳුම් කට්ටලයක් වෙනුවෙන් අපූරු වගන්ති ලියන්නට බැරිද? පුළුවන්. ඇඳුම් කට්ටලයක් වෙනුවෙන් ගීතයක් ලිවීමට බැරිද? පුළුවන්. ඒ ගීතය, ඒ වගන්ති නිතර නිතර ඇහෙන්ට සලස්වන්නට බැරිද? මොකද බැරි? පුළුවන්.

වැඩි පිරිසක් කතා කරන නැතුවම බැරි වස්තුවක් කෘත්‍රිම ලෙස ඇති කිරීමට බැරිද? පුළුවන්. ඒ හැකියාව ඇති අය සමගයි අපි අපේ කලදවස ගත කරන්නේ. ඒ නිසා කෙනෙක් කිව්වොත් අපි කලදවස ගෙවන්නේ කෘත්‍රිම සාධක මඟින් 'ජනප්‍රිය' සංකල්පය උලුප්පා දක්වන ලෝකයක කියල. ඒ මතයට අපට එකඟවීමට සිද්ධ වෙනවා. මේ නිසා අවශ්‍යතාව එකක්. අවශ්‍යතාව සකසන කෘත්‍රිම සාධක තවෙකක්."

---

# ජයලත්ගේ හිතේ උපන් 'කුසුම්ට' පණ දුන් ඇය

## - වසන්ති චතුරානි

● ඒ. ඩී. රන්ජිත් කුමාර

"වියෝ ගී ගැයෙනා හදේ
ආදර මල් නොමියේ"

නීලා වික්‍රමසිංහ විසින් ගැයූ මේ ගීතය ඇසෙත්ම අපට සිහි වන්නේ "ගැහැනු ළමයි" චිත්‍රපටයයි. "ගැහැනු ළමයි" චිත්‍රපටය මතක් වෙන විට එහි ප්‍රධාන චරිතය වූ කුසුම් ලෙස රඟ පෑ වසන්ති චතුරානි ද නිබඳව අපේ සිත් තුළ රැඳී ඇති බව දැනේ. කරුණාසේන ජයලත් නවකතාවෙන් මැවූ, ධෛර්යයෙන් හා ආත්ම ශක්තියෙන් යුක්තව, වේදනා, බාධක සහ කම්කටොලු ඉදිරියේ නොසැලී ජීවිතය ජය ගත් අපරාජිත යුවතියට පණ දෙන වසන්තීව මැවි මැවී පෙනෙයි.


ජයලත් තම මනසේ රැඳුන කුසුම්ගේ චරිතය සුමිත්‍රා පීරිස් විසින් 1978 දී සිනමාවට නැඟීමේ දි කුසුම්ට තෝරා ගන්නේ කවුද? යන අභියෝගය ඔවුන් අභිමුවේ වූහ.

"ජයලත් අපි අලුත් ළමයෙක්. විශේෂයෙන් ඇඩ්වාන්ස් ලෙවල් පන්තිවල ඉන්න පාසල් යන මට්ටමේ ගැහැනු ළමයෙක් සොයමු." සුමිත්‍රා යෝජනා කළාය.

ගම්පහ හෝලික්‍රොස් (සිරිකුරුස) විද්‍යාලයෙන් කුසුම්ට හරියන ළමයෙක් සොයා ගැනීමට සුමිත්‍රාට සිතුණේ ඇගේ ඥාති සොහොයුරියක් වූ ජානකී ගුණවර්ධනගේ ගම්පහ නිවසට ගිය දිනයක. විදුහලේ විදුහල්පතිනිය වූ නෙලී හෙලන් කන්‍යා සොහොයුරියගෙන් උපකාරයක් ගැනීමට මේ දෙදෙනා ගියේ චකිතයකින්ය. දැඩි ශික්ෂණයක්, විනයක් සහිතව පාලනයක් ගෙන ගිය කන්‍යා සොහොයුරිය ඒ සඳහා දැක්වූයේ යහපත් සුභවාදි ප්‍රතිචාරයකි.



ගඟ අද්දර චිත්‍රපටයේ සනත් ගුණතිලක සමඟ



සිරිබෝ අයියා චිත්‍රපටයේ ගාමිණී සමඟ

චිත්‍රපටයකට සුදුසු නිළියක් සොයන්න නෝනලා දෙදෙනෙක් ඇවිත් කියන ආරංචිය සිසුවියන් අතර පැතිර යාම නිසා කිහිප දෙනෙක්ම ඒ සඳහා උනන්දු වූහ. කන්‍යා සොහොයුරිය සමඟ සුමිත්‍රා පීරිස් තම ඥාති සොහොයුරිය ද විවේක කාලයේ පාසල් භූමියේ ඇවිද ගියේ කුසුම්ගේ චරිතයට ගැහැනු ළමයෙකු සොයමිනි. පාසලේ ගොඩනැගිල්ලක කණුවක් අසල කෙළි දෙළෙන් සිනාසෙමින්, ඇස්වලින් කතා කරමින් සිසුවියන් අතර සිටි සුවිශේෂ මුහුණක් දෙස සුමිත්‍රාවන්ගේ ඇස යොමු වූවාය. ඒ සිසුවිය ගැන කන්‍යා සොහොයුරියට ඇය රහසින් යමක් කීවාය.

"දරුවෝ, අර ඩොරීන්ට එන්න කියන්න මගේ ඔෆිස් එකට." කන්‍යා සොහොයුරිය අසල සිටි සිසුවියකට කීවාය. වයස අවුරුදු 15ක පමණ වයසේ පසු වූ ඇය විදුහල්පති කාමරයට පිවිසියාය. ඇය ලස්සන ඇස් දෙකකට හිමිකම් කීවාය.

"අපි චිත්‍රපටයක් කරන්න යනවා. කැමතිද? චිත්‍රපටයේ රඟපාන්න." සුමිත්‍රාවන් කාරුණිකව ඇසුවාය.

ඇය බිම බලාගෙන "කැමති නෑ" යි කීවාය.

"හරි, ඔයා කියවලා තියෙනවද? 'ගැහැනු ළමයි' නවකතාව"

"ඔව්, මම ලයිබරි එකෙන් අරං කියවලා තියෙනවා."

"එහෙනං කුසුම්ගේ චරිතය මතක ඇති. කැමති නැද්ද ඒ චරිතය චිත්‍රපටයක රඟපාන්න දුව."

"කැමතියි." ඩොරීන් කීවේ දෙවතාවක් සිතා නොවේය.

ඩොරීන්, මේ චිත්‍රපටය අධ්‍යක්ෂණය කරන්නේ මම. මේ මගේ පළමුවැනි චිත්‍රපටය. ඔයා කැමති නම් මම ඔයාව මගේ ම දුවක් විදිහට බලා ගන්නවා."

"ආච්චිගෙන් අහන්න."

"මේ 1975 වසරේ ජනවාරි මාසයයි. ඩොරීන්ගේ ලිපිනය ලබා ගත් සුමිත්‍රාට සිතුණේ "මේ තමයි කුසුම්. මීට වඩා සුදුසු ළමයෙක් තවත් නෑ. කියාය. සුමිත්‍රා තම සැමියා වූ ලෙස්ටර් ජේම්ස් පීරිස් සමඟ පසුදා ඩොරීන්ගේ ගම්පහ ගෙදරට ගොඩ වූහ.

"ඩොරීන් ඉස්කෝලේ නාට්‍යයක රඟපාල තියෙනවද?"

"ඔව්, ක්‍රිස්මස් නාට්‍යයක රඟපෑවා."

"අපි ඩොරීන්ව බොහොම ආදරෙන් බලා ගන්නවා. ආච්චි අපිට අවසර දෙනවද?" ලෙස්ටර් ඇසීය.

"මහත්තයා ඩොරින්වයි, එයාගේ අක්කා හෙලන්වයි මම ඇහේ තියාගෙන ආරක්ෂා කරගෙන හැදුවේ, මේ සීයා එක්ක. ඩොරීන්ගේ අම්මා මේ දෙන්නා පුංචි කාලේ මැරුණා."

කන්‍යා සොහොයුරියගේ රෙකමදාරුව ගැන සිතූ ඩොරීන්ගේ සීයාත්, ආච්චිත් අවසර දුන්හ.

වසන්තා ඩොරීන් පීටර්සන් නම් ඇය "වසන්ති චතුරානි" නමින් "ගැහැනු ළමයි" චිත්‍රපටයෙන් සිනමාවට එක් වූවාය.

"අපි 'වසන්තා' කියලා සිනමාවට හඳුන්වා දෙමු." සුමිත්‍රාවන් යෝජනා කළාය.

"එහෙනං වසන්තා වෙනුවට අපි "චතුරානි" කෑල්ලත් එකතු කරලා "වසන්ති චතුරානි" කියමු. යෝජනා කළේ චිත්‍රපටයේ "වියෝ ගී ගැයෙනා හදේ" ගීතය රචනය ද රැගෙන එහි පැමිණි මහාචාර්ය සුනිල් ආරියරත්නයන් විසිනි.

"මම ගැහැනු ළමයි චිත්‍රපටයේ රඟපෑවේ ගැමි සංස්කෘතිය තුළ කාන්තා සදාචාරය සංකේතවත් කරන කුසුම් ලෙස. කුසුම් තම නැන්දාට තිබූ විශ්වාසය නිසා ඇගේ පුතා වූ නිමල් තමාට දැක්වූ ආදරය ප්‍රතික්ෂේප කරමින් මනසින් වද විඳින චරිතයක්. මම මේ චිත්‍රපටයේ වඩාත් කැමතිම දර්ශනය නිමල්ගේ ඇසුරෙන් වෙන්වන අවස්ථාව." ගොළු හදවතේ දමයන්ති හා සුගත් මුහුදු වෙරළේ දී වෙන්වෙන අවස්ථාව වගේ සංවේදී අවස්ථාවක්. මේ දර්ශනයේ නිමල් ලෙස රඟපෑවේ අජිත් ජිනදාස සමඟ. මේ ඒ අවස්ථාව.

"නිමලුයි මමයි ගමන් ගත්තේ පාළු පාරක. එහා පැත්තේ මුහුද. මඳ දුරක් යන කොට මම නිමල්ගේ අත අල්ලා ගත්තා. අපි කොළඹ ලයිට් හවුස් එක දිගේ ගිහින් පියගැට පෙළක්ගාව වාඩි වුණා.

"නිමල් අපි බඩගින්නෙ ඉන්නෙ පුළුවන්කමට නෙවි. අතු පැලක් වගෙ පුංචි ගේක අපි ඉන්නෙ පුළුවන් කමට නෙවි. නිමල් මම කියන දෙයින් හිතන්න එපා මම ඔයාට ආදරේ නෑ කියලා..."

"ඔන්න කුසුම් අඬන්න පටන් ගත්තා."

"නෑ නිමල්. මම කඳුළු පිහදා ගන්නම්. නිමල් මම ඔයාට ආදරෙයි. කොයිතරම් ආදරේ ද කිව්වොත් මට පුදුමයි මොකක්ද මේ ආදරය කියලා. ...... ඔයාගේ ජීවිතය සාර්ථක වෙන්න ඉඩ දීලා පැත්තකට වෙලා - ඔයාගේ සතුට දිහා බලලා මම සතුටු වෙන එක........ මම ඔයාට ආදරෙයි. ............ ඒ නිසයි මම කියන්නෙ. ............. ඔය එකට හිඟා කමු, එකට මැරෙමු කියලා බොළඳ කතා මට කියන්න බැහැ."

"අපි එහෙනං යමු කුසුම්"

"අපිට ආයෙ මෙහෙම හමුවෙන්න ලැබෙන්නෙ නෑ නිමල්. අපි තව ටිකක් ඉමු..... තව ටිකක්." නිමල් මාව වැලඳ ගන්නවා. මේ දර්ශනයේ දී මට ඇත්තටම ඇඬෙනවා."





අහසින් පොළොවට චිත්‍රපටයේ ටෝනි රණසිංහ සමඟ

වසන්ති මේ චරිතය රඟපාන කාලයේ නැවතී සිටියේ බම්බලපිටියේ ඩික්මන් පාරේ ලෙස්ටර් හා සුමිත්‍රාගේ නිවසේ ය. සහාය අධ්‍යක්ෂ වී. උපාලි පෙරේරාත්, කලා අධ්‍යක්ෂ හේමපාල ධර්මසේන වසන්තිට මුල සිටම දෙබස් කටපාඩම් කොට, අවශ්‍ය පහසුව දෙමින් රැක බලා ගනිමින්, අවවාද දීමෙන් දිරිමත් කළ බව වසන්ති කෘතඥතා පූර්වකව මතක් කළාය. චිත්‍රපටයේ පාසල් දර්ශන කළු අග්ගල සීතාවක විද්‍යාලයේ දී රූගත විය. ඇය සමඟ ශ්‍යාමා ආනන්ද, ඉනෝකා අමරසේන, ඉන්ද්‍රානි අබේවර්ධන, ජයන්ති රුද්‍රිගු, දන්තලා වීරසිංහ, තනුජා දිල්හානි, සුසිලා පෙරේරා, සිරිල් කොතලාවල, නිමල් දයාරත්න, පද්මසේන අතුකෝරල ආදීන් රඟපෑවේ එක පවුලක දරුවන් මෙනි.

වසන්තා ඩොරින් පීටර්සන් 1959 ඔක්තෝබර් 19 වෙනිදා ගම්පහ බණ්ඩාරවත්තේ දී උපත ලැබුවාය. ඇගේ පියා වූ ස්ටැන්ලි පීටර්සන් යුද්ධ හමුදාවේ සේවය කළ අතර මව වූ ලීලාවතී පීටර්සන් කුඩා අවදියේම මිය ගියාය. ඩොරින්ට සිටියේ එක් වැඩිමහල් සොහොයුරියක් වූ විනීතා හෙලන් පීටර්සන් ය. හෙලන් හා ඩොරීන් හැදී වැඩී ඇත්තේ මැගි නෝනා නම් ආච්චිගේත් කේ.කේ. ඇල්බට් නම් සීයාගේත් ආදරය කරුණාව, සෙනෙහස මැදය. මේ දෙදෙනාම අද ජීවතුන් අතර නැත.


වසන්ති වාසනාවන්ත නිළියක් වූවාය. ඇයට ඉන්පසු රඟපෑමට ලැබුණේ විෂම, සංකීර්ණ සමාජ බලවේග හමුවේ අනේක විධ දුක් දෝමනස්සයන්ට මුහුණ දුන් චරිතය. ඒ අතර "අහසින් පොළොවට", "ගඟ අද්දර" වඩාත් කැපී පෙනෙයි.

"අහසින් පොළොවට" අධ්‍යක්ෂණය කළේ මගේ ප්‍රියතම චිත්‍රපට අධ්‍යක්ෂවරයා, මට පියෙකු ලෙස දයාව, කරුණාව දැක්වූ මහත්මා ගති ඇති ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතායි. "අහසින් පොළොවට" චිත්‍රපටයේ මම පුෂ්පා. මගේ අක්කා විනීතා (ශ්‍රියානි අමරසේන) විවාහ වී සිටියේ දොස්තර සරත් (ටෝනි රණසිංහ) එක්ක. දරු ප්‍රසූතියකදී අක්කා මිය යාමෙන් වසර කිහිපයකට පසු මම සරත් අයියා හමුවෙනවා. අක්කයි, සරත් අයියයි විවාහ වෙනකොට මම පුංචි දැරියක්. දැන් මම තරුණියක්. මාව දකින සරත් අයියාට අක්කාව යළි සිහිවෙනවා. මම සරත් අයියාව හරියට වටහා ගන්නවා.

මගේ ආදරය අනුකම්පාව නිසා සරත් යළිත් අලුත් ජීවිතයක් ආරම්භ කරනවා. මා රඟ පෑ පුෂ්පා සියුම් මානසික හැඟීම් තීව්‍ර කරන චරිතයක්. මිල්ටන් මල්ලවාරච්චි ගයන "උපුල් නුවන් විදහා" ගීතය සමඟ මගේත්, සරත්ගේත් ඇස් ගැටෙනවා. එය අපේ වටහා ගැනීමේ ආරම්භයයි.

මා රඟ පෑ අසීරු චරිතය ඇත්තේ සුමිත්‍රා පීරිස් අධ්‍යක්ෂණය කළ "ගඟ අද්දර" චිත්‍රපටයේ රඟපෑමේදී මම අපමණ මානසික පීඩනයකට පත් වුණා. කුඩා කළ සිට ප්‍රේමයෙන් බැඳී සිටි රංජිත් (සනත් ගුණතිලක) නොතකා පියා (ටෝනි) වංශවත්, ධනවත්, ව්‍යාපාරිකයකුට මාව විවාහ කර දෙනවා. අප නොදැන මගේ සැමියා විදේශික කාන්තාවක් විවාහ කොට ගෙන සිටි අතර බිරිඳ සමඟ ඇගේ දරුවන් ද සමඟ මගේ ගෙදර පදිංචි වෙනවා. එතැන් සිට මම මානසික රෝගියෙක් වෙනවා. රෝහලේ ඇයට ප්‍රතිකාර කරන තරුණ දොස්තර (විජය කුමාරතුංග) තුළින් මම දකින්නේ මගේ රංජිත්ව. මේ චරිතය මා රඟ පෑ අසීරුම චරිතය. චිත්‍රපටය බැලූ ප්‍රේක්ෂකයන් මට ඇත්තටම පිස්සු යයි සිතා ගෙදරට මාව බලන්න ආවා.

මේ චිත්‍රපටයේ අවසාන දර්ශනය මට කිසිදා අමතක කරන්න බැහැ. මේ දර්ශනය රූ ගත කළේ (මගේ නිවස ලෙස) ගිරිඋල්ලේ විශාල නිවසක පිටුපස තියෙන ගඟක් අද්දර. මේ ගෙය කටුගම්පොල හිටපු මන්ත්‍රී ලීලානන්ද වීරසිංහ මහතාට අයිති එකක්. විජය කුමාරතුංග විසින්ම පසුබිම් ගායනා කළ මේ ගීතය ගයමින් ඔහු මා වෙත එන විට මට පෙනෙන්නේ ඒ එන්නේ රංජිත් කියලා. ඒක සිහිනමය අවස්ථාවක්.



**"මම 'ගඟ අද්දර' රඟපෑවට පසු මට කතා හැදුණා. දැන් වසන්තිට පිස්සු ලු. ඉන්නේ මුල්ලේරියාවේ." "එයා ඇඩ්ලින් විතාරණගේ දුව." මේ වගේ කතා නිසා මම ගඟ අද්දර නිර්මලා වගෙ වෙයි කියලත් බොහෝ දෙනෙක් හිතුවා ලු. මේ වගේ කතා හැදුනේ මම නිර්මලාගේ චරිතය හොඳින් රඟ පෑ නිසාද?**



හංසවිලක් චිත්‍රපටයේ ස්වර්ණා සමඟ

"ගඟ අද්දර පෙම් තෙපුල්
පවන් අතරේ මනු පුෂ්පිත මුදු
සුපුල් සිනා විසිරේ"

ඒ ඡායාව බල බලා මම ගඟ අද්දරින් ගඟට වැටෙනවා."

වසන්ති මේ කතාව කීවේ සංවේදී හැඟීමෙනි. 'ගඟ අද්දර' තිරගත වූ පසු 1981 වසරේ හොඳම නිළිය ලෙස සරසවිය, ජනාධිපති සම්මාන දිනා ගැනීමට භාග්‍යවන්තියක වූවාය.

"මම 'ගඟ අද්දර' රඟපෑවට පසු මට කතා හැදුණා. දැන් වසන්තිට පිස්සු ලු. ඉන්නේ මුල්ලේරියාවේ." "එයා ඇඩ්ලින් විතාරණගේ දුව." මේ වගේ කතා නිසා මම ගඟ අද්දර නිර්මලා වගෙ වෙයි කියලත් බොහෝ දෙනෙක් හිතුවා ලු. මේ වගේ කතා හැදුනේ මම නිර්මලාගේ චරිතය හොඳින් රඟ පෑ නිසාද? වසන්ති පැවසුවාය.

වසන්ති රඟ පෑ 'අමල් බිසෝ' හි බයියාට (ගාමිණීට) පෙම් බැඳි සඳලතා චරිතය ද, "සිරිබෝ අයියා" හි සිරිබෝ අයියාට (ජෝ) පෙම් බැඳි බිසෝ ද, 'හංස විලක්' හි සමන්ති ද, "පාර දිගේ" මධූ ද, 'ආයාචනා' හි සරෝජිනී, 'බිත්ති හතරේ' මල්ලිකා ද ලෙස සිනමාවේ ප්‍රබල චරිත රඟපෑවාය. මායා මන්දිර - ඉටිපහන් - චල අචල - දුර්ගාන්තය - ගිරය - හිඟන කොල්ලා - ගජමන් නෝනා - කුලවමිය ඇය රඟපෑ ටෙලි නාට්‍යය අතර විශේෂය.

වසන්තිගේ විවාහය සිදුවන්නේ අහම්බෙනි. ඇගේ සැමියා ව්‍යාපාරිකයකු වූ කුමාර ගුණවර්ධන ය. ඔහු තම හොඳම මිතුරා වූ අසෝක කහඳවෙල සමඟ වසන්තිගේ ගෙදර ගියහ. "වසන්ති මම කැමතියි ඔයා විවාහ කර ගන්න. හිතල බලලා උත්තර දෙන්න" කුමක් නිසාදෝ වසන්තිට "මම කැමතියි" කිය වුණාය. 1981 ඔක්තෝබර් 18 වෙනිදා හිතුවක්කාර තීරණයක් ගෙන කුමාර සමඟ වසන්ති විවාහ වූහ. ඔවුනට කාවින්ද අසංග ගුණවර්ධන නම් පුතෙක් සිටී.

වසන්තිගේ විවාහයට කණ කොකා හැඬුවේ නොසිතූ ලෙස ය. හදිසියේ හෙණයක් පතිත වූ ලෙස 1992 පෙබරවාරි 10 වැනිදා සැමියා වූ කුමාර හදිසියේම මිය ගියේය. වසන්තිගේ ජීවිතයට නොසිතූ විරූ දෙයකට මුහුණ දෙන්ට වුවත් ඒ හැම දෙයකට අභීතව මුහුණ දුන්නාය. වයස අවුරුදු 20 දී විවාහ වී 22 දී මවක් වූ ඇයගේ සැමියා මිය යන විට 33 වැනි වියේ පසු වූවාය. මේ නිසා ඇයට රඟපෑමට ලැබී තිබූ 'බැද්දේගම' හි හින්නිහාමි චරිතයත්, යහළු යෙහෙළි හි මුදිතලතා චරිතයත් මඟ හැරී ගියා ය. වසන්තිගේ පුතා කාවින්ද ග්‍රැෆික් ඩිසයිනර් කෙනෙකි. පොතපත අසීමිතව කියවන ඔහුගේ එකම ලෝකය අම්මාය. පසු කලෙක වාණිජ චිත්‍රපට රැසක රඟ පෑ වසන්ති; ජීවිත අත්දැකීම්වලින් පන්නරය ලබමින් ඉන්ද්‍රකීලයක් සේ නොසැලි ජීවිතයට මුහුණ දෙන්නීය.

# ල - ළ වරදන තවත් යෙදුම්

## හරි වහර

● ශ්‍රීනාත් ගණේවත්ත



**ස**ති කිහිපයක් පුරා 'හරි වහරින්' විමැසෙන්නේ 'ල' යෙදිය යුතු තැන්හි වරදවා 'ළ' යොදා ලියනු ලබන වදන් ය. තවත් එ වන් වදන් ගණනාවක් ම ඇති හෙයින් අදත් එයින් කිහිපයක් විමැසිල්ලට ලක් කරමු. කිසි දු පොතෙක පතෙක හෝ භාෂා ව්‍යවහාරයෙහි හෝ නො දක්නා ලැබෙන ව්‍යාජ භාෂා රීති ඇතැම්හු අනුගමනය කරති. ඇතැම් ගුරුවරු සිය සිසුනට ද ඒ උගන්වති. අමූල වූ එ බඳු රීති කලිනුදු 'හරි වහරින්' දක්වනු ලැබිණ. තව ද එ බඳු රීතියක් නම් 'හ' පූර්ව කොට (දන්තජ) 'ල' නොයෙදෙති යි ද (මූර්ධජ) 'ළ' ම යෙදෙති යි ද යන්න යි.

මේ ව්‍යාජ රීතිය පිළිපැදීම නිසා වරදවන වදන් බෙහෙවි. 'කෙහෙළි' යනු ඉන් එකක් වේ. මෙහි (මූර්ධජ) 'ළ' යෙදීම ඉඳුරා වැරැදි වේ. (දන්තජ) 'ල' යෙදීම ම නිවැරැදි ය.

කොඩිය යන අරුතැති 'කෙහෙලි' යන නාම ප්‍රකෘතිය දෙ විදියෙකින් වර නැඟේ. ඉන් එක් විදියක් නම් 'ය්' ආගම වීමෙන් (අමුතුවෙන් පැමිණීමෙන්) 'කෙහෙලිය' - කෙහෙලියෙන් - කෙහෙලියට' ඈ විසින් වර නැඟීම යි. අනෙක් විදිය නම් 'ලි' යන්නෙහි 'ල්' ව්‍යඤ්ජන අක්ෂරය ද්විත්ව වී 'කෙහෙල්ල - කෙහෙල්ලෙන් - කෙහෙල්ලට' ඈ විසින් වර නැඟීම යි.

'කෙහෙලි' යනු ප්‍රාණිවාචී වැ 'කෙහෙල්ලා' ආදි වශයෙනුදු යෙදෙන බව පුරාතන සාහිත්‍යයෙන් පෙනී යයි.

සවනත පත සුනිල් - පැහැ කිඳු දඹු නෙතන තල
සරහන මල් කෙහෙල්ලා - සර යැ වියත නොහැකියෙම්

යන කව් සිළුමිණි පැදිය එයට නිදසුනෙකි. මෙහි (දන්තජ) 'ල' ම යෙදෙන බවට එ ද සාධකයෙකි. එ පැදියෙහි මල් කෙහෙල්ලා නම් අනංගයා යි.

සිංහලයෙහි 'කෙහෙලි' යන්නට අනුරූප වැ සංස්කෘතයෙහි මෙන් ම පාලියෙහිත් 'කදලි' යනු යෙදෙයි. එහි දු (දන්තජ) 'ල' ම යෙදීම සිංහල වචනයෙහි දු 'ලි' යෙදෙන බව වඩාත් තහවුරු කරයි. කදලි යනු කෙහෙලි අරුතෙහි මෙන් ම කෙහෙල් (රඹ) අරුතෙහි ද එක සේ යෙදේ.

'සැකිළි' යනු ත් මෙ සේ වරදවා 'ළ' යොදන වදනක් වේ. ඇටසැකිළි වැනි යෙදුම්හි මේ වරද බෙහෙවින් යෙදෙනු දැකිය හැකි ය. මෙහි නිවැරැදි යෙදුම නම් 'සැකිලි' යන (දන්තජ) 'ල' සහිත වදන යි.

'සැකිලි' යනු වර නැඟීමේ දී බොහෝ විට 'ල්' ද්විත්ව වෙයි. එ හෙයින් 'සැකිල්ල - සැකිල්ලෙන් - සැකිල්ලට' ආදි රූප නිපැදේ.

'ස' ම 'හ' බවට පත් වීමෙන්, නැත හොත් 'ස' වෙනුවට 'හ' ආදේශ වීමෙන් 'හැකිලි' යනු ද 'හැකිල්ල - හැකිල්ලෙන් - හැකිල්ලට' ආදිය ද නිපැදේ.

අසු වැ පියබඳුන් පිය රැව් හැකිල්ලේ
පයැ'දැ යා නො හී මහ වේ මුළුල්ලේ

ආදි තිසර සන්දේශ පද්‍යයෙහි 'හැකිල්ලේ' යනු යෙදේ. එහි 'හ්' ද ඉවත් වීමෙන් 'ඇකිලි' යනු ද යෙදී ඇත්තේ ය.

'සැකිලි' යන්නෙන් දාමය හෙවත් දම (දම්වැළ) යන අරුත ලැබේ. ඇට සැකිලි යන්නෙහි දාමයෙකින් මෙන් එකට බැඳුණු ඇට සමූහය ගැනේ. හැකිලි යන්නෙන් 'මාංචු' යන අරුත ද ගැනේ. දම්වැළ වරදකරුවන් බැඳීමට ගන්නා හෙයින් යැ යි සිතිය හැකි ය.

සැකිලි යනු හා අනුරූප වැ පාලියෙහි 'සංඛලිකා' යනු යෙදේ. එහි දු (දන්තජ) 'ල' යෙදෙන සැටි සැලැකුව මනා ය.

මෙ ලෙස නිතර වරදවන තවත් වදනක් නම් 'කිහිළි' යනු යි. 'කිහිළිකරුව' වැනි වදන් ලිවීමේ දී මේ වැරැදි යෙදුම යෙදෙනු දැකිය හැකි ය.

මෙහි ලා නිවැරැදි වනුයේ (දන්තජ) 'ල' සහිත 'කිහිල' යනු යි.


'කිහිලි' යනු වර නැඟෙනුයේ අගැ 'ල්' ද්විත්ව වීමෙන් ම ය. එ නම් 'කිහිල්ල - කිහිල්ලට - කිහිල්ලෙන්' ආදි වශයෙනි. මෙහි 'ලි' විනා 'ළි' නොයෙදෙන බවට එ ද සාධක වේ.

කිහිලි යන්නෙහි මූල රූපය 'කිසිලි' වේ. 'ස', 'හ' වීමෙන් ඒ කිහිලි වේ. මේ අරුතෙහි 'කැස' යනුත් පැරැණි වහරෙහි යෙදුණු බව

තැසින් බොනුයේ තැසුබු

යන සිදත් සඟරා කියමනින් පෙනේ. කිහිල්ලෙන් (දිය) පානය කරනුයේ තැසුබු හෙවත් තැස්බෑවා යනු එහි අරුත යි.

කිහිලි යන්න හා සම අරුතින් සංස්කෘතයේත් පාලියේත් 'කච්ඡ' යනු සමාන වැ යෙදේ. එ වුව ද, ඇතැම් මධ්‍ය ඉන්දු ආර්ය භාෂාවෙක දක්නා ලැබෙතියි ප්‍රාචීන භාෂාඥයන් පවසන 'කච්ඡලි' යන්න සිංහලයෙහි 'කිහිලි' යන්නට වඩාත් සමරූප බව කිව හැකි ය.




● **ඩබ්ලිව්.ප්‍රදීප්** - තඹුත්තේගම විශේෂ

# මතකයේ රැඳෙන ගීතයක් ලියූ
# කාටත් අමතක ගී පද රචකයා

**ඉ**හත අපූර්ව, අර්ථපූර්ණ, රස පූර්ණ ගීතයේ පද රචකයා කවුරුන් නම් විය හැකිද ? කොයි ප්‍රදේශයක වෙසෙන්නෙක් නම් විය හැකි ද ? ඔහු අද ජීවිතයේ සැඳෑ සමයට පිවිසි ප්‍රත්‍යන්ත ගම්මැද්දකට වී නිහඬ දිවියක් ගෙවන අහිංසක කලාකරුවෙකි. ඒ අපූර්ව මිනිසා ගේය පදරචක"සිරිල් සමරකෝන්" ය. සිරිල් සමරකෝන් කලාකරුවා යනු කවරෙක්දැයි අද සමහරෙකු නොදනිතත් ඔහු අතින් ලියැවුණ මේ ගීතය ඔබට මතක ඇතැයි සිතමි.

"කැරකෙන රෝදේ පුංචි කරත්තේ
ඉඳගෙන මම ඉන්නේ
පදික වේදිකා පසුකර යන්නට
තල්ලු කරන් පුතුණේ"

එඩ්වඩ් ජයකොඩි ගයන මේ හද තත් විනිවිදින අර්ථපූර්ණ පදවැල සිරිල් සමරකෝන් කලාකරුවා අතින් ලියැවී ඇත්තේ මීට දශක හතරකටත් එපිටින්ය.

කලා ලෝකයේ බොහෝ දෙනෙකුට අද ඔහු සිටින ඉසව්වක් ගැන හෝ නිච්චියක් නැත. එහෙත් කැකිරාව, අලගොල්ලෑව ගම්මැද්දට වී ඔහු අද ගෙවන දිවිය තෘප්තිමත් එකකි.

කවියක්, කෙටි කතාවක් ලියන්නට තරම් තවමත් ඔහුගේ හිත පොහොසත්ය. සාහිත, කලා වැඩමුළු, ප්‍රසංග ආදිය සඳහා ද නිතැතින් සිරිල් ඇදී යන්නේ තම තරුණ අවදියේ තිබූ උද්යෝගයෙන්මය. ගුවන් විදුලියේ රජරට සේවය හා තිබූ බැඳීම හේතුවෙන්ම පසුකාලීනව ඔහු විසින්ම ලියූ ගී කිහිපයකට සිය හඬ මාධුර්ය එකතු කිරීමට සිරිල් සමරකෝන් කලාකරුවාට වාසනාව පෑදී ඇත. බස් කොන්දොස්තරවරයෙකු ලෙස ගෙවූ

වෘත්තීය ජීවිතයෙන් ද විශ්‍රාම ලබා ඔහු දැන් ජීවිතය ගෙවන්නේ උපේක්ෂාවෙනි. හේනෙහි, කුඹුරෙහි පැලකට වී ගොවිතැන් බත් කරමින් දවස දිවි ගත කිරීම ඔහුට සැනසීමකි.

"1970 අවුරුද්දේ තමයි මං ලංගම රස්සාවට ගියේ. මට මතකයි 1972 අවුරුද්දේ තමයි කැරකෙන රෝදේ ගීතය ලියවුණේ. බස් කොන්දොස්තර රස්සාවට මගේ හිතේ කැමැත්තක් තිබුණේ නෑ. මට ඕනකම තිබ්බේ ශිෂ්‍ය ගුරු පත්වීමක් අරගෙන කොහේ හරි දුෂ්කර ගමක දරුවන්ට උගන්නන්න යන්න. ඒත් දෛවය ලියැවිලා තිබුණේ වෙන විදිහකට. ඒ කාලේ ශිෂ්‍ය ගුරු පත්වීමකට මාසික පඩිය හැටියට ගෙව්වේ රුපියල් සීයයි.

ලංගම බස් කොන්දොස්තර කෙනෙකුට මාසෙට රුපියල් 220 ක් ගෙව්වා. ඒ වෙනකොට තිබ්බ දුෂ්කරතාත් එක්ක අකමැත්තෙන් වුණත් කොන්දොස්තර රස්සාවට ආවා. එතකොට මට අවුරුදු විසිතුනයි. රස්සාවට එන්න කලින් ගඩොල් කැපුවා, ලී ඉරුවා, ගල් කැඩුවා. ඔය වගේ දුෂ්කර ජීවිතයක් ගත කෙරුවේ. ඒ කාලේ ඉදන්ම නිකං ඉන්ඩ හිතක් තිබුණේ නෑ මට."

2015 වර්ෂයේ දී කලාභූෂණ සම්මානය සහ 2016 වර්ෂයේ දී කලා කීර්තිධර සම්මානය ඇතුළුව තවත් සාහිත, කලා උපහාර සම්මාන රැසකින් පිදුම් ලබා ඇති සිරිල් සමරකෝන් කලාකරුවාට අද ඒ සියල්ලක් සොඳුරු මතක මාත්‍රයක් පමණකි. එහෙත් ඒ අතීත මතකයන් බොහෝමයක් ඔහුට තවමත් අද ඊයේ මෙනි.

"බස් කොන්දොස්තර පත්වීම ලැබිලා මං මුලින්ම වැඩකෙරුවේ 134 පාරේ ගල්කිස්ස - අංගොඩ බස් එකේ. දවසක් හවස පහට විතර පිටකොටුව කාර්මික විද්‍යාලය හරියෙදි බස් එක විනාඩියකට නැවැත්තුවා. ඉස්සර කොළඹ වැඩි හරියක් දිව්වේ ඩබල් ඩෙකර් බස්. මං වැඩකෙරුවේ බස් එකේ උඩ කැල්ලේ. පහළ වෙන කොන්දොස්තර කෙනෙක් ඉන්නවා.

ඉතිං අර බස් එක නවත්තපු වෙලාවේ මං ජනේලෙකින් දැක්කා රෝද හයි කරපු ලෑලි තට්ටුවක් උඩ මනුස්සයෙක් වාඩිවෙලා ඉන්නවා. මං හිතන්නේ ඇවිදින්න බැරි ආබාධයක් තිබුණ මනුස්සයෙක්. පරණ කුඩයක් දෙකක්, තව පොඩි පොඩි ආම්පන්න ටිකක් මේ මනුස්සයා ළඟ තිබුණා. එතැන සංවේදීම දර්ශනේ තමයි අර ලෑලි තට්ටුව තල්ලු කෙරුවේ අවුරුදු දොළහක් විතර වෙච්ච පුංචි දරුවෙක්. තාත්තයි, පුතයි වෙන්ඩ ඇති. මේ සිද්ධිය දැක්කහම එකපාරටම වගේ මගේ පපුව පිච්චිලා ගියා. මට මගේ අම්මා, අප්පච්චි, ගෙදර මතක් වුණා. මටත් නොදැනිම අතේ තිබ්බ බස් ටිකට් අමුණලා තිබුණ කාඩ්බෝඩ් කෑල්ලේ කැරකෙන රෝදේ පුංචි කරත්තේ ඉදගෙන මං ඉන්නේ - පදික වේදිකා පසුකර

යන්නට තල්ලු කරන් පුතුණේ කියලා ලිව්වේ. නිරායාසයෙන්මයි එය ලියවුණේ. එදා ලිව්වේ එච්චරයි. ඉන් පස්සේ තමයි ඉතිරි ටික ලියැවුණේ.

"ඒ කාලේ ගුවන් විදුලියේ ගීත බැංකුවට අලුත් පදමාලා භාර ගන්නවා. රත්මලානේ ඩිපෝ එකේ ඉන්නකොට මට ඇහුණා ගීත බැංකුව ගැන ගුවන්විදුලියේ කියනවා. මට හිතුණා මේ ගීතය ගුවන්විදුලියට යවන්න ඕන කියලා මම එය ගුවන් විදුලියට තැපැල් කළා. අවුරුද්දකට විතර පස්සේ මට දන්වලා එවලා තිබුණා ඔබේ ගීතය තෝරාගත්තා අහවල් දවසේ පටිගත කරනවා ඇවිත් සහභාගි වෙන්න කියලා. මට මතක හැටියට ඒ 1973 අවුරුද්දේ.



පොඩිරත්න අගමලේ කවියා සමඟ සිරිල් සමරකෝන්

ගීතය සංගීතවත් කෙරුවේ කලනි පෙරේරා, ගායනා කළේ. ඒ කාලේ නැගී එන ගායකයෙක් වෙච්ච එඩ්වඩ් ජයකොඩි. සරල ගී වැඩසටහනකට තමයි ගීතය ගායනා කෙරුවේ. මට ගුවන් විදුලියෙන් රුපියල් තිහක් දුන්නා."

නුවරගෙදර ජොසපිනාහාමි මැණියන්ටත්, ටිකිරිබණ්ඩා සමරකෝන් පියාණන්ටත් දාව වර්ෂ 1947 ක්වූ පෙබරවාරි මස 14 වැනිදාවක කැකිරාව, අලගොල්ලෑවේ දී ජන්ම දායාදය ලැබූ සිරිල් සමරකෝන් දැන් හැත්තෑහතර හැවිරිදිය. පාරම්පරික නැටුම් ශිල්පියෙක් මෙන්ම විශිෂ්ට ගනයේ උඩැක්කි වාද්‍ය ශිල්පියෙකු ලෙස නම් තැබූ පියාණන්ගේ උරුමකම් දෝතින් ගත් කෙනෙකි. සිරිල් - චන්ද්‍රලතා සෙනෙහේ කැදැල්ලේ පුතු පස්දෙනෙකි.

"මං 1976 අවුරුද්දේ කොළඹින් අනුරාධපුරේට මාරුවක් අරගෙන ආවා. ගුවන් තොටුපළ - අනුරාධපුර බස් එකේ තමයි වැඩ කෙරුවේ. බස් එකේ රියැදුරු විදිහට වැඩ කෙරුවේ පොඩිරත්න අගමලේ. ඔහුත් අද ගොඩක්දෙනෙක් දන්න දක්ෂ කලාකාරයෙක්. ඔහොම ඉන්න කොට තමයි 1979 අවුරුද්දේ ගුවන් විදුලියේ රජරට සේවය පටන් ගත්තේ. එතැන ඒ කාලේ අපි වගේ ආධුනික කලාකරුවන්ට ලොකු හෙවණක් වුණා.

විශේෂයෙන් ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහත්තයා දක්ෂයෝ හොයා හොයා උදවු කරපු විශිෂ්ට මනුස්සයෙක්."

සිරිල් සමරකෝන් ලියූ සිය ගණනක් වූ ගී පද රචනා මුද්‍රණද්වාරයෙන් කෘතියක් ලෙස පළවී ඇත්තේ "කැරකෙන රෝදේ" නමිනි. ඒ 2014 වර්ෂයේදී ය. ඔහු විසින් ලියා, ඔහුම ගී ගැයූ "මට මාගේ අම්මා වගේ" සංයුක්ත තැටිය ද ජීවිතයේ තවත් මිහිරි මතකයකි. "නිත්තෑවෝ" සහ "සඳ එළිය" නමින් කෙටි සංග්‍රහ දෙකක් පාඨකයා අතට පත්කිරීමේ වෑයම තවමත් ඔහුගේ ඉටුනොවූ සිහිනයකි. ඔහු ලියා ඔහුම ගැයූ "අඹර කුරක්කන් කළුවේ" ගීතය පසුකලෙක 11 වැනි වසරේ සිංහල භාෂාව හා සාහිත්‍ය පෙළ පොතට තෝරා පළකිරීම ද සිරිල් වැනි

අහිංසක කලාකරුවෙකුට දැක්වූ යම් පමණක උපහාරයකි.

"මං අනුරාධපුරේ වැඩ කරන කාලේ විජය කුමාරතුංග මහත්තයා එයාගේ දේශපාලන වැඩවලට එහේ එනවා. විජය අඳුරන විජයපුර පැත්තේ තේ කඩේක මුදලාලි කෙනෙක් එයාට කියලා තියෙනවා කැරකෙන රෝදේ පුංචි කරත්තේ සින්දුව ලියපු මනුස්සයා මෙහේ ඉන්නේ කියලා. දවසක් විජය මහත්තයා මාව හොයාගෙන අනුරාධපුර ඩිපෝවට ආවා. ඇවිත් මගෙන් ඇහැව්වා සිරිල් සින්දු දෙක තුනක් ලියාගන්න ඕන පුළුවන්ද කියලා. මං කිව්වා පුළුවන් කියලා. පස්සේ මං සින්දු තුනක් ලියලා දුන්නා. සරත් දසනායක මහත්තයා ලව්වා තනු දාලා ගීත පටිගත කරන බවත් මට කිව්වා. අනේ ගීත එළියට එන්ඩ කලින් විජය මහත්තයා මැරුණා."

ඔහු පවසන්නේ කනගාටුවෙනි. ඔහු මේ දිනවල අලුත් වැඩක් කිරීමට සැලසුම් කරගෙන යන්නේය.

"සංගීතවේදී නිමල් ගුණසේකර මහත්තයා එක්ක එකතුවෙලා තරු මල් පිපිලා කියන නමින් ගී රසාස්වාදන වැඩමුළු මාලාවක් පවත්වන්න සැලසුම් කරගෙන යනවා මේ දවස්වල. මත්ද්‍රව්‍ය නිවාරණයට, පරිසර හිතකාමී බවට වගේම අනාගත දරු පරම්පරාව විවිධ නොපනත්කම් වලින් මුදවා ගන්න සාහිත්‍යය, ගීතය යොදා ගන්නේ කොහොමද කියන එක පෙන්නලා දෙන එක තමයි අපේ අරමුණ. දැනට ඉතිං ඒකට තමයි සූදානම් වෙන්නේ. එහෙම යහපත් දේවල් කරනකොට මුදල් ප්‍රශ්න මතුවෙනවනේ. එතැන තමයි අපි හිරවෙලා ඉන්නේ. ඒ ඇරුනහම ඉතිං හේන්, කුඹුරු කරගෙන, හවසට වැවෙන් වතුර ටිකක් නාලා සැනසීමෙන් ඉන්නවා."

ඔහු පවසන්නේ ජීවිතයේ සැනසිල්ල විඳිමිනි.



'රෝද හයි කරපු ලෑලි තට්ටුවක් උඩ ආබාධිත මනුස්සයෙක් වාඩිවෙලා ඉන්නවා. තව පොඩි පොඩි ආම්පන්න ටිකක් මේ මනුස්සයා ළඟ තිබුණා. එතැන සංවේදීම දර්ශනේ තමයි අර ලෑලි තට්ටුව තල්ලු කෙරුවේ අවුරුදු දොළහක් විතර වෙච්ච පුංචි දරුවෙක්. මේක දුටුවම මට මගේ අම්මා තාත්තා මතක් වුණා. අතේ තිබුණ බස් ටිකට් පොතේම කැරකෙන රෝදේ .... පුංචි කරත්තේ.... ආදි වශයෙන් හිතට ආව මුල් පද ටික ලිව්වා....'



ඔහු ලැබූ ඇගයීම් සම්මාන

'ඒ කාලේ ශිෂ්‍ය ගුරු පත්වීමකට මාසික පඩිය හැටියට ගෙව්වේ රුපියල් සීයයි. ලංගම බස් කොන්දොස්තර කෙනෙකුට මාසෙට රුපියල් 220 ක් ගෙව්වා. ඒ වෙනකොට තිබ්බ දුෂ්කරතාත් එක්ක අකමැත්තෙන් වුණත් කොන්දොස්තර රස්සාවට ආවා. එතකොට මට අවුරුදු විසිතුනයි. රස්සාවට එන්න කලින් ගඩොල් කැපුවා, ලී ඉරුවා, ගල් කැඩුවා.'

වෂී 2021ක් වූ මැයි මස 09 වැනිදා ඉරිදා

සිළුමිණ

දීපානි

ලොව විසාලාවක් කළ කොවිඩ් පිටුව 26

මරණය කියන්නේ ගවේෂණයක් පිටුව 30

කොළඹ ගැන ලියූ 'කොළඹයා' පිටුව 31

සක්වළගෙල

ටිරෝනි වෑවලගේ

# කොවිඩ් රැල්ල පරදවන්න ඉන්දියාවට පුළුවන් වෙයිද?









දින තිහක කාලයක් පුරා කෝවිඩ් තෙවැනි රැල්ලෙන් බැට කෑ ඉන්දියාව මේ වන විට දෛනිකව වාර්තා වන රෝගීන්ගේ සංඛ්‍යාව කිසියම් අන්දමකින් පාලනය කර ගැනීමට සමත්ව ඇතැයි වාර්තා වේ. එහෙත් සිහි කැඳවිය යුතුව ඇත්තේ එය කිසියම් අන්දමක පාලනයක් මිස සාර්ථකත්වයක් නම් නොවන බවයි.

තින තිහක කාලයකට පසු මහාරාෂ්ට ප්‍රාන්තයෙන් පමණක් දිනකට වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව 50,000 දක්වා අඩු වන විට පසුගිය මැයි 4වැනිදා දිනයේ පමණක් නවදිල්ලියෙන් වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව ලක්ෂ තුන ඉක්මවීය. මේ ලියන මොහොත වන විටත් ඉන්දියාවේ දෛනික කොවිඩ් මරණ සංඛ්‍යාව 3,000 ඉක්මවන අතර සමස්ත කොවිඩ් මරණ සංඛ්‍යාව මේ වන විට ලක්ෂ දෙක ඉක්මවා තිබේ.

නවදිල්ලි නගරයෙන් පමණක් ආසාදිතයන් ලක්ෂ තුන ඉක්මවා දිනකට වාර්තා වන විට සමස්ත ඉන්දියාවෙන් දෛනිකව වාර්තා වන කොවිඩ් රෝගීන් සංඛ්‍යාව ලක්ෂ හතර ඉක්මවා තිබේ.

බොහෝ රෝහල් වාර්තා කරමින් සිටින්නේ තමන් වෙතට පැමිණෙන අධික ආසාදිතයන් සංඛ්‍යාව හේතුවෙන් අසාධ්‍ය පුද්ගලයන්ට පවා මූලික ප්‍රතිකාර හෝ ලබා දීමට නොහැකි තත්ත්වයක් පවතින බවයි. දැඩි සත්කාර ඒකක සම්පූර්ණයෙන් පිරී පවතින අතර ඔක්සිජන් හිඟයද දැඩිව දැනෙමින් ඇතැයි වාර්තා වේ.

ඉන්දියාව තවමත් තමන්ට අවශ්‍ය වන ඔක්සිජන් ධාරිතාව තබා ගැනීමට අසමත් වී ඇති අතර ඒ සඳහා විදෙස් රටවලින් උපකාර බලාපොරොත්තු වෙමින් සිටී. රෝගීන්ට අවශ්‍ය ඔක්සිජන් සැපයීම නොහැකි බැවින් මේ වන විට ගිනි නිවීම සඳහා භාවිත කිරීමට වෙන් කර තිබූ ඔක්සිජන් පවා රෝහල් වෙත ලබා දීමට ඇතැම් ප්‍රාන්ත කටයුතු කර ඇතැයි වාර්තා වේ.

## එන්නත් නිපදවන ඉන්දියාවේ ජනතාවට එන්නත් නැත්තේ ඇයි?

ඉන්දියාව යනු මුළු ලෝකයටම බෙහෙත් සපයන ෆාමසියයි. ඉන්දියාවේ සීරම් ආයතනය යනු මේ වන විට ලෝකයේ දැවැන්තම ඖෂධ නිෂ්පාදකයා වේ. යුරෝපා රටවල පර්යේෂණාගාරලවලදී එම රටවල විද්‍යාඥයන් විසින් පර්යේෂණ පවත්වා සොයා ගත් කොවිඩ් එන්නත් තොග වශයෙන් නිපදවීම සිදු කෙරෙන්නේ ඉන්දියාවේ සීරම් ආයතනයේදීය.

එමෙන්ම ඉන්දියාව ද ලෝකයේ සෙසු ධනවත් රටවල් මෙන්ම තම රටේ ජනතාව වෙනුවෙන් කොවිඩ් එන්නත්කරණය ඉතා විධිමත්ව ආරම්භ කළ රටකි. එය නිජනතාවට කොවිඩ් එන්නත ලබා දීම ආරම්භ කර සිටියේ 2021 ජනවාරි 16 වැනිදාය. එන්නත් ලබා දීම ඇරඹීමට පෙර විශාල භූමි ප්‍රමාණයක් සහ අධික ජනගහනයක් සහිත බැවින් විධිමත් වැඩපිළිවෙළක් යටතේ ශීතකරණ පහසුකම්ද සහිතව ඉන්දියාව එන්නත්කරණය සූදානම් වූයේය. ඒ අනුව පසුගිය ජනතාවරි 28වැනිදා වන විට ජනගහනයෙන් සියයට බින්දුවයි දශම තුනකට එනම් ලක්ෂ 38 ඉක්මවූ ප්‍රමාණයකට එන්නතේ පළමු මාත්‍රාව ලබා දීමට ඉන්දීය බලධාරීන්ට හැකි විය. පෙබරවාරි 12 වැනිදා වන විට ජනගහනයෙන් සියයට 0.6 කට එන්නතේ පළමු මාත්‍රාව ලබා දීමට කටයුතු කර තිබිණි. පෙබරවාරි 28වන විට ජනගහනයෙන් සියයට 0.9 කට එන්නතේ පළමු මාත්‍රාව ලබා දී තිබූ අතර ජනගහනයෙන් සියයට 0.2 කට එනම් ලක්ෂ 25 ඉක්මවූ සංඛ්‍යාවකට එන්නතේ මාත්‍රා දෙකම ලබා දී අවසන් කර තිබිණි. පසුගිය මාර්තු 15වැනිදා වන විට ජනගහනයෙන් සියයට දෙකකට එන්නතේ පළමු මාත්‍රාව ලබා දීමට ඉන්දීය බලධාරීන්ට හැකිවූ අතර ජනගහනයෙන් සියයට 0.5ක් සම්පූර්ණයෙන් එන්නත් කර තිබිණි. අප්‍රේල් 15 වන විට ජනගහනයෙන් සියයට 7.5කට එන්නතේ පළමු මාත්‍රාව ලබා දී තිබූ අතර සියයට 1.1කට මාත්‍රා දෙකම ලබා දී තිබිණි.

පසුගිය මැයි 2වැනිදා වන විටත් අඛණ්ඩව ඉන්දියාව පුරා ජනතාවට එන්නත් ලබාදීම සිදුවෙමින් පැවතියේ අති විශාල ලෙස කොවිඩ් පැතිර යමින් පවතී වාතාවරණයක් මධ්‍යයේය. ඒ වන විට එන්නතේ පළමු මාතාව සියයට 9.2කට ලබා දී තිබිණි. ජනගහනයෙන් සියයට 2ක් එන්නත් මාත්‍රා දෙකම ලබා ගනිමින් ආරක්ෂිතව පසු විය. එසේ වුවද ලක්ෂ 1300ක අති විශාල ජනගහණයක් සහිත ඉන්දියාවේ සමස්තයෙන් සියයට දෙකක් යනු නොසැලකිය හැකි තරමේ ඉතා සුළු සංඛ්‍යාවකි. මේ වන විටත් එන්නත්කරණය සිදුවෙමින් පවතින නමුදු වෛරසය පැතිරීම ඊට සාපේක්ෂව ඉතා වේගයෙන් සිදුවෙමින් පවතී.









## ප්‍රාන්ත මැතිවරණයෙන් මෝදි පසුබැස්සේ කොවිඩ් නිසාද?

පසුගියදා පැවති ප්‍රාන්ත මැතිවරණ ප්‍රතිඵල අනුව අගමැති මෝදිගේ භාරතීය ජනතා පක්ෂය කෙරෙහි මෙතෙක් පැවති ජනතා ආකර්ෂණය අඩුව යමින් පවතින බව පැහැදිලි විය. මේ දක්වා ඉන්දියාව ලෝකයේ බලවත් රටවල් සමඟ කරටකර තැබීමට සමත් නායකත්වය ලෙස මෝදි හඳුනාගෙන සිටි ඉන්දීය ජනතාව මෙලෙස මෝදි පිටුදැකීමට හේතු වූයේ කොවිඩ් වසංගතය පාලනය කර ගැනීමට ඔහුගේ පාලනය අසමත් වීම හේතුවෙන්දැයි යන පැනය මතු වී තිබේ.

ඉන්දියාවේ ප්‍රදේශ කිහිපයකම අගමැති මෝදිට සහ ඔහුගේ පාලනයට විරුද්ධ ජනතා ක්‍රියාකරකම් දක්නට ලැබුණු අතර ඇතැම් අවස්ථාවට ජනතාව අගමැතිවරයාගේ රුව සහිත පෝස්ටර්වලට සෙරෙප්පු පහර දෙන අන්දම දැක ගන්නට ලැබිණි. පසුගියි අප්‍රේල් හය වැනිදා ඇරඹී මැයි 2 දක්වා බටහිර බෙංගාලය, තමිල්නාඩුව, කේරළය, ඇසෑමය සහ පොන්ඩිචෙරි යන ප්‍රාන්තවල මැතිවරණය ක්‍රියාත්මක වූ අතර සමස්ත ප්‍රතිඵලය මෝදිට හිතක වූයේ නැත. විශේෂයෙන්ම වසර ගණනාවක් තමිල්නාඩුවේ බලය රඳවාගන සිටි බීජේපී හිතවාදී අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය පරාජයට පත්වූ අතර ඒ වෙනුවට කොංග්‍රසයට හිතවාදී ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය බලය ලබා ගැනීමට සමත් විය. කොවිඩ් වසංගතය අති දරුණු ලෙස ඉන්දියාව වෙළා ගනිමින් පවතින මේ අවස්ථාවේදී නිසි පරිදි එය කළමනාකරණය කර ගැනීම නොහැකි වීම සම්බන්ධව ජනතාව එල්ල කරන චෝදනාවලින් පලායෑමට අගමැතිවරයාට නොහැකි බව කිව යුතු වන්නේ රජය මගින් නිසි පරිදි සීමා පැනවීමක් සිදු කළේ නම් වසංගතය මෙවන් ව්‍යසනයක් නොවන ලෙස පාලනය කර ගැනීමේ හැකියාව පැවති බැවිනි.

ස්වකීය දෙවැනි ධූර කාලය සඳහා බලය ලබා ගැනීමේ මෝදි පකිස්තානය සමඟ නැති අර්බුදයක් මවා ගනිමින් ජාතිකත්වය ඉස්මතු කරමින් ඡන්ද ලබාගත් බව සිහිපත් කළ යුතුය. ඇතැම් විට අර්බුදයක් මගින් බලයට පැමිණි මෝදිට අර්බුදයක් හේතුවෙන්ම බලයෙන් ඉවත් වීමට වුවද සිදුවුවහොත් පුදුම විය යුතු නැත.





## පෙට්ටියෙන් නොව බයිසිකලයෙන් කොවිඩ් සිරුරු ගෙන යන මිහිපිට අපාය

මේ වන විට දෛනිකව ඉන්දියාවේ තුන්දහසකට අධික පිරිසක් කොවිඩ් හේතුවෙන් මියයමින් සිටිති. මේ අධික මරණ සංඛ්‍යාව අවම කර ගැනීම මෙන්ම මේ මරණ ආදාහනය කර ගැනීමද මේ වන විට ඉන්දිය බලධාරීන්ට අභියෝගයක් වී තිබේ. මේ ව්‍යසනයේ වඩාත් කනගාටුදායක කරුණ වී ඇත්තේ වසංගතය දරුණු ලෙස පහර ගසමින් සිටින්නේ දුගී ජනතාවට වීමයි. රෝහල් පහසුකම් නොමැති වීමෙන් මියයන වැඩි පිරිසක් දරිද්‍රතාවයේ අන්තිම අඩියේ පසුවන පරිස වන අතර ඔවුන්ට තම පවුලේ මියයන සාමාජිකයන් ආදාහනය කිරීම දක්වා ගෙන යෑමද ගැටලුවක් වී තිබේ.

මේ හේතුවෙන් රෙදිවල එතූ මළ සිරුරු පාපැදිවල තබා ප්‍රවාහනය කිරීම සුලබව සිදුවෙමින් පවතින බව වාර්තා වේ. නවදිල්ලියේ දේවස්ත නරේන්ද්‍ර සහ ඔහුගේ සොහොයුරා කොවිඩ් හේතුවෙන් මියගිය තම 50 හැවිරිදි මවගේ සිරුර මැදි කර ගනිමින් සැතපුම් නවයක් දුර ගමන් කළේ සිරුර ගෙන යෑමට වෙනත් රථයක් යොදා ගැනීම මුදල් නොමැති වීමෙනි. රජයෙන්ද ඒ සඳහා ජනතාවට කිසිඳු පහසුකමක් ලබා දී නැත. මේ වන විට ත්‍රී රෝද රථවලින් බොහෝවිට කොවිඩ් සිරුර ප්‍රවාහනය කෙරෙමින් තිබෙන අන්දමද දිල්ලි නුවර සුලබ දසුනක් වී තිබේ.

උත්තර ප්‍රදේශ්හි එක් පුද්ගලයකු තම කොවිඩ් හේතුවෙන් මියගිය තම බිරියගේ සිරුර පාපැදියක පටවාගෙන ආදාහනය සඳහා ගන ඒමට උත්සාහ දරන අති සංවේදී ඡායාරූප සමාජ මාධ්‍ය පුරා සංසරණය වනු දැකගත හැකි විය. ඔහුට එක් අවසථාවකදී ඇයගේ සිරුර සමබර කර ගැනීමට නොහැකි වීමෙන් එම සිරුර මහගම ඇද වැටෙන අන්දමද මේ ඡායාරූපවල දැකගත හැකි විය. පසුව ප්‍රාන්ත පොලීසිය මැදිහත්ව එම සිරුර ආදාහන ස්ථානය දක්වා ප්‍රවාහනය කර දෙනු ලැබීය.

තවත් ඡායාරූප මගින් දැකගත හැකිවූයේ තම මියගිය සොහොයුරා රෙද්දක ඔතා පාපැදියෙන් ආදාහන ස්ථානය කරා ගෙන යන සහෝදරයෙකි. කොවිඩ් වංසගතයේ බියකරු බවත් යුද්ධයකදී මෙන්ම එය තදින්ම දැනෙනු ඇත්තේ දුප්පතුන්ට බවත් පැවසීමට මෙයට වඩා තවත් උදාහරණ අනවශ්‍යය.












# සක්වළගැල

● ටිරෝනි වැවලගේ





# කොවිඩ් එන්නතේ වැඩි වාසි ධනවත් රටවලට

ධනවත් රටවල් තම ජනතාවට හොඳම දේ දෙන විට දුගී රටවල ජනතාව ධනවතුන්ගේ අනුකම්පාව හිමි වන තුරු බලා සිටීමේ රටාව ලොව පුරා ක්‍රියාත්මක වූයේ ඈත අතීතයේ සිටමය. එහෙත් එය සමස්ත ලෝකයක් වශයෙන් මේ වන විට අන් කවරදාකටත් වඩා වැඩියෙන් අත්විඳිමින් සිටී. ලොව දුප්පත් පොහොසත් බේදයක් නොමැති වයිරසය සැමට එක සමානව පැතිරගියද වයිරසයට එන්නත් ලබා ගැනීමේදී නම් පොහොසත් රටවල් දුප්පත් රටවල් පසෙකට තල්ලු කරමින් මුල්තැන ගෙන සිටිනා අන්දමක් දැකගත හැකිය.

මේ වන විට ලොව ධනවත් රටවල් රාශියක් තම ජනගහණයෙන් අර්ධය ඉක්මවා ඉතා විධිමත්ව එන්නත් ලබා දෙමින් සිටින නමුදු ලොව සමස්ත දුගී රටවල් එක්ව ගත් කළ ඒ සියලුම රටවල ජනහගනයෙන් එන්නත් හිමිවී ඇත්තේ සියයට 9කට තරම් අඩු ප්‍රමාණයකට බව සංඛ්‍යා ලේඛන මඟින් තහවුරු වී තිබේ.

කොවිඩ් එන්නත් නිපදවීම සඳහා ඇතැම් රටවල් මුදල් ආයෝජනය කළ අතර නිෂ්පාදිත තොගවලින් මුල් තොග එම රටවලට යැවීමට සිදුවූයේ එම ආයෝජනවලට හිලවු වශයෙනි. උදාහරණයක් ලෙස ඇමරිකාව ඩොලර් බිලියන 1.2ක් ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ඇස්ට්‍රාසෙනෙකා එන්නත නිපදවීමේ පර්යේෂණ කටයුතු සඳහා ලබා දීම දැක්විය හැකිය. එසේ ලබා දෙනු ලැබුවේ 2020 මැයි මාසයේදීය.

කෙසේ වුවද මේ ආයෝජන මෙන්ම ධනවත් රටවල කොවිඩ් එන්නත් ලබා ගැනීම සඳහා සිදුකරන ලද මුදල් වෙන් කිරීම් හේතුවෙන් 2021 වසර අවසාන වන තෙක්ම ඇතැම් එන්නත්වල නිෂ්පාදන ධාරිතාව ලොව බලවත් රටවල් විසින් වෙන් කරගෙන අවසන් බව පැවසෙනවා . ඒ අනුව ෆයිසර් ඇන්ඩ් බයෝටෙක් එන්නතේ 2021 වසරේ නිෂ්පාදන ධාරිතවෙන් සියයට 95ක් සඳහා ධනවත් රටවල් කිහිපයක් ඉල්ලුම් කර මුදල් ගෙවා අවසන් බව පැවසෙනවා. මොඩේර්නා එන්නතේ 2021 වසරේ සමස්ත නිෂ්පාදන ධාරිතාවයම ධනවත් රටවල් මුදල් ගෙවා වෙන්කරගෙන අවසන්. ඒ අනුව මේ වන විටත් දුගී රටවලට තම සම්පූර්ණ එන්නත් අවශ්‍යතාව කෙසේ වෙතත් සුළු වශයෙන් හෝ එන්නත් ලබා ගැනීමේ අවස්ථාව පවා නොලැබී ගොස් තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානය මේ විෂමතාව අවම කිරීම බොහෝ උත්සාහ දරමින් සිටින බවද වාර්තා වේ.





## ලොව පුරා රටවල් අතර කොවිඩ් එන්නත්කරණ ප්‍රතිඵල

කොවිඩ් වංසගතයෙන් ආරක්ෂා වීමට ගත හැකි එකම ක්‍රියාමාර්ගය එන්නත්කරණය පමණක්ම බව මේ වන විට මුළු ලෝකයම පිළිගෙන අවසන්ය.

ඒ අනුව ලොව පුරා රටවල් තමන්ට හැකි අන්දමින් තම රටවල ජනතාව එන්නත්කරණයට ලක් කරමින් තිබේ. මේ වන විට කොවිඩ් එන්නත්කරණය ලොව පුරා රටවල් අතර තරගයක් බවට පත්වී තිබේ.

මේ වන විට සමස්ත ලෝකය මට්ටමින් බැලූ විට සමස්ත ජනගහනයෙන් සියයට 15.1ක ප්‍රමාණයක් එන්නත්කරණය ලක් කර ඇති බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසා තිබේ. රටවල් වශයෙන් සැලකූ විට තම සමස්ත ජනගහනයෙන් සියයට 99.8කට එන්නත් ලබා දෙමින් කොවිඩ් එන්නතකරණ තරගයේ මේ වන විට ජය හිමිකරගෙන ජිබ්රෝල්ටාවයි. සීෂෙල්ස් දූපත් දෙවැනි ස්ථානය හිමි කර ගනිමින් තම ජනගහනයෙන් සියයට 60කට එන්නත් ලබා දී තිබේ. තුන්වැනි සාර්ථකම රට ලෙස ඊශ්‍රායලයත්, ඉන්පසුව පිළිවෙළින් තවත් දූපත් රාජ්‍ය ගණනාවකුත් වේ.

චිලී සහ බහරේන් රාජ්‍ය සියයට 30 ඉක්මවා ජනතවා එන්නත් කර ඇති අතර ඇමරිකා එක්සත් ජනපදය සමස්ත ජනගහනයෙන් සියයට 31.1ක් මේ වන විට එන්නත්කරණයට ලක් කර තිබේ. බ්‍රිතාන්‍ය සියයට 22.8කි. දකුණු ආසියාවේ වැඩිම එන්නත් ලබා දී ඇති රට බවට පත්වන්නේ මාලදිවයිනයි. එය සමස්ත ජනගහණයෙන් සියයට 19කට එන්නත් ලබා දී තිබේ. සිංගප්පූරුව සියයට 17.5ක්ද, ප්‍රංශය සියයට 9.7ක්ද, ජර්මනිය සියයට 7.9ක්ද, රුසියාව සියයට 5.3ක්ද, ඉන්දියාව සියයට 2.1ක්ද , බංග්ලාදේශය සියයට 1.8ක්ද වශයෙන් එන්නත් ලබා දී තිබේ.

මේ වන විටත් ලොව පුරා එන්නත් නිෂ්පාදනය කෙරමින් පවතින අතර ලෝක සෞඛ්‍ය සංවිධානයේ මතය වන්නේ කොවිඩ් වයිරසයට ශක්තිමත්ව මුහුණ දීමට තරම් ප්‍රමාණවත් එන්නත්කරණයක් සිදුකර ගත හැකි වන්නේ 2024 වසර පමණ වන විට බවයි.



## චීනය සැබවින්ම කොවිඩ් පාලනය කළාද?

2019 ඔක්තෝබර් යනු ලෝකය අද මේ මොහොතේ මුහුණ දී සිටින දරුණුතම ව්‍යසනය ආරම්භ වූ යුගයයි. ඒ චීනයේ වූහාන් නගරයෙනි. 2020 වසරේ ජනවාරි මාසයේදී වූහාන් නගරය වසා දමනු ලැබූ අතර ලොව සෙසු රටවල් සියල්ලම සිතුවේ වූහාන් නගරයෙන් හෝ චීනයෙන් පිටට මේ වසංගතය පැතිරෙණු නැති බවයි.

එහෙත් ඒ සිතිවිලි සිතිවිලිම පමණක් වූ අතර මේ වන විට චීනය හැර ලෝකයේ සෙසු රටවල් සියල්ලම පාහේ කොවිඩ් වංසගතයෙන් පීඩා විඳිමින් සිටී. සැබවින්ම කොවිඩ් වසංගතය ආරම්භ වූ චීනය කොවිඩ් පාලනය කළේ කෙසේද යන පැනය සැමගේ සිත්වල ඇතිවෙමින් තිබේ. චීනය වසංගතය ආරම්භ වූ අවස්ථාවේ සිට මේ දක්වා වාර්තා කර ඇත්තේ රෝගීන් 90,000 යන්තම් ඉක්මවූ සංඛ්‍යාවක් පමණි. වරින් වර බීජිං ඇතුළු ප්‍රදේශවලින් කොවිඩ් රෝගීන් වාර්තා වුවද චීනය ලොව අන් කිසිඳු රටක් ලෙස වයිරසයේ බරපතල පැතිරයෑම්වලට යළි මුහුණ දුන්නේ නැත. චීනයේ වූහාන් හැර අන් කිසිඳු නගරයක් වසා නොදැමූ අතර ආර්ථික කටයුතුද වෙනදා මෙන් සිදුවෙමින් තිබේ.

මෙවැනි ජයග්‍රහණයක් චීනය අත් කර ගැනීමට හේතුවූවා යැයි සැලකෙන කරුණු අතර ඉහළින්ම පවතින්නේ චීන ජනතාවගේ විනය බව පැවසිය හැකිය. චීන ජනතාව යනු කොමියුනිස්ට් විනයක් යටතේ දශක ගණනාවක් හැඩ ගැසුණු ජීවිත සහිත ජනතාවකි. ඔවුන්ට වසංගතයකින් බේරීමට අවශ්‍ය සමාජ දුරස්ථතාව, මුඛ ආවරණ පැලඳීම වැනි ක්‍රියා අඛණ්ඩව සිදුකිරීමට කටයුතු කිරීම ඉතා පහසු දෙයකි. ඒ අනුව චීනය තුළ වසංගතය පාලනය වීමට අංක එකට බලපෑ කරුණ ලෙස ජනතාවගේ විනය දැක්විය හැකිය. එමෙන්ම චීන සිනෝෆාම් එන්නතද මේ වන විට රටේ ජනනතාවගෙන් සියයට 15කට පමණ ලබා දී ඇතැයි වාර්තා වේ.එයද චීනය තුළ කොවිඩ් පාලනයට හේතු වන්නට ඇත.

එහෙත් බටහිර මාධ්‍ය නම් පෙන්වා දෙන්නේ චීනය දිගින් දිගටම තොරතුරු වාරණයක නිතර වූ බවයි. චීනයම මාධ්‍ය වෙත නිකුත් කළ එක් වාර්තාවක වරක් වාර්තා ක සිටියේ වූහාන් නගරයේ පමණක් රෝගීන් ලක්ෂ 7 ඉක්මවා සිටි නමුත් සංඛ්‍යා ලේඛන පවත්වා ගැනීමේදී යම් යම් අඩුපාඩු සිදුවී ඇති බවයි.

## නිමාවක් නොපෙනන කොවිඩ් ව්‍යාප්තිය

ඇතැම් රටවල් සංචරණ සීමා මඟින්, එන්නත් ලබා දීම මඟින් කොවිඩ් පැතිරීම යම් තරමකට පාලනය කර තිබුණද ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව මේ වන විට ලෝකය කොවිඩ් වසංගතයේ දරුණතම වාතාවරණයට මුහුණ දෙමින් සිටියි.

මේ වන විට සමස්ත ලෝකයෙන් වාර්තා වී ඇති කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව මිලියන 155 ඉක්මවා තිබේ. සමස්ත මරණ මිලියන 3.2 ඉක්මවා තිබේ.

ඇමරිකාව මේ දක්වා ලෝකයේ වැඩිම ආසාදිතයන් සහ මරණ වාර්තා කරමින් සිටින අතර මේ වන විට එන්නත්කරණය හේතුවෙන් එරට කොවිඩ් පැතිරීමේ කිසියම් පාලනයක් දැකගත හැකිවී තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධාන වෙබ් අඩවියට අනුව මේ වන විට ඇමරිකාවේ කොවිඩ් ව්‍යාප්තිය දක්වන රේඛාවන් පහළට වක්‍රවෙමින් තිබේ. එහෙත් ඉන්දියාව සහ බ්‍රසීලය මෙන්ම ප්‍රංශය, ඇතුළු යුරෝපා රටවල් රැසකද කොවිඩ් ව්‍යාප්තිය අඩුවක් පෙන්වන්නේ නැත.

අප්‍රිකා කලාපය සැලකූවිට බොහෝ රටවලින් නිවැරැදි තොරතුරු වාර්තා නොවන බව පෙනේ. එම රටවල් කොවිඩ් රෝගීන් සම්බන්ධව සංඛ්‍යා ලේඛන පවත්වා ගැනීම අත්හැර දැමූ අතර ඇතැම් රටවල රාජ්‍ය නායකයා කොවිඩ් රෝගයෙන් මියයන තෙක්ම රටපුරා කොවිඩ් ව්‍යාප්ත ව ගොස් ඇති තරම වටහා ගත හැකිය. හොඳම උදාහරණය ටැන්සානියාවයි.

නවසීලන්තය සහ ඔස්ට්‍රේලියාව දැඩි සංචරණ සීමා පනවමින්, සංචාරකයන් සඳහාද දැඩි නීති පනවමින් තම රටවල කොවිඩ් ව්‍යාප්තිය අවම කර ගැනීමේ සාර්ථකත්වය අත් කර ගැනීමට සමත් වී ඇති බව පෙනේ.

කෙසේ වුවද මේ මොහොත වන විට කොවිඩ් වසංගතයේ වැඩි බර දැරීමට ආසියාවට සිදුවී තිබේ.












## මගේ ගම

සුන්දර ගමකි මා ඉපදුණ මගේ ගම
බෙන්තර "තුන්දාව" යි ඒ ලස්සන ගමේ නම
බෙන්තර "නදී" කොමළිය හැම දිනයකම
ගංතෙර අසල සිට ලස්සන බලමි මම

කොස් දෙල් පොල්වලින් නැත අඩුවක් තිබුණේ
ලස්සන කුඹුරුයායකි හැමතැන පෙණුණේ
දිස්වන ඕලු මානෙල් දිය අද්දර පිපුණේ
ලස්සන සුරපුරක් ලෙස එය ම පෙණුණේ

ඈතින් පෙනෙන නිල් කඳුවැටි මන බඳින
පහළින් ගලන බෙන්තර ගඟ අති සොබන
සහලින් අඩු නොමැත කුඹුරුය අස්වනු ගෙනෙන
මගෙ ගම වාසනා මේ හැම දෙය තිබෙන

කවි කිවිඳියන් හා නැටුමෙහි දස්කම් කරනා
කැටයම් කපන වෙස්මුහුණු ද හැඩ කරනා
පරසිඳ සිත්තරුන් හා ගුරුවරු පිරුණා
මගෙ ගම කලා පුරයකි ලොව නම් දරනා

**මිල්ටන් ප්‍රනාන්දු**

## තුරු හිසට සමව

පෙනෙන
කඳු මුඳුන
ළඟට යනවිට
උස්ව ගිය හැටි.

**තුෂාරි ජයසිංහ**

## අහස සේ

අහසම නුඹ වීය මට නිරතුරු සෙවණ
වැහි පිනි දරා හිද හෙමිහිට මට පුදන
හබරල කොළයක්මි මම මිහිමත වසන
නොහැකිය රඳවා ගන්නට මට වැහි පින්න

**පියුමි මදුභාෂිණී**

## ඇරයුම

දුම්රොටු නැගෙන කම්හල් පිරි නගරෙ ඉඳ
කුමටද අහෝ බක්මහ සිරි නොමැති සඳ
දැක්මට මාපියන් නෑසියො බැන්ද හද
එනිසයි ආවෙ ගම වෙත ඉසිඹුවක මඳ

පටු ගුරු පාර දෙපසෙහි පැළ ගොයම සැලේ
කෝකිල විහඟ බිඟු නද රැව්දේය කැලේ
පැන්නෝ කටිල්ලෝ තාලෙට රඟති ඇළේ
අවුරුදු සිරිය කදිමයි ගම පුංචි පැලේ

බැලු බැලු සැම අත එරබඳු මල් පිපිලා
පැණි මොර බකිණි කජු වරකා වැහි වැහැලා
බක්මහ කුමරුහට වඳිමින් දණ ගසලා
යදිනෙමු අනේ නගරයටත් යමු කියලා

බක්මහ කුමරුනේ අපහට මෙත පාලා
යමු නගරයට ටිකකට ගම හැර දාලා
සංකර සිරිත් කටු කුණු රොඩු අතුගාලා
පළඳමු නගරෙ වට අඹ කජු මොර මාලා

**අකුරැස්සේ ඩයනී මාලිකා**

## මතක පද

ඔයාම මේ ප්‍රේමය තියාගන්න
තවත් නම් බැහැ මට,
මේ කඳුළ විඳගන්න...
හැකිනම් යළි යළිත් කියමි
අහගන්න,
ආයෙමත් මට මගේ
ඉස්සරම හිත දෙන්න...

ඔයාට ලැබිලා තියෙනවා
ජීවිතය,
ආය අලුතෙන් ලියන්න
ඔක්කොටම කලින් ඔය
පරණ පිටු ටික
ඉරන්න...
මේ විශ්වයේ ඉගිළෙන්න
ඔබ නොදුටු තැන් තියනවා
දැන ගන්න...
ආයෙමත් අත්තටු
බිඳ ගන්න
එපා... ඔබ,
සතුටින් ඉන්න...

**නිශාන්ත දසනායක...**

## නූතන කුවේණිය

ඇන්ඳ ඉර ළඟ හඬා වැලපී
අණට අවනත වී එදා
ජීවහත්තලා , දිසාලා වැනි
දරුවො තවමත් ඇත මෙදා
ලේ නහර වැල් පිච්චි පිච්චී
පිටුපාන ඔහු දෙස බලා
කුවේණියගේ දුකට හැඬුවේ
තෝනිගල අහසයි එදා .....

ලේන කුලයේ සුවඳ ඔබගෙන්
ඇයට දැනුණලු හිමියනේ
ඒ නිසාමලු ළමැද මැද්දෙන්
ශ්වේත දහරා ඉතිරුණේ
දැත් එක්කොට අසරණව ඇය
අයිතියක් ඉල්ලූ දිනේ
දස දහස්වර ඉපිද මියැදී
ආත්මෙම මගෙ අළු වුණේ .....

ඇය හඬාවී , නුඹ රවාවී
මගේ ඉදිරියෙ නොසිතු සේ
අපේ පැටවුන් මෙමට ළංවුණේ
මගේ නෙතු වල එළිය සේ
අසම්මතයේ බැඳුණු නුඹලගෙ
ප්‍රේම මැණිකට තිළිණ සේ
වෙන්ව යන්නෙමි සත් හවේටම
නුඹව ඇය හට දී මෙසේ ......
රකින්නට බඩ පිටට නොඇලී

අපේ මතකය ආදරෙන්
ඉරුණු ඒ සිත සවිය වූයේ
පැටවු පානා මඳහසින්
හංගගෙන දුක ම'හදවත මැද
කඳුළු පිසදා නොසොලා ඉකි ගසා
ආවෙ රට ඉඳි සිසිල් සෙවණට
ජයගන්න අපෙ දිවි හොඳින් .....

**ශර්මිලා ක්‍රිෂානි තෙවරප්පෙරුම**

## සහෘදයෝ

කියවනා පිපාසෙන්
පැමිණ මිතුරන් නිබඳ
එබී පොත් රාක්කෙට
අයැදිනා අපූරුව
කෝ දෙන්ට.. කියවන්ට...

මම කියා නැත මෙතෙක්
කිසිවෙකුට
බෑ දෙන්ට....

ඒත්... රෑ දවාලක් නැතුව
අනවසරයෙන් ඒය
මගේ පොත්වල තියෙන
රසබොන්ට....

මේ තරම් රසවිඳින්නට
මගේ පොත්
කවුරු දුන්නාද අවසර
වේයන්ට..
කාවුන්ට..
මීයන්ට..

**දඹේගොඩ ජිනදාස**

## අවදිවෙමු අපි

කුල මළ බේද ආගම් කිසිවක් නොතකා
කෝවිඩ් රජවුණිය කාගෙත් ගෙල මිරිකා
මිනිසුනි ඇයිද බැරිවුණෙ නිතිවම වළකා
දැන්වත් සිතට ගමු අපි උපදෙස් සලකා

උපදෙස ලැබෙන්නේ තබනට මීටරය
එනමුදු හැසිරුනේ එක එක ආකරය
වයිරස පැතිරුණේ සුළගෙන් පාකරය
අවසන නැවතුනේ සැමටම බෝකරය

අසල් වැසි රටෙහි දුක දැන් දැනෙනවද
දිනෙන් දිනම කොතරම් දිවි පුදනවද
අපිත් එලෙස වෙන්නට ඉඩ හරිනවද
තවත් නම් ඉතින් මොනවට හිතනවද

මිනිසුනි ඉතින් දැන්වත් ඇහැ අරින්න
කෝවිඩ් රකුසාව පලවා හරින්න
වේලක් දෙකක් කා නිදහසෙ හිඳින්න
අවදානමට මුල් තැන දී සිතන්න

**බණ්ඩාර රාජපක්ෂ**

## නුඹ සහ මම

මම මගේමය
මා දකින
මේ සිහිනය
නුඹේ ය . . . .

**නන්දන පලුකන්දැව**

## කවියන්ගේ පාඩම

යුගයෙන් යුගය ශිෂ්ටාචාරය
එකලු කළ මහ රජුන් අතහැර
පැල්පත්වල කඳුළු හොයන
කවියන්ට පාඩම් කියා දිය යුතුය

රජ ගෙදරට සිරිලිය වඩින
දෙස් විදෙස් උපකාර බන්ධන
රට්ටුන්ට අයිති නැති බිමක
පෙන්වන ශ්‍රී විභූති සංදර්ශන

හිත නිවන්න කවි මන්තර
ගොතන බව දනියි විස්තර
බුහුමන් මුරුගතු සූස්තර
හදයි ඉන් දිවුරුම් පත්තර

අපි ලියමු රජ පවුල් වර්ණන
තුටින් කල් ගෙවන කතන්දර
පැල්පතේ සුද බැඳුණ නේත්‍ර
දිලිහි දකින්ට උගුල් සාස්තර

**තැන්නහේනේ නාගිත හිමි**

යෝධ ගස් යට කුඩා පැළ ගස්
අඳුරු වැසි වනයක
විසල් තුරු ගොමුවක
දැත් විදලූ යෝධ මවු ගස්
උරා බී ගෙන හොඳම හිරු රැස්
ඌන වර්ධිත ළදරුවන් දැක
නගයි මැසිවිලි ලතාවන් හා

**ඉමල්ක විජේසේකර**

## මමයි ඔබේ ආඩම්බරකාර පෙම්වතා

ඔබට ආදරේ කළත් පණමෙන්
ඔබ ළඟින් දනින් නොවැටෙනා....
හැරයාම මෝස්තරයක් වූ දා
පෙම් කිරීමත් කලාවක් කළ දා
අඩ අඩා පසු පසම නොපැමිණියත්
ඔබයි මගේ එකම පෙම්වතිය තාමත්...

ඔබට මා උමතු යයි දැන ගත් දා
ඔබ මට තවත් වෙනස් කම් කළ දා
මගේ පෙම මන් ළඟම තනිවූවත්
ප්‍රේමය සිඟමන් යන්නෙ නෑ කෙදිනවත්...

**සඳරුවන් කරුණාතිලක**

## දෙවියන්ගෙ මල්ලි

සැමට ඉපදෙන
නැතිවම බැරිවන
වැඩියම හිඟවන
දෙයක්ය උපයන...

නැති බැරි අය අත
අත මිට සරු නැත
ඇති හැකි දන වෙත
ඇදි ඇදි එනු ඇත....

කර වැඩ කට යුතු
නිම කර ගත යුතු
වෙහෙසට කළ යුතු
යුතුකම විය යුතු...

මිනි මරලා හරි
සොරකම් කර හරි
හිඟා කකා හරි
සොයති කොහොම හරි....

සැම තැන හෙල්ලී
තැන තැන එල්ලී
එන මේ සල්ලී
දෙවියගෙ මල්ලී..
.

**ඇල්බට් ඇම්. ලියනගේ**

## දඩබ්බරයාගේ චරිත සහතිකය

නැඟලා පාසැල් වහලට
නුඹයි හැඳුවෙ තෙමෙනා විට
බර අතු වහලට නැමිවිට
කැපුවෙ නුඹයි නැඟල ගහට

තරගෙට දුවනා අයහට
ඉරි අඳින්න පිට්ටනියට
නුඹයි ආවෙ ඉස්සරහට
කියන්නටත් කලියෙන් සිට

වෙන ළමයෙක් අනතුරකට
පත්වූ විට ගෙන දැනට
දිව්වෙ නුඹයි රෝහලකට
එහෙම බැනෙ හුගක් අයට

ඕ එල්, ඒ එල් නැතුවට
සමත් නුඹයි මිනිස් කමට
ඒත් නුඹේ සහතිකේට
වැඩක් වෙයි ද මම ලිව්වට

පෙනුණත් මහ දඩබ්බරට
නුඹෙ හද තෙත්වුණි විපතට
මේ යහගුණ සහතිකේට
මම දුක්වෙමි, නොලිව්වාට

**පී. බී. ගුණරත්න**

## සුවණ්ණ වර්ණ අඟනුන්

සුවණ්ණ වර්ණ අඟනුන්
හිඳී වියෝ ළතැවුලෙන්
කාට හිමි ද ඔවුන්
කසුප් මීපල් ද නැත ළඟින්...

ලාගෙන අබරණ ගතින්
කුමට සිරවුණි ද බිතෙන්
බසිනු මැන ගිරි ශිඛරෙන්
හිඳී අය අත ගන්නට සැණින්...

පෙරඹර මඳ පවන්
ගෙනෙයි තඹුරු පුසුඹන්
වඩයි බෝ රම්‍ය හැඟුමන්
විඳින්න කියා එක්ව අප්සරුන්...

දුටු කල නොවේ සිත එක්තැන්
ලැබේවිද මේ රන්වනුන්
නෙතු දකියි රුවම හැමතැන්
බිඳලයි හදේ බැමි දැන්...

දරා නිලුපුල් අතින්
සන්කරයි ප්‍රේම හැඟුමන්
නොකිව්වත් එය මුවඟින්
දෙනෙත් ඉඟිකරයි රහසින්...

පිටින් පෙනෙනා සුරූපිනියන්
පෙන්වන උදාරම් ගති කොණින්
කුමට ළං වූයේ අදරින්
සිත් පිරී යයි ළතැවුලෙන්...

**පවිත්‍රා අංජලී ලීලාරත්න**

### මුහුණු පොතෙන් කවියක්

## තනිකම

සඳ බිම බලයි හිනැහී කොඳ කැකුළු සොයා
තරු ඉකි බිඳී ඒ සෙනෙහස මගෙය කියා
අහවර වෙන තුරා මේ දිවි පැඳුර වියා
තනිකම ඔහෙන් ඉදපං වැඩි දුරට නොයා

**ජානකි පී. කුමාරි**

### විදෙස් කවිය

## මරණයේ යථාව

සෙවණැල්ලක්ම ය , නොවටින්නේම ය
අපගේ රුධිරය , තෙද බලැති රාජ්‍යය
දෛවයට එරෙහිවන පලිහ කොහි ඇත්තේ ද
රජුන් මත මරණයේ ශීත අත පතිතවෙයි
සෙංකෝලය ද , කිරීටය ද
ඇදවැටිය යුතුමය පොළොවට

අසරණව වක ගැසුණු කැත්ත, සවල ද සමඟ
රජස් පිරි පොළොවේම සමව සැතපිය යුතුය
සමහරෙක් අසිපතෙන් පොළොව අස්වද්දාවි
මරණයේ භූමියේ හරිත පත් සිටුවමින්
දිනෙක වීරිය දිරිය හීන වී යන්නේ
තමා තම සිතටම යි හිස නැවිය යුත්තේ

අලුයමේ හෝ රැයේ
ඉරණමට දණ නවනු
සුසුම් කෙඳිරිලි අතැර දමමින්
වියොව දෙසටයි ඇදී යන්නේ
මිලින සිරකරු වියෝවන්නේ...

මල් මාල ඔබෙ නළල මත දිරා යනවා
එවිට තම මහරු ජය ගොස නොනංවනු මැනවි
මරණයේ දම්පාට අල්තාරයේ
ජය-පරාජිත දෙදෙන ලේ හලන හැටි බලනු
ඔබේ හිස ශීතල ම සුසානය වෙත ඇදෙයි
යුක්තියේ දයාවේ ක්‍රියාවන් පමණමයි
සුවඳ දී දූහුවිල්ල මතින් පිබිදෙන්නේ...

**ජේම්ස් ෂර්ලි කිවිඳාගේ Death the Leveller කාව්‍යය**

17 වන සියවසෙහි විසූ ජේම්ස් ෂර්ලි (1596 - 1666) , ප්‍රකට ඉංග්‍රීසි ජාතික නිර්මාණකරුවෙකි. අගනා කාව්‍ය නිර්මාණ රැසක් දායාද කළ ෂර්ලි, සාහිත්‍ය ලෝකයේ වඩා ප්‍රචලිත වූයේ නාට්‍යකරුවකු ලෙසිනි. ඔහු රචනා කළ මෙම කාව්‍යය හරහා එදා , අද පමණක් නොව ලොව පවතිනතාක් කල් සැමට පොදු දහමක් වන මරණයේ යථා ස්වභාවය පිළිබඳ මනා පණිවුඩයක් සහෘදයා වෙත ගෙන එයි. එනම් අන්ත දරිද්‍ර දුගියා ද , සියලු සුඛවිහරණයෙන් යුත් ධනවතා ද මරණය හමුවේ සදා එක සමාන දෛවයකට උරුමකම් කියන බවයි. බෞද්ධ ඉගැන්වීම් අතර ප්‍රධානතම ස්ථානයක් ගන්නා 'කර්මය' පිළිබඳ ද මෙම කාව්‍යය මනා අරුත් ජනිත කරයි

**අනුවාදය - අමන්දා දළුපොත**

## සතියේ කවිපොත

**කෘතිය - අපෙ අහ කොහෙද ලිලී මල්**
**කර්තෘ - අජානා රණගල**
**මිල - රුපියල් 2,000 පිටු -138**
**විමසීම් -**
***ajana.ranagala@gmail.com***
**අමුතු පබ්ලිකේෂන් ප්‍රකාශනයකි.**

වෘත්තියෙන් නීතිඥවරියක වන අජානා රණගලගේ මුල්ම කාව්‍ය සංග්‍රහය අපෙ අහ කොහෙද ලිලී මල් ය. මාතෘකා නැති මේ කාව්‍ය සංග්‍රහයේ සෑම කවියක්ම පාහේ ප්‍රේමය වස්තු විෂය කරගෙන ඇත.

ප්‍රේමය එකිනෙකා දකින විඳින විදිහ වෙනස්ය. එමෙන්ම ප්‍රේමය අහිමි වූ විට එකිනෙකා එය විඳදරා ගන්න විදිහද එකිනෙකට වෙනස්ය. ප්‍රේමය ලැබීමත්, නොලැබීමත්, එය විඳීමත් අහිමි වීමත් කිවිඳිය ලියන විදිහය මේ.

**ප්‍රේමය තිබුණේම උස් කඳු මුඳුන්වල**
**මං උන්නේම මිටියාවත් වල**
**වැහි වැටිලා කඳු හිස් තෙමාගෙන**
**ගලාගෙන එනකන් බලාගෙන**
**මිටියාවතට ප්‍රේමය...**

**ප්‍රේමය තිබුණේම දිගු වේදිකාවල**
**මං උන්නේම ප්‍රේක්ෂාගාරවල**
**පිටපතට පිට දෙබස් කියාගෙන**
**බැහැලා එනකන් බලාගෙන**
**වේදිකාවෙන් ප්‍රේමය...**

**ප්‍රේමය තිබුණේම අනුන්ගේ සරුංගල්වල**
**මං උන්නේම හිස් පිට්ටනිවල**
**උජාරුවට මහ උඩට ගියාම**
**නූල කැඩෙනකන් බලාගෙන**
**අහුලාගන්න ප්‍රේමය...**

පිරිමි හිත් පමණක් නොවෙයි ගැහැනු හිත් වුණත් නතර වන්නේ ආදරය කරුණාව දයාව දැනෙන තැනයත ආදර පිරි ඉතිරි යන් ලැබෙන රැකවරණය ලැබෙන තැනකින් පලායන්නට ඇයට හැකියාවක් නැත .එවන් ආදරයක් හිමි වූ ගැහැනියක් මෙසේ කියනවා හැර වෙන කෙසේ කියන්න ද?



**ඔයැයි අස්සක මුල්ලක් නැර**
**හදවත පුරාවට පැතිරිලා**
**පැලපදියම් වුණාම**
**කුරාකුඹියෙකුටවත් රිංගන්න**
**ඉඩක් කඩක් නෑ රත්තරං**
**අලි මං කුඹී මං**
**සේරෝම වහලා දැම්මා මං...**
**ඔයැයි දෙයි හාමුදුරුවෝ වගේ**

**කන්නලව් නොකරත් මා ඇරන්**
**පපුතුරේ හංගගත්තාම**
**දේව අඩවියෙ නොපනත් කම් කරන්නට**
**මට හයිය නෑ රත්තරන්..**

ඇගේ කවි අපූරුය. ඇතැම් කවි රසවිදිමේ දී සොඳුරු සංකල්ප රූ මැවේ.කා ප්‍රේමය පදනම් කරගත් අපේ අහ කොහෙද ලිලීමල් කාව්‍ය සංග්‍රහයේ එන කවියකි මේ.

**මැටි කුස්සියක**
**පොඩිකවුළු ඇති**
**පියන් වෙනුවට උස අතට**
**කිතුල් පොලු විතරක් හිටවාපු...**
**මිරිස් තුනපහ එකට**
**කබල උඩ බැදෙන කොට**
**කිඹිහුමක හඬ ඇහුනෙ**
**මගෙ කන පිටුපසට....**

**ගල උඩට නැමීගෙන**
**අබ මිටක් තලනකොට**
**රිද්ම තෙරපුමක්**
**දැනුනේ මගෙ ඉඟටියට...**



නීතිඥ අජානා රණගල

**විශ්වයක් ඇතුළේ**
**පොඩි ලෝකයක් නොවෙද එය**
**සියවසක් ඇතුළෙ**
**පොඩි මොහොතක් නොවෙද එය....**

තනිකඩව සිටින විට ඔබත් මාත් ජීවත් වන්නේ අපට ඕනෑ විදිහටය. ජීවිත ගොඩනගා ගන්නේ අපට ඕනෑ විදිහටය.

එහෙත් නිදහස්ව තිබූ ජීවිතයක් කාට හෝ අයත් වූ විට බොහෝ විට ඇය අනුගත වන්නේ ඔහුට ඕනෑ ආකාරයටය. ජීවිතේ හැම ප්‍රාර්ථනයක්ම, සිහිනයක්ම ගොඩ නැගෙන්නේ ඒ අනුවය. ඇයට ඇය නැති වන්නේ විවාහය තුළ දී විය හැක. එහෙමත් නැත්නම්. දැඩි ආදර ග්‍රහණයකට හසු වූ විටය. මේ එවන් අත්දැකීමකි.

**මම මා සිත්තම් කරද්දී**
**බොහෝ සේ සැලකිලිමත් විමී.**
**එක් පින්සල් පහරකටවත්**
**අයාලේ යන්නට නොදුන්නෙමි.**
**ඔබ කැමති පාටින්**
**මම මා වර්ණ ගැන්වීමි.**
**මා සිත්තම්ව අවසන්ය.**
**වර්ණවත්ව, පැහැපත්ව, දීප්තිමත්ව...**

**එහෙත් එහි මා වෙත්ද**
**මම සිත්තම පුරා මා සොයමි...**
**එහි ඇත්තේ ඔබ කැමති වර්ණයයි**
**මා සෙවු පැහැයයි**
**ඔබ ආසා කළ දීප්තියයි**
**ඉඳින් මා නම් දැන්**
**මට ද අමතකව ගිය**
**කටුසටහනකි**

මාතෘකා නැති වුවද රසවිඳින අපට කැමති මාතෘකාවක් යොදා ගත හැකි එහෙත් විවිධ පැති කෝණයන් ගෙන් බැලූ කවි රැසක් මෙහිදි අපට හමුවේ.

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න**
**කවි සිළුමිණ,**
**ලේක්හවුස් - කොළඹ 10.**
**විද්‍යුත් තැපෑල**
***kavisilumina@lakehouse.lk***

# කෙටිකතාව

# අපේක්ෂා

● ශාරිකා කරුණාතිලක

**ශල්‍ය වෛද්‍යවර ජීවක බුද්ධදාස සවස් යාමයේ නිවසට පැමිණියේ, බොහෝ සෙයින් වෙහෙසට පත් වෙමිනි. මුළු දවස පුරාම, වෛද්‍ය සමුළුවකට සහභාගී වී සිටීම, ඔහු එලෙස විඩාවට පත්වීමට, හේතු වී තිබිණ. කොළඹ, ඉහළ පෙළේ සම්මන්ත්‍රණ ශාලාවක පැවැත්වෙන, දකුණු ආසියාවේ, ශල්‍ය වෛද්‍යවරුන්ගේ සමුළුවකදී, ශ්‍රී ලංකාව නියෝජනය කරන, විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයා වන ප්‍රවීණ වෛද්‍යවර ජීවක බුද්ධදාසට, එම සතියම රාජකාරි නිවාඩු අනුමත වී තිබිණ.**

ජීවක බුද්ධදාස වෛද්‍යවරයාගේ සේවය, රජයේ රෝහලට පමණක් සීමා වී නැත. අති දක්ෂ, ප්‍රවීණ ශල්‍ය වෛද්‍යවරයකු වන ඔහු සවස් යාමයට පෞද්ගලික රෝහල් ගණනාවක උපදේශක වෛද්‍යවරයකු වශයෙන් සේවය කරයි. එහෙයින් එම වෛද්‍ය මධ්‍යස්ථානවල, බොහෝ රෝගීහු, ඔහු එනතුරු මඟ බලා සිටිති.

ජීවකගේ මෝටර් රිය පිවිසෙන හඬ අසා, ඔහුගේ බිරිඳ මායා, ඉක්මන් ගමනින් පෙරමඟට පිවිසියේ, බොහෝ නොඉවසිලිමත්වය.

"අද හුඟක් පරක්කු වුණා මායා. අර කොහෙන්ද ඇවිල්ලා හිටිය යකා, එයාගේ කතාව ඕනෑවට වඩා දිග්ගැස්සුවා" යි කියමින්, ඔහු ගෙතුළට යන්නට සූදානම් වත්ම, මායා ඉදිරියට ආවේ කලබලයෙනි.

"අනේ ජීවක, ඔයාට ඉස්පිරිතාලෙන් කෝල්ස් දෙකක්ම ආවා" යි ඇය කියන්නට වූයේ, බියපත් ලෙසිනි.

"කෝල්ස් දෙකක්! ඒ මොනවාටද?" ජීවක විමසුවේ විමතියට පත්වෙමිනි.

"අනේ හදිස්සි ලෙඩෙක් ගෙනැල්ලා. ඉක්මනට ඔපරේෂන් කරන්න වේවිලු. ඒ නිසා ගෙදර ආ ගමන්ම එවන්න කිව්වා."

"මොනවා! ඇයි එතන ඉන්න මහ එවුන් දන්නෙම නැද්ද මම මේ ටිකේම ඩියුටි ලීව් බව." ජීවක කෑගසන්නට වූයේ මහත් කෝපයකිනි.

"අනේ ජීවක, අවුරුදු හතරක විතර පුංචි කෙල්ලෙක්, අනේ අපේ දුවගෙ වයසේ." මායා එසේ කියමින් ආයාචනා කරන්නට වූයේ, ඔහුගේ කෑගැසීම නොඇසුණු ලෙසිනි.

"හරියට මෙයා දැක්කා වගේ" ජීවකට සිය බිරිඳ ගැනද බලවත් කෝපයක් ඇති විය. "එහෙනම් බොහෝම අනුකම්පාවෙන් කතා කරන්න ඇති. ඕකුන් ඔක්කොම දන්නවා ගෑනුන් රවටෙන විදිය කතා කරන්න." ජීවක මහා හඬින් කෑගැසීය.

"මම විතරමද ඔය ඉස්පිරිතාලෙ ඔපරේෂන් කරන්න දන්න එකම මිනිහා. ඇයි හදිස්සි ඒකකයේ තව හතර පස් දෙනෙක්ම ඉන්නේ."

"ඒ ඉන්න අයට වඩා ඔයා කොලිෆයිඩ් නිසා වෙන්න ඇති ඔයාටම කතා කරේ." මායා කියන්නට වූයේ සන්සුන් ලෙසිනි.

"ඔයා එන්න එපා මායා මට ඕකුන් ගැන කියා දෙන්න. අර පහුගිය දවස්වල ඉන්දියාවේ සම්මේලනයට යවන්න සර්ජන්ලා තෝරන කොට, මහ එකා දන්නෙ නෑ මම කොලිෆයිඩ් බව. මේ වගේ හදිස්සි වුණාම විතරයි ඒක දන්නෙ."

ඒ අසුණු මායා, අසරණව ජීවක දෙස බලා සිටියාය. නවදිල්ලියේ පැවැති සම්මේලනයට යැවීම සඳහා නිර්දේශව සිටි ජීවක බුද්ධදාසගේ නම අවසන් මොහොතේ කැපී ගිය බව ඇයට සිහිපත් වූයේය.

වෛද්‍ය අධිකාරීන්ගේ කෙනෙහිලිකම් කෙසේ වෙතත්, සිය දියණියගේ වයසේ අහිංසක දැරියක, ශල්‍ය වෛද්‍යවරයෙකුගේ ඉක්මන් පිහිට බලාපොරොත්තුවෙන් ජීවිතයත්, මරණයත් අතර සිරවී සිටින අයුරු මෙනෙහි වෙත්ම මායා හදවතින් හඬා වැටෙන්නට වූවාය.

"ඒගොල්ලන් ගැන හිතන්න එපා ජීවක, අර දරුවා වෙනුවෙන් යන්න. ඒ අහිංසක දරුවා ඔයාට කිසි වරදක් කරලා නැහැනෙ." මායා එසේ කියන්නට වූයේ නුදුටු දැරිය වෙනුවෙන් දරු සෙනෙහස උතුරා යන ආදරණීය මවක ලෙසිනි.

"ඒකට වගකියන්න ඕනෑ මම නෙවෙයි, අර පවුකාරයෝ, පාහර............" ජීවක තවත් අසභ්‍ය වචන ගණනාවක්ම කියාගෙන ගියේ සිය දූ, පුතුන් ඒ අසලකවත් නැති බව සලකාගෙනය.

"බොහෝම හොඳයි ලොකු දොස්තර මහත්තයා. හරි ලස්සනයි. ඔයා හීනෙන් කතා කරන්නෙත් ඉංග්‍රීසියෙන්. ඒත් ඉතින් කේන්ති ගියාම, සුද්ද සිංහල කටේ තොලේ ගෑවෙන හැටි අපූරුයි." මායා එසේ කීවේ බලවත් අප්‍රසාදයකිනි.

"ඔයාට ඔක්කොටම වඩා ලොකු සල්ලි. නර්සිං හෝම්වල චැනල් සර්විස්. ඔහොම ගියාම මේ රටේ මිනිස්සු ඔයාට විතරක් නෙවෙයි, මටයි මේ අහිංසක දරුවන්ටයි එක්කම සාප කරාවි."

"චැනල් සර්විස් යන්නෙ මම විතරයි. සල්ලි ගන්නෙ මම විතරයි. අනිත් එවුන් ගන්නෙනෑ." ජීවක සාලයේ ඒ මේ අත ඇවිද්දේ, තවමත් පහව නොගිය කෝපයෙනි.

"මේ ගෑනි මහ පුදුම ගෑනියෙක්. ලෙඩෙක් වුණාම ළමයාත් එකයි. නාකි මිනිහත් එකයි. වෙන ගෑනු වැඩිපුර කීයක් හරි හොයාගන්න යන්න මිනිහාව ලෑස්ති කරලා යවනවා. ඒකට මෙයා. හරියට වෙස්සන්තර රජ්ජුරුවන්ගෙ පරම්පරාවෙ ගෑනියෙක් වගේ."

ජීවකගේ කුඩා දියණිය, සාලයේ කෙළවර ලොකු පුටුවක වාඩිවී ඇඟිල්ලක් කටේ රුවාගෙන, නිහඬව බලා සිටියාය. මා පියන් අතර කියැවෙන මේ උණුසුම් කතා බහට, ඇය කිසිසේත් කැමති නැත. ඔවුන් උස්හඬින් කියන්නේ කවුරුන් පිළිබඳවදැයි ඉඳුරාම නොවැටහුණද, තමා වැනි දැරියක රෝගාතුරව රෝහලේ සිටින බව ඇයට දැනුණේ මවගේ ආයාචනය නිසාය.

"අනේ අපේ දුවගේ වයසේ දරුවෙක්. අනේ ඉක්මනට යන්න." එසේ පවසන සිය මෑණියන්ට බැණ වදින පියාගේ ආරවුල නවත්වන තුරු ඇයට ඉවසුම් නැත.

ජීවක, සිය දියණිය මෙලෙස බලා සිටින බව දුටුවේ හදිස්සියෙනි. ඔවුන් දෙදෙනාගේ කතාබහ නිසා, ඇය බියපත්ව සිටිනු අවබෝධ වූ හෙයින්, ඔහු බොහෝ සෙයින් තිගැස්සුණේය. වහා ඇය වෙත ආ ඔහු දැරිය වඩාගෙන සිපගත්තේ අපමණ වූ දරු සෙනෙහසිනි.

"මගේ දුවට, තාත්තා හරියට ආදරෙයි" ඔහු කියන්නට වූයේ සිනාසෙමිනි.

"තාත්තා, මගේ දුවට විතරක්ම ආදරේ වුණොත් මදැයි. අර ඉස්පිරිතාලේ ඇඳක අසරණ වෙලා වැටිලා ඉන්නෙත් කාගෙ හරි හුරතල් දුවෙක් තමයි." මායා එලෙස කියනු ඇසුණු ජීවක තිගැස්සුණේය. තමා සියල්ල අමතක කරදමා රෝහලට යා යුතු නොවේදැයි ඔහුට සිතිණ. එහෙත් ඒ මොහොතකට පමණි! තවත් මෙබඳු සුරතල් වියේ දියණිවරුන්, තමා එනතුරු පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවල රැඳී සිටිනු ඇතැයි ඒ සමඟම ඔහුට සිතුණේය.

"නෑ.... මම ඉස්පිරිතාලේ යන්නේ නෑ" යි යළිත් සිත දැඩි කරගත් ඔහු දියණිය සිප පුටුව මත තැබුවේ, නාන කාමරයට යන අදහසිනි. එහෙත් ඒ සමඟම මෝටර් රියක් පෝටිකෝවට එනු දුටු ඔහු, විමතියට පත්ව එහි ගියේය.

ඔහු එහි යත්ම, රෝහල් ශල්‍යාගාරයේ සේවය කරන නාලක වීරසිංහ වෛද්‍යවරයා ඔහු අබියසට එමින් සිටියේය.

"සර්, හදිස්සි ලෙඩෙක් සර්." වෛද්‍යවරයා කියාගෙන ගියේ මඳක් පැකිළෙමිනි. ඒ රාජකාරි නිවාඩු ලබා සිටින විශේෂඥ වෛද්‍යවරයා හමුවන්නට පැමිණීම නොමනා වේදැයි යන දෙගිඩියාවෙනි.

"අවුරුදු හතරක විතර හුරතල් කෙල්ලක්. බඩේ ගෙඩියක් වගෙයි. අපි අත ගහන්න බයයි වගේ සර්. ගෙදරට කෝල්ස් දෙකක්ම දුන්නා. එතකොට සර් ඇවිත් නෑ."

"මම මේ දැන් ආවා විතරයි. ගෙදර ආ ගමන්ම පණිවිඩය කිව්වා. නාලක වාඩිවෙන්න. මම ඉක්මනට එන්නම්."

මෑතකදි සේවයට බැඳුණු, මෙම ළා බාල වෛද්‍යවරයාගේ බැගෑපත් ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම තමා වැනි ප්‍රවීණ වෛද්‍යවරයකුට කිසිසේත්ම නොගැළපෙන බව ජීවක බුද්ධදාස වෛද්‍යවරයා විශ්වාස කෙළේය. එහෙයින්ම ඔහු ඉක්මනින්ම සූදානම් වී, නාලක වීරසිංහ සමඟ නික්මී ගියේය.

ඔවුන් රෝහලට යන විට, දැරිය සැත්කම සඳහා අවශ්‍ය පූර්ව කාර්යයන් සියල්ල නිසි ලෙස නිමකර තිබූ හෙයින්, ජීවක බුද්ධදාස ශල්‍යාගාරයට පිවිසුණේය. සැත්කම් සයනෙහි සිටි දැරිය දුටු සැණින්, ඔහු මවිතව, තිගැස්සී බලා සිටින්නට වූයේ, බොහෝ සෙයින් කැලඹෙමිනි.

"මොනවා! මේ මගේ චූටි දුව වගේම නේදැ"යි ඔහුට කියැවුණේ නිතැතිනි.

සුදු පැහැති සුරතල් මුහුණ, කැරලි ගැසුණු කෙටි කොණ්ඩය, මුහුණේ ඇඳී තිබූ සිනාමුසු බව!

"සර්ගෙ දුව වගේම තමයි සර්" නාලකට කියැවුණේ, තමා එහි ගිය මොහොතේ ඉදිරියට දිව ආ ප්‍රවීණ වෛද්‍යවරයාගේ කුඩා දියණිය සිහිපත් වීමෙනි.

"අනේ එයා වගේම තමයි" ජීවකට කියැවුණේ සිහින් ස්වරයෙනි.

"හැබෑටම! ඒකද එන්න බැරිය කියලා මාත් එක්ක රණ්ඩු වුණේ" මායා එලෙස පවසනු ඔහුට ඇසෙන්නට විණ.

"හැම පුංචි දුවක්ම, අපේ දුවක් කියලා හිතන්නකෝ" ඉක්බිතිව දෝංකාරයක් බඳුව මායාගේ හඬ මුළු ශල්‍යාගාරය පුරා පැතිරී යන්නට විය.

ශල්‍යකර්මය සඳහා දිගු කාලයක් ගත නොවීය. එය අන් අය සිතූ පමණ බැරෑරුම් කාර්යයක්ද නොවීය. ශල්‍ය වෛද්‍යවරයා පිටතට ආවේද, බොහෝ තුටුපහටු සිතිනි. සිය දියණිය වන් කුඩා රෝගියාට පිහිට වීමට හැකිවීමේ උද්දාමය ඔහුගේ සිත පුරා ඉතිරී යමින් තිබිණ. ශල්‍යකර්මය මුළුමනින්ම සාර්ථක වූ බව ඔහු පළපුරුද්දෙන්ම දැන සිටියේය.

ජීවක බුද්ධදාස වෛද්‍යවරයා සිය කාර්ය මණ්ඩලයට අවශ්‍ය උපදෙස් ලබාදී පිටතට පැමිණෙත්ම කොරිඩෝරයේ අසල දරුවෙකු වඩාගත් තරුණ කාන්තාවක හා ඇයගේ ස්වාමිපුරුෂයා යැයි සිතිය හැකි තරුණයෙකු ද සිටි අතර, ඔව්හු වෛද්‍යවරයා දැක ඉදිරියට ආහ.

"අනේ බුදු දොස්තර මහත්තයෝ, අපේ දරුවාට මොකදැ"යි එම තරුණ කාන්තාව කඳුළු සලමින් විමසුවේ ඉතා බැගෑපත් ලෙසිනි.

"බයවෙන්න දෙයක් නෑ. ඒක අපි හිතුවාට වඩා සුළු එකක්." වෛද්‍යවරයා එසේ පවසත්ම, ඔවුන් දෙදෙනාගේ දෑස් කඳුළින් පිරෙන්නට වන. ඒ, සතුටු කඳුළුය!

ශල්‍ය වෛද්‍යවර ජීවක බුද්ධදාස, වහා රෝහලෙන් නික්ම ගියේ පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවල, ඔහු එනතුරු නොඉවසිලිමත්ව බලා හිඳින රෝගීන්හට අවශ්‍ය උපදෙස් ලබාදී, ඔවුන් සුවපත් කරන අරමුණ ද සිත තුළ රඳවාගෙනය. අපේක්ෂා නම් වූ කුඩා දැරිය මරණයෙන් බේරා, ඇය තවත් බොහෝ කලක් ජීවත් කරවීමට හැකිවීම පිළිබඳව දැඩි සතුටක් ද ඔහු තුළ වූයේය.

ජීවක මුල්ම වෛද්‍ය මධ්‍යස්ථානයට යන විට, බොහෝ වේලාවක් බලා සිටි ඇතැම් රෝගීන් ආපසු නික්ම ගොස් තිබිණ. දෙවැනි මධ්‍යස්ථානයේ රැඳී සිටියේ, කලින් දැන්වීමක් සිදු නොකොට ආ කීපදෙනෙකු පමණි. "ගෙදරට කෝල් කරාම කිව්වා, හදිස්සි ඔපරේෂන් එකකට ගියා. එන වේලාවක් කියන්න බෑ කියලා." එක් මධ්‍යස්ථානයකින් එලෙස කියැවුණු ඇසුණු ජීවකට මායා කෙරෙහි කෝපයක් ඇතිවූයේ නිතැතිනි.

"එහෙමද කියන්න තිබුණේ. ඉක්මනට එයි කිව්වා නම්, මිනිස්සු ආපසු යන්නෑ." මායා හිතන්න ඇති ඔපරේෂන් එකක් කිව්වාම රෑ දෙගොඩ හරි යාමෙ වෙනතුරු නටන තොවිලයක් කියලා."

ජීවක ගෙදර එනවිට සැඳෑ යාමය ගෙවීගොස් තිබිණ. වැහි වලාවක් පෙරමඟ එන බව පවසන ලෙසින් අඳුර දැඩිව පරිසරය වසා පැතිරී යන බවක් ඔහුට පෙනෙන්නට විය. මායා, කුඩා දියණියට බත් කවමින් සිටිනු ඔහු දුටුවේය.

"අනේ ජීවක, අර දරුවාට මොකද?" ඔහු දුටු සැණින් මායා නොඉවසිලිමත්ව අසා සිටියාය.

"කවුරුවත් මැරුණෙ නෑ. සනීප වුණා. මැරුණෙ මම." ජීවක කීවේ කෝපයෙනි.

දියණිය ඔහු දෙස බලා සිනාසුණාය. ඇය දුටු සැණින් ඔහුට අපේක්ෂා දියණිය සිහිපත් විය. ඒ වන විට ඇය සිහිය ලබා බොහෝදුරට සුවපත්ව සිටින බව, ඔහු දුරකථනයෙන් විමසා දැනගෙන තිබිණ.

"චූටි දුව, ඔයා බත්කාලා ඉවරවෙලා ගිහින් නිදාගන්න. තාත්තාට ලැබ් එකේ ලොකු වැඩක් කරන්න තියෙනවා. මම ඉක්මනට එන්නම්කෝ." ඔහු කීවේ ආදරණීය හඬකිනි.

ජීවක බුද්ධදාස නම් වූ ඒ මහානුභාව සම්පන්න අග්‍රගණ්‍ය ශල්‍ය වෛද්‍යවරයා ඇඟට පණ නැතිව ඇටසැකිල්ලට සවන් දීගෙන සිටියේ බොහෝ සෙයින් බියපත්වය. මෙම ඇටසැකිල්ල කිසිදු බියක් සැකක් නැතිව කතා කරන්නේත්, ඇවිදින්නේත් කවර ශක්තියක් නිසාදැයි ජීවකට කිසිසේත් සිතාගත නොහැකි විය.

"දොස්තර මහත්තයා, උඹ ටිකකට කලින් කියනවා මට ඇහුනා, අර හිපොක්‍රටීස් රූපය යටින් ලියල තියෙන වාක්‍යය, ඒ උත්තමයා මේ කාලෙ හිටියා නම් කියන එකක් නැතෙයි කියලා. මතක තියාගනින්. ඒ කියමන සදාකාලෙටම වලංගුයි. උඹ අර දරුවාගේ ඔපරේෂන් එකට යන්න බැරිය කියලා ගෙදර යකා නැටුවා නේද? දරුවාගේ ජීවිතයට වඩා චැනල් සල්ලි උඹට ලොකු වුණා නේද?" අනතුරුව ඇටසැකිල්ල බිහිසුණු ලෙස සිනාසුණු අතර, පර්යේෂණාගාරයේ වූ සියලුම මෙවලම් සෙලවෙන්නට විය.

"වෛද්‍ය විද්‍යාවේ ඉහළම විභාග පාස්කරාට, උඹලා වගේ අය මොන්ටිසෝරියේ ඉඳගෙන අඳුරේ අතපත ගානවා විතරයි. මනුස්සකමේ එකම විභාගයක්වත් පාස් නෑ."

අනතුරුව ඇටසැකිල්ල ඔහුගේ ඇටකෝටු සුරත ඉහළට ඔසවා ගත්තේය.

"ඒත් උඹේ නෝනා! අන්න නියම මිනිස් දෙව්දුවක්! අර පුංචි දොස්තර මහත්තයා ගෙදරටම නොආවා නම් උඹ යන්නෙ නෑ නේද? එයාට කසාදෙකුත් නෑ - දරුවෙකුත් නෑ. දරු සෙනෙහස අඳුරාගත්තේ අර දරුවා දැකලා පපුව උණුවෙලා. උඹට දරුවො තුන්දෙනෙක් ඉඳලත් එහෙම උණුවීමක් නෑ."

"නෑ - නෑ මම ගියා. ගිය නිසා දරුවාගේ ජීවිතය බේරුණා." ජීවක කීවේ ගොත ගසමිනි.

"ගියා නේන්නම්! චැනල් සල්ලි නැතිවෙන දුකට හුල්ලාගෙන ගිහින් දරුවා දැක්කාම තමයි කිරි එරුණේ. දොස්තරලා වුණාම හැමතිස්සෙම හිතන්න ඕනෑ, තමන් ළඟට එන්නේ තමන්ගෙම අය කියලා." එසේ කියමින් සිටි ඇටසැකිල්ල. එක්වරටම මහ හඬින් හඬන්නට විය. ජීවක බියපත්ව, ඇටසැකිල්ලේ ඇස් කුහරෙන් ගලන කඳුළු දැක මවිතයට පත්විය.

"උඹ දන්නෙ නෑ ජීවක, මම කවුද කියලා. මම බොහෝම දුප්පත් පවුලක කොල්ලෙක්.

අපි පොඩි කාලෙම තාත්තා මැරුණු නිසා මම මගේ දුප්පත් අම්මාට පවුල ගොඩදාගන්න උදවු වෙන්න, ගල්වළේ වැඩ කරා. මගේ බඩේ ගෙඩියක් හැදිලා ඉස්පිරිතාලෙ ගියාම ඔපරේෂන් ලැයිස්තුවේ මගේ නම වැටුණේ අගට." එසේ පවසා ඇටසැකිල්ල ඉකිබිඳින හඬ, පර්යේෂණාගාරය පුරා දෝංකාර හඬ නැංවීය.

"ඔපරේෂන් එක ඉක්මන් කරගන්න තිබුණා අත යට සල්ලි දුන්නා නම්. අනේ ඉතින් අපිට කොයින්ද සල්ලි. ඒ අතරට ගෙඩිය පුපුරලා මම මැරුණා."

ඒ වනවිට ඔහුගේ පුතුන් දෙදෙනා රූපවාහිනී වැඩසටහනක් නරඹමින් සිටියහ. ජීවක වහා දිය නා අවසන්ව වේලාසනින්ම රාත්‍රී ආහාරය ද ගෙන, පසුදින වෛද්‍ය සම්මන්ත්‍රණයේදී තමා පැවැත්විය යුතු දේශනයට සූදානම් වීම සඳහා සිය පර්යේෂණාගාරයට යෑමට ලිපි ගොනු කීපයක් ද එක්රැස් කර ගත්තේය.

"පුතේ වහින්න එනවා වගෙයි. ගොරවන සද්දෙත් එනවා. ටී.වී. එක වහලදාලා ගිහින් බත් කාලා නිදාගන්න" මායා පුතුන් දෙදෙනාට පවසනු ජීවකට ඇසුණේය.

ජීවක නිවසේ එහා කෙළවරක වූ ඔහුගේ පර්යේෂණාගාරයට පිවිසෙන විට පොද වැස්ස අකුණු සහිත මහවැස්සක් බවට පත්ව තිබිණ. ඔහු එහි පසෙක වූ අල්මාරියෙන් තමාට අවශ්‍ය පොත්පත් කීපයක් තෝරාගෙන, සිය කාර්යය සඳහා මේසය අසල වාඩි වූයේය.

'තුන්වැනි ලෝකයේ ශල්‍ය වෛද්‍යවරයන්ගේ කාර්ය භාරය' ඔහුගේ දේශනය සඳහා මාතෘකාව විය.

"ඉක්මනට මේක ලියලා ඉවරයක් කරන්න ඕනෑ. මට අද හරි මහන්සියි" තමාටම කියාගත් ඔහු දේශනය සඳහා කරුණු එක්රැස් කරන්නට විය. "හවස අර කරදරේ වුණේ නැත්නම්, මේක කලින් ලියලා ඉවර කරන්න තිබුණා. කොහේද? අතට ගන්න තිබුණු තුට්ටු දෙකත් නැතිවුණා." ඔහුට මායා ගැන නැවතත් කෝපයක් ඇති විය.

එකෙණෙහිම අකුණක් පුපුරා ගිය අතර මහ හඬ නඟමින්, පාරේ ගසක අත්තක් කඩා වැටී විදුලිය ද විසන්ධි විය. ජීවක, මොහොතක් අඳුරේ බලා සිට, ඉන්පසුව අසල වූ විදුලිපන්දමේ එළියෙන් ඉටි පන්දම් දෙකක් සොයාගෙන දල්වා සිය කාර්යය නැවත ආරම්භ කෙළේය.

එහෙත් සමාධිගත සිතකින් ඔහුට වාර්තාව ලියාගත නොහැකි විය. ඉටිපන්දම් එළියෙන් විවිධාකාර රූප බිත්තිවල නටන අයුරු ඔහුට පෙනෙන්නට විය. රෝහලේ වාට්ටුවල වේදනාවෙන් කෙඳිරි ගාන රෝගීන්ගේ හඬ ඔහුට ඇසුණේ, අමුතු බියක්ද සමඟය. ඒ අතරට ඔහුට අපේක්ෂාගේ මවුපියන්ගේ කඳුළු පිරි දුක්මුසු මුහුණු ද සිහිපත් වන්නට විය. ඒ දසුන ඔහු රැගෙන ගියේ අතීතයේ එක්තරා ඉසව්වකටය.

ජීවකට පියා අහිමි වන විට, ඔහු දසවැනි වියේ පමණ විය. ගුරුවරියක වූ ඔහුගේ මව, සුමනලතා ඉස්කෝලේ හාමිනේ ජීවක ඇතුළු සිය දරුවන් පස්දෙනෙකු ඇති දැඩි කරගත්තේ මහත් දුෂ්කරතා මධ්‍යයේය. ඉතා අර පරෙස්සමින් විය පැහැදම් කරමින් දරුවන් උසස් අධ්‍යාපන ලාභීන් වූයේ ඇයගේ නොපසුබට උත්සාහය නිසාය.

දරුවන් රෝගී වූ කල, සුමනලතා ඉස්කෝලේ හාමිනේ ඔවුන් රැගෙන රෝහල් පෝලිම්වල තෙරපෙමින් ප්‍රතිකාර ලබා දුන්නේ, හුදෙක්ම වියදම් අඩුකර ගැනීම සඳහාය.

"පුතේ, පුතා කවදාහරි හොඳට ඉගෙනගෙන, දොස්තර කෙනෙක් වුණ දාක මේ පෝලිම්වල දුක් විඳින දුප්පත් ලෙඩ්ඩුන්ට හොඳට සලකන්න ඕනෑ." වසර ගණනාවකට පෙරදී, සිය මව දුන් අවවාදය ජීවකට නැවත සිහිපත් වූයේ අපේක්ෂාගේ මවුපියන් දැකීමෙනි.

හදිසියෙන්ම පර්යේෂණාගාරය කෙළවර වීදුරු ජනේලය දෙසින් සියුම් හඬක් ඇසෙන්නට වූ හෙයින් ජීවක බොහෝ සෙයින් කැලඹී, මවිතයට පත්ව එදෙස බලා සිටියේය. එහි බිත්තියේ ගසා ඇති බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස සම්මානිත හිපොක්‍රටීස්ගේ ඡායාරූපය නිසලව තිබෙන අයුරු ඔහු දුටුවේය. එය යටින් ලියැවී ඇති අර්ථාන්විත වැකිය ද ඔහුට පෙනෙන්නට විය.

"වෛද්‍යවරයෙකුගේ උත්තරීතර මෙහෙවර, සකල ලෝකයා සුවපත් කරනු පිණිස, සිය කාලයත් ශ්‍රමයත්................"

"හිපොක්‍රටීස් මේ කාලයේ ජීවත්ව සිටිනවා නම් ඔහොම කියන එකක් නෑ" යි තමාටම කියාගත් ජීවක, ආපසු හැරෙත්ම වීදුරු ජනේලය යළි සෙලවෙන්නට විය. බොහෝසෙයින් බියට පත්වූ ඔහු එදෙස බලත්ම,

"ඒයි බුද්ධදාස ජීවකරත්න" යැයි සිය නම වරදවා හසුරුවමින් අමතනු ඇසුණු ඔහු තිගැස්සී බලා සිටියේ එක්තරා කෝපයකින් යුතුවය.

"කවුද යකෝ මට මගේ නම කියලා කතා කරන්න පුළුවන් එකෙක් මේ හතර දිග්බාගයක ඉන්නේ." ඔහු කෑගැසුවේ බියපත් වෙමිනි.

"ඇයි මම!" ජනේලය දෙසින් ඇසුණේ වියරු හඬකි.


"මේ, මම එනවා!"

"මොනවා! හතරවම් දෙවියනේ!"

බිත්තියේ කෙළවර රාක්කය අසල තබා තිබූ ඇටසැකිල්ල දෑත් විදහාගෙන තමා දෙසට එන දසුන ඔහුගේ මුළු සිරුරම අප්‍රාණික කරන්නට විය. ජීවක තමා දෙස බලා සිටිනු දුටු ඇටසැකිල්ල මේසයට මඳක් ඈතින් නතරවිය.

"බුද්ධදාස ජීවකරත්න! අනිච්චං ඉතිහාසයේ ජීවත්වුණු වටිනා වෛද්‍යවරුන් දෙන්නෙකුගේ නම් දෙකකට ගිහින් තියෙන කලක්." ඇටසැකිල්ල වියරු හඬින් සිනාසුණේය. ඒ බිහිසුණු හඬ, පර්යේෂණාගාරයේ දෝංකාර හඬ නැංවීය.

"මේ දෙන්නාම වෙදකම් කරේ, අහිංසක මිනිසුන්ගේ වියදමෙන් ඉගෙන ගෙන, අන්තිමට ඒ මිනිස්සුන්ගෙ තුට්ටු දෙක හූරාගන්න හිතාගෙන නම් නෙවෙයි. එම්. බී. බී. එස්, එම්.ඩී, එෆ්. ආර්. සී. එස් වගේ නම අගට වට්ටෝරු නැතුවාට නියම මිනිස් දෙවිවරු. ලෙඩ්ඩු පණ අදින වෙලේ වැඩි පඩි පහසුකම් නිලතල දීමනා ඉල්ලලා වැඩ වර්ජන කරපු අය නෙවෙයි. ඒ වගේ උතුම් මිනිස්සුන්ගේ නම් උඹලා වගේ අයට වටින්නේ නෑ."



එයින් අනතුරුව, මොහොතකට ඇටසැකිල්ල නිහඬ විය.

"උඹ දන්නවාද මැරිලා වළලා ටික කාලයක් ගියාම මට වෙච්ච දේ." ඔහු නැවත කියවන්නට වූයේ කඳුළු පිස දමමිනි.

"එක අඳුරු රෑක හතරපස් දෙනෙක් ඇවිත් මගේ මිනිය ගොඩ දැම්මා. එතකොට පෙට්ටිය දිරලා. ඒකත් දාලා වළ වහලා, මාව ගඟට අරගෙන ගිහින් හෝදලා මැදලා පිරිසිදු කරලා දොස්තර කෙනෙකුට විකුණලා දැම්මා. එයා මිනී වෙළෙන්දෙක්. එයාගෙන් තමයි උඹ සල්ලි දීලා මාව අරගත්තේ."

"නෑ - නෑ එයා එහෙම කෙනෙක් නෙවෙයි. සිරිවර්ධන දොස්තර මහත්තයා. රටේ නම ගිය දක්ෂ දොස්තර කෙනෙක්." යැයි ජීවක කීවේ එයට බොහෝ කලකට පෙර සිය මව හඳුනන ගුරුවරයෙකු මඟින් ඒ දොස්තර මහතාගෙන් එය ලබාගත් අයුරු සිහිපත් කරමිනි. එතෙක් මෙතෙක් ඒ ඇටසැකිල්ල බොහෝ සුරක්ෂිත ලෙස ඔහු වෙත තිබිණ.

"ඔය ප්ලාස්ටික් ඒවා වගේ නෙවෙයි, නියම ඔරිජිනල් බඩු" යි ඒ ගුරුවරයා පවසා ඇත.

"හොඳ කෙනෙක් නිසා නේන්නම් ඔය ජාවාරම් වලට හවුල්." ඇටසැකිල්ල සිනාසුණේය.

"අනේ, මගේ මිනියට ගමේ මිනිස්සු කොයි තරමට සැලකුවාද? අපි දුප්පත් නිසා මළගෙදර ඔක්කෝම වැඩ කළා. අන්තිමට මිනිය සොහොනට අරගෙන ගියේ බෙර ගගහ.

ඒ මදිවට හත්දවසෙ, තුන්මාසෙ දාන දීලා මිනීවළ උඩ පාන් පත්තු කරලා ගෞරව කරා. ඒ තරම් සලකපු මගේ මිනියට, මොන තරම් නින්දා සහගත වැඩක්ද කළේ. අපිට මැරිලාවත් නිදහසේ ඉන්න දුන්නාද?" ඇටසැකිල්ල එසේ කීවේ දරදඬු අත් ඉහළට ඔසවාගෙන මහත් කෝපයකිනි.

"ගල්වළේ වැඩ කරපු මගේ අත්දඬු තාම සවි ශක්තියි, ඕනෑම කෙනෙකුගේ බෙල්ල හිර කරන්න පුළුවනි." ඇටසැකිල්ල එසේ පවසත්ම, ජීවක බොහෝසෙයින් බියපත් විය.

"දොස්තර මහත්තයා, බයවෙන්න එපා. මම උඹව මරන්නේ නෑ. ඒ, මම ගෞරව කරන නෝනලා තුන්දෙනෙකුට කරන සැලකිල්ලක් නිසා. ඒ මගේ දුප්පත් අම්මා, සුමනලතා ඉස්කෝලෙ හාමිනේ, අනිත එක්කෙනා මායා නෝනා." ඇටසැකිල්ල කියාගෙන ගියේය.

"උඹව මම මරන්නේ නැත්තේ තව හේතු දෙකක් නිසා. එකක්, එහෙම වුණොත් දරුවන් තුන්දෙනෙක් එක්ක මායා නෝනා තනි වෙනවා. අනිත් එක, මොනවා වුණත් ජීවක දොස්තර මහත්තයා කලාතුරකින් රටකට ඉපිදෙන ඉතාම දක්ෂ ශල්‍ය වෛද්‍යවරයෙක්. ඒත්, මේ රටේ මිනිස්සුන්ගේ පෙර අකුසලයකට, අර ඉස්පිරිතාලෙ ඉන්න මහ මිනිස්සු උඹේ දක්ෂකම පිළිගන්නෙ නෑ. උන් උඹට ඉරිසියාව." ඇටසැකිල්ල සාවඥ ලෙස සිනාසුණේය.

"මට තව පණිවිඩයක් තියෙනවා. ඔක්කොම ලොකු දොස්තර මහත්තුරුන්ට කියා දෙන්න. ලෝක වෙළඳපොළේ තෙල්, පිටි, සීනි, කිරිපිටි වගේ දේවල් මිල වැඩිවුණාම, අපේ රටේ නියඟ ගංවතුර නිසා වගා විනාස වුනාම බඩුමිල ඉහළ ගිහින් මිනිස්සුන්ට කරදර වෙනවා. ඒවා වළක්වා ගන්න අමාරුයි. ඒ වුනත් ලොකු දොස්තර මහත්තයාලා, නෝනාලාගේ චැනල් ගාස්තු එන්න එන්නම වැඩි වෙන්නේ ඒගොල්ලන් ගංවතුරට අහුවෙලාද?" ඇටසැකිල්ල මහා හඬින් සිනාසෙන්නට විය. "මිනිස්සු හිඟා කාලා හරි සල්ලි හොයාගෙන චැනල් කරනවා තමයි. ඒත්, දොස්තර මහත්තුරු තමන්ටම ආභරණයක් නෙවෙයි. රටටම දිලිසෙන ආභරණ වෙන්න ඕනෑ."

එසේ පවසමින් ඇටසැකිල්ල ඉදිරියට එනු දුටු ජීවක, බියපත්ව දෑස් පියා ගත්තේය. "මම, ආපහු යනවා. ආයෙමත් කවදාවත් එන්නෙ නෑ. ඒත් මගේ පණිවිඩය මතකයිනෙ."

ජීවක, බොහෝදුරින් ඇසුණු හඬින් නැවත දෑස් විවරකොට, ඒ මේ අත බැලුවේය.

"මොනවා! කෝ මේ ඇටසැකිල්ල" මවිතයට පත්වූ ජීවක නැගී සිටිත්ම, නැවත විදුලි එළිය දැල්වෙන්නට විය.

"ආ! අර රාක්කෙ ළඟම තියෙන්නේ." ජීවක මුළු පර්යේෂණාගාරය පුරාම විමසුම් සහිතව බලන්නට වූයේ, තවත් ඇටසැකිල්ලක් කොතැනක හෝ තිබිය හැකි යැයි යන දෙගිඩියාවෙනි. හදිස්සියේම ඔහු වීදුරු ජනේලය දෙස බැලුවේ,

ඒ අසල බිත්තියේ කිසියම් අඩුවක් දකින්නට වූ හෙයිනි.

"ආ! මොනවා, හතරවරම් දෙයියනේ! කෝ අර හිපොක්‍රටීස්ගේ රූපෙ. ඒක අතුරුදහන් වෙලා." යි කියමින් ජීවක එතැනට දිව ගියේ, බලවත් ලෙස සිත් කැලඹීමෙනි.

# අපල සපල

වෂී 2021ක් වූ මැයි මස 09 වැනිදා ඉරිදා සිළුමිණ

## සතියේ මහා නැකැත්

09 ඉරිදා උදේ 08.14 සිට 08.32 දක්වා දකුණ බලා
10 සඳුදා උදේ 06.31 සිට 06.52 දක්වා දකුණ බලා
12 බදාදා උදේ 07.52 සිට 08.21 දක්වා උතුර බලා
13 බ්‍රහස්පතින්දා උදේ 08.02 සිට 08.17 දක්වා උතුර බලා
14 සිකුරාදා උදේ 06.02 සිට 06.21 දක්වා උතුර බලා

## දිවාමය සුබ මුහුර්ථ

09 ඉරිදා උදේ 06.47 සිට 06.57 දක්වා දකුණ බලා
10 සඳුදා උදේ 06.14 සිට 06.32 දක්වා දකුණ බලා
11 අඟහරුවාදා උදේ 7.47 සිට 08.04 දක්වා නැගෙනහිර බලා
12 බදාදා උදේ 06.42 සිට 07.08 දක්වා උතුර බලා
13 බ්‍රහස්පතින්දා උදේ 06.37 සිට 06.52 දක්වා උතුර බලා
14 සිකුරාදා උදේ 07.21 සිට 07.42 දක්වා උතුර බලා
15 සෙනසුරාදා උදේ 07.01 සිට 07.17 දක්වා උතුර බලා

| දිනය | රාහු කාලය |
|---|---|
| 09 ඉරිදා | සවස 04.16 - 06.19 දක්වා අලුයම 04.28-05.55 |
| 10 සඳුදා | උදේ 07.28 - 09.01 දක්වා රාත්‍රි 07.46-09.13 |
| 11 අඟහරුවාදා | 03.13 - 04.46 දක්වා අලුයම 03.00-04.27 |
| 12 බදාදා | දහවල් 12.06 - 01.39 දක්වා අලුයම 12.06-01.33 |
| 13 බ්‍රහස්පතින්දා | දහවල් 01.40 - 03.13 දක්වා අලුයම 01.34-03.01 |
| 14 සිකුරාදා | දහවල් 10.34 - 12.07 දක්වා රාත්‍රි 10.40-12.01 |
| 15 සෙනසුරාදා | උදේ 09.00 - 10.33 දක්වා රාත්‍රි 09.13-10.40 |

## සතියේ කුළුදවස

සුබසෙත ජ්‍යේෂ්ඨ කර්තෘ - අජිත් ධර්මසිරි, 077 3470914

2021-05-09 සිට 2021-05-15 දක්වා

### මේෂ - ආර්ථික ලාභ

මේෂ ලග්නයට අනුව මෙම සතිය ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා 12 - 01 - 02 - 03 යන ස්ථානවල ගමන් කිරීම ඉතා සුබ ඵල උදා කරවන්නකි. විශේෂයෙන් ආර්ථික ලාභ ගෙනදෙන ව්‍යාපාර ප්‍රතිලාභ උසස් කරවන පිහිටීමකි. රැකියා ස්ථානගත දුෂ්කරතා එළඹීමට හේතු වුවද තම ජීවනෝපාය යහපත් වනු ඇත. දණහිස ආශ්‍රිත අයහපත්කම් සහිතයි.

### වෘෂභ - සතිය පුරා සතුට

වෘෂභ ලග්නයට අනුව මෙම සතියේ ඔබට හදිසි ධන සම්පත් උදාවේ. තමා පෙර ආරම්භ කර තිබූ ව්‍යාපාරයක් ලාභ ගෙනදෙන තත්ත්වයට පත්වේ. සිතේ සතුට මතු කෙරේ. සතුටුදායක තත්වයෙන් සතිය ආරම්භ වෙමින් සතුටුදායක ලෙසින් සතිය ගෙවෙනු ඇත. දුරබැහැර ගමන් බිමන් යෙදේ. තම නිවසේ ආගමික කටයුත්තක් යෙදෙනු ඇත. රැකියා ස්ථානයේ බොහෝ අය වෙතින් ප්‍රසාදය හිමි වනු ඇත.

### මිථුන - දේපළක උරුමය

මිථුන ලග්නයට අනුව මෙම සතිය ඔබට තම දේපළක උරුමය පෙන්වයි. හදිසි දුර ගමන් යෙදෙන අතර පවුලට නව සාමාජිකයන් එක්වන සතියකි. තම පහසුව සලකා නිවසේ කටයුතුවලට එක්කර ගන්නා අයකු නිසා කිසියම් කරදරයකට මුහුණ දීමට ඉඩ ඇත. පිටස්තර අය පිළිබඳ ඕනෑවට වඩා විශ්වාසය තබා ගැනීම සුදුසු නැත. යටි බඩේ අසාත්මිකතාවක් නිසා පීඩාගෙන දෙනු ඇත.

### කටක - විවිධ පරිත්‍යාගයන්

කටක ලග්නයට අනුව මෙම සතිය ඔබ කේන්ද්‍රයේ චන්ද්‍රයා 09 - 10 - 11 - 12 යන ස්ථාන පසු කර ගමන් ගන්නා නිසා නිවසේ ආගමික මුහුණුවරක් පෙන්වයි. දානමය කටයුත්තකට කටයුතු සූදානම් වේ. තම මවු පාර්ශ්වයේ අයකු වෙනුවෙන් එම කටයුතු සංවිධානය කිරීමට ඔබට සිදුවේ. සිතේ සතුට සැනසුම මෙන්ම විවිධ පරිත්‍යාගයන් නිසා ඔබ ආර්ථික වශයෙන් ද ඉදිරියට යනු ඇත.

### සිංහ - නිවසක උරුමය

සිංහ ලග්නයට අනුව මෙම සතිය ඔබ කේන්ද්‍රයේ චන්ද්‍රයා 08 - 09 - 10 - 11 යන ස්ථානවල ගමන් ගැනීමේදී සතිය ආරම්භය අසුබ ඵල උදාවුවත් සතිය මැද සිට ආර්ථික, රැකියා හා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ සතුටුදායක තත්ත්වයකි. නිවසක උරුමය නව වාහන මිලදී ගැනීම් මේ අතර වෙයි. තම පුතකු නිසා ආඩම්බර විය හැකි තත්ත්වයකි. තුනටියට අගුණයි.

### කන්‍යා - අධිෂ්ඨානය දැඩිවේ

කන්‍යා ලග්නයට අනුව ඔබ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 07 - 08 - 09 - 10 යන ස්ථාන පසු කරමින් යන නිසා යුග දිවියේ සතුට උපරිම ලෙස ලැබේ. අවිවාහක අයට විවාහ යෝජනා ආදර සබඳතා මතු කෙරෙනු ඇත. අඹු සැමියන් අතර සාමය සමගිය මතු කෙරේ. නව හිතමිතුරු කැලක් තම මිත්‍ර සංගමයට එක්වෙනු ඇත. විශ්වාසය අධිෂ්ඨානය දැඩි වන සතියකි.

### තුලා - දුර බැහැර ගමන්

තුලා ලග්නයට අනුව මෙම සතිය ඔබට දුර බැහැර ගමන් යෙදේ. දුෂ්කර කාලයකට හේතු වේ. චන්ද්‍රයා ඔබ කේන්ද්‍රයට අනුව 06 - 07 - 08 - 09 යන ස්ථාන පසුකර යන නිසා යටිබඩේ අසනීප තුනටියේ ආපදා මතු කෙරේ. තමා පාවිච්චි කරන ඖෂධයක් විෂ වීමට බොහෝ දුරට ඉඩ ඇති නිසා සුපරික්ෂාකාරී වන්න. එදිනෙදා කටයුතුවලදී දුෂ්කරතා මතු කෙරෙන අතර වියදම් පාර්ශ්වය ද ඉහළ යනු ඇත.

### වෘශ්චික - නව ජීවන රටාවක්

වෘශ්චික ලග්නයට අනුව චන්ද්‍රයා ඔබ කේන්ද්‍රයේ 05 - 06 - 07 - 08 යන ස්ථාන පසුකර ගමන් ගන්නා නිසා නව ජීවන රටාවකට ඔබ මුහුණ දෙනවා ඇත. ඒ අනුව ඔබ පවුලේ නව සාමාජිකයකු නිසා කාර්යය බහුල වන අතර දරුසම්පත් හිමිකම ද පෙන්වයි. යාළු හිතමිත්‍රයන් නිවසට එන සතියකි. ඒ නිසාද ඔබගේ එදිනෙදා කාර්ය භාරය අවිවේකී ස්වරූපයක් ගනු ඇත. කුස ආශ්‍රිත අගුණ පල වන නිසා සැර උෂ්ණ ආහාරපාන අවම කරන්න.

### ධනු - උසස් ජීවන තත්ත්වයක්

ධනු ලග්නයට අනුව මෙම සතිය ඉතා වාසනාවන්ත එකකි. චන්ද්‍රයා ඔබ කේන්ද්‍රයට අනුව මෙම සතියේ 04 - 05 - 06 - 07 යන ස්ථානවල ගමන් කිරීම නිසා වාහන, ඉඩම්, නිවාස ලාභ මෙන්ම ගෘහ ජීවිතයේ සුබවාදී තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නැංවෙන සතියකි. තම දේපළ ඉඩකඩම් වලට තිබූ නීති ගැටලු ඉවත් වේ.

### මකර- බොහෝ අයගේ පැසසුම්

මකර ලග්නයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 03 - 04 - 05 - 06 යන ස්ථාන පසුකර යාම විශේෂ ගරු බුහුමන් ලැබීමට හේතුවන සතියකි. තමා සමාජශීලී ලෙස ජනතාවට කරන සේවාවන් බොහෝ දෙනාගේ පැසසුමට කතාවට ලක්වේ. ආර්ථික ප්‍රතිලාභ අධ්‍යාත්මික සහනය උදාවනු පෙනේ. තමා දරුවන්ට කරන කැපවීමේ ප්‍රතිඵල ඇස්පනාපිටම දැක ගන්නට ලැබෙන සතියකි. පපුවේ සෙම හතිය දැඩි වන නිසා ප්‍රවේශම් වන්න.

### කුම්භ - ධන හිමිකමක්

කුම්භ ලග්නයට අනුව මෙම සතිය ඔබට විශේෂ වන්නේ කලක් බලාපොරොත්තු වූ ධනයකට හිමිකම් කීමට ලැබීමයි. ඔබ ඉල්ලා තිබූ ණය මුදලක් හෝ ආයතන මට්ටමින් ඔබට දීමට තිබූ මුදලක් විය හැක. ඒ කෙසේ හෝ වේවා ඒ තුළින් ඔබ නව ආයෝජන කටයුත්තකට අතගසනු ඇත. බොහෝ අයගේ ඇප උපකාර ඒ සඳහා ඔබට ලැබෙනු ඇත. උරහිස ආශ්‍රිත උවදුරු පෙන්වයි.

### මීන - සැනසිලිදායක සතියක්

මීන ලග්නයට අනුව මෙම සතිය ඔබ කේන්ද්‍රයේ චන්ද්‍රයා 01 - 02 - 03 - 04 යන ස්ථානවල ගමන් කිරීම ඉතා සැනසිලිදායක සතියක ආරම්භයකි. තම නිර්මාණශීලී හැකියාව හුවා දැක්වීමට අවස්ථාව උදාවේ. නිවසේ උත්සවශ්‍රීයක් පෙනෙන්නට තිබේ. ආර්ථික පසුබිම යහපත් වුවද වියදම් පැත්තෙන් ශීඝ්‍රතාවක් දක්නට පුළුවන. නිතර හිසට වද දෙන රෝගී තත්ත්වයක් මතුවිය හැක.

# ද්වාර වේධ දෝෂ හඳුනා ගැනීම



● විශ්‍රාමලත් විදුහල්පති ශාස්ත්‍රවේදී **චන්දිම ජයරත්න**



**නිවසකට ප්‍රධාන උළුවස්ස තැබීමේදී සැලකිය යුතු ප්‍රධාන දෝෂ රාශියක් පෙරදිග වාස්තු විද්‍යා ග්‍රන්ථවල දැක්වෙයි. වාස්තු විද්‍යාවට අනුකූලව දොරටු තබන නිවසින් ධන සම්පත් හිමිවන බලයක් ඇතිවේ. නිවෙස් වාසීන්ගේ ආයු බල සම්පත් හා නිරෝගී බව ඇති කරවයි. දියුණුවට කරනු ලබන කටයුතු සාර්ථක වෙයි. දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සපල වේ. යහපත් ගුණගරුක ගති පැවතුම් ඇතිවෙයි.**

නිවසට නිබඳව වාසනාව අභිවෘද්ධිය හිමිකර දෙයි.

මෙම දියුණුව අභිවෘද්ධිය ළඟාකර ගැනීමට ප්‍රධාන උළුවස්ස සහ සෙසු උළුවහු තැබිය යුතු නිවැරැදි පිළිවෙළ ගැන අප අවධානය යොමු කළ යුතුයි.

නිවසේ දිග පළල නිවැසියන්ගේ උපන් නැකත්වලට ගැළපෙන ආකාරයට සකස්කර ප්‍රධාන උළුවස්ස තැබිය යුතු දිසා හා ස්ථාන ගැන වාස්තු විද්‍යාවට අනුව දැඩි අවධානයක් යොමු කෙරේ. එහිදී ශුභඵල හිමිවන ආකාරයට ප්‍රධාන දොරවල් සහ සෙසු දොරවල් ස්ථානගත කරගත යුතුයි.


මෙම ලිපි මාලාවෙන් ඒ පිළිබඳව දීර්ඝ විස්තර වාස්තු විද්‍යාවට අනුව සඳහන් කරන්නෙමු.

අද අපගේ ලිපියෙන් ප්‍රධාන උළුවහුව නොහොත් උළුවස්ස ස්ථානගත කිරීමේදී සැලකිය යුතු ප්‍රධාන වේධ දෝෂ සඳහන් කරන්නෙමු.

ද්වාර වේධ දෝෂ යනුවෙන් අදහස් කරනු ලබන්නේ නිවසින් පිටවන ප්‍රධාන දොරටුවට යොමු නොවී තිබිය යුතු අශුභ පිහිටීම්ය. වාස්තු විද්‍යාවේ එවැනි දෝෂ 18 ක් ගැන දැඩි අවධානය යොමුකර එම දෝෂ, ඉවත්කර ගත යුතු බව සඳහන් කරයි.

**1. මාර්ග වේධ දෝෂය**

ප්‍රධාන දොරට ඉදිරියෙන් ප්‍රධාන දොර දෙසට මාර්ගයක් පිහිටා තිබීම මාර්ග වේධ දෝෂය යනුවෙන් හැඳින්වෙයි. මහා මාර්ගයක් හරි කෙළින් ප්‍රධාන දොර දෙසට පිහිටීම ද ප්‍රධාන දොරටුව ඉදිරිපිට දී මාර්ගයේ වංගුවක් ඇතිවීම ද මෙම දෝෂය ඇතිවීමට හේතු වෙයි.



**2. වෘක්ෂ වේධ දෝෂය**

නිවස ඉදිරිපිට ප්‍රධාන දොරට ඉදිරියෙන් ආසන්නයේ විශාල ලෙස හැදී වැඩී ඇති අඳුර ඇති කරන නුගගස්, බෝගස් හෝ එවැනි විශාල වෘක්ෂ නොතිබිය යුතුයි.

**3. කදම් වේධ දෝෂය**

ප්‍රධාන දොරට ඉදිරියෙන් මඩවළක් ජලය රැඳී ඇති අපවිත්‍ර ස්ථානයක් නොතිබිය යුතුයි.

**4. ජල - නිර්ගමන වේධ දෝෂය**

ප්‍රධාන දොර ඉදිරිපිට ජල මාර්ගයක් කෙළින් පැමිණ වංගුවක් ලෙස හැරී යාම ජල නිර්ගමන වේධ දෝෂය ලෙස හැඳින්වෙයි.

**5. කූප වේධ දෝෂය**

ප්‍රධාන දොර ඉදිරිපිට ළිඳක් පොකුණක් ජලය රැඳී ඇති ටැංකියක් පිහිටීම ඉතා අශුභ වෙයි.

**6. දේවතා වේධ දෝෂය**

ප්‍රධාන දොර ඉදිරිපිට දේවාලයක්, විහාර ගෙයක්, දේව රූප පිහිටීම ද අශුභවේ.

**7. ස්ථම්භ වේධ දෝෂය**

ප්‍රධාන දොරට ඉදිරියෙන් කුලුනක් ගල් කණුවක් පිහිටීම ස්ථම්භ වේධ දෝෂය නමින් හැඳින්වේ.

**8. සුසාන වේධ දෝෂය**

ප්‍රධාන දොරට ඉදිරියෙන් සොහොන් බිමක් සොහොන් කොතක් එක එල්ලේ පිහිටීම මෙයින් අදහස් කරයි. මෙම පිහිටීම ඉතා අශුභ ඵල ඇති කරවයි.

**9. කෝණ වේධ දෝෂය**

ප්‍රධාන දොරට ඉදිරියෙන් තුං මං සන්ධියක් සතරමං සන්ධියක් වෙනත් නිවසක මුල්ලක් වෙනත් ඉඩමක මුල්ලක් පිහිටීම අශුභ වෙයි.

**10. ද්වාර වේධ දෝෂය**

ප්‍රධාන දොරට කෙළින් වෙනත් නිවසක ගේට්ටුවක් හෝ දොරක් පිහිටීම අශුභ වෙයි.

**11. වර්චස්ථාන වේධ දෝෂය**

ප්‍රධාන දොරට කෙළින් වැසිකිළියක්, මල මූත්‍ර පහකරන ස්ථානයක් තිබීම අශුභවෙයි. කුණු කසළ වළවල් වැසිකිළි වලවල් තිබීම අශුභ වෙයි.

**12. චිරස්විත වේධ දෝෂ**

ප්‍රධාන දොරට ඉදිරියෙන් ගවගාලක් - කුකුල් කොටුවක් - බලු කූඩුවක් තිබීම ඉතා අශුභ වෙයි.

**13. රජක වේධ දෝෂය**

රෙදි අපුල්ලන ස්ථානයක් පිහිටීම මෙයින් අදහස් කෙරේ. ඉතා අශුභ පිහිටීමකි.

**14. කුම්භකාර වේධ දෝෂය**

ප්‍රධාන දොර උළු, ගඩොල්, වළං සාදන පෝරණුවක් තිබීම ශුභ නැත.

**15. ගණිකා වේධ දෝෂය**

ප්‍රධාන දොර ඉදිරිපිට ගණිකා මඩමක් තිබීම ඉතා අශුභ වෙයි.

**16. මෙලෙච්ඡ වේධ දෝෂය**

ප්‍රධාන දොර ඉදිරිපිට පහත් වැඩ කරන, හිඟමන් යදින, සොර සතුරු වැඩ කරන, පහත් වැඩ කරන අය පදිංචිය ඉතා අශුභ වෙයි.

**17. රාජ වේධ දෝෂය**

තමාට වඩා ඉතා උසස් රාජ්‍ය අමාත්‍යාදීන්ගේ නිවාස ඇත්නම් එය රාජ වේධ දෝෂය වෙයි. මෙය ද අශුභය.

**18. බ්‍රහ්ම වේධ දෝෂය**

ප්‍රධාන දොර නිවසේ දිගින් හෝ පළලින් හරි මැද දොර තැබීම ශුභ නැත. දුක් කරදර පීඩා ඇතිවෙයි. එය විහාර දේවාලවලට ශුභඵල දෙයි. මෙම දෝෂ මග හැර ගෙන වාස්තු විද්‍යානුකූලව නිවාස සැලසුම් සකස් කර ගත යුතු වේ.

ඒ වෙනුවෙන් වාස්තු විද්‍යාව දන්නා සැලසුම් ශිල්පියකුගේ සහාය ලබා ගැනීම වැදගත් වන අතර එසේ නොවන්නේ නම් වාස්තු විද්‍යාවේ අවශ්‍යතා සැලසුම් ශිල්පියා දැනුම්වත් කළ යුතුය.

එවිට සැලසුම් ශිල්පියා වාස්තු විද්‍යානුකූලව කිසිදු ගැටලුවක් ඇති නොවන ආකාරයට සැලසුම ඇඳ දීමට කටයුතු කරනු ඇත. විශේෂයෙන්ම නවීන තාක්ෂණය ඔස්සේ මේ දෝෂ මඟ හරවා ගැනීම බොහෝ පහසුය.

අනුව සැලසුම් ශිල්පියාට අවශ්‍යතාවය පැහැදිලි කළ විට ගැටලු මතු නොවේ.

එහෙත් අද බොහෝ විට අපට පෙනෙන්නේ නිවාසය තැනීමෙන් පසු එහි දෝෂ සොයමින් යන නිවැසියන් වැඩි පිරිසක් සිටිනා බවයි. එය තම ධනය කාලය මෙන් ශ්‍රමය අධිකව වැය කරන්නකි. එමෙන්ම නිවසේ පදිංචිව සිටිමින් එහි වෙනස්කම් කිරීම දැඩි අපහසුතා මතු කරයි. එම නිසා වඩාත්ම උචිත මෙන්ම කළ යුතුම ක්‍රමය වන්නේ පළමුව සැලසුම නිසි පරිදි සකස් කර ගැනීමයි.

ඉහත සඳහන් කළ ද්වාර වේධ දෝෂ දහ අට නිසා ගෘහ මූලිකයන්ට හා ගෘහයේ සෙසු අයට ඇතිවන දුර්විපාක ඊළඟ ලිපියෙන් ඉදිරිපත් කරන්නෙමු.

# ග්‍රහලොව රජු සුරතලියගේ නිවසට

● අජිත් ධර්මසිරි

**ග්‍රහලොව රජු ලෙසින් හඳුන්වන රවි ග්‍රහයා මසක් පුරා මේෂ රාශියේ සිට (2021 මැයි 14 වැනි දින රාත්‍රි 11.25ට පමණ) ග්‍රහලොව සුරතලිය වන සිකුරුගේ නිවහන වන වෘෂභයට සම්ප්‍රාප්ත වෙයි. බොහෝවිට රවි සතුරු වෙමින් පැමිණෙන මෙම ඉදිරි කාලය විශේෂයෙන් කාන්තා හිංසනයට අපයෝජනයට ළමා අපචාරවලට හේතුවීමට ඉඩ ඇත.**

මෙසේ රවි ග්‍රහයා සතුරුව - නීචව - රාශි ගතවූ විටෙක එකී භාවයේ අසුබ ගති ලක්ෂණ පහළ කළ අයුරු මීට පෙර අවස්ථා කීපයකදීම අපට අත් විඳින්නට වූ අහිතකර බලපෑම් එමටය.

ඒ අතර මේ රවිගේ වෘෂභ සම්ප්‍රාප්තිය රටේ කාමාතුර පිරිස් තුළ අශීලාචාර හැසිරීම් රටා ඇති කිරීමට ද තරුණ තරුණියන් අතර සමාජයේ එළිපිටම නොහොබිනා හැසිරීම් රටා මතු කරලීමට ද හේතුවිය හැක. අඹු සැමියන් අතර මත ගැටුම් - විවිධ අනියම් සබඳතා මතුවීම තුළ විවාහ ගැටලු යුගදිවි දෙදරායාම් ද පෙන්වන කාල සීමාවකි. තම ආත්ම ගරුත්වයට හානි වන බව දැන දැන සමාජයේ ගැහැනු පිරිමි අතර ඇති වන සබඳතා තුළ කාමය මුල් වනවා මිස දුර දිග බැලීමක් ද නැත. මේ වකවානුව අනියම් දරු උපත් හා ගබ්සාවීම් ගබ්සා කරවීම් බහුල වන අතර තම ආත්ම ගරුත්වය පිළිබඳ කිසිසේත්ම සලකන්නේ නැති පිරිස් වෙතින් සමාජයට විශාල අවැඩක් ද සිදු වනු පෙනේ.

තවත් විටෙක පැවතුණු ලෙඩ රෝග යළි හිස එසවීම රාජ්‍යතාන්ත්‍රික මට්ටමේ මත ගැටුම් ද උද්ගතවීමට මේ රවිගේ සතුරු භාවය ඉවහල් වනු ඇත. රජය කොතෙක් උත්සාහ ගත්තත් කොවිඩ් වසංගතය හමුවේ ජනතාවගේ හැසිරීම අශීලාචාර නොහික්මුණු බවින් යුතු වීම තවත් විෂ බීජ සමාජයට එක් කරන්නකි. උතුම් පැහැදිලි ශීලාචාර ඇවතුම් පැවතුම් කිලිටි කිරීමට රවි මීට පෙර අවදිවල ද සතුරු වූ අවස්ථා අපට අත්විඳින්නට හැකි විය.

එලෙස උදාවන මෙම කනගාටුදායක ග්‍රහ තත්ත්වය නිසා බොහෝ පිරිස් රජය විවේචනය කිරීමට යටි කුට්ටුවැඩ ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගන්නා නමුත් සෞඛ්‍ය අංශ ආරක්ෂක අංශවල පවතින ශක්තිය මත ඒ සැමදේ මැඩ පැවැත්වෙනු ඇත. මේ අයුරින් කොතෙක් බාධා කිරීම් එල්ල වුවද 2021 මැයි 26 වැනි දින උදේ 08.33ට බුධ ග්‍රහයා මිථුන රාශිගත වීමෙන් රටේ පැහැදිලි වාතාවරණයක් මතු කරමින් රජයේ වැඩපිළිවෙළ ඉතා සාර්ථක කරමින් බුද්ධිමතුන්ගේ ජයග්‍රහණය රටේ සෞභාග්‍යවත් ඉදිරියක් උදෙසා ඉවහල් වනු ඇත.

# බිළිඳු නමට අකුරු

● සමන්ති අහුබුදු

(මැයි මස 09 සිට මැයි 15 දක්වා)

**09 ඉරිදා**
17.28 තෙක් රේවතී නැකැත යි. සුදුසු අකුරු "දෙ, දො, ච, චි"

**10 සඳුදා**
09 ඉරිදා 17.28 සිට 10 සඳුදා 20.25 තෙක් අස්විද නැකැත යි. සුදුසු අකුරු "චු, චෙ, චො, ල"

**11 අඟහරුවාදා**
10 සඳුදා 20.25 සිට 11 අඟහරුවාදා 23.30 තෙක් බෙරණ නැකැත යි. සුදුසු අකුරු "ලි, ලු, ලෙ, ලො"

**12 බදාදා**
11 අඟහරුවාදා 23.30 සිට 12 බදාදා දිනය පුරා කැති නැකැත යි. සුදුසු අකුරු "අ, ඉ, උ, එ"

**13 බ්‍රහස්පතින්දා**
02.39 තෙක් කැති නැකැත යි. සුදුසු අකුරු "අ, ඉ, උ, එ"

**14 සිකුරාදා**
13 බ්‍රහස්පතින්දා 02.39 සිට 14 සිකුරාදා 05.44 තෙක් රෙහෙන නැකැත යි. සුදුසු අකුරු "ඔ, ව, වි, වු"

**15 සෙනසුරාදා**
14 සිකුරාදා 05.44 සිට 15 සෙනසුරාදා 08.38 තෙක් මුවසිරිස නැකැත යි. සුදුසු අකුරු "වෙ, වො, ක, කි" ඉන්පසු ඉරිදා 11.13 තෙක් අද නැකැත යි. සුදුසු අකුර "කු"

මෙහි වේලාව දක්වා ඇත්තේ පැය 24 ඔරලෝසුව අනුවයි.

වෂී 2021ක් වූ මැයි මස 09 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# සිළුමිණ The Silumina JOBS
## රැකියා අතිරේකය

**Airport & Aviation Services (Sri Lanka) (Private) Limited**

"Make Happy Journeys"

## කාර්මික ශිල්පී (වඩු කාර්මික) II වන ශ්‍රේණිය තනතුර

**මෙම සමාගමේ ඉහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

අපගේ **www.airport.lk>CORPORATE>CAREERS** වෙබ් අඩවියේ සඳහන් කාර්මික ශිල්පී (වඩු කාර්මික) II වන ශ්‍රේණිය තනතුර සඳහා සුදුසුකම් හා සේවා පළපුරුද්ද ඔබ ලබා තිබේ නම් එම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකසා සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් පහත සඳහන් ලිපිනයට අදාළ සියලුම සහතිකවල ඡායා පිටපත්ද සමග පහත ලිපිනයට 2021 මැයි මස 24 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු වේ.

අදාළ සහතික වල ඡායා පිටපත් හා ඉහත සඳහන් ආකාරයෙන් අයදුම්පත් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ,**
**කටුනායක.**

---

### කළමනා

නිමි ඇඳුම් ප්‍රදර්ශනාගාරයකට සේවක සේවිකාවන් අවශ්‍යයි.
(වයස 18 – 40 අතර)
වැටුප 25,000/– / 30,000/–
0777-600912

---

**අඹතලේ මාර්ග වැඩබිම සඳහා පහත වැඩ සඳහා උප කොන්ත්‍රාත්කරුවන් අවශ්‍යයි**

01. ඉන්ටර්ලොක් (Interlock) ගල් ඇතිරීම
02. කර්බ් (Kerb) ඇල්ලීම
03. මාර්ගයේ මැද (Center meadia) ඉන්ටර්ලොක් ගල් හා කර්බ් ඇල්ලීම

**විමසීම් :**
**ගයාන් - 0703331471**
**කසුන් - 0703331466**

---

**සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය**

බුදුසරණ

---

කොවිඩ් නිසා ඔබගේ රැකියාව අහිමි වුවාද...

ඔබගේ වෘත්තීය පැස්සුම් කරුවකුද...
එන්න අප හා එක්වන්න
**පැස්සුම්** ශිල්පයකු වන්න

අපට කතා කරන්න 0716 414 751 / 0716 802 033

---

ඔබ **පැස්සුම් (Arc)** ශිල්පය හැදෑරීමට කැමතිද ?

අපව අමතන්න ! පුහුණු කාලයේ වැටුප් සහ පුහුණුවෙන් පසු වැඩිවැටුප් සමග රැකියාව.

අමතන්න 0716 414 751 / 0716 802 033

---

**කොමර්ෂල් ඩිවලොප්මන්ට් සමාගම පී.එල්.සී**
(REG NO. PQ -114)

## රියදුරු ඇබෑර්තු

[illegible]

---

## හවුස් බෝයි

**සමාගම් සභාපතිවරයෙකු ගේ කොළඹ නිවසේ සේවය සඳහා හවුස්කීපිං පිළිබඳ පළපුරුදු හවුස් බෝයි කෙනෙකු අවශ්‍ය වී ඇත.**

විශේෂයෙන් බංගලාවක සේවය කොට ඇති පළපුරුදු අය පමණක් ඉල්ලුම් කරන්න.

**හොඳ වැටුප් සහ වෙනත් පහසුකම්**

සම්මුඛ පරීක්ෂණය සඳහා අමතන්න
**0716 352 122**

---

## රෝහල් ඇබෑර්තු

ගම්පහ ආරෝග්‍යා රෝහල් පුද්ගලික සමාගමේ ජ්‍යෙෂ්ඨ හෙද නිළධාරිනියන් (ශල්‍යාගාර, වාට්ටු) සඳහා පහත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- වසර 3ක හෙද පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම
- අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද
  - වැටුප රු. 45,000.00 සිට ඉහළට
  - වෛද්‍ය පහසුකම් හා දීමනා
  - නවාතැන් පහසුකම්

සඟතිකයන් රැගෙන සතියේ දිනවල උදේ 9-12 ත් අතර පැමිණෙන්න.

ආරෝග්‍යා රෝහල් පුද්ගලික සමාගම
නො. 250, කොළඹ පාර, ගම්පහ
දුක. 0332224592

---

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## උපකුලපති තනතුර

[illegible]

**ඩබ්ලිව්.එල්. විජේධාස ජයසේන,**
**ලේඛකාධිකාරී සහ ලේකම්, පාලක සභාව**
**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**නාවල**
**නුගේගොඩ**
2021 මැයි 9 වන දින


**University Web page : www.ou.ac.lk**

---

**BE BETTER INFORMED!** News you can trust now free on your mobile phone.

Dinamina | Daily News | Thinakaran

AVAILABLE AT
App Store | Google play | Windows Store




Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE

---

# සිළුමිණ The Silumina Tender/OTHER ADVERTISEMENTS
silumina.advt@lakehouse.lk 011 242 9351 - 071 782 9018

# ලංසු කැඳවීමයි

## වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය

## වැලිසර, රාගම වෙත වාණිජ පුපුරණ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම

01. දේශීය සහ විදේශීය සැපයුම්කරුවන් වෙතින් වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය (CEFAP Unit) වෙත පහත සඳහන් පුපුරණ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සඳහා ලංසු ආරාධනා පත්‍රයේ තුන්වන කොටසේ (Scetion III) සඳහන් සුදුසුකම් සපුරාලිය හැකි සැපයුම්කරුවන්ගෙන් පමණක් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

    **කොන්ත්‍රාත් අංක CEFAP/PRT/08/2021** – විදුලි ඩෙටොනේටර් (9 Mtr) අංක 500,000

02. ලංසු කැඳවීම ජාත්‍යන්තර තරගකාරී ලංසු කාර්යය පටිපාටියට අනුකූලව සිදුකරනු ලැබේ.

03. මේ සඳහා උනන්දුවක් දක්වන දේශීය හා විදේශීය සැපයුම්කරුවන් හට අවශ්‍ය වැඩිදුර තොරතුරු වැලිසර, රාගම පිහිටි වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකයේ මිලදී ගැනීමේ නිලධාරීන්ගෙන් **දුරකථන අංක** 0112958227 හෝ අධ්‍යක්ෂ වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතොරාම් මිලදී ගැනීමේ ඒකකය (දුරකථන අංක 0112955514) වෙතින් ලබාගත හැකි වේ.

04. එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වෙන වෙනම ලංසු ලේඛන මිලදී ගත යුතුය.

05. අධ්‍යක්ෂ, වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය, වැලිසර, රාගම වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ආපසු නොගෙවන **රු. 4,500.00 ක** ගාස්තුවක් මුදලින් ගෙවා **2021 මැයි මස 10 වන දින සිට 2021 ජූනි මස 21 දක්වා සතියේ වැඩකරන දිනයන්හිදී** 0900 පැයේ සිට 1600 **පැය දක්වා** ලංසු ලේඛන මිලදී ගත හැක. (විදේශීය සැපයුම්කරුවන් විසින් දේශීය නියෝජිතයෙකු මේ සඳහා පත්කළ යුතුය).

06. ලංසු විවෘත කරන දින සිට දින 150 ක කාලසීමාවක් සඳහා ලංසු වලංගුතාවය පැවතිය යුතු අතර, සියලු ලංසු සඳහා කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක් (Bid Bond) ඉදිරිපත් කළ යුතුය. අදාළ ලංසු සුරක්ෂණය ලංසු විවෘත කිරීමේ දින සිට දින 180 ක කාලසීමාවක් සඳහා වලංගු විය යුතුය. (එම ලබා ගන්නා ලද ලංසු සුරක්ෂණය දේශීය වාණිජ බැංකුවක් මගින් ලබා දීමට කටයුතු කළ යුතුය)

07. ඇණවුම්පත පිරිනැමීමත් සමග අදාළ සැපයුම්කරු විසින් බදු රහිත ලංසු වටිනාකමින් 10% වටිනාකමට සමාන කොන්දේසි විරහිත කාර්යය සාධන සුරක්ෂණයක් (**Performance Bond**) ලබාදිය යුතුය.

08. **2021 ජූනි මස 22 වන දින 1400 පැය** දක්වා කොළඹ 01, කොඩිගහ වීදියේ ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩල සභාපතිවරයා වෙත දෙපිටපතකින් යුතු මුද්‍රා තබන ලද ලංසු භාරදීම හෝ එම ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ නාවික හමුද මූලස්ථානයේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් බහාලුම වෙත බහාලීම සිදු කළ හැකි අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වන ලංසු නියෝජිතයින් ඉදිරිපිට දී ඒවා විවෘත කරනු ලැබේ.

09. මෙම ලංසු කැඳවීම පිළිබඳ වැඩිදුර විස්තර නාවික හමුද වෙබ් අඩවිය **www.navy.lk** මගින් ලබා ගත හැක.

**අධ්‍යක්ෂ,**
**වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ පතරොම් මිලදී ගැනීමේ ඒකකය,**
**රජයේ වෙඩිබෙහෙත් ගබඩාව,**
**වැලිසර, රාගම.**

# සිළුමිණ Tender/OTHER ADVERTISEMENTS

silumina.advt@lakehouse.lk 011 242 9351 - 071 782 9018

## 2021 වර්ෂයේ මිහින්තලා පුදබිම

### ආලෝකකරණය හා ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතිය සඳහා මිල ගණන් කැඳවීමයි

**ටෙන්ඩර් අංක : LPA/04/2021**

2021 ජුනි මස පැවැත්වෙන පොසොන් උත්සවය නිමිත්තෙන් ලේක්හවුස් ආයතනය මිහින්තලා පුදබිම අලෝකකරණය හා ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතිය සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

- ආලෝකකරණය ජුනි 15 සිට 25 දක්වා
- ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතිය ජුනි 15 සිට ජුනි 25 දක්වා ද සැපයිය යුතුවේ.

අදාළ පිරිවිතරයන් 2021 මැයි 10 දින සිට 2021 මැයි 17 දින දක්වා පෙ.ව. 9.00 ත් ප.ව.3.00 ත් අතර කාලසීමාව තුළ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

අදාළ මිල ගණන් බහා මුද්‍රා තබන ලද කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"2021 වර්ෂයේ මිහින්තලා ආලෝක පූජාව සහ ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා මිල ගණන්"** යනුවෙන් පැහැදිලිව සටහන් කර 2021 මැයි 18 වෙනි දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි, ප්‍රධානී ප්‍රසම්පාදන, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනය වෙත යොමු කළ යුතු අතර, එම කාලය ඉක්මගිය වහාම ලැබී ඇති මිල ගණන් විවෘත කරනු ලැබේ.

එම මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට අදාළ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමැතියලත් නියෝජිතයන්ට අවසර ලැබේ. කෙසේ වෙතත්, කිසිදු හෝ හේතු දැක්වීමකින් තොරව ලැබී ඇති මිල ගණන් හෝ ඉන් කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සතුය.

LAKE HOUSE

**ප්‍රධානී ප්‍රසම්පාදන,**
**ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,**
**අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.**
**විස්තර සඳහා : 2429422, 2429454, 2429451**

තරුණියන්ගේ
කාන්තාවන්ගේ
මවුවරුන්ගේ

හද බැඳි කාන්තා
පත්තරය
සෑම බදාදාවකම

තරුණී

THE ORIGINAL DCSL ESTD1913
DISTILLERIES COMPANY OF SRI LANKA PLC

## විකිණීමට

සමාගම සතු හොඳ තත්ත්වයෙන් නඩත්තු කරන ලද පහත දැක්වෙන වාහන විකිණීමට ඇත. (තනි පාවිච්චිය)

| වාහන අංකය | මාදිලිය |
|---|---|
| 48-2841 | ටොයොටා හයි ඒස් LH-113 Freezer Van |
| 68-8304 | ටොයොටා හයි ඒස් LH-102 Freezer Van |
| HL-1000 | නිසාන් සෙෆිරෝ වර්ෂය - 2000 |
| GO-7895 | ටොයොටා ලයිට් ඒස් CM51 Freezer ලොරි රථය |

කොළඹ - 10, නොරිස් කැනල් පාරේ, අංක 110 දරණ ඩිස්ටිලරීස් කොම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී යන ස්ථානයේදී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වා කාලය තුළ මෙම වාහන පරීක්ෂා කර බලා ලිඛිත මිල ගණන් ඉදිරිපත් කළ හැක.

**විමසීම් - රොෂාන්ත් පෙරේරා**
ප්‍රවාහන කළමනාකරු
දුරකථන: 2687801, 2695295-7, 5507000

## ලංසු සඳහා ආරාධනයයි

### ආරක්ෂක අමාත්‍යාංශය

### අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ පිහිටි 01 සහ 02 ඒකක සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතිය (ICTS) නිර්මාණය කොට, සපයා, ස්ථාපිත කිරීම සඳහා ලංසුව

**කොන්ත්‍රාත් අංක : DHQC/ICTS/01&02/2021**

1. ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහතින් විස්තර කොට ඇති පරිදි, බත්තරමුල්ල, පැලවත්ත, අකුරේගොඩ පාරේ, යෝජිත ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ 01 සහ 02 ඒකක සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතිය (ICTS) නිර්මාණය කොට, සපයා, ස්ථාපිත කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලංකා රුපියල් මිලියන 480 වේ.

   **The works consists of Supply, Installation, Configuration and Maintenance of all the works in Local Area Network Switches System (LANS), Network Operating Center (NOC), Closed Circuit Television IP Surveillance System (CCTV/IPSS) and Door Access Control System (DACS) of Block 01 & Block 02 of Defence Headquarters Complex at Akuregoda, Sri Lanka.**

2. අදාළ ඉදිකිරීම් කාලය දින 270 කි.
3. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයවනු ලැබේ.
4. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අපලේඛන ගතවූ අයකු නොවිය යුතුය. ලංසුකරු සතුව **විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ පද්ධති, ආරක්ෂක පද්ධති හා නළ සංගීත පද්ධති (ELV) උප විශේෂඥතාවය යටතේ විදුලිමය හා යාන්ත්‍රික සේවා (EM1) විශේෂඥතාවයේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ EM1** ශ්‍රේණිය සඳහා ලියාපදිංචිය තිබිය යුතුය.

05. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවශ්‍ය අනෙකුත් අවම සුදුසුකම් පහතින් දක්වා ඇත.

| | සුදුසුකම් | අවම සුදුසුකම් අවශ්‍යතා |
|---|---|---|
| (i) | පසුගිය වසර 10 තුළදී ඕනෑම වසර පහක් තුළ ඉටුකළ කාර්යයන්හි වාර්ෂික පිරිවැටුම් වටිනාකමේ සාමාන්‍යය (2010 සිට 2019 දක්වා) | වසරකට ශ්‍රී ලංකා රු. මිලියන 500 යි. (ලංසු සමග 2010/2011, 2011/2012, 2012/2013, 2013/2014, 2014/2015, 2015/2016, 2016/2017, 2017/2018, 2018/2019, 2019/2020 වර්ෂ සඳහා වන සහතික කරන ලද විගණනය කළ මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතුය.) |
| (ii) | පසුගිය වසර 10 තුළදී නිර්මාණය කොට, සපයා, ස්ථාපිත කිරීමේ පළපුරුද්ද (2010, 2011, 2012, 2013 හා 2014, 2015, 2016, 2017, 2018 හා 2019) | පසුගිය වසර 10 තුළ අවම වශයෙන් තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධති 03 ක් සාර්ථකව නිමාකර තිබිය යුතුය. එවන් එක් (01) පද්ධතියක වටිනාකම ලංකා රු. මිලියන 120 ට අඩු නොවිය යුතුය. තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධති සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් ප්‍රමාණය (වෙනත් කොන්ත්‍රාත්මය බැඳීම් සඳහා වෙන් කළ පසු) හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර | ශ්‍රී ලංකා රු. මිලියන 160 ට නොඅඩු විය යුතුය. සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, බත්තරමුල්ල, පැලවත්ත, අකුරේගොඩ පාරේ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ, අධ්‍යක්ෂ වෙතින් සහ විද්‍යුත් තැපැල pmudhqc@gmail.com මගින් වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර, **2021.05.10 දින සිට 2021.06.06 දින දක්වා 09.00 පැය සිට 15.00 පැය** දක්වා ඉහත ලිපිනයේදී ගාස්තු ගෙවීමකින් තොරව ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

07. ආපසු ගෙවනු නොලබන ලංකා **රු. 40,000.00 ක** (ශ්‍රී ලංකා රුපියල් හතලිස් දහසක්) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව **2021.05.10 දින සිට 2021.06.06 දින දක්වා 09.00 පැය පැය හා 15.00 පැය** අතර, කොළඹ 03, බාලදක්ෂ මාවතේ, අංක 15/5. ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද (1A වෙළුමේ I වන හා III වන වගන්ති හැර) සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරයක් මගින් කොළඹ 03, බාලදක්ෂ මාවතේ අංක 15/5 ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ (බිම් මහල) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ ප්‍රධාන ගණකාධිකාරී නමින් කළ යුතුය.

08. පූර්ව ලංසු රැස්වීමක් **2021.05.17 වෙනි දින 10.00** පැයේදී බත්තරමුල්ල, පැලවත්ත, අකුරේගොඩ පාරේ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ වැඩ බිමේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ දී පැවැත්වෙන අතර, එදිනම පූර්ව ලංසු රැස්වීමෙන් පසුව වැඩ බිම් සංචාරය පැවැත්වේ.

09. ලංසු, පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදීමෙන් හෝ පහත ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමෙන් **2021.06.07 දින 10.00 පැයට** පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ, නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

10. ලංසු **2021.10.03** දින දක්වා (අදාළ ලංසු භාර ගැනීමේ හා විවෘත කිරීමේ අවසන් දින සිට දින 119 ක් දක්වා) වලංගු විය යුතුය.

11. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් හතලිස් නව ලක්ෂයක (ශ්‍රී ලංකා රු. 4,900,000.00) වටිනාකමින් යුත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් ලබාගත්, ඒක්ෂණ හා කොන්දේසි විරහිත බැඳුම්කරයක් වශයෙන් වූ "ලංසු ඇපකරයක්" තිබිය යුතු අතර, එම ලංසු ඇපකරය, **2021.10.31** දින දක්වා (ලංසු අවසන් දින සිට දින 147) වලංගු විය යුතුය. අදාළ ලංසු ඇපකරයේ ප්‍රතිලාභියා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විය යුතුය.

12. ලංසුකරුවන් විසින් ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතියෙන් අදාළ ලංසු ලේඛන මිලදී ගැනීමට පෙර, (අදාළ වෙතොත්) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

13. ලංසුකරුවන් විසින්, ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට අපේක්ෂිත අයගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය / පාස්පෝට් අංකය අදාළ විවෘත කිරීමේ දිනයට අවම වශයෙන් රාජකාරී දින තුනකට (03) පෙර, ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**ඉහත 9 හි සඳහන් ලිපිනය නම්,**

**සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන මූල්‍ය නිලධාරී (I), ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය (බිම් මහල)**
**ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත,**
**කොළඹ 03, ශ්‍රී ලංකාව.**

**දුරකථනය - 0094-077-3766601**
**ෆැක්ස් - 0094-011-2390720**

## කාබනික පොහොර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය
(කෘෂිකර්ම අමාත්‍යාංශය)

### දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත සමාජ -ආර්ථික රටාවක් කරා යන ගමනේදී

සී/ස ලංකා පොහොර සමාගම, අතිගරු ජනාධිපතිතුමාගේ දැක්මට අනුගතවෙමින් දිවයින පුරා විසිරී සිටින සුදුසුකම් ලත් කාබනික පොහොර නිෂ්පාදකයින් මගින් උසස් ප්‍රමිතියෙන් යුත් කාබනික පොහොර නිෂ්පාදන මිළදී ගැනීම සඳහා සැපයුම් කරුවන් ලියාපදිංචි කරනු ලැබේ

මේ සඳහා ඔබ පහත සඳහන් සුදුසුකම් සපුරා ඇත්නම් සහ කාබනික පොහොර සැපයුම් කරුවෙකු ලෙස පූර්ණ රාජ්‍ය ආයතනයක් වන සී/ස ලංකා පොහොර සමාගම සමග එක්ව දිවයින පුරා කාබනික පොහොර බෙදාහැරීම් ජාලයේ සාමාජිකයෙකු වීමට කැමැත්තක් දක්වන්නේනම් පහතින් ඉල්ලුම් කර ඇති තොරතුරු 2021 ජුනි මස 30 දිනට පෙර අප වෙත යොමු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

### මූලික සුදුසුකම් සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන

1. ව්‍යාපාර ලියාපදිංචි සහතිකය
2. කාබනික පොහොර නිෂ්පාදකයෙකු ලෙස ජාතික පොහොර ලේකම් කාර්යාලයේ/ මාකඳුර කාබනික පොහොර නිෂ්පාදන හා පර්යේෂණ ආයතනයෙහි ලියාපදිංචි සහතිකය
3 වලංගු පරිසර බලපත්‍රය
4. එක් එක් නිෂ්පාදනයන් සඳහා ආසන්නතම මාස 3ක් ඇතුළතදී ප්‍රතීතන සහතික ලත් රසායනාගාරයක් මගින් ලබා ගත් රසායනාගාර වාර්තා

### අනෙකුත් ලේඛන

1. ආයතනික පැතිකඩ (Company profile)
2. වත්මන් නිෂ්පාදන වර්ග හා ධාරිතාවයන්
3. එක් එක් නිෂ්පාදනයන්හි ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය
4. නිෂ්පාදනාගාරය පවත්වාගෙන යන ලිපිනයන්
5. ඔබගේ නිෂ්පාදනයන් භාවිතා කළ හැකි භෝග වර්ග හා ඒ සඳහා නිර්දේශයන්

(රජය මගින් මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඉදිරියේදී ලබා දීමට බලාපොරොත්තු වන සියළු පහසුකම් අප සමාගම හරහා ලබාදීමට අපේක්ෂා කෙරේ)

ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "කාබනික සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම" ලෙස සඳහන් කර 21/06/30 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙහි සඳහන් ලිපිනයට යොමුකිරීමට හෝ ගෙනවිත් භාරදීමට කටයුතු කරන්න

වැ.බ ප්‍රසම්පාදන කළමණාකරු
ප්‍රසම්පාදන අංශය
**සී/ස ලංකා පොහොර සමාගම**
ලක්පොහොර ස්වර්ණජයන්ති මාවත, හුණුපිටිය, වත්තල.
දුරකථන : 011 2947762, 011 2930298 / 99 ෆැක්ස් : 011 2947760
ඊ-මේල් : lakpohora@sltnet.lk, mm@lakpohora.lk
www.lakpohora.lk lakpohora.lk

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

**ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ**

## අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනයයි (EOI)

**විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ නිෂ්පාදනාගාරයක් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම**

## TO SET UP AN ORTHOPEDIC AND NEUROSURGICAL IMPLANTS MANUFACTURING PLANT IN SRI LANKA

### 01. පසුබිම

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) යනු, විශේෂයෙන් දේශීය අවශ්‍යතා භාවිතය සඳහා රජය වෙත අත්‍යවශ්‍ය ඖෂධ නිෂ්පාදන නිපදවීම සඳහා 1957 කර්මාන්ත සංස්ථා පනත යටතේ, වර්ෂ 1987 දී ස්ථාපිත කරන ලද, ශ්‍රී ලංකාවේ විශාලතම රජය සතු ඖෂධ නිෂ්පාදකයා වේ. මෙම විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය බොහෝ කලක පටන් පැවැති අතර, SPMC ආයතනය විසින් එම කාර්යය, රටේ පවත්නා ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ මිලියන 20 කට වැඩි ජනතාවකගේ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා මෙම විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ ආනයනය කිරීම සඳහා සැහෙන විදේශ විනිමයක් අප රට විසින් වැය කරනු ලබයි.

### 02. අරමුණ

ඉහත කරුණ සලකා බලා SPMC ආයතනය විසින්, අදාළ විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ නිෂ්පාදනාගාරයක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම සඳහා සැළසුම් සකස් කරමින් සිටින අතර, සුදුසු EU / WHO / US GMP අනුකූලත්වය විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා, මනා ලෙස ස්ථාපිත වූ, ප්‍රසිද්ධ, උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් අභිලාෂය ප්‍රකාශ කිරීම් (EOI) තුළින් අදාළ තොරතුරු රැස්කිරීමේ නිරතව සිටී.

### 03. අවශ්‍යතාව

ඒ අනුව, උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් සමාන යන්ත්‍රාගාර ඉදිකිරීමේ පසුගිය පළපුරුද්ද පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කරනු ලබන අතර, උනන්දුවක් දක්වන පාර්ශවය විසින් EU / WHO / US GMP මාර්ගෝපදේශවලට අනුකූලව හා ඉහත කරුණුවලට මාර්ගගතව, SPMC ලෝටස් පාර්මා කලාපයේ යෝජිත ව්‍යාපෘතිය සඳහා යන්ත්‍රාගාර සැළසුම් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. නිෂ්පාදන සංවර්ධනය හා මූලික මෙහෙයුම්, උනන්දුවක් දක්වන පාර්ශවයේ ප්‍රවීණ උපදේශකයකු යටතේ මාර්ගෝපදේශ හා අධීක්ෂණය යටතේ සිදු කළ යුතු අතර, තාක්ෂණය සම්ප්‍රේෂණය එකඟවූ කාලයක් තුළ සිදුකළ යුතුය. එයට අමතරව, උනන්දුවක් දක්වන පාර්ශවය විසින්, යන්ත්‍රාගාරය සඳහා වන සැලැස්ම සකස් කළ යුතු අතර, පහත සඳහන් කරුණු ද ඇතුළත්ව සම්පූර්ණ කලාපය සඳහා සැළසුම් පිළියෙල කිරීම සම්බන්ධීකරණයට එකඟ විය යුතුය :- පෙති හා කරල් යන්ත්‍රාගාරය (මුඛ භාවිත ඝන මාත්‍රා / සාමාන්‍ය නිෂ්පාදන), විකලාංග චිකිත්සා රෝපණ හා ස්නායු ශල්‍යකර්ම රෝපණ නිෂ්පාදනාගාරයක්, පිළිකා ඖෂධ හා අශ්‍රිත උපයෝගීතා නිෂ්පාදනාගාරයක්, තන්තුක ස්ටෙන්ස් නිෂ්පාදනාගාරයක්, අන්තර් අක්ෂීය කාච නිෂ්පාදනාගාරයක්, පරිපාලන ප්‍රදේශයක්, මධ්‍යම ගබඩාව, ඖෂධ පර්යේෂණ මධ්‍යස්ථානය හා රසායනාගාරය, රුධිර මලු කැනියුලා, නික්ෂේපණ කට්ටල හා කැතීටර නිෂ්පාදනාගාරය, ශල්‍ය අත්වැසුම් නිෂ්පාදනාගාරයක්, බැහැර කළ හැකි සිරිංජ නිෂ්පාදනාගාරයක්, එතලීන් ඔක්සයිඩ් යන්ත්‍රාගාරයක්, වෛද්‍ය ඔක්සිජන් යන්ත්‍රාගාරයක්, සම්මන්ත්‍රණ හා අධ්‍යාපන මධ්‍යස්ථානය, නේවාසිකාගාර, අපද්‍රව්‍ය පවිත්‍රකරණ යන්ත්‍රාගාරයක් හා ජලාපවහන පද්ධතියක්, ජල පවිත්‍රකරණ හා ගබඩා සමග බෙදාහැරීමේ පද්ධතිය, (උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින්, ප්‍රධාන සිතියම් සංකල්පය ප්‍රකාරව ගූගල් සිතියම් ප්‍රතිබිම්බය හා භූමි ප්‍රදේශ සිතියම සමග අභ්‍යන්තර මාර්ග, ජලසම්පාදනය හා ජලාපවහන පද්ධතිය, ආදිය සඳහා පසුතල සැලැස්ම යාකළ යුතුය. SPMC ආයතනයේ වෙබ් අඩවිය වන www.spmclanka.lk හි සඳහන් යෝජිත SPMC ලෝටස් පාර්මා කලාපයේ යෝජිත ස්ථානයේ මිනුම් සැලැස්ම වෙත යොමු වන්න.

### 04. විස්තරාත්මක අභිලාෂය ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කිරීම

විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම්වලට අදාළව විස්තාරත්මක යෝජනා හා අදාළ තොතුරු, සභාපති, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, කඳවලවත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව යන ලිපිනයට යොමු කොට SPMC ආයතනය වෙත, මුද්‍රා තැබූ කවරයක බහා 2021 ජුනි 07 වන දින පෙරවරු 10.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ "**විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම**" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ප්‍රමාද වී ලැබෙන අභිලාෂය ප්‍රකාශ කිරීම් සළකා බලනු නොලැබේ. ඊමේල් මගින් යොමු කිරීම් ද භාරගනු නොලැබේ)

### 05. ඉදිරිපත් කළ යුතු විස්තර

#### 5.1 පොදු තොරතුරු

i) සමාගමේ විස්තරයක්

ii) සාමාන පහසුකම් සංවර්ධනය කිරීමේ හැකියාව (විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ) නිෂ්පාදන ක්ෂේත්‍රයේ පළපුරුද්ද සමග වෙනත් රටවල විකලාංග හා ස්නායු ශල්‍ය රෝපණ නිෂ්පාදනාගාර ස්ථාපිත කිරීමේ පළපුරුද්ද සඳහන් කළ යුතුය. (මෙය උනන්දුවක් දක්වන පාර්ශවයේ පදිංචි රටට අමතරව වේ).

iii) තාක්‍ෂණ සුදුසුකම් ඇතුළත්ව කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරයක් (අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සහිත ප්‍රධාන කළමනාකරණ පිරිස් ද ඇතුළත්ව)

iv) සිටිනුයේ නම්, ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිත පිළිබඳ විස්තරයක්.

#### 5.2 මූල්‍ය තොරතුරු

i) විගණනය කළ මූල්‍ය වාර්තා සමග අඛණ්ඩ ව්‍යාපාරික වසර පහක සමස්ත ව්‍යාපාර පිරිවැටුම් ප්‍රකාශ

ii) පසුගිය වසර තුන සඳහා ඉතිරිව තිබෙන හා අවිනිශ්චිත බැඳීම් පිළිබඳ ප්‍රකාශ.

#### 5.3 තාක්ෂණ තොරතුරු

i) උපයෝගිතා (නිර්මාණ 3 D මොඩලයේ පසුතලයක්) ඇතුළත්ව සම්පූර්ණ පහසුකම් පිළිබඳ යෝජිත ඇඳීම් පසුතලයක් (සාමාන්‍ය සැකසුම)

ii) පරීක්ෂණ නිෂ්පාදනාවලියක් හා වාණිජ නිෂ්පාදනයක් දක්වා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැදගත් අවස්ථාවක්.

iii) යන්ත්‍රාගාරය අනුකලනය කිරීම සඳහා ගොඩනැගිලි කළමනාකරණ පද්ධතියක් ; උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් අදාළ වෙනස්වීම් සපුරාලීම සඳහා යම් මෘදුකාංගයක් නිතර යාවත්කාලීන කිරීම සිදුකළ යුතුය.

iv) නිෂ්පාදන උපකරණ පිළිබඳව විස්තරාත්මක ලැයිස්තුවක් (යන්ත්‍රාගාර සාධක හා කාර්යක්ෂමතාවය, නිෂ්පාදිත රට, වර්ගය හා මාදිලිය, වගකීම් කාලය) රසායනාගාර උපකරණ හා මෙවලම්, උපයෝගිතා උපකරණ සමග යෝජිත වර්ගය, ධාරිතාවය හා සංඛ්‍යාව පිළිබඳ අවශ්‍යතා.

v) යෝජනා කරනු ලබන ඇසුරුම් ද්‍රව්‍යවල විස්තරයක් සහ එම තෝරාගැනීමට හේතු.

vi) නිෂ්පාදන ප්‍රවාහ සැලැස්ම සටහන සමග ධාරිතා තුලනය පිළිබඳ විස්තරයක්.

vii) උපකරණ, පද්ධති හා පටිපාටින් සඳහා අවශ්‍ය සුදුසුකම් හා වලංගුකරණය හා එයට අවශ්‍ය කාලය.

viii) NMRA (ජාතික ඖෂධ නියාමන අධිකාරිය) ආයතනය විසින් අපේක්ෂා කරනු ලබන ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) හා EU GMP මාර්ගෝපදේශ ප්‍රකාරව යෝජනා කරනු ලබන තත්ත්ව පද්ධති සමග අවශ්‍ය ලේඛන.

ix) අදාළ නිෂ්පාදන පහසුකම් ස්ථානය, EU GMP, WHO GMP අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

x) දැනට මෙරට පවත්නා පාරිසරික බලපෑම් තක්සේරු රෙගුලාසි හා අනෙකුත් ව්‍යවස්ථාපිත අනුකූලතාවයන්හට අනුකූල විය යුතුය.

xi) අවසන් නිෂ්පාදනය ජාත්‍යන්තර ප්‍රමිතිවලට පිළිගත හැකි පරිදි අනුගත විය යුතුය.

xii) පහත සඳහන් අයිතම පිළිබඳව විස්තර කරන්න :

- ජල පවිත්‍රාගාරය ඇතුළුව ජල සැපයුම (SPMC ආයතනය විසින් අදාළ ඉඩම ලබාදේ)
- ගොඩනැගිලි
- නිෂ්පාදන උපකරණ, ජීවානුහරණය හා ඇසිරීම
- තත්ත්ව සහතික, තත්ත්ව පාලන උපකරණ
- උපයෝගිතා උපකරණ
- ගබඩා පහසුකම් හා අවශ්‍ය උපකරණ
- ආරක්ෂක උපකරණ හා පහසුකම්
- විදුලි පහන් ඇතුළත්ව විදුලිමය උපකරණ
- අදාළ වර්ගවල හා දිග ප්‍රමාණවල නළ
- පිරිසිදු කාමර අවශ්‍යතා
- යාන්ත්‍රික, HVAC, විදුලිමය හා ජලනළ නිර්මාණ
- කාර්යාල උපකරණ හා අනෙකුත් උපකාරක උපකරණ
- ආපනශාලා පහසුකම්
- ලොන්ඩ්‍රි සේවා (සාමාන්‍ය රෙදි හා පිරිසිදු කාමර රෙදි)
- අපද්‍රව්‍ය පවිත්‍රකරණ යන්ත්‍රාගාරය
- ජල ගබඩා පහසුකම්
- හරිත ගොඩනැගිලි තාක්ෂණය ස්ථාපිත කිරීම හා අදාළ සහතිකකරණය

**06.** අදාළ අභිලාෂය ප්‍රකාශ කිරීම්, මෙම දැන්වීමේ සඳහන් සෑම අයිතමයක සඳහන් විස්තර ආවරණය කළ යුතුවේ.

**07.** අභිලාෂය ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත පාර්ශවකරුවන් තමනට අවශය පැහැදිලි කරගැනීම්, පහත සඳහන් අය වෙතින් 2021 මැයි 31 දිනට පෙර ලබාගත යුතුය.

**දුරකථන අංක : +94 11 2637574 / +94 11 2635353**
**ෆැක්ස් : +94 11 2634771**
**ඊමේල් : chairman@spmclanka.lk**

**වෛද්‍ය උත්පල ඉන්දුවංශ**
**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව.**

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

**ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ**

## අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනයයි (EOI)

**පිළිකාමය ඖෂධ නිෂ්පාදනාගාරයක් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම**

## TO SET UP AN ONCOLOGY DRUGS MANUFACTURING PLANT IN SRI LANKA

### 01. පසුබිම

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) යනු, විශේෂයෙන් දේශීය අවශ්‍යතා භාවිතය සඳහා රජය වෙත අත්‍යවශ්‍ය ඖෂධ නිෂ්පාදන නිපදවීම සඳහා 1957 කර්මාන්ත සංස්ථා පනත යටතේ, වර්ෂ 1987 දී ස්ථාපිත කරන ලද, ශ්‍රී ලංකාවේ විශාලතම රජය සතු ඖෂධ නිෂ්පාදකයා වේ. මෙම පිළිකාමය ඖෂධ නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය බොහෝ කලක පටන් පැවැති අතර, SPMC ආයතනය විසින් එම කාර්යය, රටේ පවත්නා ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ මිලියන 20 කට වැඩි ජනතාවගේ සෞඛ්‍යාරක්‍ෂණ අවශ්‍යතා සඳහා මෙම පිළිකාමය ඖෂධ ආනයනය කිරීම සඳහා සැහෙන විදේශ විනිමයක් අප රට විසින් වැය කරනු ලබයි.

### 02. අරමුණු

ඉහත කරුණු සලකා බලා SPMC ආයතනය විසින්, අදාළ පිළිකාමය ඖෂධ නිෂ්පාදන යන්ත්‍රාගාරයක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම සඳහා සැළසුම් සකස් කරමින් සිටින අතර, සුදුසු EU / WHO / US GMP අනුකූලත්ව පිළිකාමය ඖෂධ නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා, මනා ලෙස ස්ථාපිත වූ, ප්‍රසිද්ධ, උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් අභිලාෂය ප්‍රකාශ කිරීම් (EOI) තුළින් අදාළ තොරතුරු රැස්කිරීමේ නිරතව සිටී.

### 03. අවශ්‍යතාව

ඒ අනුව, උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් සමාන යන්ත්‍රාගාර ඉදිකිරීමේ පසුගිය පළපුරුද්ද පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කරනු ලබන අතර, උනන්දුවක් දක්වන පාර්ශවය විසින් EU / WHO / US GMP මාර්ගෝපදේශවලට අනුකූලව හා ඉහත කරුණුවලට මාර්ගගතව, SPMC ලෝටස් පාර්මා කලාපයේ යෝජිත ව්‍යාපෘතිය සඳහා යන්ත්‍රාගාර සැළසුම් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. නිෂ්පාදන සංවර්ධනය හා මූලික මෙහෙයුම්, උනන්දුවක් දක්වන පාර්ශවයේ ප්‍රවීණ උපදේශකයකු යටතේ මාර්ගෝපදේශ හා අධීක්ෂණය යටතේ සිදු කළ යුතු අතර, තාක්ෂණය සම්ප්‍රේෂණය එකඟවූ කාලයක් තුළ සිදුකළ යුතුය. එයට අමතරව, උනන්දුවක් දක්වන පාර්ශවය විසින්, යන්ත්‍රාගාරය සඳහා වන සැකැස්ම සකස් කළ යුතු අතර, පහත සඳහන් කරුණුද ඇතුළත්ව සම්පූර්ණ කලාපය සඳහා සැළසුම් පිළියෙල කිරීම සම්බන්ධීකරණයට එකඟ විය යුතුය :- පෙති හා කරල් යන්ත්‍රාගාරය (මුඛ භාවිත ඝන මාත්‍රා / සාමාන්‍ය නිෂ්පාදන), විකලාංග චිකිත්සා හා ස්නායු ශල්‍යකර්ම බද්ධ නිෂ්පාදනාගාරයක්, පිළිකා ඖෂධ හා ආශ්‍රිත උපයෝගිතා නිෂ්පාදනාගාරයක්, කන්තුක ස්ටෙන්ස් නිෂ්පාදනාගාරයක්, අන්තර් අක්ෂීය කාච නිෂ්පාදනාගාරයක්, පරිපාලන ප්‍රදේශයක්, මධ්‍යම ගබඩාව, ඖෂධ පර්යේෂණ මධ්‍යස්ථානය හා රසායනාගාරය, රුධිර මලු කැනියුලා, නික්ෂේපණ කට්ටල හා කැතීටර නිෂ්පාදනාගාරය, ශල්‍ය අත්වැසුම් නිෂ්පාදනාගාරයක්, බැහැර කළ හැකි සිරිංජ නිෂ්පාදනාගාරයක්, එතිලීන් ඔක්සයිඩ් යන්ත්‍රාගාරයක්, වෛද්‍ය ඔක්සිජන් යන්ත්‍රාගාරයක්, සම්මන්ත්‍රණ හා අධ්‍යාපන මධ්‍යස්ථානය, නේවාසිකාගාර, අපද්‍රව්‍ය පවිත්‍රකරණ යන්ත්‍රාගාරයක් හා ජලාපවහන පද්ධතියක්, ජල පවිත්‍රකරණ හා ගබඩා සමග බෙදාහැරීමේ පද්ධතිය, (උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින්, ප්‍රධාන සිතියම් සංකල්පය ප්‍රකාරව ගූගල් සිතියම් ප්‍රතිබිම්බය හා භූමි ප්‍රදේශ සිතියම සමග අභ්‍යන්තර මාර්ග, ජලසම්පාදනය හා ජලාපවහන පද්ධතිය, ආදිය සඳහා පසුතල සැලැස්ම යාකළ යුතුය.) SPMC ආයතනයේ වෙබ් අඩවිය වන www.spmclanka.lk හි සඳහන් යෝජිත SPMC ලෝටස් පාර්මා කලාපයේ යෝජිත ස්ථානය වෙත යොමු වන්න.

### 04. විස්තරාත්මක අභිලාෂය ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කිරීම

පිළිකාමය ඖෂධ නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම්වලට අදාළව විස්තරාත්මක යෝජනා හා අදාළ තොරතුරු, සභාපති, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, කඳවලවත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව යන ලිපිනයට යොමු කොට SPMC ආයතනය වෙත, මුද්‍රා තැබූ කවරයක බහා 2021 ජුනි 07 වන දින පෙරවරු 10.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ "**පිළිකාමය ඖෂධ නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම**" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ප්‍රමාද වී ලැබෙන අභිලාෂය ප්‍රකාශ කිරීම් සළකා බලනු නොලැබේ. ඊමේල් මගින් යොමු කිරීම්ද භාරගනු නොලැබේ)

### 05. ඉදිරිපත් කළ යුතු විස්තර

#### 5.1 පොදු තොරතුරු

i) සමාගමේ විස්තරයක්

ii) සමාන පහසුකම් සංවර්ධනය කිරීමේ හැකියාව පිළිකාමය ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ පළපුරුද්ද සමග වෙනත් රටවල පිළිකාමය ඖෂධ නිෂ්පාදනාගාර ස්ථාපිත කිරීමේ පළපුරුද්ද සඳහන් කළ යුතුය. (මෙය උනන්දුවක් දක්වන පාර්ශවයේ පදිංචි රටට අමතරව වේ)

iii) තාක්‍ෂණ සුදුසුකම් ඇතුළත්ව කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරයක් (අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සහිත ප්‍රධාන කළමනාකරණ පිරිස් ද ඇතුළත්ව)

iv) සිටිනුයේ නම්, ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිත පිළිබඳ විස්තරයක්.

#### 5.2 මූල්‍ය තොරතුරු

i) විගණනය කළ මූල්‍ය වාර්තා සමග අඛණ්ඩ ව්‍යාපාරික වසර පහක සමස්ත ව්‍යාපාර පිරිවැටුම් ප්‍රකාශ

ii) පසුගිය වසර තුන සඳහා ඉතිරිව තිබෙන හා අවිනිශ්චිත බැඳීම් පිළිබඳ ප්‍රකාශ.

#### 5.3 තාක්ෂණ තොරතුරු

i) උපයෝගිතා (නිර්මාණ 3 D මොඩලයේ පසුතලයක්) ඇතුළත්ව සම්පූර්ණ පහසුකම් පිළිබඳ යෝජිත ඇඳීම් පසුතලයක්

ii) පරීක්ෂණ නිෂ්පාදනාවලියක් හා වාණිජ නිෂ්පාදනයක් දක්වා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැදගත් අවස්ථාවලියක්. (පොදු කාර්ය සැලැස්මක්)

iii) යන්ත්‍රාගාරය අනුකලනය කිරීම සඳහා ගොඩනැගිලි කළමනාකරණ පද්ධතියක්, උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් අදාළ වෙනස්වීම් සපුරාලීම සඳහා යම් මෘදුකාංගයක් නිතර යාවත්කාලීන කිරීම සිදුකළ යුතුය.

iv) නිෂ්පාදන උපකරණ පිළිබඳව විස්තරාත්මක ලැයිස්තුවක් (යන්ත්‍රාගාර සාධක හා කාර්යක්ෂමතාවය, නිෂ්පාදිත රට, වර්ගය හා මාදිලිය, වගකීම් කාලය) රසායනාගාර උපකරණ හා මෙවලම්, උපයෝගිතා උපකරණ සමග යෝජිත වර්ගය, ධාරිතාවය හා සංඛ්‍යාව පිළිබඳ අවශ්‍යතා.

v) යෝජනා කරනු ලබන ඇසුරුම් ද්‍රව්‍යවල විස්තරයක් සහ එම තෝරාගැනීමට හේතු.

vi) නිෂ්පාදන ප්‍රවාහ සැලැස්ම සටහන සමග ධාරිතා තුලනය පිළිබඳ විස්තරයක්.

vii) උපකරණ, පද්ධති හා පටිපාටින් සඳහා අවශ්‍ය සුදුසුකම් හා වලංගුකරණය හා එයට අවශ්‍ය කාලය.

viii) NMRA (ජාතික ඖෂධ නියාමන අධිකාරිය) ආයතනය විසින් අපේක්ෂා කරනු ලබන ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) හා EU GMP මාර්ගෝපදේශ ප්‍රකාරව යෝජනා කරනු ලබන තත්ත්ව පද්ධති සමග අවශ්‍ය ලේඛන.

ix) අදාළ නිෂ්පාදන පහසුකම් ස්ථානය, EU GMP, WHO GMP අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

x) දැනට මෙරට පවත්නා පාරිසරික බලපෑම් තක්සේරු රෙගුලාසි හා අනෙකුත් ව්‍යවස්ථාපිත අනුකූලතාවයන්හට අනුකූල විය යුතුය.

xi) අවසන් නිෂ්පාදනය ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට පිළිගත හැකි පරිදි අනුගත විය යුතුය.

xii) පහත සඳහන් අයිතම පිළිබඳව විස්තර කරන්න :

- ජල පවිත්‍රාගාරය ඇතුළුව ජල සැපයුම (SPMC ආයතනය විසින් අදාළ ඉඩම ලබාදේ)
- ගොඩනැගිලි
- නිෂ්පාදන උපකරණ, ජීවානුහරණය හා ඇසිරීම
- තත්ත්ව සහතික, තත්ත්ව පාලන උපකරණ
- උපයෝගිතා උපකරණ
- ගබඩා පහසුකම් හා අවශ්‍ය උපකරණ
- ආරක්ෂක උපකරණ හා පහසුකම්
- විදුලි පහන් ඇතුළත්ව විදුලිමය උපකරණ
- අදාළ වර්ගවල හා දිග ප්‍රමාණවල නළ
- පිරිසිදු කාමර අවශ්‍යතා
- යාන්ත්‍රික, HVAC, විදුලිමය හා ජලනළ නිර්මාණ
- කාර්යාල උපකරණ හා අනෙකුත් උපකාරක උපකරණ
- ආපනශාලා පහසුකම්
- ලොන්ඩ්‍රි සේවා (සාමාන්‍ය රෙදි හා පිරිසිදු කාමර රෙදි)
- අපද්‍රව්‍ය පවිත්‍රකරණ යන්ත්‍රාගාරය
- ජල ගබඩා පහසුකම්
- හරිත ගොඩනැගිලි තාක්ෂණය ස්ථාපිත කිරීම හා අදාළ සහතිකකරණය

**06.** අදාළ අභිලාෂය ප්‍රකාශ කිරීම්, මෙම දැන්වීමේ සඳහන් සෑම අයිතමයක් සඳහන් විස්තර ආවරණය කළ යුතුවේ.

**07.** අභිලාෂය ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත පාර්ශවකරුවන් තමනට අවශ්‍ය පැහැදිලි කරගැනීම්, පහත සඳහන් අය වෙතින් 2021 මැයි 31 දිනට පෙර ලබාගත යුතුය.

**දුරකථන අංක : +94 11 2637574 / +94 11 2635353**
**ෆැක්ස් : +94 11 2634771**
**ඊමේල් : chairman@spmclanka.lk**

**වෛද්‍ය උත්පල ඉන්දුවංශ**
**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව.**



# ප්‍රතිශක්තිය වඩන හෙළ වෙදකමෙන් කොරෝනාවට පිළිසරණක්

● රසික කොටුදුරගේ

**නව කොරෝනා වයිරස ප්‍රභේදය පාලනය කිරීමට නම් ප්‍රතිශක්තිය පිටතින් නොව ශරීරයෙන් ම වර්ධනය කිරීම අවශ්‍ය බව පෙනී ගොස් තිබේ. මේ සඳහා පාරම්පරික හෙළ වෙදකම දක්වන සමත්කම පිළිබඳව රජයේ මෙන්ම වෛද්‍ය ක්ෂේත්‍රයේ ද අවධානය යොමුව තිබේ. මේ ඒ සම්බන්ධයෙන් දේශපාලන බල අධිකාරය සහ වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් දැක් වූ අදහස්වල සම්පිණ්ඩනයකි.**

මේ වනවිට කොරෝනා රෝගීන් හුවමාරු මධ්‍යස්ථාන වශයෙන් අයුර්වේද රෝහල් පවත්වා ගෙන යනු ලබන අතර, ඒවා ප්‍රතිකාර මධ්‍යස්ථාන වශයෙන් පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව දැනුම්වත් කර ඇති බව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි පවසයි. එසේම දේශීය ආයුර්වේදයේ අනුමත ඖෂධ පමණක් එකී ප්‍රතිකාර සඳහා යොදා ගැනීමට අවසර ලබා දෙන ලෙස අදාළ බලධාරීන්ගෙන් ඉල්ලීමක් ද කර ඇත.

මෙරට ආයුර්වේද රෝහල් 120 පවතින අතර, ඒ අතර පර්යේෂණ රෝහල් 4ක්ද, දිස්ත්‍රික් රෝහල් 7ක්ද, ප්‍රාදේශීය වශයෙන් ස්ථාපිත රෝහල් 104 ද ඇත. ඒවා තුළ ඇඳන් 5027 පමණ ඇති අතර, 1000 වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් හා 5000ට ආසන්න සේවක පිරිසක් සේවය කරති. දීර්ඝ කාලයක් තිස්සේ මේ රෝහල් පද්ධතිය ජාතික සෞඛ්‍ය සේවයට මනා දායකත්වයක් සපයා ඇති අතර, පළපුරුදු සේවක පිරිසකින් යුත්තය. එනිසා මෙම අරෝග්‍ය ශාලා හුදෙක් රෝගීන් රැකබලා ගන්නා සෙන්ටර් බවට පත් කිරීමෙන් පමණක් තමන් සෑහිමකට පත් නොවන බවත්, ඒවා දේශීය වෛද්‍ය ප්‍රතිකාර ලබාගත හැකි මධ්‍යස්ථාන බවට පත් කිරීමට උපරිමයෙන් ක්‍රියා කරමින් සිටින බව ද අමාත්‍යවරයා සඳහන් කළේය. ආරම්භයක් ලෙස මේ වනවිටත් බොරැල්ල හා පල්ලෙකැලේ පිහිටි ආයුර්වේද රෝහල්වල ප්‍රතිකාර ගන්නා කොරෝනා රෝගීන් සඳහා ආයුර්වේද හා පාරම්පරික ඖෂධ වර්ග ලබා දීම සඳහා අවසර ලබා දෙන්නැයි ඉල්ලා ඇති බව ද හෙතෙම පැවසීය.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණියගේ අදහස අනුව, බටහිර වෛද්‍ය ක්‍රමය මඟින් මේ සඳහා ප්‍රතිකාර කළ හැකි ක්‍රම කිහිපයකි. ඉන් එකක් වන්නේ ප්‍රතිශක්තිය දියුණු කර තැබීමය. දෙවන කාරණය වන්නේ වයිරස් රෝගයට මුහුණදිය හැකි කලින් සොයාගත් වැක්සින එන්නත් භාවිතය යි. එමගින් රෝගය ශරීරගත වීමට ප්‍රථම ප්‍රතිදේහ දියුණු කර තැබිය හැකිය. තෙවන ක්‍රමය වන්නේ මේ වයිරසයට මුහුණ දිය හැකි ප්‍රතිජීවක ඖෂධ ලබාදීම ය. එහෙත් මේ ප්‍රතිජීවක ලබාදිය හැක්කේ වයිරස් වර්ග කිහිපයකට පමණි. බොහෝ වයිරස් රෝග සඳහා ප්‍රතිජීවක ඖෂධ නිෂ්පාදනය වී නැති අතර, මේ සඳහා මුහුණ දීමට ඇත්තේ පළමු ක්‍රමවේද දෙක පමණි. නමුත් ශරීරයේ ප්‍රතිශක්තිය වර්ධනය කිරීම සඳහා නොයෙකුත් දේශීය ඖෂධ වර්ග රාශියක් අප සතුව පැවතිණි.

ඉතිහාසය අධ්‍යයනය කර බලන විට ශ්‍රී ලංකිකයනට බෝවන සහ බෝ නොවන රෝග නොතිබුණු තරම්ය. ඊට අප රට තුළ පැවති ඖෂධ වෙදකම, නිල වෙදකම, රස වෙදකම, චිකිත්සා ක්‍රම මෙන්ම ජානමය ශක්තිය හා ආහර සංස්කෘතිය බලපා ඇති බව සිතිය හැකිය. ආයුර්වේදය වෛද්‍ය ක්‍රමය පසුකාලීනව ඉන්දියාවෙන් පැමිණියද ඊට ප්‍රථම පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම අපරට තුළ පැවතිණි.

බටහිර වෛද්‍ය ක්‍රමය තුළ මීට මුහුණ දීම සඳහා එතරම් ලොකු දෙයක් කිරීමට නැත. වාෂ්ප ඇල්ලීම, විටමින් සී පෙත්තක් ලබාදීම හා අව්වේ සිටීමට උපදෙස් ලබා දීම ඉන් සිදු වේ. කෝවිඩ් වයිරසය අප රටට පැමිණි මුල් අවස්ථාවේදී වෛද්‍ය පාදෙණිය දේශීය වෛද්‍ය ක්‍රමය අනුව යමින් වාෂ්ප ඇල්ලීම පිළිබඳව ප්‍රකාශ කළ විට බටහිර වෙදකම අනුදත් වෛද්‍යවරු අතර ලොකු හාහුවක් ඇති විය. පසුව එය බ්‍රිතාන්‍ය නිල වෙබ් අඩවි මඟින් ප්‍රචාරයට පත්වන විට ඔවුන් නිරුත්තර විය. ඔවුන් නිකම්ම ජල වාෂ්ප අල්ලන විට අප සතුව ඖෂධීය වාෂ්ප ඇල්ලීමක් පැවතිණි. බටහිර වෛද්‍ය ක්‍රමය ඉගෙන ගත් වෛද්‍යවරුන් වුව ප්‍රතිකාර කිරීමේ අරමුණ විය යුත්තේ ප්‍රතිකාර කරන රෝගියා කෙසේ හෝ සුවපත් කිරීමය. එලෙස රෝගියා සුවපත් කිරීම සඳහා ක්‍රමවේදයක් දේශීය වශයෙන් හඳුන්වා දිය හැකිනම් එය අපට ලෝකය පුරා මේ රෝගය නිසා අවධානමට ලක්වී සිටින ජනතාව වෙනුවෙන් ලබාදිය හැකිය. එය විධිමත් අධ්‍යයනයකින් සහ තාක්ෂණිකව ඔප්පු කර පෙන්විය හැකි ක්‍රමවේදයක් ද විය යුතුය.

අලුත් ඖෂධයක් සමාජගත වනවිට ඊට විවිධ ප්‍රතිචාර හිමි වේ. විශේෂයෙන්ම දේශීය දේ සම්බන්ධයෙන් ඇතැමුන් තුළ ඇත්තේ අඩු තක්සේරුවකි. එසේ වුවත් අදාළ පාර්ශ්ව සමඟ තවදුරුටත් සාකච්ඡා කර එකඟතාවකට පැමිණිය හැකි නම් එය රෝගය පැතිරීම වැළැක්වීමට මෙන්ම රෝගය සුව කරගැනීමට මනා පිටිවහලක් වනු ඇත. මේ සඳහා බටහිර, පාරම්පරික හා ආයුර්වේද යන වෛද්‍ය ක්ෂේත්‍ර තුනම එක්ව එකඟතාවකට පැමිණ කටයුතු කිරිම වැදගත්ය. එමගින් මෙම රෝගී තත්ත්වය පාලනය කිරීමට කටයුතු කිරීම වඩා පහසුවන බව වෛද්‍ය පාදෙණියගේ අදහසය.

අද ලොව පුරා ඖෂධ මාෆියාවක් පවතී. එනිසා මේ වයිරසය සඳහා ප්‍රතිකාර සෙවීමේදී බොහෝ දෙනා කටයුතු කරන්නේ වාණිජ පරමාර්ථ ඇතිවය. මෙනිසා බුද්ධිමය දේපළ අයිතිය තමන් නියෝජනය කරන පාර්ශ්වයට ලබාගැනීමේ ලොකු තරගයක් අද ලොව පුරා ඇතිව තිබේ. පෙර ලෙස රටවල් කිහිපයක් එකට එකතු වී පරීක්ෂණ කර සාර්ථකත්වයට පැමිණි අවස්ථා මේ නිසා අල්පය.

රිජ්වේ ආර්යා ළමා රෝහලේ ළමා රෝග විශේෂඥ වෛද්‍ය හැරිස් පතිරගේ පවසන්නේ අසාධ්‍ය වූ කොරෝනා ආසාදිත රෝගීන් සුව කිරීම සඳහා දේශීය හා පාරම්පරික වෛද්‍ය ක්‍රම භාවිත කිරීමට අවසර ලබා දෙන ලෙස ජනාධිපති, අගමැති, දේශීය වෛද්‍ය අමාත්‍යවරයා, රාජ්‍ය අමාත්‍යවරයා හා සෞඛ්‍ය අමාත්‍යවරියට ලිඛිතව තමන් විසින් ඉල්ලීමක් කළ බවය. කොරෝනා වසංගතය නිසා මිය යන, සහ බරපතළ සංකූලතාවන්ට ලක්වන දහස් ගණන් රෝගීන්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහාත්, තවදුරටත් කොරෝනා වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහාත් දේශීය හා පාරම්පරික වෙද සහ හෙද කම භාවිත කළ යුතු බව හෙතෙම දැඩිව අවධාරණය කරයි.



වමේ සිට - දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය නීතිඥ සිසිර ජයකොඩි, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය, රිජ්වේ ආර්යා ළමා රෝහලේ ළමා රෝග විශේෂඥ වෛද්‍ය හැරිස් පතිරගේ, පාරම්පරික සිංහල වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති ආසිරි පෙරේරා සහ ආයුර්වේද ඖෂධ සංස්ථා සභාපතිනි නීතිඥ සාගලා අබේවික්‍රම

මේ සඳහා ප්‍රථම පියවර වශයෙන් හැකි ඉක්මනින් දේශීය හා පාරම්පරික වෛද්‍යවරුන් කැඳවා කතිකාවක් නිර්මාණය කර ඔවුන් මේ වන විටත් නිපදවා ඇති ඖෂධ, දැඩි සත්කාර ඒකකවල මරණාසන්නව සිටින රෝගීන්ට ලබා දීමට කටයුතු කළ යුතුය. දෙවැනි පියවර වන්නේ දැනට රෝහල්වල සහ නිරෝධායන මධ්‍යස්ථානවල රඳවා සිටින කොරෝනා රෝගීන්ට මෙම ප්‍රතිකාර විධි නියමිත සැලැස්මකට අනුව ලබා දීමට කටයුතු කිරීමය.

මේ සඳහා බාධක වශයෙන් පවතින විවිධ නීතිමය රෙගුලාසි, සායනික පරීක්ෂණ අත්‍යාවශ්‍ය යැයි හැඟෙන බටහිර වෛද්‍යමය තර්ක සහ තහංචි පිළිබඳව අදාළ පාර්ශ්ව දැනුම්වත් කොට, මියයන රෝගීන්ගේ ජීවිත රැක ගැනීම වෙනුවෙන් කටයුතු කරන ලෙසය. මීට නීතිමය අවසරය නොලැබෙන පසුබිමක අප රටේ පාරම්පරික සහ දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම භාවිත කිරීමට නොහැකි වුව ද ඒ ඖෂධ විදේශීය රටවල් ගණනාවකම භාවිතයට ගෙන ඇති බව සනාථ වී තිබේ. මේ වන විට ඉතා සාර්ථකව කොරෝනා මර්දනය කර ඇති චීනය, ඒ සඳහා බටහිර වෛද්‍ය ක්‍රමය මෙන්ම තමාගේ අවුරුදු දහස් ගණන් පැරණි සම්ප්‍රදායික, පාරම්පරික වෛද්‍ය ක්‍රම ද භාවිතයට ගන්නා බව හෙළි කර තිබේ.

මේවනවිට ආයුර්වේද රෝහල් කිහිපයක්ම කොරෝනා රෝගීන් සඳහා වෙන් කර ඇති හෙයින් ඒවා තුළ බටහිර වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම මෙන්ම අපේ පාරම්පරික උරුමයක් වූ දේශීය වෙදකමට අවස්ථාව සලසා දීමට වත්මන් රජයේ අවධානය යොමු කිරීම යෝග්‍ය බව හෙතෙම පවසා සිටියි.

කෙරෝනා යනු සෙම් රෝග සහ උණ රෝග බාණ්ඩයට වැටෙන රෝගී තත්ත්වයකි. ඉතිහාසය පුරා මෙැනි රෝග හා වසංගත තත්ත්ව ඉතා සාර්ථකව මැඩ පවත්වා ඉදිරියට පැමිණි ප්‍රෞඪ ජාතියක් ලෙස අප ලොව කිසිදු මානව ශිෂ්ටාචාරයකට නොදෙවෙනි විය. මෙරට සාම්ප්‍රදායික වෙදකම මඟින් ඕනෑම රෝගයකට ඔරොත්තු දිය හැකි ලෙස පුද්ගල ශරීරයේ පවතින ප්‍රකෘති ශක්තිය ඉහළ නැංවීම සිදු කරයි. එලෙස ප්‍රතිශක්තියක් ඇති කළ විට කොරෝනා නොව ඊට වඩා දරුණු රෝගයකට වුව මුහුණ දීමට එම පුද්ගලයාට හැකි වේ. කොරෝනා වයිරසය විකෘති වී ඇති බව අද පිළිගත් ජගත් මතයයි. එවැනි තත්ත්වයක් සඳහා මුහුණ දීමට කල්තියා සකස් කළ එන්නතකට නොහැකි බව ඇමරිකාවේ ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියක වූ ඇමරිකානු ජාතික රොබින් හෝසර් සම්බන්ධ සිදු වීමෙන් පෙනේ. ඇය Pfizer BioNTech වැක්සීනයේ දෙවන මාත්‍රාව ලබාගෙන සති හතකින් පසුව කොරොනා රොගයට ගොදුරු වීමෙන් පෙනීයයි. මෙනිසා මෙම වෙනස්වෙමින් වර්ධනය වන වයිරසයට මුහුණ දීම කළ හැක්කේ ශරීරයේ ප්‍රතිශක්තිය ඊට මුහුණ දිය හැකි පරිදි වර්ධනය කිරීමෙන් පමණක් බව පාරම්පරික සිංහල වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති ආසිරි පෙරේරා පැවසීය.

කොරෝනා රෝගය ආරම්භ වූ මුල් අවස්ථාවේ සිටම පාරම්පරික වෛද්‍යවරු කිහිප දෙනකු විසින් තමන් වෙත පැමිණි රෝගීන්ගේ ප්‍රතිශක්තීකරණය ඉහළ දැමීම සඳහා ප්‍රතිකාර කර තිබුණි. එම රෝගීන් සුවපත් විය. එහෙත් මේ සඳහා විධිමත් පර්යේෂණ සිදුකර නැති බව පවසමින් රෝගීන් සඳහා ශරීර අභ්‍යන්තරයට ඖෂධ ලබාදීමට අවසර නොලැබිණි. එසේ වුව තම කාර්ය අත්නොහැර බාහිරින් ගල්වා ශරීරයේ ප්‍රතිශක්තීකරණය ඉහළ නැංවිය හැකි තෛලයක් නිපදවීමට පාරම්පරික වෛද්‍යවරයකු වූ වනපවන වෙද මහතා සමත් විය. එම ඖෂධීය තෛලය සඳහා ආයුර්වේද ඖෂධ නීතිගත සංස්ථාව මඟින් අනුමැතිය ද හිමි වුවද වෛද්‍යවරයකුට සෘජුව මෙම තෙල ලබාදීමට හැකියාවක් නැති බව වෛද්‍ය ආසිරි සඳහන් කළේය. ජනාධිපතිවරයා සෘජුව මැදිහත් වී රෝගය පාලනය කිරීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රයෝජනයට ගන්නා ලෙස උපදෙස් දී ඇති හෙයින් මේ වනවිට තත්ත්වය තරමක් වෙනස් වී ඇති බව සඳහන් කළ හෙතෙම, වාෂ්ප ඇල්ලීමේ සතියක් ප්‍රකාශයට පත් කර මුළු රටේම ජනතාව ඊට යොමු කළ හොත් රෝගය පැතිරීමේ සම්භාවිතාව ශීඝ්‍රයෙන් පාලනය කළ හැකි බව ද පැවසීය.

2019 දෙසැම්බර් මාසයේ කොරෝනා රෝගියකු මෙරටින් වාර්තා වීමත් සමඟ 2020 මාර්තුවන විට රට ලොක් ඩවුන් තත්ත්වයට පත් විය. ඒ අවස්ථාව වනවිට අත්‍යාවශ්‍ය සේවා අතර ආයුර්වේද ඖෂධ සංස්ථාවත් අත්‍යාවශ්‍ය සේවය ලෙස සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ ගැසට් කළේය. ඒ අවස්ථාවේ සෞඛ්‍ය අමාත්‍යවරිය ලෙස පවිත්‍රාදේවි වන්නිආරච්චි කොරෝනා උවදුර මැඩලීමේ සඳහා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික කමිටුවක් පත් කළේය. මෙම කමිටුව මඟින් රෝගය නිර්වචනය කිරීමක් සිදු කළ අතර, ඒ අනුව ආයුර්වේද පොත්පත්වල සඳහන් වන ජනපද උද්වංසන රෝගයට කොරෝනා රෝගය සමාන බව කමිටුව තීරණය කළේය. මේ සඳහා ප්‍රතිකාර ක්‍රමයක් යෝජනා කළ අතර රෝග ආරම්භය, මැදි අවස්ථාව සහ අවසාන අවස්ථාව ආදී වශයෙන් රෝගයේ එක් එක් අවදිවලදී කළ යුතු ප්‍රතිකාර ක්‍රමවේදය අදාළ කමිටුව විසින් නිර්දේශ කෙරිණි. නමුත් නිරෝධායන නීති යටතේ එකදු රෝගියකුවත් ආයුරවේද ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ආයුර්වේද රෝහල් වෙත පැමිණියේ නැත. එසේ වුවත් මේ රෝගයෙන් වැළකීම සඳහා ශරීරයේ ප්‍රතිශක්තීකරණය අවශ්‍ය බව පෙන්වා දුන් මෙම කමිටුව, ඒ සඳහා ගුඩුච්ඡාදී කසාය ඉතාම සුදුසු බව නිර්දේශ කළේය. ඒ අනුව ආයුර්වේද සංස්ථාව විසින් 2020 මාර්තු මාසයේදී සතියක් පමණ ඇතුළත ගුඩුච්ඡාදී කසාය සාදා වෙළෙඳපොළට නිකුත් කළේය. මීට අමතරව සංස්ථාව මඟින් ඒ වනවිටත් නිෂ්පාදනය කරමින් සිටි රත කල්කය, සුදර්ශන චූර්ණය, සුදර්ශන කැප්සූල්, සීතාරාම විටී, බුද්ධරාජ කල්කය, නවරත්න කල්කය, ධන්‍ය පංචකය ආදී ඖෂධ වර්ග මේ රෝගයට සුදුසු බව කමිටුව විසින් නිර්දේශ කළේය. ඒ අනුව මේ ඖෂධ පළාත් ආයුර්වේද කොමසාරිස්වරු හරහා ජනතාවට ලබාගත හැකි පරිදි අදාළ ඖෂධ වෙළෙඳසැල් වෙත නිකුත් කෙරිණි.

පළමු අවස්ථාවේ බොහෝ දෙනා මේ ඖෂධ මඟින් රෝගය පාලනය කරගත් බව සිතිය හැකියි. සංස්ථාවේ සේවකයන් 350 පමණ සිටින අතර මේ හැම කෙනකුටම දිනකට දෙවතාවක් සුදර්ශන කැප්සූල් ලබා දුන් අතර, සේවකයන් දෙදෙනකුට හැර අනෙක් කිසිවකුට රෝගය වැලඳුණේ නැත. ඔවුන් දෙදෙනා කර්යාලය පුරාම ගමන් කරන සේවකයන් දෙදෙනකු වුවද ඔවුන්ගෙන් අනෙකුත් සේවකයන් කිසිවකුට රෝගය බෝ නොවුණි. ඔවුන් දෙදෙනාට වුව කොරෝනා වැලඳී තිබුණේ වෙනත් රෝගී තත්ත්වයක් සඳහා ඔවුන් ප්‍රතිකාර ලබමින් සිටි නිසා බව පසුව අනාවරණය විය. එනිසා වත්මන් තත්ත්වය පාලනය කිරීමට දින කට දෙවතාවක් දින දහයක් සුදර්ශන කැප්සූල් එක ලබා ගන්නා ලෙස මහජනතාවගෙන් තමන් ඉල්ලා සිටින බව ආයුර්වේද ඖෂධ සංස්ථාව සභාපතිනිය සාගලා අබේවික්‍රම සඳහන් කර සිටියා ය.

---

# වසංගතයේ ව්‍යාප්තියෙන් අහස උසට නඟින බඩු මිල

● චන්දිමා එදිරිමාන්න

**වසංගතයේ තීව්‍රත්වය සමඟ සැපයුම් දාමයේ සිදු වී ඇති ප්‍රමාද හා තවත් අවශේෂ කරුණු රැසක් සමඟ වෙළෙඳපොළ තුළ ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය හි හිඟයක් නිර්මාණය වී තිබේ. අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල මිල ඉහළ ගොස් තිබීම වැනි හේතු නිසා ජනතාව බලවත් දුෂ්කරතා රැසකට මුහුණ දී ඇති අතර; අධික මිල ගණන් ගෙවමින් තම අවශ්‍යතා සපුරා ගැනීමට ජනතාවට සිදු වී තිබීම කනගාටුවට කරුණකි.**

උදාහරණයක් ලෙස පසුගිය දින කීපය තුළ සම්බා, කිරි සම්බා, සම්බා කැකුළු, සුදු කැකුළු, රතු කැකුළු හා නාඩු සහල් හි මිල ඉහළ ගොස් තිබීම පෙන්වා දිය හැකිය. එම මිල ඉහළ යාම් හමුවේ කිරි සම්බා කිලෝව රු.180/= සිට රු.200/- දක්වා ඉහළ ගොස් තිබුණු අතර සම්බා කිලෝවක මිලද රු.120/- දක්වා ඉහළ ගොස් තිබුණි. මෙලෙස සහල් නිෂ්පාදනයන්හි මිල ගණන් ඉහළ යාම පිළිබඳව හේතු දැක්වූ හෙක්ටර් කොබ්බෑකඩු ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනය ප්‍රකාශ කළේ මේ ආකාරයෙන් සහල් මිල ඉහළ යෑමට හේතු වූයේ සැපයුම අඩුවීම සහ වී මිල ඉහළ යාම බවයි. කෙසේ වුවත් අත්‍යාවශ්‍ය ආහාර වෙළඳ භාණ්ඩ ආනයනකරුවන් සහ වෙළෙඳුන්ගේ සංගමය සඳහන් කර සිටින්නේ ජනතාවගේ ප්‍රධානතම අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යයක් වන සහල් මිල මෙලෙස වැඩි වී තිබෙන්නේ එම මිල පාලනය සඳහා රජයට නිසි වැඩපිළිවලක් නොමැති වීම හේතුවෙන් බවයි. සහල් පමණක් නොව මුං ඇට හා කවුපි ආදී ධාන්‍ය වර්ග වල මිලද ඉහළ ගොස් ඇති බවත්,ආනයන සීමා කිරීම්ද මෙම මිල ඉහළ යාම් සඳහා සෘජුවම බල පා ඇති බවත් එම සංගමයේ ප්‍රකාශකයකු "සිළුමිණ" සමඟ සඳහන් කළේය. මේ වන විට මුං ඇට කිලෝ ග්‍රෑම් එකක මිල රු.900/= සිට රු.1,200/= දක්වා වැඩි වී ඇති අතර කව්පි කිලෝවක මිලද රු. 640/= ත් රු.900/= ත් දක්වා මිල ගණන් වලට වැඩි වී තිබේ. මීට අමතරව කඩල හා මයිසූර් පරිප්පු හි මිලද පාරිභෝගික ජනතාවගේ පසුම්බියට ඔරොත්තු නොදෙන අයුරින් වැඩී වී ඇත.

එපමණක් නොව සිංහල අලුත් අවුරුදු සමය ආරම්භ වීමත් සමඟ මිල ගණන් ඉහළ ගිය කුකුළු මස්, මාළු, ටින් මාළු සහ වියළි මාළු හී මිල ගණන්ද තවමත් අඩු වී නැත. උත්සව සමය තුළදී තෝරා, පරා හා ඉස්සන් යන මත්ස්‍ය වර්ග හි මිල එතෙක් පැවැති මිලට සාපේක්ෂවඉහළ ගිය අතර ජීවන වියදම පිළිබඳ දර්ශකය සකස් කරන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සිල්ලර වෙළඳපොළේ මත්ස්‍ය නිෂ්පාදන අලෙවි වන ගණන්ද සටහන් කර ගන්නා ලදී.



එම දත්ත වලට අනුව පරව් මාළු කිලෝවක් රු1,200/= ත් රු1,240/=, තලපත් මාළු කිලෝවක් රු.1,000/= ත් රු.1500/=, බාලයා මාළු කිලෝවක් රු.500/= ත් රු1,000/=,, කෙලවල්ලා මාළු කිලෝවක් රු.920/= ත් රු.1,380/= සහ ඉස්සන් කිලෝවක් රු1,270/=ත් රු.1,400/- යන මිල ගණන් දක්වා වැඩි වී තිබුණි. ඊට අමතරව වෙළෙඳ පොළ තුළ ජනප්‍රිය ටින් මාළු වර්ග රැසක මිලද ඉහළ ගොස් ඇති බවට නිරීක්ෂණය විය.

වෙළඳ භාණ්ඩ ආනයනකරුවන් සහ වෙළෙඳුන්ගේ සංගමය පවසන පරිදි ටින් මාළු මිල ඉහළ යාමට ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ ටින් මාළු වල ආසනික් මට්ටම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සම්මත සීමාය. චීනයෙන් මෙරටට ආනයනය කරනු ලබන එන බොහෝ ටින් මාළු නිෂ්පාදනයන්හි ආසනික් මට්ටම 1.3 mg සිට 1.5 mg අතර වන අතර එය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් නියම කර ඇති මිලිග්‍රෑම් සීමාවට වඩා වැඩිය. මේ තත්ත්වය තුළ ආනයනික ටින්මාළු නිෂ්පාදන සීමා කර ඇති අතර එය මිල ඉහළ යෑමක් ඇති කරයි.

මීට අමතරව ගුණාත්මකභාවය සහ වෙළඳ නාම මත පදනම්ව සිල්ලර වෙළඳපොළ තුළ කුළු බඩු වර්ග වල මිලද ඉහළ ගොස් ඇත. ඒ අනුව කහ කිලෝව රු. 2,400/= සිට රු.6,000/= මිල ගණන් යටතේත්,සියඹලා කිලෝව රු.400/= සිට රු.1,100/= දක්වා මිල ගණන් යටතේත්,වියළි මිරිස් කිලෝව රු.600/= සිට රු.1,100 /=දක්වා මිල ගණන් යටතේත්, ගොරකා කිලෝව රු.600/= සිට රු.1,400/= දක්වා මිල ගණන් යටතේත් මේ වන විට වෙළෙඳපොළ තුළ අලෙවි වීම සිදු වේ. තවද ආහාර රසවත් කරන මාලදිවයිනෙන් මෙරටට ආනයනය කරනු ලබන උම්බලකඩ නිෂ්පාදනයන් හී කිලෝවද මේ වන විට රු.1,800/= සිට රු.2,700/= දක්වා වැඩි වී ඇත.

පසුගිය කාලය පුරාම අඛණ්ඩව පොල් මිලද ඉහළ ගොස් තිබුණු අතර දැනටද පොල් ගෙඩියක මිල එහි ප්‍රමාණය අනුව රු.70/= සිට රු. 120/=ක් දක්වා මිලක් වී තිබේ. සමහර පොල් තෙල් වර්ග වල පිළිකා කාරක ඇති බවට අනාවරණය වීමත් සමග උසස් තත්ත්වයේ,පිරිසුදු පොල් තෙල් නිෂ්පාදනයන්හී මිලද ඉතාම වේගයෙන් ඉහළ යන ලදී. ඒ නිසා මේ වන විට වෙළෙඳපොළ තුළ මිලි ලීටර්750 පොල් තෙල් බෝතලයක මිල සටහන් වන්නේ රු.500/= සිට රු.550/=ක් දක්වා වූ මිල ගණන් යටතේයි.

මේ සියලු කාරණා මෙලෙස පෙළ ගැසෙන විට කොවිඩ් 19 නව කොරෝනා වයිරස් ව්‍යාප්තියේ තුන් වන රැල්ලේ ප්‍රතිඵලයක් ලෙස දින කීපයකට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය වසා දැමීමටද සිදු විය.ඒ හා සමගම එම ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් දිවයින පුරා බෙදා හරින එළවළු වර්ගයන්හි මිලද වැඩි වුණු අතර ඇතැම් ගොවීන්ට තම නිෂ්පාදන අපතේ යැවීමටද සිදු වුණි. කොවිඩ් අවදානම මැද වුවද දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය විවෘත නොවුණහොත් රට පුරා උග්‍ර එළවළු හිඟයක් ඇති විය හැකි බවට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳුන්ගේ සංගමය ප්‍රකාශ කළ අතර; සියලු කරුණු පිළිබඳව අවධානය යොමු කර දැඩි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද වලට යටත්ව එම ආර්ථික මධ්‍යස්ථානය තොග වෙළෙඳුන් සඳහා දැන් යළිත් විවෘත වී තිබේ.

වර්තමාන කොවිඩ් වසංගත අවදානම සමඟ ආහාර සැපයුම් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම හේතුවෙන් ඒ ආහාර හිඟය වැළැක්වීම සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා රජය විසින් පැහැදිලි සැලැස්මක් ඉදිරිපත් කළ යුතු බව මේ තත්ත්වය සම්බන්ධයෙන් අදහස් දක්වන විශේෂඥයන්ගේ මතය වී තිබේ. වසංගත තත්ත්වය තුළ අගුළු දැමීම් ඇතුළු කුමන ක්‍රියාමාර්ග ගත්තද සහල්, එළවළු පලතුරු, මස්, මාළු, කුළු බඩු ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ හිඟයක් නැති බවට බලධාරීන් සහතික විය යුතුය. සැපයුම් දාමය විධිමත් කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. විනාශ වන එළවළු සහ පලතුරු සඳහා ආර්ථික මධ්‍යස්ථානවල අධි ශීත පහසුකම් ඇති ගබඩා අත්‍යාවශ්‍ය වේ. වසංගත තත්ත්වයේ ව්‍යාප්තිය සමඟ රට පුරා ඇති වී ඇති වාතාවරණය තුළ මේ වන විට අස්වනු විකුණා ගත නොහැකි වීම නිසා සිදු වී ඇති අලාභය සියයට 30-40ක් පමණ වන බවද ආර්ථික විශේෂඥයන් ඇතුළු විද්වතුන් රජයට පෙන්වා දී තිබේ.

# පෑන් ඒෂියා නව සභාපති - ජයන්ත එස්. බී. රන්ගමුව
## උපසභාපති - අරවින්ද පෙරේරා

මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු වන ජයන්ත එස්. බී. රන්ගමුව, පෑන් ඒෂියා බැංකුවේ නව සභාපති ධුරයට 2021 මැයි මස 02 වන දින සිට පත්කරනු ලැබ ඇත. හිටපු සභාපති ජී.ඒ.ආර්.ඩී ප්‍රසන්න මහතාගේ විශ්‍රාම යාමත් සමඟ මෙම පත් කිරීම සිදුකොට ඇත.

රන්ගමුව මහතා 2014 අගෝස්තු මස පෑන් ඒෂියා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට සහ 2018 ජනවාරි මස නියෝජ්‍ය සභාපති ලෙස ද පත්ව සිටි අතර, මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් හි හිටපු අධ්‍යක්ෂකවරයකු හා සෙන්ට්‍රල් ෆිනෑන්ස් සහ අර්නස්ට් ඇන්ඩ් යන්ග් හි ද සේවයේ නියුතුව ඇත.

එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකු වන ඔහු ඕස්ට්‍රේලියාවේ කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ සාමාජිකයෙකුද වන අතර, ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය හිමිකරගෙන ඇත. රන්ගමුව මහතා ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙන් මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ නවසීලන්තයේ යුනිටෙක් අධ්‍යයන (ක්‍රීඩා) පිළිබඳ සහතිකයක් ද ලබා ඇත.



**ජයන්ත එස්. බී. රන්ගමුව**
**සභාපති**



**අරවින්ද පෙරේරා**
**නියෝජ්‍ය සභාපති**

පෑන් ඒෂියා බැංකුවේ උප සභාපතිධුරය සඳහා ප්‍රවීණ බැංකුකරුවෙකු වන අරවින්ද පෙරේරා මහතා 2021 මැයි මස 02 වන දින සිට පත්ව ඇත. 2017 අගෝස්තු මාසයේදී පෑන් ඒෂියා බැංකු මණ්ඩලයට පත් කරන ලද ඔහු බැංකු ක්ෂේත්‍රයේ වසර 37 කට වැඩි කාලයක් සේවයකර ඇත. පෙරේරා මහතා 2012 ජනවාරි 1 සිට 2016 සැප්තැම්බර් මස විශ්‍රාම යන තෙක් සම්පත් බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂධුරය හොබවා ඇත.

වර්තමානයේ ඔහු රෝයල් සෙරමික් ලංකා කළමනාකාර අධ්‍යක්ෂවරයා සහ සිංගර් ෆිනෑන්ස් සභාපතිවරයා ලෙසද කටයුතු කරයි. හේලීස් , හේලීස් ඇවෙන්චුරා , ෆෙන්ටන්ස් ලිමිටඩ් සහ හේලීස් ඇඩ්වාන්ටිස් ලිමිටඩ් හි ද අධ්‍යක්ෂවරයෙකි. ඔහු ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ හිටපු පාලක මණ්ඩල සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙකි.

# අසමසම තාක්ෂණය සහිත නවතම උපකරණ අබාන්ස් වෙතින්



අබාන්ස් හඳුන්වා දෙන සෑම නව නිෂ්පාදනයක්ම අසමසම විශිෂ්ටත්වයකින්, උසස් ප්‍රමිතියකින් සහ අති නවීන තාක්ෂණයෙන් යුක්තව ඔබ වෙත එන නිසා ජීවිතයට සුව පහසුව සහ නවීනත්වය එක් කරනු ලබයි. පවුලේ දෛනික ජීවිතයට සුව පහසුව එක් කරන, විශාල ලෙස විදුලිය ඉතුරු කරන, සනීපාරක්ෂාව තහවුරු කරන සහ සුපිරි රසාස්වාදයක් අත්විඳිය හැකි නිෂ්පාදන රැසක් මෙම වසර තුළත් වෙළඳපොළට හඳුන්වාදීමට අබාන්ස් විසින් කටයුතු කර ඇත.

LG InstaView Door-in-Door ශීතකරණය සුවිශේෂී Instaview වීදුරු පැනලයකින් සමන්විත වන අතර, එම පැනලයට දෙවරක් තට්ටු කළ පසු ඇතුළත ඇති දේ හොඳින් දැක බලා ගැනීමේ අවස්ථාව හිමි වේ. මෙහි වෙන වෙනම විවෘත කළ හැකි දෙරවල් 5 ක් දැක ගත හැකි අතර, ඒවා වෙන් වෙන් වශයෙන් විවෘත කළ හැකි නිසා අනවශ්‍ය පරිදි සිසිලස පිටතට ගොස් හානියට ලක් නොවෙයි. ඇති තරම් ආහාරපාන අසුරා ගත හැකි විශාල ධාරිතාවයකින් සමන්විත මෙම ශීතකරණයේ සෞඛ්‍යාරක්ෂාව ඉහළින්ම තහවුරු වී ඇති අතර, සිසිල් වායු දහරාවන්ගේ පවතින විෂබීජ සහ බැක්ටීරියා 99.9% ක් විනාශ කිරීමට සමත් නැවුම් පිරිපහදු පද්ධතියක් දැකිය හැකියි. මෙහි ඇති ඉන්වර්ටර් ලීනියර් කොම්ප්‍රෙසරයේ ක්‍රියාකාරිත්වය 42% දක්වා විදුලිය ඉතුරු කරයි. මෙම ශීතකරණය සැබැවින්ම ඔබේ නිවහනට නැවුම් කළ එළියක් එක් කරනු ලබයි.

LG Vivace ෆ්‍රන්ට් ලෝඩර් රෙදි සෝදන යන්ත්‍රයේ Twin Wash ක්‍රියාකාරිත්වයක් දැක ගත හැකි අතර, එමගින් රෙදි ලෝඩ් 2 ක් එකවර සෝදා ගැනීමේ හැකියාව ලැබේ. ඒ අනුව විශාල රෙදි ප්‍රමාණයක් ඉහළ කොටසේ සෝදා ගත හැකි අතර, විශේෂිත සේදීමක් අවශ්‍ය වන කුඩා රෙදි ප්‍රමාණයක් පහළ කොටසේ සෝදා ගත හැක. එමනිසා වටිනා කාලය මෙන්ම විදුලියත් ඉතුරු කර ගැනීමේ හැකියාව ලැබේ. මෙම සුවිශේෂී වොෂර් ඩ්‍රයරය Artificial Intelligence Direct Drive (AI DD) තාක්ෂණයෙන් සමන්විත වේ.

# Durdans රෝහලෙන් TAVI හදවත් කපාට සැත්කම්

හෘද රෝගවලදී, විවෘත හදවත් ශල්‍යකර්ම (Open-heart surgery) නිතරම කතාබහට ලක් වේ. එහි ඇති සංකීර්ණභාවය නිසා එය විශාල ජීවිත අවදානමක් සහිත ශල්‍යකර්මයක් බව බොහෝ දෙනාගේ විශ්වාසයයි.

එම මතය කෙසේ වෙතත් වැඩිහිටියන් හෝ වෙනත් රෝගාබාධයන්ගෙන් පෙළෙන පිරිස් විවෘත හදවත් සැත්කම් සඳහා භාජනය කිරීමට වෛද්‍යවරු පවා මැළිකමක් දක්වති.

හෘද සැත්කම් අතරින් සංස්ථානික හෙවත් මහා ධමනි (Aortic) හෘද කපාට ආදේශන (Aortic valve replacement) සැත්කම් සිදු කළ යුතු රෝගීන් බොහෝ දෙනකු හමුවන අතර, විවෘත හදවත් ශල්‍යකර්ම සඳහා මුහුණ දීමේ අවදානම මත අවශ්‍ය ප්‍රතිකාර නොලැබී යැමෙන් බොහෝ දෙනාගේ ජීවිත අවාසනාවන්ත ලෙස නිමාවට පත් වේ.

මේ වන විට Durdans Heart Centre විසින් ක්‍රියාවට නංවා තිබෙන ඊජ්ෂධ (Transcatheter Aortic Valve Implantation) හෘද සැත්කම් ප්‍රතිකර්මය එවැනි රෝගීන්ට මහත් අස්වැසිල්ලකි.

අධි අවදානම් හා බොහෝ වේලාවක් ගතවන හෘද සැත්කම් වෙනුවට, TAVI ශල්‍යකර්මය සරල හා කදිම පිළිතුරක් වන අතර, විශේෂඥ හෘද ශල්‍ය වෛද්‍යවරයකු ලෙස අත්දැකීම් රාශියක් හිමි විශේෂඥ වෛද්‍ය පණ්ඩුල අතාවුදආරච්චි මහතා ගේ උපදේශකත්වයෙන් Durdans Heart Centre හිදී එම සැත්කම් සිදුකෙරේ. මේ වන විටත් ඉතාමත් සාර්ථකව ඊජ්ෂධ ශල්‍යකර්ම පෙළක් සිදු කරන්නට වෛද්‍ය පණ්ඩුල අතාවුද ආරච්චි මහතා ඇතුළු කණ්ඩායම සමත්ව සිටිති.



මෙම සැත්කමේදී රෝගියා සිහිනැති කරවීමක් සිදුනොවන අතර, සාමාන්‍ය හිරිවැට්ටීමක් පමණක් මගින් සිදුකරනු ලබයි.

සිහිනැතිකිරීම නොමැතිව TAVI ශල්‍යකර්ම මෙරටට හඳුන්වා දීමේ ගෞරවය විශේෂඥ වෛද්‍ය පණ්ඩුල අතාවුදආරච්චි මහතාට හිමි වන අතර, ඒ මහතා හෘද කපාට ආශ්‍රිත ශල්‍යකර්ම සම්බන්ධයෙන් තවත් බොහෝ නව හඳුන්වා දීම් සිදුකළ විශිෂ්ට වෛද්‍ය වෘත්තිකයෙකි. විනාඩි 90ක් වැනි කෙටි කාලයකදී සිදුකරන TAVI ශල්‍යකර්මයක් මගින් රෝගී හෘද කපාට වෙනුවට නව කපාට ආදේශනයන් සිදුකරමින් රෝගියාගේ ශරීරයෙහි ඔක්සිජන් සැපයුම යථා තත්ත්වයට රැගෙන එන අතර, රුධිර සැපයුම ක්‍රමවත් කෙරේ.

මේ සඳහා MyVal හෝ Edwards මෙන්ම Medtronic Evolut™R සන්නාමයන් යටතේ නිපදවන විශිෂ්ටතම ක්‍රියාකාරිත්වයක් සහිත හෘද කපාට යොදාගනී. රෝගී කපාටය වෙනුවට කැතීටරයක් සහිත කපාටයක් ආදේශනය කරමින් සිදුකරන TAVI ශල්‍යකර්මයකින් පසුව ඉතාමත් ඉක්මනින් රෝගියා යථා තත්ත්වයට පැමිණෙන අතර පැය 24ක් වැනි කෙටි කාලයකදී රෝගියාව ඇවිදවනු ලබයි.

මෙහිදී හදිසි හෘදයාබාධ, ආසාධන පිළිබඳ අවදානම ඉතාම අවම වන අතර, කෘත්‍රිම ශ්වසන යන්ත්‍ර (Ventilators) අවශ්‍යතාවය ද නොමැත. සැත්කමින් දින 3කට පසු රෝගියාට රෝහලෙන් පිටව යාමට ද හැකි වේ

# ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලයිෆ් වෙතින් Early Cash




වෙනස්වන නවීන ජීවන රටාවන්ට සහ අවශ්‍යතාවලට අනුකූලව පූර්ණ රැකවරණය සමගින් වාරික ගෙවන අතරතුර කලින්ම ප්‍රතිලාභ ලබාගත හැකි රක්ෂණ සැලසුමක් ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලයිෆ් "Early Cash" හඳුන්වා දිය හැක.

මෙම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලයිෆ් "Early Cash" රක්ෂණ සැලසුම යටතේ වාරික ගෙවන අතරතුර අවස්ථා 2කදී රක්ෂිත මුදලේ වටිනාකමින් 50% දක්වා මුදල් පූර්ව ප්‍රතිලාභ ලෙස නැවත ලබාගත හැක. ( අවුරුදු 10 ක සැලසුමකට 50%ක්ද, අවුරුදු 15/20 සැලසුමකට 40% ක්ද වේ.)

එසේ කලින් මුදල් ලැබුනද මුළු රක්ෂිත මුදලටම බෝනස් ගණනය කරනු ලබන නිසා ඔප්පුව කල්පිරීමේදී විශාල බෝනස් මුදලක් ලබා ගැනීමට හැකිවේ.

එමෙන්ම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ලයිෆ් "Early Cash" රක්ෂණ සැලසුම සමගින් අසාධ්‍ය රෝග ආවරණය, ආරෝග්‍ය ශාලා ගතවීම් ආවරණය, අතිරේක ජීවිතාවරණය, සදාකාලික අකර්මණ්‍යතා ප්‍රතිලාභ, අහඹු මරණ ආවරණය, කාලත්‍ර ආවරණය ඇතුළු ආවරණ රැසක් ලබා ගැනීමේ හැකියාව තිබේ.

එසේම රක්ෂිතයා හදිසියේ අභාවයට පත්වුවහොත්, පෙර ලබාගත් මුදල් නොසලකා මුළු රක්ෂිත මුදලත් එයට හිමි බෝනස් මුදලත් යැපෙන්නන්ට හිමිවේ.

වයස අවුරුදු 18 ත් 60ත් අතර ඕනෑම අයකුට රක්ෂණ ඔප්පුව විවෘතව පවතින අතර, රක්ෂණ ඔප්පු හිමියන්ට අවුරුදු 10, 15, 20, දක්වා රක්ෂණ ඔප්පුව සඳහා කාලසීමාව තෝරාගත හැකිය.එමෙන්ම පාරිභෝගිකයාගේ පහසුව අනුව වාරික ගෙවීම් වාර්ෂිකව, අර්ධ වාර්ෂික, කාර්තු වශයෙන් හෝ මාසිකව සිදු කළ හැකිය.

# AIA ඉන්ෂුවරන්ස් දෙවැනි වරටත් සම්මාන ලබයි

AIA ඉන්ෂුවරන්ස්, ගෞරවාන්විත "ග්ලෝබල් බෑන්කින් සහ ෆිනෑන්ස් රිව්‍යු" වෙතින් ශ්‍රී ලංකාවේ හොඳම ජීවිත රක්ෂණ සමාගම ලෙස අඛණ්ඩව දෙවන වසරටත් සම්මානයෙන් පිදුම් ලැබීම මහත් අභිමානයෙන් සමරයි. මෙම ගෞරවනීය ඇගයුම සඳහා, මූල්‍ය ක්ෂේත්‍රය සහ ලෝක ආර්ථිකය පිළිබඳ විශ්ලේෂණ සිදුකරන්නා වූ, එක්සත් රාජධානියේ ප්‍රබල සන්නිවේදන ආයතනයක් වන මෙම සමාගම, ප්‍රධාන කාර්යසාධන දර්ශක පිළිබඳව විස්තරාත්මක තක්සේරු කිරීමක් කරන ලදී.



AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගමට මෙවන් සම්මානයකට හිමිකම් කීමට විශේෂ හේතු සාධක රැසක් පවතියි. ඒ අතරින් AIA ඉන්ෂුවරන්ස්, ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය තුළ ඉහළම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ ප්‍රතිශතය හිමි ජීවිත රක්ෂකයා වීමත්, එබැවින් අවදානම් තත්ත්වයන් සහ අර්බුදකාරී අවස්ථාවන් සඳහා ඉතා හොඳින් මුහුණ දීමේ අසමසම ශක්තියත්, හැකියාවත් AIA සතුව තිබීම හැඳින්විය හැකිය. නොබෝදා ඇති වූ COVID-19 වසංගත අවස්ථාවේ දී AIA ඉන්ෂුවරන්ස් ලංකා සමාගම සවිමත් පදනමක් සහිත සමාගමක් බව මනාව පැහැදිලි වූයේ ඔවුන් සියලු හිමිකම් ගෙවමින් කිසිම බාධාවකින් තොරව ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කරගෙන යමින් නිරතුරුව සවිමත්ව රැඳී සිටීම නිසයි. AIA ඉන්ෂුවරන්ස් හි මෙම මූල්‍ය ශක්තිය සහ ස්ථාවරත්වය සඳහා සමාගමේ විචක්ෂණශීලී ආයෝජන ක්‍රමෝපායන් මෙන්ම උසස් තත්ත්වයේ ආයෝජනයන් ද මහත් රුකුලක් වේ.

AIA ඉන්ෂුවරන්ස් සැමවිට සිය සේවාලාභීන්හට වඩාත් තෘප්තිමත් අත්දැකීමක් ලබාදීම සඳහා කටයුතු කරමින් සිටින අතර, පසුගිය වසර 30 ක කාලය පුරාවට රක්ෂණවර හිමියන හට පොරොන්දු වූවාටත් වඩා වැඩි අගයක ලාභාංශ ගෙවා ඇත. AIA ඉන්ෂුවරන්ස් හි පුරෝගාමී ඩිජිටල්කරණ ප්‍රයත්නයන් සේවාලාභී සත්කාරය වඩාත් පහසු කරණු ඇති අතර, මෙමගින් සේවාලාභී කේන්ද්‍රිය රක්ෂණ සමාගමක් ලෙස එහි කීර්තිනාමය තවදුරටත් ශක්තිමත් වනු ඇත. සේවාලාභීන්ගේ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා සමාගම නිරතුරු වෙහෙසෙමින් සිටින අතර, ඔවුනගේ අවශ්‍යතා සඳහා කල්තියා ඉක්මන් විසඳුම් සොයා බැලීමට ඔවුන් ක්‍රියා කරයි. ඊට කදිම උදාහරණයක් ලෙස කොවිඩ් වසංගතයට කලින් රක්ෂණ ක්ෂේත්‍රය වෙත සමාගම හඳුන්වා දුන් පුරෝගාමී සේවාවක් වන oDOC ටෙලි-මෙඩිසින් සේවාව හැඳින්විය හැකිය.

# බිස්නස් නිව්ස්

## යුනියන් ඇෂුවරන්ස් - නේෂන්ස් ට්‍රස්ට් අත්වැල් බැඳගනී

යුනියන් ඇෂුවරන්ස් (UA) සිය ජීවිත රක්ෂණ කළඹේ වටිනාකම ඉහළ නැංවීමට සහ තිරසාර ව්‍යාපාරික වර්ධනයට ශක්තිමත් උපායමාර්ගික පියවරක් වශයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුව (NTB) සමඟ වන සමාගමේ දිගුකාලීන හවුල්කාරිත්වය පසුගියදා තවත් වසර පහකට දීර්ඝ කළේය.

යුනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ජූඩ් ගෝමස් සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ප්‍රියන්ත තල්වත්ත යන මහත්වරු විසින් අදාළ අවබෝධතා ගිවිසුමට අත්සන් තබන ලදී.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ යුනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ජූඩ් ගෝමස් මහතා "නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සමඟ පවතින මෙම හවුල්කාරිත්වය දීර්ඝ කිරීමට ලැබීම අපට ගෞරවයක්. ඉහළ ගුණාත්මකභාවය හා වටිනාකමින් යුතු සේවාවක් ලබා දීම සඳහා අප යන ගමනේදී උපායමාර්ගික සබඳතාවන් අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව තිබෙනවා වගේම ගනුදෙනුකරුවන්ගේ ජීවිත වඩාත් යහපත් හා සුරක්ෂිත කිරීමට හා ජීවිත රක්ෂණ වෙළෙඳපොළ තවදුරටත් පුළුල් කිරීම සඳහා සාමූහික කැපවීමක් ද අවශ්‍යවනවා. ගනුදෙනුකරුවන්ගේ විවිධ හා වෙනස් වන අවශ්‍යතා සපුරා ලීම සඳහා රටේ ප්‍රමුඛ පෙළේ සමාගම් දෙකක් එකට එක්ව සහයෝගයෙන් කටයුතු කළ හැකි බවට අපගේ මෙම හවුල්කාරිත්වය කදිම නිදසුනක් බව අප විශ්වාස කරනවා." යනුවෙන් පැවසුවේය.



**ජූඩ් ගෝමස්**
**යුනියන් ඇෂුවරන්ස්**
**ප්‍රධාන විධායක නිලධාරී**

"මූල්‍ය ක්ෂේත්‍රය තුළ මෑතකදී අත්සන් කරන ලද විශාලතම බැංකු රක්ෂණ උපායමාර්ගික හවුල්කාරිත්වය ලෙස මෙය පෙන්වා දිය හැකි අතර, නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට හා යුනියන් ඇෂුවරන්ස් සමාගමට සැබවින්ම මෙය සුවිශේෂී සන්ධිස්ථානයක්. බැංකු රක්ෂණ සේවා පිරිනැමීමේ ප්‍රමුඛයා ලෙස මෙය අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට මූල්‍ය ක්ෂේත්‍රය පදනම් කරගත් පාරිභෝගික සේවා ප්‍රමිතීන් සමගින් පරිපූර්ණ මූල්‍ය විසඳුම් ලබාදීමේ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ තවත් එක් වැදගත් පියවරක් ලෙස සැලකිය හැකියි." යනුවෙන් නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ප්‍රියන්ත තල්වත්ත මහතා පැවසුවේය.

# Promalt
## ශ්‍රී ලාංකික සන්නාමය හඳුන්වා දෙයි



අත්‍යවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ 30 කට වඩා අධික, සහ Whey Protein අඩංගු පෝෂ්‍යදායී සමබර ආහාර අතිරේකයක් (Nutraceuticals), Asian Chemicals and Foods (පුද්.) සමාගම, සාඩම්බරයෙන් ඉදිරිපත් කරයි. Nutraceutical පානය විටමින්, ඛනිජ ලවණ, ඇමයිනෝ අම්ල සහ සාර්ව පෝෂ්‍ය පදාර්ථ වැනි සෞඛ්‍යමත් දිවියකට මග පාදන පෝෂ්‍ය පදාර්ථ අඩංගු ආහාරමය අතිරේකයක් ලෙස වර්ගීකරණය කර ඇත.

සෞඛ්‍ය සම්පන්න සහ ක්‍රියාශීලී ජීවන රටාවක් අපේක්ෂා කරන, වයස අවුරුදු 6 සහ ඊට වැඩි අය සඳහා වන සමබර පෝෂණ අතිරේකයකි. Promalt Regular නිෂ්පාදනය සතුව පෝෂක වර්ග 31 ක්, ජීර්ණය වන තන්තු, Omega 3 ] 6 Fatty acid සහ Whey Protein අඩංගු වේ. එය Branched Chain Amino Acids වලින් පොහොසත් වන අතර එය මලල ක්‍රීඩා ජවය වැඩිදියුණු කිරීමටත්, මාංශ පේශී වර්ධනයටත් උපකාරී වේ.

Promalt Diabets 10 ට වඩා අඩු ග්ලයිසමික් දර්ශක අගයක් දරන අතර, එය රුධිර සීනි මට්ටම යාමනය කිරීමට උපකාරී වෙමින් දියවැඩියා රෝගීන්ගේ පෝෂණ අවශ්‍යතාවයන් ප්‍රශස්ත කරවයි. Omega 3 හා 6 fatty acids, සහ අත්‍යවශ්‍ය පෝෂක 33 කින් Promalt Diabets සමන්විත වේ.

Promalt Motherhood දරුවාගේ මොළය වර්ධනයට අවශ්‍ය වන folic acid සහ ඇනීමියා තත්ත්වයන් වැළැක්වීමට දායකවන යකඩවලින් පරිපූර්ණ වේ.

සියලු Promalt නිෂ්පාදන වැනිලා සහ චොකලට් රසවලින් යුක්ත වේ. "Promalt යනු පූර්ණ වශයෙන්ම ශ්‍රී ලාංකික සන්නාමයක් වන අතර එය ආනයනික වෙළෙඳ නාම සමඟ සසඳද්දී, සාමාන්‍ය ජනතාවට දැරිය හැකි මිලකට ලබාගත හැකි වෙනවා." Asian Chemicals and Foods (පුද්.) සමාගමේ අලෙවිකරණ අධ්‍යක්ෂ Gowri Shankar කියයි.

# HNB ඇෂුවරන්ස්
## මෙරට හොඳම බැංකු ආශ්‍රිත රක්ෂණ සේවා සැපයුම්කරු වේ

ගෝලීය බැංකු හා මූල්‍ය සමාලෝචන ආයතනය (Global Banking and Finance Review) මගින් සංවිධානය කරන ලද "ගෝලීය බැංකු හා මූල්‍ය සම්මාන උළෙල" හි දී "රක්ෂණ සහ තකාෆුල්" කාණ්ඩය යටතේ HNB ඇෂුවරන්ස් PLC (HNBA) ආයතනය 2021 වසරේ ශ්‍රී ලංකාවේ හොඳම බැංකු ආශ්‍රිත රක්ෂණ සේවා සැපයුම්කරු ලෙස සම්මාන හිමිකර ගත්තේය. මෙම සම්මාන උළෙල මගින් ගෝලීය මූල්‍ය ක්ෂේත්‍රය තුළ සමාගම්වල නවෝත්පාදන, ජයග්‍රහණ සහ අනුවර්තනයන් ඇගයීමට ලක්කරයි. HNBA සමාගමේ සහ එහි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (HNBGI) හි ප්‍රධාන විධායක නිලධාරි ප්‍රසන්න ප්‍රනාන්දු මහතා මෙම සුවිශේෂී ජයග්‍රහණය පිළිබඳව අදහස් දක්වමින් මෙසේ පැවසීය.

"ගෝලීය වශයෙන් පිළිගත් ඇගයීම් ආයතනයක් වන ගෝලීය බැංකු හා මූල්‍ය සමාලෝචන ආයතනය මගින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ හොඳම බැංකු ආශ්‍රිත රක්ෂණ සේවා සැපයුම්කරු ලෙස ඇගයීමට ලක්වීම සමාගමට මහත් ගෞරවයක්. HNBA ආයතනය කලට ගැළපෙන ස්ථාවර හා අඛණ්ඩ වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, ජනතාවගේ ජීවිත රක්ෂණ අවශ්‍යතා සඳහා සුවිශේෂී විසඳුම් රැසක් ලබාදෙනවා. අපගේ මව් සමාගම වන හැටන් නැෂනල් බැංකුවේ (HNB) කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයෙන් අපට නිරන්තරයෙන් ලැබුණු සහයෝගය මෙම ජයග්‍රහණයට බෙහෙවින්ම ඉවහල් වුණා. HNB ගනුදෙනුකරුවන් වෙත ඉතා ගුණාත්මක බැංකු ආශ්‍රිත රක්ෂණ සේවාවක් ලබාදීමට පසුගිය වසර කිහිපයේදී අපට හැකියාව ලැබීම සතුටට කරුණක්".



**ප්‍රසන්න ප්‍රනාන්දු**
HNBA සහ HNBGI
**ප්‍රධාන විධායක නිලධාරී**



**ලසිත විමලරත්න**
HNBA **ප්‍රධාන**
**මෙහෙයුම් නිලධාරී**



HNBA **හි හවුල් ව්‍යාපාර**
**ප්‍රධානී සනේෂ් ප්‍රනාන්දු**

HNBA සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ලසිත විමලරත්න මහතා අදහස් දක්වමින් පැවසුවේ,

"මෙම සම්මානය HNB සහ HNBA යන ආයතනවල සියලුම දෙනාගේ කැපවීමේ හා ක්‍රියාකාරිත්වයේ විශිෂ්ටත්වය පිළිබඳ උදාහරණ සපයනවා. HNB සමාගමේ බැංකු ආශ්‍රිත රක්ෂණ සේවා සැපයුම්කරු වන HNBA මගින් ලබා දෙන රක්ෂණ විසඳුම් සඳහා ශ්‍රී ලාංකික ජනතාව අතර ඉතා ඉහළ ඉල්ලුමක් පවතිනවා. මෙම ජයග්‍රහණයට උරදුන් මගේ කණ්ඩායම ප්‍රමුඛ සියලුම දෙනාට මම ස්තුතිවන්ත වීමට මෙය අවස්ථාවක් කරගන්නවා" යනුවෙනි. HNBA ආයතනයේ හවුල් ව්‍යාපාර ප්‍රධානී සනේෂ් ප්‍රනාන්දු මහතා සිය අදහස් මෙසේ බෙදා ගත්තේ ය.

"මෙම ජයග්‍රහණය කණ්ඩායමක් විදියට වැඩකිරීමේ ප්‍රතිඵලයක්. HNBA ආයතනය මේ වන විට ශ්‍රී ලංකාවේ බැංකු ආශ්‍රිත රක්ෂණ සේවා සැපයුම්කරුවන් අතර විශිෂ්ටත්වයේ සංකේතය බවට පත්වෙලා තිබෙනවා. අපට ලබාදුන් සහයෝගය වෙනුවෙන් HNB කණ්ඩායමට මම හදවතින්ම ස්තුතිය පුදකරනවා".

වෂී 2021ක් වූ මැයි මස 09 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.